321 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 321 - இல. 08
Volume 321 - No. 08

2025 සැප්තැම්බර් 26වන සිකුරාදා
2025 செப்ரெம்பர் 26, வெள்ளிக்கிழமை
Friday, 26th September, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1235]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1238-1272]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
සීනි කර්මාන්තයේ තිරසරභාවය [තීරුව 1272]
පලාලි ගුවන් තොටුපොළ සහ කන්කසන්තුරේ වරාය සංවර්ධනය [තීරුව 1275]

**මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටස ඉදිකිරීමේදී සිදුවී ඇති අක්‍රමිකතා:**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1283]

**තයිඉට්ටි හි පෞද්ගලික ඉඩමක තිස්ස රජමහා විහාරය ඉදිකිරීම:**
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1288]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1289]

**පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම** [තීරුව 1290]

**කල්තැබීමේ යෝජනාව:**
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව [තීරු 1291-1398]


# பிரதான உள்ளடக்கம்


**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1235]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1238-1272]

**தனி அறிவித்தல் மூல வினா:**
சீனிக் கைத்தொழிலின் நிலைத்தன்மை [ப: 1272]
பலாலி விமான நிலையம் மற்றும் காங்கேசன்துறை துறைமுகத்தின் அபிவிருத்தி [ப: 1275]

**மத்திய அதிவேக நெடுஞ்சாலையின் கடவத்தை - மீரிகம பகுதியின் கட்டுமானத்தின்போது இடம்பெற்ற முறைகேடுகள்:**
போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று [ப: 1283]

**தையிட்டியில் தனியார் காணியில் திஸ்ஸ ரஜமஹா விகாரை நிர்மாணம்:**
புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1288]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1289]

**பாராளுமன்ற நிலையியற் கட்டளைகளைத் திருத்துதல்** [ப: 1290]

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் நான்காவது அறிக்கை [ப: 1291-1398]


# PRINCIPAL CONTENTS


AUDITOR-GENERAL'S REPORT [Col. 1235]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1238-1272]

QUESTION BY PRIVATE NOTICE:
Sustainability of Sugar Industry [Col. 1272]
Development of Palaly Airport and Kankesanthurai Port [Col. 1275]

IRREGULARITIES IN CONSTRUCTING KADAWATHA-MIRIGAMA SECTION OF CENTRAL EXPRESSWAY:
Statement by Minister of Transport, Highways, Ports and Civil Aviation [Col. 1283]

CONSTRUCTION OF TISSA RAJAMAHA VIHARAYA ON A PRIVATE LAND IN THYIDDY:
Statement by Minister of Buddhasasana, Religious and Cultural Affairs [Col. 1288]

APPROPRIATION BILL, 2026:
Read the First time [Col. 1289]

AMENDMENTS TO THE STANDING ORDERS OF THE PARLIAMENT [Col. 1290]

ADJOURNMENT MOTION:
Fourth Report of the Committee on Public Enterprises [Cols. 1291-1398]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 සැප්තැම්බර් 26වන සිකුරාදා***
*2025 செப்ரெம்பர் 26, வெள்ளிக்கிழமை*
*Friday, 26th September, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIX කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ IX හා X කොටස්, තෙවැනි කාණ්ඩයේ VII හා VIII කොටස් සහ නවවැනි කාණ්ඩයේ V කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Bank of Ceylon for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Report on the submission of observations and steps taken in terms of Standing Order No. 119(4) of Parliament with regard to the matters mentioned on the Ministry of Digital Economy in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(1) තෙලිජ්ජවිල, කිරිමැටිමුල්ල, බාලගේවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.බී. මල්ලිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
(2) අම්බලන්තොට, රුහුණු රිදියගම, 5 කණුව යන ලිපිනයෙහි පදිංචි ජේ.එල්.එච්. අජිත් සුදසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;
(3) තෙලිජ්ජවිල, කිරිමැටිමුල්ල, බාලගේවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.එච්. චන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ
(4) තංගල්ල, ගොඩැල්ලවෙල, ළිඳගාවවත්ත යන ලිපිනයෙහි පදිංචි පේමසිරි අන්ද්‍රාහැන්නදි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, පන්නිපිටිය, කොට්ටාව, බංගලාවත්ත, පන්සල පාර, අංක 227/01 යන ලිපිනයෙහි පදිංචි බී.සී.පී. විජේතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු කථානායකතුමනි, හැටන්, මොරහේනගම, කොල්හේන, අංක 132/1 යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී. ජයසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගම්පහ, පෙතියාගොඩ, අංක 125/3 යන ලිපිනයෙහි පදිංචි ජී. අමරනන්ද ආරියරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) කොටුගොඩ, ඕපාත, අංක 235/ඒ/1 යන ලිපිනයෙහි පදිංචි ජී.සී.කේ.ආර්.එෆ්.එස්. ඕපාත මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

ගරු කථානායකතුමනි, කොළඹ 06, වැල්ලවත්ත, පීටර්සන් පාර, අංක 43, 5/1 යන ලිපිනයෙහි පදිංචි ප්‍රියන්ත උදය කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දේවාලේගම, කන්දෙගෙදර යන ලිපිනයෙහි පදිංචි පී.ටී. ජයසිරි වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) ඉල්ලගොල්ල, ලැමසූරියගම, හප්පාවර යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.යූ.ජී. චමින්ද රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -677/2025- (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### බහලුම් මුදා හැරීමේ ප්‍රමාදය පාලනය කිරීම: යෝජනා
### கொள்கலன்களை விடுவிப்பதிலுள்ள தாமதத்தைக் கட்டுப்படுத்தல்: முன்மொழிவுகள்
### CONTROL DELAY IN RELEASING CONTAINERS: PROPOSALS

737/2025

**2.** **ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට කොළඹ වරායේ බහලුම් නිදහස් කර ගැනීමේ අර්බුදකාරී තත්ත්වයක් මතුවී තිබෙන බවත්;
(ii) එම තත්ත්වය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමුද්‍රීය සැපයුම් සමාගම් සහ වාණිජ මණ්ඩල විසින් ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කර තිබෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සැලැස්මේ ඇති යෝජනා කවරේද;
(ii) එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்புத் துறைமுகத்தில் தற்போது கொள்கலன்களை விடுவிப்பதில் நெருக்கடியான நிலைமை ஏற்பட்டுள்ளது என்பதையும்;
(ii) இந்த நிலைமையைக் கட்டுப்படுத்துவதற்கு இலங்கையின் பிரதான கடல்சார் விநியோக நிறுவனங்கள் மற்றும் வர்த்தகச் சம்மேளனங்கள் ஒரு கூட்டுச் செயற்றிட்டத்தை முன்மொழிந்துள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி திட்டத்திலுள்ள முன்மொழிவுகள் யாவை என்பதையும்;
(ii) அந்த முன்மொழிவுகளை நடைமுறைப்படுத்து வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Is he aware that a -

(i) problematic situation has arisen at present concerning the release of containers from the Colombo Port; and

(ii) coordinated action plan has been proposed by the key maritime supply companies in Sri Lanka and the Chambers of Commerce to bring the situation under control;

(b) Will he inform this House the -

(i) proposals included in the said plan; and

(ii) measures that will be taken to execute those proposals?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බහලුම් නිදහස් කිරීම යනුවෙන් සඳහන් කෙරෙනුයේ, කොළඹ වරායෙන් ආනයන බහලුම් නිදහස් කිරීමයි. දැනට ආනයන බහලුම් නිදහස් කිරීම සම්බන්ධයෙන් තදබදයක් හෝ ගැටලුකාරී තත්ත්වයක් නොමැත. කෙසේ වුවද, සියලුම පර්යන්තවල ප්‍රතිඅපනයන බහලුම් ධාරිතාව ශීඝ්‍ර ලෙස ඉහළ යාමක් සිදු වීම හේතුකොටගෙන ප්‍රතිඅපනයන බහලුම් පර්යන්ත අතර ප්‍රවාහනය - inter-terminal trucking - සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පැන නැඟී ඇත.

(ii) වාණිජ මණ්ඩලය විසින් ප්‍රධාන පෙළේ සමුද්‍රීය සැපයුම් සමාගම් හා එක්ව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත යවන ලද නිවේදනය මඟින් නැව් භාණ්ඩ නිෂ්කාසනයේදී දක්නට ලැබෙන අකාර්යක්ෂමතාව පිළිබඳව ඔවුන්ගේ කනස්සල්ල පළ කර ඇති අතර පහත දැක්වෙන කරුණු ඇතුළත් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර ඇත.

- කඩිනම් නිෂ්කාසන කමිටුව - Speed Clearance Committee - නැවත සක්‍රිය කිරීම.
- දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක වන පරිලෝකන හා පිරික්සුම් පද්ධති - scanning and screening systems - ක්‍රියාත්මක කිරීම.
- විශ්වාසවන්ත වෙළඳ නැව් සඳහා හරිත ප්‍රවේශ ඇළ මාර්ගය - Green Channel - පුළුල් කිරීම.
- RCT පර්යන්තයෙහි නිෂ්කාසන ධාරිතාව ඉහළ නැංවීම සහ
- KPI dashboard යෙදවුම හරහා නියෝජිත ආයතන මඟින් සිදු වන නිෂ්කාසන ප්‍රමාදයන් ප්‍රකාශයට පත් කිරීම.

ගරු කථානායකතුමනි, මේ සියල්ලම රේගුව මඟින් සිදු කරන දේවල්. මම පිළිතුරු ලබා දෙන්නේ මේක ඒකාබද්ධ ක්‍රියාවලියක් නිසා පමණයි.

මෙම නිර්දේශ අගය කිරීමෙන් යුතුව සැලකිල්ලට ගනු ලබන අතරම, මෙම අභියෝග තීරණාත්මකව ජය ගැනීම සඳහා රජය විසින් සහ අනෙකුත් නියෝජිතායතන - port community - විසින් මේ වනවිටත් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බව මෙම සභාවේ වාර්තාගත කිරීම සඳහා අවධාරණය කළ යුතුව ඇත. එම පියවර මෙසේයි.

1. කඩිනම් නිෂ්කාසන කමිටුව - Speedy Clearance Committee - නැවත සක්‍රිය කිරීම.

   මෙය අපේ Cabinet Subcommittee එකෙන් ගිය අවුරුද්දේ ආරම්භ කළා.

2. Scanning and screening systems ශක්තිමත් කිරීම.

   එහිදී නියමිත කාල සීමාව ඉක්මවා පරිලෝකන කටයුතු සිදු කිරීම දැනටමත් ආරම්භ කර ඇති අතර දවසේ පැය 24ම ආවරණය වන පරිදි සේවයට අනුගත වීමේ ක්‍රමය ක්‍රියාත්මක වීමට නියමිතව ඇත. භාණ්ඩ එකවර නිෂ්කාසනය කිරීමට සහ පරීක්ෂා කිරීම් දෙවරක් සිදු වීම අවම කිරීමට හැකි වන පරිදි දත්ත හවුලේ පරිහරණය කිරීමේ කාර්යයෙහි නිරතවීමට නියෝජිතායතනය උපරිම මට්ටමින් කටයුතු කරමින් සිටී.

3. Green Channel එක පුළුල් කිරීම.

   රේගුව විසින් ආනයනකරුවන්ගේ තොරතුරු හඳුනා ගැනීම් සිදු කර ඇති අතර එමඟින් අඩු අවදානම් සහිත නැව් භාණ්ඩ සඳහා Green Channel එක පුළුල් කර ඇත. මෙම වැඩ පිළිවෙළ මඟින් නිෂ්කාසන තදබදය අඩු වී ඇති අතර විශ්වාසවන්ත වෙළෙඳ නැව් සඳහා කඩිනම් නිෂ්කාසනයේ ප්‍රතිලාභ අත් විඳීමට හැකියාව ලැබේ.

4. RCT පර්යන්තවල ධාරිතාව ඉහළ නැංවීම.

   මේවා බහුතරයක් පසුගිය කාලය තුළ පෞද්ගලික අංශයට පවරා තිබෙන දේවල්, ගරු කථානායකතුමනි. එම නිසා ඒවායේ සිදු වෙලා තිබෙන ගැටලු මේවායි. අතපසු වීමෙන් එක්රැස් වූ වැඩ නිරවුල් කිරීම පහසු කිරීම සඳහා අතිරේක කාර්ය මණ්ඩල යෙදවීම. සරලව ගත්තොත් මේ තැන්වල සිටිය යුතු සේවක සංඛ්‍යාව නොසිටීමත් විශාල ගැටලුවක්. මේවා අතීතයේදී පෞද්ගලීකරණය කරපු දේවල්. මෙහෙයුම් පැය ගණන දීර්ඝ කිරීම හා පරීක්ෂා කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම ක්‍රියාත්මකව ඇත.

   මෙම මැදිහත්වීම්වල ප්‍රතිඵල මේ වනවිටත් නැව් භාණ්ඩ නිෂ්කාසනය වඩා ඉක්මනින් සිදු කිරීමට දායක වී ඇත.

5. අධීක්ෂණය හා වගවීම.

   ගරු කථානායකතුමනි, මෙම පිළිතුර සම්පූර්ණ වීම සඳහා මේ කාරණය මා සඳහන් කළ යුතුයි. මෙම නැව් භාණ්ඩ නිදහස් කර ගැනීම හුදෙක්ම රජයේ ක්‍රියාමාර්ග පිළිබඳ කරුණක් නොවන අතර, සාමූහික වගකීමක් වේ. මේ වන තෙක්

[ගරු බිමල් රත්නායක මහතා]

අත්කර ගත් ප්‍රගතිය අපි නිවැරදි දිශාවට ගමන් කරමින් සිටින බව පෙන්නුම් කරන අතර, අඛණ්ඩතාවෙන් හා සංයමයකින් යුතුව කටයුතු කිරීම මඟින් මෙම අභියෝග ජය ගත හැක.

ගරු කථානායකතුමනි, රජයට පරිබාහිර ආයතනවලින් මේ සම්බන්ධව ගැටලු රාශියක් තිබෙනවා. අවශ්‍ය නම් ඒවා මට ඉදිරියේදී ඉදිරිපත් කරන්න පුළුවන්.

(ආ) (i) කලින් පිළිතුරට අදාළව එම යෝජනා තමයි ඉදිරිපත් කළේ.

(ii) කාර්යක්ෂමතාව හා පාර්ශ්වකරුවන් අතර විශ්වාසය ඉහළ නැංවීම පිණිස පසුබැම් පිටු දැකීමට ගත හැකි සියලු පියවර ගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි මේ පිළිබඳව Cabinet Subcommittee එකේදී recommendations ගණනාවක් නිකුත් කරලා, ඒවා ක්‍රියාත්මක කරලා තිබෙනවා. මම ඉන් කිහිපයක් කියන්නම්.

එකක් තමයි, ITT - Inter-terminal Trucking - කිරීම එක සමාගමක් අතේ තමයි වැඩිපුර තිබුණේ. එම නිසා අපි ඒක තව සමාගම් කිහිපයකට ගන්න කියලා යෝජනා කළා. එය එක්කෙනෙකුට සම්පූර්ණයෙන් පාලනය කරන්න තිබුණු ඉඩකඩ දැනට නැති කරලා තිබෙනවා.

දෙවැනි එක, other government agenciesවල, ඒ කියන්නේ Health Ministry, Quarantine Unit හා ප්‍රමිති ආයතනය වාගේ ආයතනවල containers දවස් ගණන් පරීක්ෂා කළ යුතු වනවා.

එතකොට ඒවායෙන් වරාය ඇතුළේ තදබදයක් ඇති වෙන එක වළක්වන්න අපි වරායට අයිති බිලූමැන්ඩල්වල වෙනම Customs inspection bay එකක් එක්ක හදලා තිබෙනවා, මේ අවුරුද්දේ පෙබරවාරි, මාර්තු වනකොට. නමුත්, ඒක තවම Sri Lanka Customs එකෙන් ප්‍රයෝජනයට අරගෙන නැහැ, ඔවුන්ට අනවශ්‍ය නිසා. ඒ, ඔවුන්ට දැනට ඒක අවශ්‍ය නැති නිසා වෙන්න පුළුවන්. නමුත්, ගැටලුවක් ඇති වුණොත් එය පාවිච්චි කරන්න පුළුවන්.

ඒ වාගේම dashboard එකක් තිබුණේ නැහැ, වරායේ වෙන්නේ මොකක්ද කියලා. අපි dashboard එකක් හදලා එය මේ වනකොට ක්‍රියාත්මක වෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම පෞද්ගලික අංශය විසිනුත් දින තුනක්ම clearance කරන්නේ නැති බව ඔබතුමා දන්නවා. ඒක වෙනස් කරන්න අපි උපරිම උත්සාහ දරමින් ඉන්නවා. ඒවා පෞද්ගලික ආයතනවලින් හදා ගෙන තිබෙන සම්ප්‍රදායයන්. සෙනසුරාදා සහ ඉරිදා බැංකු කටයුතු කෙරෙන්නේ නැහැ කියන ප්‍රශ්නයත් තිබෙනවා. අපි ඒවාටත් නියෝග පනවලා තිබෙනවා. නමුත්, ඒ සියල්ල අතරේ පෞද්ගලික අංශයේ ඒවාත් තිබෙනවා. ඒ වාගේම සමහර සමාගම්වලින් සිකුරාදා clear කරන කන්ටේනර් එළියට ගෙනියන්නේ නැහැ. ඒවා වරාය ඇතුළේ නතර කරගෙන ඉන්නවා. ඒකත් එක හේතුවක්. වරාය park එකක් වෙලා තිබෙනවා, සමහර කොම්පැනිවලට. ඒගොල්ලන්ට අපි පෑලියගොඩ ඉඩමක් වෙන් කරලා දුන්නා. නමුත්, ඒවාට එන්නේ නැහැ. පෞද්ගලික අංශය හරියාකාරව ප්‍රමිතියෙන් කටයුතු නොකිරීමත්, දිගු කාලයක් තිස්සේ වරායේ තිබෙන සමහර අඩුපාඩුත් ඒ සඳහා බලපා තිබෙනවා. විශේෂයෙන්ම වංචා සහ දූෂණ නිසා වරාය නැඟෙනහිර පර්යන්තය නිසි කාලයට - 2023 වෙනකොට- හදලා අවසන් කරන්න බැරි වුණා. ඒකත් මේ තත්ත්වයට බලපා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඉතින්, මෙහෙම කාරණා ටිකක් තමයි තිබෙන්නේ. රේගුවේ digitalization තවම අවසන් වෙලා නැති එකත් මේකට බාධා වෙලා තිබෙනවා. ඒ නිසා ඒවාට ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. සමහර ඒවා පටන් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම Health Ministry එකේ ඒ අවශ්‍ය කරන නිලධාරින් ඉන්නේ නැහැ, රෑ 9.00න් පස්සේ check කරන්න. ඒ quarantine units හැම එකටම අපි මහන්සි වෙලා අවශ්‍ය කරන නිලධාරින් පසුගිය මැයි, ජූනි වෙනකොට බඳවා දුන්නා. ඒ නිසා යම් ප්‍රගතියක් ලබා තිබෙනවා. නමුත්, පොදුවේ Red Sea එකේ තිබෙන ප්‍රශ්නත්, මැද පෙරදිග කලාපයේ තිබෙන ප්‍රශ්නත් නිසා අපිට එන flow එක වැඩිවෙලා තිබෙනවා. ඒකත් අමතර හේතුවක්. පොදුවේ ගත්තොත්, මේ ඔක්කොම කාරණා එකතු වෙලා ප්‍රශ්නයක් තිබුණා. දැන් එහෙම ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳිලාත් නැහැ. ඒක නැවත ඇති වෙන්න පුළුවන්; Specially, December or Januaryවල එන්න පුළුවන්. ඒ නිසා අපි දැනට plan කරගෙන යනවා, ඒකට මුහුණ දෙන්න.

(ඇ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මම මේ ප්‍රශ්නයෙන් මතු කළේ ජනවාරි මාසයේ ඇති වෙච්ච කන්ටේනර් තදබදය පිළිබඳ කාරණය. අපි ප්‍රශ්න ඉදිරිපත් කළාට පස්සේ මාස තුන හතරක් ගත වෙනවා, මේ ගරු සභාවේ ප්‍රශ්නය අහන අවස්ථාව එළඹෙන්න. ගරු ඇමතිතුමනි, මේ ආණ්ඩුවට බලයට එන්න mandate එක ලැබුණේ හොරකම, දූෂණය වළක්වා ගැනීමටයි. මේ රටේ විශාල හොරකමක්; වංචාවක් සිදු වුණා, මේ කන්ටේනර් 320 පිළිබඳ සිද්ධියේදී. එහිදී ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ වාර්තාවක් කැඳෙව්වා. ඒ වාර්තාව අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමනි, ඒ වාර්තාවේ තිබෙන නිර්දේශ ගැන සහ මේ වරදට සම්බන්ධ අයට නීතිය ක්‍රියාත්මක කරනවාද, එහෙම කරලා තිබෙනවාද කියන එක තමයි මම අතුරු ප්‍රශ්නය හැටියට ඔබතුමාගෙතන් අහන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා විසින් ඒ පිළිබඳ පරීක්ෂණ කමිටුවක් පත් කරලා, ඒ පරීක්ෂණ කමිටුව විසින් වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා, පර්යේෂණ අංශයට. ජනාධිපතිවරයා පරීක්ෂණ කමිටුවක් පත් කරන්නේ අනිවාර්ය වශයෙන් ඒකට අදාළ කරන ක්‍රියාමාර්ග ගන්නයි. ඒ පිළිබඳව අද තිබෙන තත්ත්වය ගැන මම දන්නේ නැහැ, අපේ අමාත්‍යාංශයේ නොවන නිසා. නමුත් මීට සතියකට කලින් නියෝජ්‍ය මුදල් ඇමතිතුමාගෙන් විමසුවාම මට දැනගන්න ලැබුණා, ඊට අදාළ පරීක්ෂණ කටයුතු සිදු කෙරෙනවා කියලා. ඒක තමයි මට ඔය සම්බන්ධව කරන්න තිබෙන පැහැදිලි කිරීම.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමනි, මම අහන්න බලාපොරොත්තු වුණු එක ප්‍රශ්නයකට ඔබතුමා උත්තරයක් දුන්නා. ඔබතුමා කිව්වා, Customs එකේ clearance වේගවත් කරන්න බිලුමැන්ඩල්වල අලුතෙන් inspection bay එකක් හදනවා කියලා. ඒ වාගේම නිලධාරින්ගේ යම් අඩුවකුත් තිබෙනවා කියලා වාර්තා වෙලා තිබෙනවා, ස්ථානයේ ඉඩ කඩ අඩුවට අමතරව. ඒ නිලධාරින්ගේ අඩුව සම්පූර්ණ කරන්නත් අවශ්‍යයි. ඒ ප්‍රශ්නය ඔබතුමන්ලා හඳුනා ගෙන තිබෙනවාද, එයට කඩිනම් විසඳුමක් ලබා දෙනවාද? ඒ වාගේම තීන්දු තීරණ ගැනීමේදී ඒ නිලධාරින්ට යම් නිදහසක් දෙන්නත් ඕනෑ. මොකද, රාජ්‍ය ආයතනවල තීන්දු තීරණ ගන්නකොට එක පාරක් නොවෙයි දහ පාරක් හිතන්න වෙලා තිබෙනවා. කොච්චර සද්භාවයෙන් තීන්දු තීරණ ගත්තත් සමහර වෙලාවට ඔහුව යම් වරදකට හසු වෙන්න පුළුවන්. මම මේ කියන්නේ හොරු ගැන නොවෙයි, සද්භාවයෙන් වැඩ කරන යම් නිලධාරින් පිළිබඳවයි. තීන්දු තීරණ ගැනීමේදී වෙනදාට වඩා අද හිතන්න වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ඒ නිලධාරින්ට, සේවක හිඟයට, හඳුනා ගෙන තිබෙන ප්‍රශ්නයට ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමා, වරාය අධිකාරියේ සමහර ශ්‍රේණිවල සේවක හිඟයක් තිබෙනවා. ඒ පිළිබඳව ගරු අගමැතිතුමිය යටතේ තිබෙන කමිටුවට ඉදිරිපත් කරලා මට මතක හැටියට විවිධ තනතුරු - 215ක් - අනුමත කර ලබා දී තිබෙනවා. ඒ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිද්ධ වෙමින් තිබෙනවා. අනුමැතිය දීලා තිබෙනවා. ඒවාට recruit කරන්න ඕනෑ යම් ක්‍රමයකට නේ. ඊට අමතරව තවත් පිරිසක් බඳවා ගන්න අපට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ ගැනත් එම කමිටුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා සේවක හිඟය සම්බන්ධ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් කියලා අපි හිතනවා. වරායේ SoR ප්‍රශ්නයක් තිබෙනවා. ඒක හරියාකාරව හදලා නැහැ. අපි ඒවා හදාගෙන යනවා. අපි හිතනවා, ඉතාම ඉක්මනින් ඒ කටයුත්ත අවසන් කරන්න පුළුවන් කියලා. ඒ වාගේම වරාය සේවකයන්ගේ බෝනස් එහෙමත් අපි ලබා දී තිබෙනවා. ඇත්තටම, සද්භාවයෙන් වැඩ කරන රාජ්‍ය නිලධාරින් හැම කෙනෙක්ම වුණත් දහ වතාවක් හිතලා වැඩ කරන එක හොඳයි කියලා මම හිතනවා. මොකද, පසුගිය අවුරුදු හැත්තෑ ගණන තිස්සේ රටට වෙලා තිබෙන විනාශය නිසා.

එතුමන්ලා සද්භාවයෙන් වැඩ කරන නිසා කාර්යක්ෂමතාව වැඩිවෙලා තිබෙනවා. පසුගිය කාලයත් එක්ක සංසන්දනය කරද්දී වරායේ ලාභය සියයට 66කින් වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා පරණ බොරු වළවල්වලට වැටෙන්නේ නැතිව, පරණ හොරුන්ගෙන් බේරිලා - ඒ හොරුන්ගේ අවතාර එක්කෙනෙක් දෙන්නෙක් තවම ඉන්නත් පුළුවන් වරායේ, එහේ මෙහේ තැන්වල - දස වතාවක් පමණ කල්පනා කරලා සද්භාවයෙන් වැඩ කිරීම තුළින් අපි වරායේ ලාභය වැඩි කරගෙන තිබෙනවා. අපි East Container Terminal එකේ partial operations ඔක්තෝබර්වලදී පටන් ගන්නවා. ඒ නිසා මම හිතනවා, සද්භාවයෙන් වැඩ කරන අය හිතලා තමයි වැඩ කරන්න ඕනෑ කියලා, නලින් මන්ත්‍රීතුමනි.

## "e-Motoring" ව්‍යාපෘතිය: අරමුණු
## "e-Motoring" கருத்திட்டம்: நோக்கங்கள்
## "E-MOTORING" PROJECT: OBJECTIVES

810/2025

**3. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "e-Motoring" ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;
(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;
(iii) එම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද ආයතනයේ නම කවරේද;
(iv) එම ආයතනය තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;
(ii) එම ව්‍යාපෘතියේ විවිධ දූෂණ සිදුවී ඇති බව දන්නේද;
(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "e-Motoring" கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;
(ii) அந்தக் கருத்திட்டம் ஆரம்பிக்கப்பட்டதன் நோக்கங்கள் யாவை என்பதையும்;
(iii) மேற்படி கருத்திட்டத்துக்காகத் தெரிவு செய்யப்பட்ட நிறுவனத்தின் பெயர் யாது என்பதையும்;
(iv) குறித்த நிறுவனத்தைத் தெரிவுசெய்யும்போது பின்பற்றப்பட்ட நடைமுறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டத்துக்காக இதுவரை செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;
(ii) அந்தக் கருத்திட்டத்தில் பல்வேறு ஊழல்கள் இடம்பெற்றுள்ளதை அறிவாரா என்பதையும்;
(iii) அவ்வாறாயின், அந்த விடயம் சம்பந்தமாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -
(i) the year in which the "e-Motoring" Project was commenced;

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

- (ii) the objectives of initiating the project concerned;
- (iii) the name of the institution selected for the project; and
- (iv) the methodology followed in selecting the institution concerned?

(b) Will he also inform this House -

- (i) the amount of money spent so far on the above project;
- (ii) whether he is aware that various acts of corruption have taken place associated with the said project; and
- (iii) if so, the measures that will be taken in this regard?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අංක අමප/18/0933/808/007/ටීබීආර් හා 2018.05.31 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2018.07.19 වැනි දින ගිවිසුම්ගතව ඇත.

(ii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සේවා කාර්යක්ෂමතාව වර්ධනය කරමින්, අධි තාක්ෂණය හා සුහුරු තාක්ෂණය භාවිත කරමින් වාහන ලියාපදිංචි කිරීම, නැවත පැවරීම හා ඊට ආනුෂංගික ක්‍රියාවලි සඳහා ව්‍යාපාර ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය කිරීමේ අවශ්‍යතාව.

(iii) Metropolitan Advanced Technologies (Pvt.) Ltd. ආයතනය.

මෙම ආයතනය, Face Technologies (Pvt.) Ltd. (South Africa) සහ Metropolitan Office (Pvt.) Ltd. යන සමාගම්වලින් සැදුම්ලත් ඒකාබද්ධ ව්‍යාපාරයකි; joint venture එකක්.

(iv) ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මඟින් තෝරා ගෙන ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් - SCAPC- පත් කරන ලදී. එම කමිටුවට සහය වීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ එවකට ලේකම්වරයාගේ ඉල්ලීම මත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් තාක්ෂණික ඇගැයීම් කමිටුවක් - TEC එකක් - ද පත් කරන ලදී.

ඒ අනුව සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් 2018 ජූලි 19 වන දින අදාළ ආයතනය තෝරා ගන්නා ලදී.

(ආ) (i) මෙතෙක් වියදමක් දරා නොමැත.

(ii) වාර්තා වී නැත.

(iii) පැන නොනඟී.

(ඇ) අදාළ නොවේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ මෙතුමාගේ විෂයත් එක්ක බැඳෙන කාරණයක් සම්බන්ධවයි. ගරු ඇමතිතුමනි, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ බැරි වෙලා තිබෙනවා, driving licence එක issue කර ගන්න. මම හිතන විධියට, මේ වනකොට අවුරුදු 2ක කාලයක් වෙනවා. 2023දී licence එක ගත්තු අය පවා තවම තාවකාලිකව දෙන කොළය අරගෙන තමයි වාහන පදවන්නේ. එතකොට, අවුරුදු දෙකක කාලයක් තිස්සේ driving licences issue කරන්නේ නැහැ. තවම තිබෙන්නේ තාවකාලික කොළය. ඒ හා සමානවම, වාහනවලට දෙන number platesවලට රුපියල් 5,000ක වාගේ මුදලක් අය කර ගන්නවා. දැන් ලක්ෂ 2ක් විතර වාගේ වාහන ප්‍රමාණයක් තිබෙනවා, number plates issue කරලා නැති. මේ වනකොට සෑහෙන කාලයක් ගිහිල්ලා තිබෙනවා. මේ ගැටලුව විසඳන්න තවත් කොතරම් කාලයක් ගත වෙයිද කියා මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, driving licences සම්බන්ධව ඔබතුමා කී කාරණය නිවැරැදිම නැහැ. ඒවා එවේලේම දෙන්නේ නැති බව ඇත්ත. නමුත් අවුරුදු දෙකක් තිස්සේ නොදී ඉඳලා නැහැ. අපි තිබුණු backlog එකකුත් - ලක්ෂ 9ක වාගේ - අවසන් කළා, පසුගිය අප්‍රේල් මාසය වනකොට. ගරු කථානායකතුමනි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තනිකරම digital solutions දෙන වෙළෙඳ සමාගම්වල කැලයක් වෙලායි තිබෙන්නේ. තේරුම් ගන්නයි මා එහෙම කිව්වේ. අවුරුදු 10ක් විතර තිස්සේ digitalization software solutions සම්බන්ධ තත්ත්වය ඒකයි. එහිදී එක පැත්තකින් නිලධාරීන්ගේ නොදැනුවත්කම බලපා තිබෙනවා. අනෙක් පැත්තෙන්, හිටපු ඇමතිවරුන්ගේ සහ හිටපු කොමසාරිස්වරුන්ගේ අන්ත දූෂිතභාවයත් එයට එකතු වෙලා තිබෙනවා වාගේම ඒ සමාගම්වල තිබෙන අතිබරපතළ දූෂිතභාවයත් එකතු වෙලා තිබෙනවා, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වගකීම් විරහිත හැසිරීමත් එක්ක. බොහෝ දෙපාර්තමේන්තුවල තත්ත්වය මේකම තමයි. දුම්රිය දෙපාර්තමේන්තුවේ පවා එහෙමයි. මොනවා හරි digital solution එකක් තිබෙනවා නම් ඒක සහමුලින් ඒ වෙළෙඳ සමාගම මතම රඳා පවතිනවා. එහි දැනුමෙන් සියයට එකක්වත් - කිසිම දැනුමක් - අඩුම ගාණේ අවුරුදු 10කට, 15කට, 26කට පස්සේවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත මාරු වෙන්නේ නැහැ. එක සමාගමක් එම කටයුත්ත අවුරුදු 26ක් තිස්සේම සිදු කරනවා. මම හිතනවා මේ තත්ත්වය සියලු රාජ්‍ය ආයතන සම්බන්ධවත් යම් ප්‍රමාණයකට සත්‍යයි කියලා. මෙන්න මෙවැනි විශාල අවුලක් තමයි තිබෙන්නේ. ඒකෙන් ජනතාවට සේවය ලැබෙන්නෙත් නැහැ, නිලධාරීන් පුහුණු වෙන්නෙත් නැහැ. ඒ වාගේම විශාල මුදල් නාස්තියක් ද වෙනවා. සාමාන්‍යයෙන් රුපියල් මිලියන 5කින් කරන්න පුළුවන් web solution එකකට මිලියන 290 ගණන් දාලා තිබෙනවා. එහෙම තමයි ඒවා කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, ඒවා rocket science කරලා, ඒ rocket science ඇතුළේ හොරකම් කරලායි තිබෙන්නේ. ඊටත් වඩා ප්‍රශ්නය, ඒ හා සම්බන්ධ agreements ඔක්කෝම කල් පැනලා තිබීමයි. ඒ නිසා කිසිම ආයතනයක් update කරන්නේ නැහැ, මේ software.

මා එහි පසුබිම ගැනයි ඒ කිව්වේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට නිශ්චිත පිළිතුර දුන්නොත්, අපි රියැදුරු බලපත්‍ර ලබා දෙමින් තිබෙනවා. දැනට තිබෙන තත්ත්වය මේකයි. අපි අලුත් features අනුව අලුත්ම රියැදුරු බලපත්‍රයක් සකස් කරමින් ඉන්නවා. එම අලුත් රියැදුරු බලපත්‍රය ලබා දීම අපට ඉදිරියේදී පුළුවන්.

ඒ වාගේම, number plates සම්බන්ධයෙන් තිබුණේ අර මා කියන පසුබිම නිසාම ඇති වූ තත්ත්වයයි. එක සමාගමක් කිසිදු

ගිවිසුමක් නැතුව කටයුතු කරලා තිබුණා. අපි ඒ සමාගමත් සමඟ කථා කරලා බැලුවා. මොකද, අපට ප්‍රශ්නයක් තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන ඔබතුමාත් දන්නවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හිටපු ප්‍රධානියා අත්අඩංගුවට ගත්තා. අපි එතුමා සමඟත් මාස 6ක් වැඩ කළා. එහෙම කළේත් බයෙන්, බයෙන්; එය කඩා වැටෙන එක වළක්වන්න. අපි දැනට අදාළ tender procedures ඔක්කෝම අවසන් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි හිතනවා නොවැම්බර් 15වන දා වෙනකොට number plates ලබා දෙන්න අපට පුළුවන් වේවි කියලා. මොකද, ඒවා අලුත් security features එක්කයි එන්නේ. ඒ නිසා ඒවා කලින් ඒවාට වඩා advanced. මා එහි පසුබිම කිව්වේ, මේවාට අදාළව tenders ගිහිල්ලා තිබෙන නිසායි. අපි greenfield එකක වැඩ කරනවා නොවෙයි. අර අවුල ලිහලා තමයි අලුත් තැනට එන්න ඕනෑ. මා එහි පසුබිම කිව්වේ, ඒක රටේ ජනතාවට වැදගත් වන නිසා. මම පිළිගන්නවා, දැනට නිසියාකාරව number plates නැතුව යම් වාහන ප්‍රමාණයක් පාරේ ධාවනය කරවන්න සිදු වෙලා තිබෙනවා කියලා. මම හිතනවා මේ නොවැම්බර් 15වන දායින් පසුව ඒ ප්‍රශ්නය වේගයෙන් විසඳන්න අපට පුළුවන් වෙයි කියලා. බොහෝ විට නොවැම්බර් 15වන දා දක්වාත් - ඒ අතර මැද්දටත් - තාවකාලික solution එකක් ලබා දීමේ කටයුත්ත ලබන සතියේ පටන් ගන්න අපට පුළුවන් වෙයි. ඒක තමයි පිළිතුර.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් ගරු ඇමතිතුමාගේ විෂයයත් එක්ක බැඳෙනවා.

පසුගිය කාලයේ පාරවලට අලුතින් බස් රථ දමන්න වැඩ පිළිවෙළක් ආරම්භ කරලා කරගෙන ගියා. එහිදී විශේෂයෙන් කොළඹ නගරයේ මාර්ගවල ධාවනය බස් රථවලින් විශාල ප්‍රමාණයක් ධාවනය වෙන්නේ නැතුව ඇණ හිටලා තිබුණා. උදාහරණයකට ගත්තොත්, 140, 155, 167 වාගේ බස් රථ කොළඹ නගරය තුළ ඉතා ජනාකීර්ණ ප්‍රදේශවල ධාවනය වන ඒවා. අපි දැක්කා, පසුගිය කාලයේ ඔබතුමන්ලා මාර්ග අංක 155 මට්ටක්කුලිය - පුරහල බස් රථ ධාවනය ඉතා උත්සවශ්‍රීයෙන් පටන් ගත්තා. ප්‍රශ්නය මේකයි ගරු ඇමතිතුමනි. මට්ටක්කුලියේ සිට පුරහලට ගිය බස් රථය දැන් නැහැ. දැන් ඒක නැවතිලා තිබෙන්නේ. නමුත් ඒක පටන් ගන්නකොට, විශාල උත්සවයක් පවත්වලා තමයි පටන් ගත්තේ. නමුත් දැන් වනවිට එය නැවතිලා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ඒ පිළිබඳව සොයා බලන්නය කියලා.

ඒකත් එක්කම, ගරු සභානායකතුමාට වගකීමක් තිබෙනවා, මේ සම්බන්ධව -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයට අදාළව - *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මේකත් එක්කම අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අසා තිබෙන මුල් ප්‍රශ්නයට අදාළවද ඔය කාරණය අහන්නේ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මේකත් එක්කම ඇහුවාම, ඇමතිතුමාට දෙකටම උත්තර දෙන්න පුළුවන් නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙකක් එකවර අහන්න බැහැ, එකයි අහන්න පුළුවන්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මේ ප්‍රශ්නය continuously යන එකක්. ගරු සභානායකතුමනි, ඒකයි මම ඔබතුමාගෙන් මේ ගැන අහන්නේ. මොකද, ඔබතුමා ආණ්ඩුවේ ප්‍රධානියෙක් හින්දා ඔබතුමාට වගකීමක් තිබෙනවා අද මේකට උත්තරයක් දෙන්න. ඊයේ තිබුණු මාධ්‍ය වැඩසටහනකදී නන්දන ගුණතිලක -1999 වසරේ ඔබතුමන්ලාගේ ජනාධිපති අපේක්ෂකයා- පැවසුවා, රංග දිසානායක ඔබතුමන්ලාගේ නීති අංශයේ වැඩ කළා කියලා. ඒක බරපතළ චෝදනාවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය අදාළ නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අදාළයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මෙතුමා ආණ්ඩුවේ නායකයෙක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙලාවේ ඔබතුමන්ලා මොනවාද මේ කියන්නේ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමා, ඒක වැදගත් වෙන්නේ - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* ඒක වෙන ප්‍රශ්නයකින් අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
-ජනතා විමුක්ති පෙරමුණේ නීති අංශයේ හිටියා කියලා හිටපු පක්ෂ සාමාජිකයෙක් කියනකොට - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි.

ප්‍රශ්න අංක 4, ගරු (නීතිඥ) චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය. *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
උත්තර දුන්නේ නැහැ, මම අහපු දෙවැනි අතුරු ප්‍රශ්නයට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අදාළ එකක් නොවෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට්ටක්කුලිය බස් රථ ධාවනය නැවතුණු එක ගැන?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, බස් රථ ගැන - *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමන්ලා ගැන ගීතයක් කියන්නයි මට හිතුණේ. "ඇයත් නොදන්නිය ඇය යන මානය" කියලා ගීතයක් තිබෙනවා නේ. ඒ වාගේ "ඔහුත් නොදන්නෙය ඔහු යන මානය". මොකක්ද මේ සජබෙට වෙලා තිබෙන්නේ? වැදගත් පක්ෂයක් නේද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඉස්සර වැදගත් පක්ෂයක් නේද? මම උත්තර දෙන්නම්. අර සින්දුව තමයි ඔබතුමන්ලාගේ තේමා ගීතය කරන්න වෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, කොළඹ නගරයේ පමණක් නොවෙයි, නාගරික ජනතාවට අවශ්‍ය හොඳම ප්‍රවාහන සේවයක් ලංකාවේ නැහැ. ඒක නිසා අතිවිශාල ගාස්තුවක් ජනතාව ටැක්සිවලට ගෙවනවා. ඒ සේවය වේගයෙන් සපයන්න පුළුවන් තැන තමයි ලංකා ගමනාගමන මණ්ඩලය. නමුත් ලංකා ගමනාගමන මණ්ඩලය සහමුලින්ම වාගේ බිඳ වට්ටලා තිබෙන්නේ. ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල කළමනාකාරිත්වය සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවලිනුත්, පසුගිය ආණ්ඩුවලිනුත් නුසුදුසු පුද්ගලයන්ගෙන් ඒක පුරවලා තිබෙන්නේ. ඒක නිසා අපි කියලා තිබෙනවා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට, පොලීසිවල OICලාට විශේෂයෙන් මේකට මැදිහත් වෙන්න කියලා. ඒ ඩිපෝ එකක, දෙකක නොවෙයි ගොඩක් ඒවායේ හොඳට වැඩ කරන වැඩි පිරිසක් ඉන්න අතරේ සමහර සේවකයන් දවල් 11.00 ඉඳන් බොනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ට, පොලීසියේ OIC මහත්වරුන්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට මම කියලා තිබෙනවා, ඒ ඩිපෝවලට ගිහිල්ලා යම් මැදිහත් වීමක් කරලා ඒවා යම් ප්‍රමාණයකින් හරි ගොඩනඟන්න යම් උත්සාහයක් ගන්න කියලා. ඒ ගොඩනඟන්න දරන උත්සාහවල හොඳ ප්‍රතිලාභ තිබෙනවා. කළුතර අපේ ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා මහන්සි වෙලා පෞද්ගලික සහ ලංගම එකතු කරලා කළුතර - කොළඹ ඒකාබද්ධ සේවය පටන් ගත්තා. හැබැයි, ගරු කථානායකතුමනි, සමහර උත්සාහයන් ඒ වෙලාවට සාර්ථක වුණාට, සමහර වෙලාවට දිගට පවත්වා ගෙන යන්න බැහැ. මොකද, කළමනාකරණය කුඩුපට්ටම් කරලා තිබෙන්නේ.

මම ඔය කියන නිශ්චිත සිද්ධිය දන්නේ නැහැ. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා මඟින් මට දැන් තොරතුරක් ලැබිලා තිබෙනවා, ඊයේත් 155 මාර්ගයේ බස් ගමන් වාර 20ක් ධාවනය කරලා තිබෙනවා කියලා.

මගේ පිළිතුර අවසන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සොයා බලා ප්‍රශ්නය අහන්න.

බොහොම ස්තුතියි.

## මහනුවර නගරය: වායු ගුණාත්මකභාවය
கண்டி நகரம்: காற்றுத் தரம்
KANDY CITY: AIR QUALITY

834/2025

**4. ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වායු ගුණාත්මක දර්ශකය අනුව මහනුවර නගරය ඉතා අවදානම් මට්ටමක පවතින බව දන්නේද;

(ii) ඒ සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் காற்றுத் தரச் சுட்டியின்படி கண்டி நகரம் மிக அதிகளவு ஆபத்தான மட்டத்தில் உள்ளதை அறிவாரா என்பதையும்;

(ii) அதில் தாக்கம் செலுத்தியுள்ள காரணிகள் யாவை என்பதையும்;

(iii) இது தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment :

(a) Will he inform this House -

(i) whether he is aware that Kandy City is at a very high risk level as per the Sri Lanka Air Quality Index;

(ii) the factors that have led to it; and

(iii) the actions that will be taken in this regard?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මධ්‍යම පරිසර අධිකාරිය විසින් සංසරණ වායුගෝලීය තත්ත්වය සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කරන අතර, එම දත්තවලට අනුව මහනුවර නගරයේ වායු තත්ත්වය ජාතික සම්මත ප්‍රමිතිවලට අනුකූලව වේ.

ගරු කථානායකතුමනි, සැප්තැම්බර් 7වැනි දා "ජාත්‍යන්තර නිල් අහස් දිනය" පැවැත්වුණා. එදා අපි වායුගෝලයේ ගුණාත්මකභාවය හඳුනා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ජාතික වෙබ් අඩවියක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජනගත කළා. ඒ ජනගත කළ වෙබ් අඩවිය පාවිච්චි කරලා, ඕනෑම මොහොතක ඒ මොහොතේ අදාළ නගරයේ තිබෙන වායු තත්ත්වය නිරීක්ෂණය කර ගන්න පුළුවන්. ඒ නිල වෙබ් අඩවිය තමයි www.aq.cea.lk කියන වෙබ් අඩවිය.

ඒ වෙබ් අඩවිය භාෂා තුනෙන්ම ක්‍රියාත්මක වෙනවා. මම ගරු මන්ත්‍රීතුමියට ආරාධනා කරනවා, ඔබතුමියගේ සභා මේසය මත තිබෙන ලැප්ටොප් පරිගණකයෙන් එම වෙබ් අඩවියට පිවිසෙන්න කියලා. එම වෙබ් අඩවියේ තිබෙනවා, අද දවසේ - මේ මොහොතේ - නුවර වායුගෝලයේ තත්ත්වය. එම තත්ත්වය good. එය කොළ පාටින් සලකුණු වෙලා තිබෙනවා. ඊට අමතරව මේ මොහොතේ නුවර උෂ්ණත්වය, humidity එක ඇතුළු සියලු තොරතුරු ඒ වෙබ් අඩවියේ තිබෙනවා. ඒ වෙබ් අඩවිය ක්‍රියාත්මක වෙන්නේ, මධ්‍යම පරිසර අධිකාරියත්, NBRO එකත්, VETT Fund එකත්, පරිසර අමාත්‍යාංශයත් සම්බන්ධ වෙලා. අපි පසුගිය සැප්තැම්බර් 8වැනි දා තමයි එම වෙබ් අඩවිය ජනගත කළේ. ඉතින්, දැන් ඔබතුමන්ලා සියලුදෙනාට පුළුවන් එම වෙබ් අඩවිය හරහා, ලංකාවේ ඒ ඒ නගරවල ඕනෑම වේලාවක වායුගෝලයේ තත්ත්වය නිරීක්ෂණය කරන්න.

ඇතැම් දිනවල අන්තර් දේශ සීමා හරහා එන වායු දූෂකාරකවල - සියුම් අංශුවල - බලපෑම මත පැය කිහිපයක් පමණ නුවර වායුගෝලයේ ගුණාත්මකභාවයේ පහළ යෑම් නිරීක්ෂණය වී තිබෙනවා. නමුත්, පොදුවේ ගත්තොත් නුවර වායුගෝලීය තත්ත්වය ඉතා අවදානම් මට්ටමක පවතිනවාය කියලා නිරීක්ෂණය වෙන්නේ නැහැ.

(ii) ඔක්තෝබර් මස සිට මාර්තු මාසය දක්වා කාලය තුළ සමහර දිනවලදී - පැය කිහිපයක් පමණ - අන්තර් දේශ සීමා හරහා මෙරටට පැමිණෙන වායු දූෂකාරක හේතුවෙන් කාලගුණික බලපෑම් වාර්තා වන අතර, එය මුළු දිවයිනටම බලපාන තත්ත්වයකි. එය නුවරට විතරක් බලපාන තත්ත්වයක් නොවෙයි.

(iii) සමස්තයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන අනුව වායු තත්ත්ව කළමනාකරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග:

නියාමන කටයුතු සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කර ක්‍රියාත්මක කිරීම.

- ජාතික පාරිසරික - වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති - නියෝග 1295/11 (2003), 1557/14 (2008), 1887/20 (2014), 2079/42 (2018), 2083/03 (2018) නියෝග හඳුන්වා දී ඇත. මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා වාහන වායු විමෝචන වැඩසටහන ආරම්භ කරන ලද අතර, මෙම රෙගුලාසි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් නියාමනය කරයි.
- ජාතික පාරිසරික (ස්ථානීය ප්‍රභව වායු විමෝචන පාලනය) නියෝග නිකුත් කර ඇත. මෙම නියෝග මඟින්, කර්මාන්ත මඟින් සිදුවන වායු දූෂණය පාලනය සඳහා නියමයන් දක්වා ඇති අතර, අප අධිකාරිය විසින් ලබාදෙන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදයේදී සහ පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේදී නියාමනය වේ.
- ජාතික පාරිසරික (විවෘත පරිසරයේ කසළ දහනය තහනම් කිරීමේ නියෝග) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව මඟින් නියාමනය කෙරේ.

වායු තත්ත්ව පසුවිපරම් කටයුතු සිදු කිරීම.

- මධ්‍යම පරිසර අධිකාරිය වායු තත්ත්ව පසු විපරම් කරන සෙසු ආයතන සමඟ සංසරණ වායුගෝලයේ තත්ත්වය අඛණ්ඩව පසු විපරම් කරන අතර, වායු ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් විශ්ලේෂණය කර ජනතාව දැනුවත් කිරීම සඳහා ද, දේශීයව සිදු විය හැකි වායු දූෂකාරක ප්‍රභව පාලනය කිරීම සඳහා ද මෙම කළමනාකරණ සැලැස්ම මඟින් ක්‍රමවේදයන් සකස් කර ඇත.
- ඊට අමතරව ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම 2022-2030 යටතේ ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව කළමනාකරණය සඳහා උපාය මාර්ග 10ක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී වායු තත්ත්ව ගුණාත්මකභාවය කළමනාකරණය කිරීමට අදාළ වන ප්‍රමුඛ ආයතන 11ක් හඳුනාගෙන පරිසර අමාත්‍යාංශය මූලිකත්වයෙන් අන්තර් ආයතන සම්බන්ධිත කමිටුවක් මඟින් එම ආයතනවලට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ලබයි.

අන්තර් දේශ සීමා හරහා එන වායු දූෂණය පාලනය කිරීම.

- ශ්‍රී ලංකාව අන්තර් දේශ සීමා හරහා එන වායු දූෂණය පසු විපරම් කිරීම, පාලනය කිරීම හා ඒ සම්බන්ධයෙන් කලාපීය සහයෝගීතාව ලබා ගැනීම සඳහා පිහිටුවන ලද මාලේ ප්‍රකාශය -

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

Male Declaration - නැමති වැඩසටහනක් සඳහා සම්බන්ධීකරණය වී කටයුතු කළ අතර මේ වන විට එය ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. ඒ අනුව මෙම ගැටලුවට ගෝලීය හා කලාපීය අවධානය යොමු කර ගැනීමට පරිසර අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් දකුණු ආසියානු සහයෝගීතා පාරිසරික වැඩසටහනේ - South Asia Co-operative Environment Programme, SACEPහි - සහයෝගය ලබාගෙන ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

පිළිතුර ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම සන්තෝෂයි, අද දින ගත්තොත් මහනුවර දිස්ත්‍රික්කයේ කාලගුණ තත්ත්වය සුබදායී අන්දමින් තිබෙන බවට දැනගන්නට ලැබීම පිළිබඳව. නමුත් අපි දැක්කා, පසුගිය මාසවල පුවත් පත් හරහා වාර්තා වෙලා තිබෙනවා, දිස්ත්‍රික්කයම කෙසේ වෙතත් මහනුවර නගර සීමාව තුළ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව. වනාන්තරයෙන් වටවෙලා ඒ නගරය පිහිටීම මෙන්ම වාහන තදබදය නිසා නගරය තුළ ඇති වී තිබෙන වායු දූෂණ තත්ත්වය බලන්න. අපි දන්නවා, වැව රවුමේ - වැව වටේ - පාසල් කිහිපයක් තිබෙන බව. මහනුවර රෝහලෙන් වාර්තා වෙලා තිබෙනවා, මේ වායු දූෂණය හේතුවෙන් දරුවන් ප්‍රතිකාර ලබා ගන්නවා කියලා. අපි දන්නවා, COPD - Chronic Obstructive Pulmonary Disease - කියලා රෝගයක් තිබෙන බව. මේ රෝගයෙන් ළමයින් විශාල සංඛ්‍යාවක් පෙළෙන බව මහනුවර මහ රෝහලෙන් වාර්තා වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට බලාපොරොත්තු වෙනවාද කියලා මම අපේ ගරු ඇමතිතුමාගෙන් පළමුවන අතුරු ප්‍රශ්නය විධියට අසන්නට කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමියනි, දැනට අප සතුව තිබෙන දත්ත අනුව, අන්තර් දේශ සීමා හරහා කිසියම් කාලයකට සිදුවන ඒ වායු දූෂණයට අමතරව අපේ දර්ශක අනුව මහනුවර නගරයේ එහෙම බරපතළ වායුගෝලීය දූෂණයක් අපට පෙන්නුම් කරන්නේ නැහැ. නමුත් අපි සූදානම්, ඔබතුමිය කියන ඔය කාරණය සම්බන්ධයෙන් සොයා බලන්න. දරුවන්ට නිතර නිතර ශ්වසන ආබාධ ඇති වෙනවා නම්, සමහර විට දේශගුණික තත්ත්වයන්, උෂ්ණත්වය, humidity වැනි තත්ත්වයනුත් ඒකට බලපානවා ඇති. වායුවේ තිබෙන ඒ අංශු ප්‍රමාණය, වායුගෝලයේ දූෂ්‍යකාරක වායු අඩංගු වෙනවාද, නැද්ද කියන එකට අමතරව, එවැනි ශ්වසන ආබාධ හැදෙන්න තවත් තත්ත්වයන් බලපානවා. සමහර විට එවන් තත්ත්වයන්වල බලපෑමක් නිසා මේක සිද්ධ වෙනවා ද දන්නේ නැහැ. නමුත්, ඔබතුමිය ඉදිරිපත් කළ කරුණු ගැන අපි අවධානය යොමු කරලා, ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය මොකක්ද කියලා සොයා බලන්නම්.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

යුනෙස්කෝ ආයතනය විසින් මහනුවර ලෝක උරුම නගරයක් බවට පත් කර තිබෙනවා කියලා අපි දන්නවා. මහනුවර දිස්ත්‍රික්කයෙන් වාර්තා වුණු වායු දූෂණය නිසා මේ සම්බන්ධයෙනුත් යම්කිසි අවදානමක් තිබෙනවා කියලා තමයි වාර්තා වෙලා තිබෙන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙනුත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

අපි ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් වෙන්නම්, ගරු මන්ත්‍රීතුමියනි. අපේ වෙබ් අඩවිය හරහා ඔබතුමියට මේ සම්බන්ධයෙන් තොරතුරු බලාගන්න පුළුවන්. ඉදිරි සතියක කාලය තුළ වායුගෝලයේ ගුණාත්මකභාවය - air quality එක - කොහොමද තිබෙන්නේ කියලා අපි අනාවැකියක් ඉදිරිපත් කරනවා. අපේ වෙබ් අඩවිය හරහා මේ සම්බන්ධයෙන් ඔබතුමියට බලාගන්න පුළුවන්. ඉදිරි සතියක කාලය තුළ එවැනි අනාවැකි පළ කිරීමකුත් ඒ වෙබ් අඩවියේ තිබෙනවා. ඒ ආශ්‍රයෙනුත් අවශ්‍ය තොරතුරු ලබා ගන්න පුළුවන්. ඊට අමතරව ජාතික පාරිසරික සංසරණ වායුගෝලීය තත්ත්ව යටතේ මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන අතරේම, හදිසි ප්‍රතිචාර ක්‍රියාකාරී සැලැස්මකුත් ක්‍රියාත්මක වෙනවා. ඒ අනුවත් අපි මැදිහත් වෙලා මේ සම්බන්ධයෙන් සොයා බලන්නම්. එම කාරණය සම්බන්ධයෙන් අපව දැනුවත් කළාට ගරු මන්ත්‍රීතුමියට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -880/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසා තිබෙන ප්‍රශ්නයට අදාළ පිළිතුර අපට තවම ලැබිලා නැහැ. එම නිසා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -980/2025- (1), ගරු සුසන්ත කුමාර නවරත්න මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## සමාජ මාධ්‍ය ඔස්සේ වැරදි තොරතුරු සහ වෛරී ප්‍රකාශ පැතිරවීම: අධීක්ෂණය සහ පාලනය
## சமூக வலைதளங்களினூடாக தவறான தகவல்கள் மற்றும் வெறுப்புரைகளைப் பரப்புதல்: கண்காணித்தலும் கட்டுப்படுத்தலும்
## SPREAD OF MISINFORMATION AND HATE SPEECHES ON SOCIAL MEDIA: MONITORING AND CONTROL

1008/2025

**7.** ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමාජ මාධ්‍ය වේදිකා හරහා වැරදි තොරතුරු සහ වෛරී කතා, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වාර්ගික කලබල හෝ කෝලාහල ඇති කරන අන්තර්ගතයන් බෙදා හැරීම නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) එවැනි හානිකර අන්තර්ගතයන් බෙදා හැරීම වැළැක්වීම සඳහා සමාජ මාධ්‍ය සමාගම්, විදුලි සංදේශ සේවා සපයන්නන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධවී කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එලෙස ගෙන ඇති පියවරවල ස්වභාවය කවරේද;

(iv) එම පියවර ක්‍රියාත්මක කිරීම මඟින් අත්කර ගෙන ඇති ප්‍රගතිය කවරේද;

(v) මාර්ගගතව වෛරී කතා පැතිරවීම, වාර්ගික උසිගැන්වීම් සිදු කිරීම හෝ කලහකාරී ක්‍රියා සංවිධානය කිරීම අධීක්ෂණය කිරීම සඳහාම වෙන්වූ අධීක්ෂණ ඒකකයක් හෝ අන්තර්-ආයතන කාර්ය සාධක බලකායක් ස්ථාපනය කර තිබේද;

(vi) වෛරී කතා සම්බන්ධයෙන් වගවීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මකව ඇති යාන්ත්‍රණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமூக வலைதளங்களினூடாக தவறான தகவல்கள் மற்றும் வெறுப்புரை, குறிப்பாக இலங்கையில் இனமுறுகலை அல்லது வன்முறைகளைத் தூண்டும் உள்ளடக்கங்கள் பரப்பப்படுவதைக் கண்காணிக்கவும் கட்டுப்படுத்தவும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் எவை?

(ii) அத்தகைய ஆபத்தான உள்ளடக்கங்களைப் பரப்புவதைத் தடுப்பதற்காகச் சமூக ஊடக நிறுவனங்களுடனும் தொலைத்தொடர்புச் சேவை வழங்குநர்களுடனும் ஏனைய சம்பந்தப்பட்ட பங்கீடுபாட்டாளர்களுடனும் கலந்துரையாடல்களில் ஈடுபடுவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டுள்ளனவா என்பதையும்;

(iii) அவ்வாறெனில், அத்தகைய ஈடுபாடுகளின் தன்மை யாது என்பதையும்;

(iv) அந்த ஈடுபாடுகளின் மூலம் அடைந்துள்ள முன்னேற்றங்கள் யாவை என்பதையும்;

(v) இணையவழி வெறுப்புப் பேச்சுக்கள், இன முறுகல்களுக்கான தூண்டுதல்கள் அல்லது கும்பல்களைத் திரட்டுதல் ஆகியன தொடர்பாக மேற்பார்வை செய்வதற்காக ஏதேனும் பிரத்தியேகமான கண்காணிப்பு அலகு அல்லது முகவர்களுக்கு இடையிலான செயலணி தாபிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(vi) வெறுப்புப் பேச்சுத் தொடர்பான வகைப்பொறுப்புப் பொறிமுறைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the measures taken to monitor and control the spread of misinformation and hate speeches on social media platforms, particularly content that incites communal tensions or mob violence in Sri Lanka;

(ii) whether steps have been taken to engage with social media companies, telecommunication service providers and other relevant stakeholders to curb such harmful content;

(iii) if so, the nature of the such engagements;

(iv) the progress acheived so far through these engagements;

(v) whether any dedicated monitoring unit or inter-agency task force has been established to oversee online hate speech, communal incitement or mob mobilisation; and

(vi) the mechanisms in place to ensure accountability in relation to hate speech?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)
- වෛරී කථා සම්බන්ධයෙන් 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ 06වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරන අතර, ශ්‍රී ලංකාවේ වාර්ගික කලබල හෝ කෝලාහල ඇති කරන අන්තර්ගතයන් සම්බන්ධයෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 120(6) වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම.

[ගරු ආනන්ද විජේපාල මහතා]

- අන්තර්ජාල ආවේක්ෂණ රාජකාරි සිදු කිරීම, සමාජ මාධ්‍ය ආයතන මඟින් ඊට අදාළ තොරතුරු ලබා ගැනීම හා බුද්ධි අංශ වෙත තොරතුරු ලබා ගෙන අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

- 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතේ ප්‍රතිපාදන සංශෝධනය කිරීම සඳහා මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව කටයුතු කිරීමට නියම වී තිබෙනවා. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ සොලිසිටර් ජනරාල් විරාජ් දයාරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුතු ඉහත අමාත්‍යාංශ තුන සහ ඩිජිටල් ආර්ථික කටයුතු අමාත්‍යාංශය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, නීති කෙටුම්පත් සම්පාදක, ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ ශ්‍රී ලංකා පොලීසිය නියෝජනය කරන කමිටුවක් මඟින් සුදුසු සංශෝධන කිරීමට නිර්දේශ ලබා ගැනීම සිදු කිරීමට අනුමැතිය හිමි වෙලා තිබෙනවා. මේ වන විට මහජන අදහස් විමසීමට ප්‍රසිද්ධ පුවත් පත් දැන්වීමක් පළ කරලා තිබෙනවා.

(ii) ඔව්.

(iii)
- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අංශය සහ ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය මේ සම්බන්ධව කටයුතු සිදු කරනු ලබනවා.

- අදාළ සමාජ මාධ්‍ය සමාගම් මඟින් තොරතුරු ඉල්ලුම් කිරීම හා අවශ්‍ය කරන අනෙකුත් ආයතන මඟින් තොරතුරු ඉල්ලීම් කිරීම සිදු කරනු ලබනවා.

- එවැනි හානිකර අන්තර්ගතයන් බෙදා හැරීම වැළැක්වීම සඳහා මෙටා, ටික්ටොක්, ටෙලිග්‍රෑම් වැනි සමාජ මාධ්‍ය ආයතන දැනුවත් කිරීම් සිදු කරනවා.

- IP ලිපින සම්බන්ධයෙන් අන්තර්ජාල සේවා සපයන්නන්ගේ ග්‍රාහක තොරතුරු ලබා ගැනීමට කටයුතු කරනු ලබනවා.

(iv)
- සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කරනු ලබන වෛරී කථා පැතිරවීම, වාර්ගික උසිගැන්වීම් සිදු කිරීම හෝ කලහකාරී ක්‍රියා සම්බන්ධයෙන් මෙටා, ටික්ටොක්, ටෙලිග්‍රෑම් වැනි සමාජ මාධ්‍ය ආයතන මඟින් තොරතුරු ඉල්ලුම් කිරීමට ශ්‍රී ලංකාව සඳහා සම්බන්ධතා ද්වාරයක් - contact portal - ලබා දී ඇති අතර, එමඟින් ඉහත ආයතන දැනුවත් කර ඒ ආයතන මඟින් අදාළ පළ කිරීම් ඉවත් කිරීමට කටයුතු කරනු ලබනවා.

- ත්‍රස්ත ක්‍රියාකාරකම් හා ළමා අපචාර සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන එම තොරතුරු අනුව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතිනවා.

(v) නොමැත.

(vi) අපරාධ වරදක් ව්‍යුත්පන්න වන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා පොලීසිය විසින් ඒ සම්බන්ධව කටයුතු කරනු ලබනවා.

(ආ) පැන නොනඟී.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவை வினாவுகின்றேன்.

எங்களுடைய இலங்கையானது அழகான, எல்லோராலும் விரும்பப்படுகின்ற ஒரு நாடாகக் காணப்படுகின்றது. உலகத்திலுள்ள செல்வந்த அல்லது வளர்ச்சியடைந்த நாடுகளுக்கு இங்கிருந்து சென்று வந்த பலரும், "எல்லா நாடுகளைவிடவும் இலங்கை அழகான நாடு; வாழ்வதற்குச் சிறந்த நாடு" என்று கூறுகின்றார்கள். அப்படிப்பட்ட எங்களுடைய இலங்கை நாடானது, நீண்ட காலமாக இனவாதம், மதவாதம் மற்றும் அடிப்படைவாதத்தால் பிளவுபட்டிருந்தது. சில ஆண்டுகளுக்கு முன்னர், இந்த நாடு வங்குரோத்தடைந்து, யாருமே வாழ முடியாதென்ற நிலையில் இருந்தது. இப்பொழுது மெல்ல மெல்ல பொருளாதார ரீதியாகவும் இன்னும் பல வழிகளிலும் மீட்சிபெற்று வருகின்றது. பனையால் விழுந்தவனை மாடேறி மிதித்த கதையாகத் தொடர்ந்தும் பல சம்பவங்கள் இந்த நாட்டில் நடைபெற்று வருகின்றன. வளர்ச்சியடைந்து வருகின்ற இந்த நாட்டை மீண்டும் சிலர் இனவாதத்தாலும் மதவாதத்தாலும் வீழ்த்துவதற்கு முயற்சிக்கின்றார்கள்.

இன்று பொது மக்களிடமிருந்து பல்வேறு முறைப்பாடுகள் எங்களுக்குக் கிடைக்கின்றன. குறிப்பாக, OTPஐ எடுத்து வங்கிக் கணக்குகளிலிருந்து பணம் திருடப்படுவதாகக் கூறுகின்றார்கள். இதனால் கோடிக்கணக்கான பணத்தைத் தாங்கள் இழந்திருப்பதாகக் கூறுகின்றார்கள். இது பற்றி பொலிஸில் முறையிடும்போது அது தட்டிக்கழிக்கப்படுவதாகவும் சில நேரங்களில் அவற்றை விசாரணைக்கு எடுத்துக்கொள்வதில்லை எனவும் அவர்கள் கூறுகின்றார்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, would you raise your Question please?

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

அண்மையில் 'வீசா' பெற்றுத்தரலாமெனக் கூறி யாழ்ப்பாணத்திலிருந்து ஒருவர் கொழும்புக்கு அழைக்கப்பட்டு இருக்கிறார். அவர் வந்த பிறகு, அவரிடமிருந்த phone மற்றும் பணத்தைப் பறித்திருக்கிறார்கள். இதுபோன்ற நிதி சம்பந்தமான மோசடிகள் பல எமது நாட்டில் நடைபெற்று வருகின்றன. இவை தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் என்ன என்பதைக் கூற முடியுமா?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මට ඒ සම්බන්ධයෙන් පැමිණිලි අංක ඇතුළු විස්තර ඉදිරිපත් කළොත් ඒ පිළිබඳව සොයා බැලීමක් කරන්න හැකියාව තිබෙනවා. බොහෝ පරිගණක අපරාධ

සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සම්බන්ධයෙන් මේ වනවිට සංශෝධන සිදු කරමින් පවතිනවා, ගරු සොලිසිටර් ජනරාල් විරාජ් දයාරත්න මහත්මයාගේ ප්‍රධානත්වයෙන් පත් කරපු කමිටුව විසින්. සමහර කාරණා සම්බන්ධයෙන් ක්‍රියා කරන්න නීති රීති ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ඒවා යම් පාලනයකට නතු කරන්න අවශ්‍ය වෙනවා. ඒ හින්දා එවැනි කාරණාවලදී සමහර පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම එතරම් සාර්ථක තත්ත්වයක නැති බව මම පිළිගන්නවා. කොහොම වුණත්, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව ගැන වෙනම හොයා බලන්න මම කටයුතු කරනවා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
எனது இரண்டாவது மேலதிக வினாவை கௌரவ மயில்வாகனம் ஜெகதீஸ்வரன் அவர்கள் கேட்பார்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, இன்று சமூக ஊடகங்கள் ஊடாகப் பரப்பப்படுகின்ற அவதூறான செய்திகளால் நேர்மையாகச் செயற்படுகின்ற எங்களது தேசிய மக்கள் சக்தியின் பாராளுமன்ற உறுப்பினர்களும் அமைச்சர்களும் இழிவுபடுத்தப்படுவதைக் காணக்கூடியதாக இருக்கின்றது.

குறிப்பாக, வெளிநாடுகளில் இருந்து இயக்கப்படுகின்ற வலைத்தளங்கள் அல்லது போலியான முகநூல் கணக்குகள் மற்றும் TikTok போன்ற வலைத்தளங்கள் ஊடாகப் பரப்பப் படுகின்ற செய்திகள் மன உளைச்சலை ஏற்படுத்துவதோடு, போலிப் பிரசாரத்தை ஊக்கப்படுத்துவதாகவும் இருக்கின்றன. எனவே, இவ்வாறான போலியான வலைத்தளங்களுக்கு எதிராக விரைவாகச் செயற்படவேண்டிய தேவை இருக்கின்றது. இதற்குரிய நடவடிக்கைகளை விரைவாக எடுப்பதற்கு ஏதேனும் வழிகள் உண்டா? நாங்கள் இது தொடர்பில் பொலிஸில் முறைப்பாடு செய்தபோதிலும், முடிவுகள் எங்களுக்கு விரைவாகக் கிடைக்கப் பெறுவதில்லை. கடந்த வாரம்கூட, வன்னித் தேர்தல் மாவட்டத்தைச் சேர்ந்த பிரதி அமைச்சர் ஒருவர் தொடர்பில் போலியான செய்திகள் 'தினகரன்' என்ற website ஊடாகப் பரப்பப்பட்டு இருந்தது. இது மிகவும் வேதனை அளிக்கக்கூடிய விடயமாகும். அவர் இது தொடர்பில் பொலிஸில் முறைப்பாடு செய்திருக்கிறார். இருப்பினும், இன்னும் அதற்கான தீர்வு கிடைக்கவில்லை. எனவே, சட்டமூலம் ஒன்றைக் கொண்டுவந்தோ அல்லது சட்டரீதியான வேறு ஏதேனும் ஒரு நடவடிக்கை மூலமோ இந்த விடயத்துக்கு விரைவாக முற்றுப்புள்ளி வைக்கவேண்டிய தேவை இருக்கின்றது. இது தொடர்பில் கருத்துக்கூற முடியுமா? என கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, මම කලිනුත් ප්‍රකාශ කළ පරිදි මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතට සංශෝධන යම් ප්‍රමාණයක් අවශ්‍ය වෙලා තිබෙනවා. සමාජ මාධ්‍ය හරහා යම් යම් අයට චෛරී ප්‍රකාශ සිදු කිරීම සහ අපහාස කිරීම් දිගින් දිගටම සිදු වෙනවා. ඒවා යම් පාලනයකට නතු කර ගැනීම සඳහා නීති රීති අවශ්‍යයි. ඒ නිසා එම පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනම් කරලා තිබෙනවා. මේ සඳහා අමාත්‍යාංශ හතරක ඒකාබද්ධතාවෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. දැනට තිබෙන නීති රීති ඔස්සේ තමයි විමර්ශන සිදු කරන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ නිශ්චිත කාරණය සම්බන්ධයෙන් මට තොරතුරු ලබා දුන්නොත් ඒ පිළිබඳව තවදුරටත් සොයා බලා ඔබතුමාට පිළිතුරක් ලබා දීමට හැකියාව තිබෙනවා.

## අරුගම්බේ 'සබාත් නිවස': විස්තර
### அறுகம்பையிலுள்ள 'சபாத் இல்லம்': விபரம்
### "SHABBAT HOUSE" IN ARUGAM BAY: DETAILS

1210/2025

**8. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පොතුවිල්, අරුගම්බේ ප්‍රදේශයේ මුස්ලිම්වරුන්ගේ මෆාසා මුස්ලිම් දේවස්ථානයට ආසන්නව ඊශ්‍රායලයට අයත් නීති විරෝධී 'සබාත් නිවස' නමැති ආයතනයක් ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ආයතනය කොපමණ කාලයක සිට ක්‍රියාත්මක වන්නේද;

(iii) එම ආයතනය පිහිටුවා ඇති ඉඩම ලබා දී ඇති පදනම කවරේද;

(iv) එම ආයතනයට දැඩි ආරක්ෂාවක් ලබා දීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ආකර්ෂණීය ප්‍රදේශයක් වන අරුගම්බේ ප්‍රදේශයේ ජනතාව, දේශීය හා විදේශීය සංචාරකයන්, ධීවරයන් සහ ගොවි ජනතාව බියට පත්වී සිටින බව දන්නේද;

(v) ඉහත ආයතනය ඉවත් කිරීම සඳහා කිසියම් පියවරක් ගෙන තිබේද;

(vi) එම ආයතනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ පොතුවිල් ප්‍රාදේශීය සභාවෙන් වාර්තාවක් කැඳවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொத்துவில், அறுகம்பை பிரதேசத்தில் முஸ்லிம் களின் மபாஸா பள்ளிவாசலுக்கு அருகில் இஸ்ரேலுக்குச் சொந்தமான சட்டவிரோத 'சபாத் இல்லம்' எனும் நிறுவனம் இயங்கி வருவது குறித்து அறிவாரா;

(ii) மேற்படி நிறுவனம் எவ்வளவு காலமாக இயங்கி வருகின்றது;

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

(iii) மேற்படி நிறுவனம் அமைந்துள்ள காணி வழங்கப்பட்டுள்ள அடிப்படை யாது;

(iv) மேற்படி நிறுவனத்துக்குப் பலத்த பாதுகாப்பு வழங்கப்பட்டுள்ளமையால், இலங்கையின் சுற்றுலாக் கைத்தொழிலில் கவர்ச்சிகரமான பிரதேசமாகத் திகழும் அறுகம்பே பிரதேசத்தைச் சேர்ந்த மக்கள், உள்நாட்டு மற்றும் வெளிநாட்டு உல்லாசப்பயணிகள், மீனவர்கள் மற்றும் விவசாயிகள் அச்சமடைந்துள்ளார்கள் என்பதை அறிவாரா;

(v) மேற்படி நிறுவனத்தை அகற்றுவதற்கு ஏதேனும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா;

(vi) மேற்படி நிறுவனம் தொடர்பில் அமைச்சானது, பொத்துவில் பிரதேச செயலகம் மற்றும் பொத்துவில் பிரதேச சபையிடமிருந்து அறிக்கை யொன்றைக் கோரியுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House-

(i) whether he is aware that an illegal institution called "Shabbat House" belonging to Israel is operating close to the Mafasa Mosque of Muslims in the Arugam Bay area in Pottuvil;

(ii) the duration for which the said institution has been operating;

(iii) the basis on which the land has been granted;

(iv) whether he is aware that the residents of the Arugam Bay area, which is a popular tourist attraction in Sri Lanka, the local and the foreign tourists, fishermen and farmers are frightened due to the tight security provided to that institution;

(v) whether any step has been taken to remove the above institution; and

(vi) whether the Ministry has called for a report from the Pottuvil Divisional Secretariat and the Pottuvil Pradeshiya Sabha regarding that institution?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. සබාත් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් පොතුවිල් ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තාවක් කැඳවන ලදුව පොතුවිල් ප්‍රාදේශීය ලේකම් විසින් 'සබාත් නිවස' නමැති ආයතනයක් පවතින බවට වාර්තා කර තිබෙනවා. ඊට අදාළ ලිපිය ඇමුණුම ලෙස දක්වා ඇත.

(ii) නොදනී.

(iii) මෙම ආයතනය පිහිටි ඉඩම පෞද්ගලික ඉඩමක් බව පොතුවිල් ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇත.

(iv) එහෙම තොරතුරු වාර්තා වෙලා නැහැ. නමුත්, මෙම ප්‍රශ්නයට ඔබතුමාට අවශ්‍ය තොරතුරු ඔබතුමාගේ අතුරු ප්‍රශ්නවලදී මම කියන්න කැමතියි.

(v) මෙම ආයතනය ඉවත් කිරීම මෙම අමාත්‍යාංශයට අදාළ නැහැ. ඒ වාගේම බලයකුත් නැහැ. නමුත්, ඔබතුමාට තොරතුරු සම්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා. හැබැයි, ඒවා ආරක්ෂක අමාත්‍යාංශයෙන් තමයි ලබා ගන්න වෙන්නේ.

(vi) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් වෙතින් වාර්තාවක් කැඳවා ඇත. ඒ සම්බන්ධව ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களே, மிகவும் முக்கியமானதொரு பிரச்சினை சம்பந்தமாகவே நான் இந்தக் கேள்வியை முன்வைத்து இருக்கிறேன். மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் ஐக்கிய நாடுகள் பொதுச் சபையின் 80ஆவது கூட்டத்தொடரில் பலஸ்தீன் - காஸா தொடர்பில் கருத்துத் தெரிவித்தமைக்கு முதலில் அவருக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். காஸா பகுதியில் நடந்து வருகின்ற கொடூரமான பேரழிவுகள் கவலையை ஏற்படுத்தி இருப்பதாக அவர் சொல்லி இருக்கிறார். ஆட்சியாளர்களின் கடமை மக்களின் உயிர்களைப் பாதுகாப்பது எனவும் பலஸ்தீன் நாடு ஒன்றுக்கான பிரிக்க முடியாத உரிமையை இலங்கை அங்கீகரிப்பதாகவும் சனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் சபையில் கூறியிருக்கிறார். அதுமாத்திரமல்ல, காஸா பகுதி மக்களுக்கு இலங்கை மக்கள் சார்பில் தனது கவலையையும் தெரிவித்துள்ளார். தங்களுடைய அதிகார மோகத்துக்காக மக்கள்மீது செல்வாக்குச் செலுத்தவும் அவர்களை ஒடுக்கவும் யாருக்கும் உரிமை கிடையாது.

பொத்துவில் அறுகம்பை பிரதேசத்தில் அமைக்கப்பட்டுள்ள இஸ்ரேலியர்களின் சட்டவிரோத 'சபாத்' இல்லத்தை மூட வேண்டுமென பொத்துவில் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும், பொத்துவில் பிரதேச சபை அமர்விலும் ஏகமனதாகத் தீர்மானம் எடுக்கப்பட்டது. அது தொடர்பான ஆவணங்களை நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்**.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த விடயம் தொடர்பில் நாங்கள் உங்களோடு பிரச்சினைப்படவில்லை. நீங்கள் நேர்மையாகச் செயற்படக்கூடிய ஓர் அமைச்சர் என்பதை

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். முஸ்லிம்களுடைய பள்ளிவாசலுக்குப் பக்கத்திலே இந்த 'சபாத் இல்லம்' அமைக்கப்பட்டு இருக்கின்றது. இலங்கை - பலஸ்தீன் நட்புறவுச் சங்கத்தின் தலைவர் பதவியிலிருந்து கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் இராஜினாமா செய்திருப்பதாக நான் நேற்றைய தினம் செய்தி ஊடாக அறிந்து கொண்டேன். இந்தக் காலகட்டத்தில் அவர் இந்தப் பதவியை இராஜினாமா செய்திருப்பது கவலையளிக்கிறது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය කෙටි කරන්න. ඔය ප්‍රශ්නයට දැන් විනාඩි දෙකක් ගතවෙලා තිබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ප්‍රශ්නය කෙටි කරන්නම්, ගරු කථානායකතුමනි.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் கலாசார விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் என்ற வகையில், மேற்குறிப்பிட்ட 'சபாத்' இல்லத்தை அகற்றுவதற்கு என்ன நடவடிக்கைகளை மேற்கொண்டு இருக்கின்றீர்கள் எனக் கேட்கின்றேன். இது பாதுகாப்பு அமைச்சுடன் சம்பந்தப்பட்ட விடயம் என்றால், நாங்கள் இவ்விடயம் தொடர்பில் பாதுகாப்பு அமைச்சரான மாண்புமிகு சனாதிபதியிடமோ அல்லது பிரதிப் பாதுகாப்பு அமைச்சரிடமோ கேட்கின்றோம்.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය පැහැදිලියි. ඇත්තටම මේ සම්බන්ධව ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙනුත් මම මීට මොහොතකට කලින් විමසීමක් කළා. එතුමා මේ දැනුත් දීර්ඝ

මැදිහත්වීමක් කරලා විස්තරාත්මක තොරතුරු ලබා දුන්නා. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී අරගෙන තිබෙන තීරණය මම දන්නවා. අපිට ඒ ගැන දැනුම් දුන්නා. ඒ අනුව මේකට අවශ්‍ය කරන දිගු,

ඉතා නිරවද්‍ය මැදිහත්වීමක් ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව සෙවීම් සියල්ල සිදු කර දීලා, ගරු අධිකරණයට කරුණු වාර්තා කරලා තිබෙනවා. ඒ වාගේම මේ ඉඩම පවා විදේශිකයන් මිලදී අරගෙන තිබෙන්නේ. ඒක මුස්ලිම් ජාතිකයෙකුට අයිති ඉඩමක්. එතැන තමයි මේක පවත්වාගෙන යන්නේ. ඒ වාගේම මේ ගැන සොයා බලනකොට ප්‍රාදේශීය ලේකම් වාර්තාවේ සඳහන් වෙනවා, ඒ හිමිකරුවන් එතැන දැන් නැහැ කියලා. සමහර විට ඒ අය විදේශගත වෙලා වෙන්න පුළුවන්. ඒ අනුව ගරු විනිශ්චයකාරතුමා හොඳ තීරණයක් ලබා දීලා තිබුණා, "මේ මැදිහත්වීම් ඒ විධියට කරන්න එපා. තමන්ගේ නිශ්චිත ඉල්ලීම ඇතුළේ පමණක් ඒ ආයතනය රෙස්ටුරන්ට් එකක් නම් ඒක විතරක් මේ විධියට කරගෙන යන්න" කියලා. ඒ විධියට උපදෙස් දීලා තිබෙනවා. ඉදිරියේදී මහජන පීඩාව ඇති වෙන විධියට කරුණු යෙදුණොත් දැඩි අවවාද කරලා, නීතිමය ක්‍රියාමාර්ග ගන්න පොලීසියට අවශ්‍ය කරන උපදෙස් දීලා තිබෙනවා. එම නිසා අපි ඒ පැත්තෙන් මේ සඳහා සෘජුව මැදිහත් වෙලා තිබෙනවා. ගරු අමාත්‍යවරයා ඒ බව මීට මොහොතකට කලින් තහවුරු කළා. අවශ්‍ය නම් කරුණු පැහැදිලි කරන්නත් පුළුවන්.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! எனது இரண்டாவது மேலதிக வினாவை எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள் கேட்பார்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Speaker, with your permission, may I ask this.
ගරු අමාත්‍යතුමනි, මගේ ප්‍රශ්නයෙන් අහන්නේ ඊයේ මැල්සිරිපුර, නා උයන ආරණ්‍ය සේනාසනයේ සිදු වුණු ඛේදවාචකය ගැනයි. එවැනි අසීරු තැන්වලට ගමන් කිරීම සඳහා මෙවැනි යාන්ත්‍රික ප්‍රවාහන පහසුකම්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
අතුරු ප්‍රශ්නය තමයි මම අහන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අසීරු තැන්වලට ගමන් කිරීම සඳහා යොදා ගන්නා යාන්ත්‍රික ප්‍රවාහන පහසුකම්වලදී ඇති වෙන මෙවැනි ඛේදවාචක වැළැක්වීම සඳහා යම් නිසි ක්‍රමවේදයක් අවශ්‍යයි. නොයෙකුත් තැන්වල මෙවැනි යාන්ත්‍රිකව ක්‍රියාත්මක වන ප්‍රවාහන පහසුකම් තිබෙනවා. එක්කෝ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, එහෙම නැත්නම් පළාත් පාලන ආයතන මේවා නිසි පරීක්ෂණයට ලක් කරලා ඒවාට අවසර පත් ලබා දීම, වාර්ෂිකව පරීක්ෂාවට ලක් කිරීම වැනි කාරණා කළ යුතුයි. අදාළ අංශ ඒ පිළිබඳව කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව ඔබතුමාත් අදාළ ආයතනවලට දැනුම් දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, ඇසූ මූලික ප්‍රශ්නයට සෘජුව අදාළ නැතත්, කාලීන තොරතුරක් එතුමා ඉදිරිපත් කරන්නේ. සිදුවීමක් වුණාට පස්සේ තමයි සමහර ක්ෂේත්‍ර පිළිබඳව අපේ අවධානය බරපතළ විධියට යොමු වෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ කාරණය වැදගත්. මම ඊයේ දවස ඇතුළත අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ මේ කාරණය මේ විධියටම සාකච්ඡා කළා. අපේ අමාත්‍යාංශයේ විෂය පථය ඇතුළේ එවැනි මැදිහත්වීම් කළ යුතු තැන්වලට අපි මැදිහත් වෙනවා. ඒ වාගේම

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශය ඇතුළු මීට උදවු අවශ්‍ය කරන තැන්වලින් ආධාර උපකාර, මඟ පෙන්වීම් ගන්නත් අපි පසුබට වෙන්නේ නැහැ. බොහොම ස්තුතියි, ඔබතුමාට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1270/2025- (1), ගරු සුජීව දිසානායක මහතා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය, වැඩබලන අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு பதில் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media, Acting Minister of Justice and National Integration and Chief Government Whip)
ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -1295/2025- (1), ගරු රුවන්තිලක ජයකොඩි මහතා.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## අදානි සමාගම සමඟ අත්සන් කරන ලද ගිවිසුම: වත්මන් තත්ත්වය
## அதானி நிறுவனத்துடன் கைச்சாத்திடப்பட்டுள்ள ஒப்பந்தம்: தற்போதைய நிலை
AGREEMENT SIGNED WITH ADANI COMPANY: CURRENT SITUATION

677/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හෙක්ටර් අප්පුහාමි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Hector Appuhamy)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට - (1):

(අ) (i) පසුගිය රජය විසින් ඉන්දියාවේ අදානි සමාගම සමඟ බලාගාර ව්‍යාපෘතියක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබූ බව දන්නේද;

(ii) වර්තමාන රජය විසින් එම ව්‍යාපෘතිය සංශෝධනය කරන්නේද;

(iii) නොඑසේ නම්, අවලංගු කරන්නේද;

(iv) පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට ජාත්‍යන්තර ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்கம் இந்தியாவின் அதானி நிறுவனத்துடன் மின் உற்பத்தி நிலையக் கருத் திட்ட ஒப்பந்தமொன்றில் கைச்சாத்திட் டிருப்பதை அறிவாரா என்பதையும்;

(ii) தற்போது ஆட்சியிலுள்ள அரசாங்கத்தால் மேற்படிக் கருத்திட்டத்தில் திருத்தங்கள் மேற் கொள்ளப்படுமா என்பதையும்;

(iii) இன்றேல், இக்கருத்திட்டம் இரத்துச்செய்யப் படுமா என்பதையும்;

(iv) புதுப்பிக்கத்தக்க வலுசக்தி துறைக்குச் சர்வ தேச முதலீட்டாளர்களைக் கவரும் பொருட்டு மேற்கொள்ளக்கூடிய நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that the previous Government had signed an agreement with the Adani Company of India for a power plant project;

(ii) whether the present Government would revise the said project;

(iii) if not, whether it would be cancelled; and

(iv) the measures that will be taken to attract international investors to the renewable energy sector?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

ශ්‍රී ලංකාව තුළ සුළං විදුලි බලය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉන්දියාවේ අදානි සමූහ ව්‍යාපාරයේ පාලිත සමාගමක් වන අදානි ග්‍රීන් එනර්ජි ලිමිටඩ් (AGEL) සහ ශ්‍රී ලංකාවේ පහත සඳහන් පාර්ශ්ව අතර 2022.03.11 දින අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.

1. මුදල් අමාත්‍යාංශය
2. විදුලිබල අමාත්‍යාංශය
3. විදුලිබල මණ්ඩලය
4. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
5. ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය

(ii) කලින් පැවැති රජය විසින් මෙම ව්‍යාපෘතිය හරහා නිපදවන විදුලිය මිලදී ගැනීමට එකඟවී තිබූ ගාස්තු සම්බන්ධයෙන් නැවත සලකා බැලීමට රජය තීරණය කරන ලදී. ඒ සඳහා ව්‍යාපෘති කමිටුවක් හා ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

(iii) අදානි සමාගම විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව ඉවත් කර ගන්නා බව අදානි ග්‍රීන් එනර්ජි ලිමිටඩ් සමාගම 2025.02.12 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත දන්වා ඇත. ව්‍යාපෘති යෝජනාව ඉල්ලා අස්කර ගෙන ඇති බැවින් අවලංගු කිරීමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

(iv) විදුලිබල මණ්ඩලය සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය එක්ව ඉදිරියේදී සැලසුම් කර ඇති මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම, පරිසර අනුමැතිය සහ අදාළ අනෙකුත් අනුමැතීන් ලබාගැනීම සහ ඉඩම් අත්කර ගැනීම වැනි මූලික වැඩකටයුතු සම්පූර්ණ කිරීම, එමඟින් විදේශීය අයෝජකයන්ට කිසිදු ගැටලුවකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට වාතාවරණය/අවස්ථාව සැලසේ.

- ජාත්‍යන්තර තරගකාරි ලංසු/ඉල්ලීම් ක්‍රමය මඟින් යෝජනා කැඳවීම මඟින් තරගකාරි තාක්ෂණික සහ මූල්‍යමය යෝජනා ඉදිරිපත් කිරීමට ඉඩ සැලසීම සහ විදේශ විනිමය පිළිබඳ අවදානම ආයෝජකයන්ට නොපැවරෙන අයුරින් මිලදී ගන්නා බලශක්තිය සඳහා ඩොලර් (Dollar-tariff) මඟින් ගෙවීම.

- තවද, විදේශීය ආයෝජකයන්ට ගෙවීම් සුරක්ෂිත කිරීම සඳහා ලෝක බැංකුව සමඟ ආරක්ෂණ වැඩ පිළිවෙළක් (Payment guarantee mechanism) ක්‍රියාත්මක කිරීමේ මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.

(ආ) අදාළ නොවේ.

## අනුරාධපුර, හෝගොඩයාගම බීජ ගොවිපළ: බදු දීම
## அநுராதபுரம், ஹோகொடயாகம விதைப் பண்ணை: குத்தகை
## HOGODAYAGAMA SEED PRODUCTION FARM, ANURADHAPURA: LEASE

980/2025

**6. ගරු තිළිණ සමරකෝන් මහතා (ගරු සුසන්ත කුමාර නවරත්න මහතා වෙනුවට)**
(மாண்புமிகு திலிண சமரக்கோன் - மாண்புமிகு சுசந்த குமார நவரத்ன சார்பாக)
(The Hon. Thilina Samarakoon on behalf of the Hon. Susantha Kumara Nawarathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) අනුරාධපුර, ගල්නෑව, හෝගොඩයාගම බීජ ගොවිපළට අයිති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම ගොවිපළ යම් පුද්ගලයෙක්/ආයතනයක් වෙත බදු පදනම මත ලබාදී තිබේද;

(v) එසේ නම්, බදු පදනම මත ලබා දුන් වර්ෂය කවරේද;

(vi) බදු පදනම මත ලබා ගත් පුද්ගලයාගේ/ආයතනයේ නම සහ ලිපිනය කවරේද;

(vii) එම පුද්ගලයා/ආයතනය නිසි පරිදි බදු මුදල් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மகாவலி அதிகாரசபைக்குச் சொந்த மான பண்ணைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவற்றின் விபரங்கள் யாவை என்பதையும்;

(iii) அநுராதபுரம், கல்னேவ, ஹோகொடயாகம விதைப் பண்ணைக்குரிய காணியின் பரப்பளவு ஏக்கரில் எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி பண்ணை நபரொருவருக்கு/நிறுவன மொன்றுக்குக் குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனின், குத்தகைக்கு வழங்கப்பட்ட ஆண்டு எது என்பதையும்;

(vi) இப்பண்ணையைக் குத்தகை அடிப்படையில் பெற்றுக்கொண்ட நபரின்/நிறுவனத்தின் பெயர் மற்றும் முகவரி பற்றிய விபரங்கள் யாவை என்பதையும்;

(vii) மேற்படி நபர்/நிறுவனத்தால் உரிய முறையில் குத்தகைப் பணம் செலுத்தப்பட்டதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු තිළිණ සමරකෝන් මහතා]

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of farms owned by the Sri Lanka Mahaweli Authority;

(ii) the names of those farms;

(iii) the extent in acres of the land owned by the Seed Production Farm of Hogodayagama, Galnewa in Anuradhapura;

(iv) whether that farm has been leased out to any individual/institute;

(v) if so, the year in which it was leased out;

(vi) the name and the address of the individual/ institute to whom/ to which the said farm has been leased out; and

(vii) whether that individual/institute has paid the lease rent properly?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොවිපළ සංඛ්‍යාව 17කි.

(ii) ඇමුණුම 01හි සඳහන් කර ඇත.

ඇමුණුම 01

2025 සැප්තැම්බර් 26 සිකුරාදා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා , කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අංක -980/2025

(අ) (i) මේ වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොවිපල සංඛ්‍යාව 17 කි.

(ii) ඒවායේ නම් හා ලිපිනයන්

| අ.අ | ගොවිපලෙහි නම සහ ලිපිනය | පිහිටි මහවැලි කලාපය | ප්‍රමුඛ කාර්ය | වපසරිය (හෙක්.) |
|---|---|---|---|---|
| 01 | අරලගංවිල බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>අරලගංවිල | බී | බීජ වී නිෂ්පාදනය | 209 |
| 02 | රත්කිඳ බීජ නිෂ්පාදන ගොවිපල<br>දියවිද්දාගම, නව මැදගම<br>දෙහිඅත්තකණ්ඩිය. | සී | බීජ වී නිෂ්පාදනය | 381 |
| 03 | බිසෝපුර සත්ව පාලන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>බිසෝපුර<br>මැදිරිගිරිය. | ඩී | පැල නිෂ්පාදනය | 12 |
| 04 | ගුරුවෙල උද්‍යාන බෝග ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>ගුරුවෙල<br>මොරගහකන්ද. | ජී | බෝග නිෂ්පාදනය | 45 |
| 05 | අත්තනකඩවල බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>අත්තනකඩවල<br>බකමූණ | ජී | බීජ වී නිෂ්පාදනය | 9 |
| 06 | නිරාවිය සත්ව පාලන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>තඹුත්තේගම | එච් | සත්ව පාලනය සහ බෝග නිෂ්පාදනය | 136<br>(මෙයින් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත තාවකාලිකව හෙක්. 60.403 ක් ලබා දී ඇත.) |
| 07 | කලංකුට්ටිය සත්ව පාලන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>කලංකුට්ටිය | එච් | සත්ව පාලනය සහ බෝග නිෂ්පාදනය | 7 |
| 08 | ගල්වලයාය උද්‍යාන බෝග ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පොල්ලෙබැද්ද | රඹකැන්ඔය | බෝග නිෂ්පාදනය සහ සත්ව පාලනය | 24 |

| අ.අ | ගොවිපලෙහි නම සහ ලිපිනය | පිහිටි මහවැලි කලාපය | ප්‍රමුඛ කාර්යය | වපසරිය (හෙක්.) |
|---|---|---|---|---|
| 09 | සම්පත්නුවර බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා0 මහවැලි අධිකාරිය<br>ඇකාවැටුනුවැව<br>සම්පත්නුවර | එල් | බීජ නිෂ්පාදනය සහ බෝග නිෂ්පාදනය | 9 |
| 10 | සම්පත්නුවර සත්ව පාලන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>ඇකාවැටුනුවැව<br>සම්පත්නුවර | | සත්ව පාලනය | 4 |
| 11 | කන්දකැටිය මහ බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>කැන්දකැටිය<br>රත්මල්වල | වලව | බීජ නිෂ්පාදනය සහ පලතුරු බෝග නිෂ්පාදනය | 21 |
| 12 | සූරියවැව බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>සංවර්ධන මධ්‍යස්ථානය<br>සූරියවැව | | බීජ වී නිෂ්පාදනය | 3 |
| 13 | මහගම සත්ව පාලන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>සෙවනගල | | සත්ව පාලනය සහ පලතුරු බෝග නිෂ්පාදනය | 32 |
| 14 | ගුරුගොඩැල්ල බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>ගුරුගොඩැල්ල, උස්වැව<br>තංගල්ල | | බීජ වී නිෂ්පාදනය | 13 |
| 15 | කට්ටකඩුව බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>අගුණකොලපැලැස්ස | | බීජ වී නිෂ්පාදනය සහ පලතුරු බෝග නිෂ්පාදනය | 7 |
| 16 | මුරවැසිහේන උද්‍යාන බෝග ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>මුරවැසිහේන<br>බරවකුඹුර | | පලතුරු බෝග නිෂ්පාදනය | 20 |
| 17 | කච්චිගල්ආර බීජ නිෂ්පාදන ගොවිපල<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br>බින්කම<br>අගුණකොලපැලැස්ස | | බීජ වී නිෂ්පාදනය සහ පලතුරු බෝග නිෂ්පාදනය | 16 |

(iii) අක්කර 47 පමණ (හෙක්ටෙයාර 18.83 පමණ)

(iv) ඔව්.

(v) 2001 වර්ෂයේදී

(vi) ප්‍රාදේශීය ලේකම් ගල්නෑව මගින් උතුරු මැද පළාත් සභාව හරහා, රජරට ජන සහන පදනම වෙත

ලිපිනය - සැනසුම, අංක 630, ගුවන් තොටුපළ පාර, අනුරාධපුරය

(vii) නැත.

(ආ) මෙම ඉඩම් ගල්නෑව ප්‍රාදේශීය ලේකම් වෙත විධිමත් පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් භාර දී ඇති අතර, ප්‍රාදේශීය ලේකම්, ගල්නෑව විසින් උතුරුමැද පළාත් සභාව වෙත භාර දී ඇත. උතුරුමැද පළාත් සභාව විසින් රජරට ජන සහන පදනම වෙත භාර දී ඇත. ඒ අනුව මහවැලි අධිකාරිය සතුව බදු ගෙවීම් සම්බන්ධ ලේඛන නොමැත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### සීනි කර්මාන්තයේ තිරසරභාවය
### சீனிக் கைத்தொழிலின் நிலைத்தன்மை
### SUSTAINABILITY OF SUGAR INDUSTRY

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා නැඟී සිටින්නේ, ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයේ අනාගතය පිළිබඳව කථා කරන්නයි. මේක සෘජුවම සම්බන්ධ වන්නේ අපේ ආහාර ආරක්ෂාවට, විදේශ විනිමය ආරක්ෂාවට සහ ගොවීන්ගේ ජීවිතාධාරය සම්බන්ධයෙන්.

2025 සැප්තැම්බර් 13 වන දින ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමයේ 35 වන වාර්ෂික සම්මේලනයේදී ගරු කර්මාන්ත ඇමතිතුමා ප්‍රකාශ කළේ "රජයේ ප්‍රධාන කාර්යය වන්නේ ව්‍යාපාර සක්‍රිය වීමට සුදානම් පරිසරයක් නිර්මාණය කිරීමයි. සෘජුව ව්‍යාපාර කළමනාකරණය කිරීම නොවේ" යනුවෙනි. Sir, "Daily FT" of 15th September, 2025 also reported, I quote:

[ගරු රවී කරුණානායක මහතා]

" Govt. to step back from running businesses, focus on facilitation"

I congratulate the Hon. Minister for saying so. මුලින්ම මම ගරු අමාත්‍යතුමාට ප්‍රශංසා කරනවා.

ලොව පුරා දීර්ඝ කාලයක සිට පිළිගත් සත්‍යයක් වන රජයන්ට ව්‍යාපාර සාර්ථකව කළමනාකරණය කළ නොහැකි බව හා ඔවුන්ගේ නිසි භූමිකාව වන්නේ ප්‍රතිපත්ති තීරණ ගැනීම, සාධාරණ පාලනය සහ පෞද්ගලික ව්‍යාපාර ඉදිරියට යාමට සුදුසු පරිසරයක් සැලසීමයි යන කාරණය. එය ඔබ විසින් දැන් පිළිගෙන තිබෙනවා. එය ප්‍රශංසනීයයි.

ඒ වාගේම තමයි එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1977දී විවෘත ආර්ථිකය ගේනකොටත් පදනම් කර තිබුණේ මේකමයි.

කෙසේ වෙතත්, මේ අදහස ගරු අමාත්‍යතුමා විසින් මාස නවයකට පෙර දැක්වූ මතයට සම්පූර්ණ විරුද්ධයි. එවිට එතුමා පාර්ලිමේන්තුව අමතමින් ප්‍රකාශ කළේ, ශ්‍රී ලංකාවට ස්වයංපූර්ණ සීනි නිෂ්පාදනයක් පමණක් නොව, ආසියානු වෙළඳපොළටත් අපනයනය කිරීමේ හැකියාවක් ඇති බවයි. අද එම ආශාව අතහැර දැමුණු අතර, මෙය ගොවීන්, කම්කරුවන් සහ ආයෝජකයන් අතර විශ්වාසය කඩා වැටීමට හේතු වී ඇත.

2024දී අපේ සීනි අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 664,000ක් වූ අතර, නිෂ්පාදනය වූයේ මෙට්‍රික්ටොන් 81,000ක් පමණයි. එය ජාතික අවශ්‍යතාවෙන් සියයට 12ක් පමණි. ඉතිරි මෙට්‍රික්ටොන් 583,000 ආනයනය කළ අතර, වාර්ෂිකව සම්භාව්‍ය මිලකින් ඇමෙරිකානු ඩොලර් මිලියන 290-300 අතර වියදමක් විය. මෙසේ විදේශ විකුණුම්කරුවන්ට වාසි ලැබෙන අතර, අපේ උක් ගොවීන් පීඩා විඳින්නේ පසුගිය ගෙවීම, අඩු මිල, ඉහළ ආදායම් වියදම් සහ නවීකරණ සඳහා ආධාර නොමැති තත්ත්වයෙනි. මේ අතරේම බදු සහ ආදායම් ප්‍රතිපත්ති දේශීය නිෂ්පාදනය පරාජය කරමින් ආනයනයට වාසි සැලසීම නිසා ස්වයංපූර්ණතාව දුර්වල කර ඇත.

ගරු කථානායකතුමනි, ඒ අනුව මම ගරු ඇමතිතුමාගෙන් අසන ප්‍රශ්න වන්නේ,

1. රජයන්ට ව්‍යාපාර සාර්ථකව කළමනාකරණය කළ නොහැකි බවත්, ඔවුන්ගේ භූමිකාව policy තීරණ ගැනීම පමණක් බවත් ඔබ දැන් ප්‍රකාශ කර ඇත. මෙය ඔබගේ පෞද්ගලික මතය පමණක්ද, නැතිනම් NPP ආණ්ඩුවේ නිල හා ඒකාග්‍ර මතයද?

   මම ඇමතිතුමාව අගය කරනවා, මේක කිව්වාට.

2. මාස නවයකට පෙර, ශ්‍රී ලංකාවේ සීනි, අවශ්‍යතාවට පමණක් නොව ආසියාවටම අපනයනය කිරීමට හැකි බව ඔබතුමා ප්‍රකාශ කළේය. එම ප්‍රකාශයට මූලික වූ දත්ත, ආර්ථික ගණනය කිරීම් හෝ හැකියාවන් මොනවාද? ඒවා මේ සභාවට ඉදිරිපත් කළ හැකිද?

   අද, ඇමෙරිකානු ඩොලර් මිලියන 500කට ආනයනය කරන්න පුළුවන් හැකියාව තිබුණත්, මේ මොහොතේ දුඹුරු සීනි නිෂ්පාදනය කරන්න - පැල්වත්ත, හිඟුරාන කර්මාන්තශාලාවලට - ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් විතර වියදම් වෙනවා.

3. අද, ඔබේ මතය සම්පූර්ණයෙන් වෙනස් වී ඇත. මෙය සිදු වීමට හේතු වූ නව සාධක මොනවාද සහ මෙවන් ප්‍රතිපත්ති වෙනස්කම් විශ්වාසය හා ආයෝජන අවශ්‍යතාව අඩු කරන බව ඔබ පිළිගනිත්ද?

4. 2024 දී නිෂ්පාදනය වූ සීනි ප්‍රමාණය මෙට්‍රික්ටොන් 81,000ක් පමණක් වූ අතර, අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 664,000ක් විය. ඉතිරි මෙට්‍රික්ටොන් 583,000 ආනයනය කරමින්, වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක වියදමක් සිදු වී ඇත. මෙය, අපනයනය සම්බන්ධයෙන් ඔබ කලින් කළ ප්‍රකාශ අසත්‍ය බවට සාක්ෂියක් නොවේද? එසේ නම්, ගරු ඇමතිතුමනි, ඉදිරියේදී යථාර්ථමය නිෂ්පාදන ඉලක්ක ඔබට දැක්විය හැකිද?

5. රජය තවදුරටත් සීනි කර්මාන්තශාලා පාලනය නොකරන්නේ නම් ඒවා පිළිබඳව ගෙන ඇති පියවර මොනවාද? පෞද්ගලිකකරණයද, ප්‍රජා පෞද්ගලික හවුල් ව්‍යාපාරද, නැතිනම් වසා දැමීමද? එය විවෘත හා පක්ෂපාතී නොවන ක්‍රමයකින් සිදු කරන බවට සහතික කිරීමක් ලබා දෙනවාද?

6. උක් ගොවීන් පසුගිය ගෙවීම්, අඩු මිල සහ ඉහළ වියදම් නිසා අසරණ තත්ත්වයට පත් වෙති. ඔවුන්ට සාධාරණ මිලක් සහ කාලෝචිත ගෙවීම් සහතික කිරීමට රජයට පිළිගත් නියමිත යන්ත්‍රණයක් තිබෙනවාද?

7. දේශීය නිෂ්පාදනයට බරපතළ බාධා සලසමින්, ආනයනයට වාසි ලබා දෙන බදු සහ ආදායම් ප්‍රතිපත්ති වෙනස් කිරීමට රජය සැලසුම් කර තිබේද? එසේ නම්, එම සංශෝධන මොනවාද?

8. සීනි යනු කර්මාන්තමය කරුණක් පමණක් නොව, ජාතික ආහාර ආරක්ෂාව සහ පාරිභෝගික මිල ප්‍රතිරෝධය සම්බන්ධ කරුණකි. දේශීය අවශ්‍යතාවයේ සියයට 85කට වැඩි ප්‍රමාණයක් ආනයනය මත රඳා පවතිමින් පොහොසත් වන තත්ත්වයකදී, ගොවීන්ට සාධාරණ ආදායමක් සහ පාරිභෝගිකයන්ට ගත හැකි මිලක් අතර සමතුලිතතාව රජය රඳවා ගන්නේ කෙසේද?

9. අද වන විට ආනයනික සීනි කිලෝග්‍රෑමයක් මත අය කරන සියලු බදු සහ දේශීයව නිෂ්පාදිත සීනි කිලෝග්‍රෑමයක් මත අය කරන සම්පූර්ණ බදු ප්‍රමාණය පැහැදිලි කරනවාද?

10. අවසානයේ, ගරු අමාත්‍යතුමා සීනි කර්මාන්තය පිළිබඳ මුද්‍රිත වාර්තාවක් - white paper එකක් - ඉදිරිපත් කරන බවට සහතික දෙනවාද? ඒ තුළ නිෂ්පාදන ඉලක්ක, ආනයන අවශ්‍යතා, ස්වයංපූර්ණතා ඉලක්ක, පෞද්ගලික ආයෝජන භූමිකාව, බදු සංශෝධන සහ NPP ආණ්ඩුවේ නිල මතය පැහැදිලිව සඳහන් විය යුතුය.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්න ඊයේ හවස් වරුවේ තමයි අපට ලැබුණේ. එහි දීර්ඝ ප්‍රශ්න 10ක් තිබෙනවා. එම නිසා එම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, ප්‍රතිපත්තිමය කාරණා සහ තොරතුරු විශාල ප්‍රමාණයක් ඔබතුමා ඉල්ලා තිබෙන නිසා අපි සතියකින් උත්තර ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ගරු කථානායකතුමනි. මේ සම්බන්ධයෙන් කාලය ගත කිරීම නොවෙයි අපට අවශ්‍ය වෙන්නේ. සීනි කර්මාන්තය සම්බන්ධයෙන් ගොවීන්ට තිබෙන ප්‍රශ්නය විසඳලා, අපේ පාරිභෝගිකයාටත් සාධාරණ මිලක් ලබා දිය යුතුයි. මම කිව්වා වාගේ ඇමෙරිකානු ඩොලර් 490කට ආනයනය කරන්න පුළුවන් අවස්ථාවක් තිබෙන කොට ඇමෙරිකානු ඩොලර් මිලියන 575ක් විතර යනවා මේ නිෂ්පාදනයට. ඒකත් එක්ක VAT එකත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගොවීන් ප්‍රමාණයක් ඉන්න නිසා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ සමස්ත ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සතියක කාලයක් ලබා ගත්තා නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔව්. ඒකට මේ කොටසත් එකතු කළා නම් අංග සම්පූර්ණ උත්තරයක් ලැබෙයි කියා මා හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

## II

## පලාලි ගුවන් තොටුපළ සහ කන්කසන්තුරේ වරාය සංවර්ධනය කිරීම

### பலாலி விமான நிலையம் மற்றும் காங்கேசன்துறை துறைமுகத்தின் அபிவிருத்தி

### DEVELOPMENT OF PALALY AIRPORT AND KANKESANTHURAI PORT

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த வாரம் யாழ்ப்பாணத்தில் தங்களுடைய தலைமையில் நடந்த சிறப்பு ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில், யாழ். மக்களுக்கு மிகவும் அடிப்படையான உட்கட்டமைப்பு வசதிகள் தொடர்பாகத் தாங்கள் மிகுந்த சிரத்தையுடன் செயற்பட்டதை நினைத்துப் பெருமகிழ்ச்சி அடைகின்றேன். அந்தக் கூட்டத்தில் கலந்துரையாடப்பட்ட விடயங்களில் இரண்டு முக்கியமான விடயங்கள் பொதுமக்களின் நலன் கருதிப் பாராளுமன்றத்தில் விவாதிக்கப்பட வேண்டிய விடயங்களாக இருக்கின்றன. முதலாவது, பலாலி விமான நிலையம் சம்பந்தமானது. அதாவது, சர்வதேச விமான நிலையம் என்று தாங்கள் சொல்லிக்கொள்ளும் ஓர் இடம்! இரண்டாவது, காங்கேசன்துறை இறங்குதுறை சம்பந்தமானது. அதை துறைமுகம் என்றும் பொருள் கொள்ளலாம்.

வடக்கு மாகாணத்தின் அபிவிருத்தியில் எந்தவொரு நபருக்கும் இல்லாத அக்கறையை இந்த அரசாங்கம் செலுத்துவதைக் கண்டு பூரிப்படைந்தேன். தங்கள் அரசாங்கத்தின் அர்ப்பணிப்புகளை நினைத்துப் பூரிப்படையும் பாமர மக்களில் நானும் ஒருவன். ஆனால், வெறும் வாய்ப்பேச்சுகளால் ஒரு வருடத்தைக் கடந்துவிட்ட இந்த அரசாங்கத்திடமிருந்து நிலையான அபிவிருத்தியை வடக்கு மாகாணத்துக்குப் பெற்றுக்கொடுக்க வேண்டும் என்ற அடிப்படையில், எதிர்க்கட்சியிலிருந்து மிகவும் கரிசனையுடன் சில விடயங்களைத் தங்களிடம் கேட்கவேண்டி இருக்கின்றது. தாங்கள் கீழ்வரும் கேள்விகளுக்குப் பொருத்தமான பதில்களைத் தருவீர்கள் என்ற நம்பிக்கை, வடக்கு மாகாணத்தில் வாழ்கின்ற, தங்களுக்கு வாக்களித்த மக்களுக்கு இப்போதும் இருக்கிறது.

1. வடக்கு மாகாணத்தில் இருக்கின்ற பலாலி உள்நாட்டு, வெளிநாட்டு விமான நிலையத்தின் அபிவிருத்திக்காக தங்களுடைய அரசாங்கத்தால் 2025ஆம் ஆண்டு ஒதுக்கப்பட்ட மொத்தப் பணம் எவ்வளவு? அதில் 2025ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 21ஆம் திகதி வரை செலவழிக்கப்பட்ட பணம் எவ்வளவு? அதற்குரிய ஆதாரங்களைப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடியுமா?

2. வடக்கின் ஒரேயொரு பொருளாதாரத் துறைமுகமாக இருக்கும் காங்கேசன்துறை இறங்குதுறையின் -அது துறைமுகமாக மாற்றப்படவில்லை - அபிவிருத்திக்காக தங்களுடைய அரசாங்கத்தின் 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்ட பணம் எவ்வளவு? அதில் 2025ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 21ஆம் திகதி வரை செலவழிக்கப்பட்ட பணம் எவ்வளவு? அதனை ஆதாரங்களுடன் இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடியுமா?

3. 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் வடக்கு மாகாணத்திலுள்ள சிறு சிறு துறைமுகங்கள் மற்றும் இறங்குதுறைகளுக்காக ஒதுக்கப்பட்ட பணம் எவ்வளவு? அவற்றில் செலவழிக்கப்பட்ட பணம் எவ்வளவு? ஆதாரத்துடன் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடியுமா?

4. கடந்த ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் 'ஊழல்வாதி' என்று ஆளுநரால் தங்களுடைய Cabinet அமைச்சருக்கு எழுத்துமூலம் அறிவிக்கப்பட்ட, அரசாங்க அதிபர் பதவியிலிருந்து விலக்குமாறு அறிவுறுத்தப்பட்ட, அரசாங்க அதிபர் ம. பிரதீபன் அவர்கள் வலிகாமம் வடக்கில் மீள்குடியேற்றம் தொடர்பாகவும் இராணுவத்தால் அபகரிக்கப்பட்ட மக்களின் காணி தொடர்பாகவும் கருத்துகளைத் தெரிவித்திருந்ததைப் பொதுமக்கள் அவதானித்து இருக்கிறார்கள். அந்தக் கருத்துகளுக்கு அமைய, பலாலி விமான நிலையத்தின் தற்போதைய நில அளவு எவ்வளவு? பலாலி விமான நிலையத்தில் சட்டரீதியாக அரசாங்கம் கொண்டிருக்கும் நிலத்தின் அளவு

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

எவ்வளவு? அந்த விமான நிலையத்தில் சட்டரீதியாக அல்லாமல் கையகப்படுத்தப்பட்டு இருக்கும் பொது மக்களுடைய காணிகளின் அளவு எவ்வளவு? கையகப்படுத்தப்பட்டுள்ள பொது மக்களின் காணிகளில் இதுவரை எத்தனை உரிமையாளர்களுக்கு - குடும்பங்களுக்கு - compensation வழங்கப் பட்டுள்ளது? அது எப்போது வழங்கப்பட்டது? யாரால் வழங்கப்பட்டது? அதன் மொத்தப் பெறுமதி எவ்வளவு?

5. பலாலி விமான நிலைய விஸ்தரிப்புக்காக கையகப்படுத்தப்பட்ட தனியார் காணிகளில் இதுவரை தங்களுடைய அரசாங்கம் விடுவித்திருக்கும் நிலப்பரப்பு எவ்வளவு? உரிமையாளர்களால் உரிமை கோரப்படாத, விடுவிக்கப்பட்ட தனியார் காணிகளின் அளவு எவ்வளவு? எத்தனை குடும்பங்களின் காணிகள் விடுவிக்கப்பட்டன?

6. இலங்கையின் வடக்கு, கிழக்கு தவிர்ந்த வேறு எந்தப் பகுதியிலாவது தனியார் காணிகள் விமான நிலைய அல்லது துறைமுக அபிவிருத்திக்காக உள்வாங்கப்பட்டு, இதுவரை பணம் செலுத்தப்படாமல் இருக்கிறதா? அவ்வாறாயின், அவற்றின் விபரங்களை ஆதாரத்துடன் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடியுமா?

7. காங்கேசன்துறை துறைமுகத்தை அபிவிருத்தி செய்து சர்வதேச துறைமுகமாக மாற்ற முடியாதென்ற தங்களுடைய முடிவை அவதானித்த பின்னர், அவ்வாறானதொரு முடிவுக்குத் தாங்கள் வந்ததற்கான காரணத்தை விளக்க முடியுமா? அவ்வாறாயின், அம்பாந்தோட்டை மற்றும் மத்தள ஆகிய விமான நிலையங்களை அபிவிருத்தி செய்ய செலவிடப்பட்ட பணம் வீண்விரயம் செய்யப்பட்டுள்ளதென நீங்கள் கருதினால், பலாலி விமான நிலையத்தால் பயனடையப்போகும் சர்வதேச பயணிகளின் வருடாந்த வரவையும் அதனால் ஏற்படப்போகும் இலாபத்தையும் அனுமானமாகச் சொல்ல முடியுமா?

8. பலாலி விமான நிலையம் அபிவிருத்தி செய்யப்பட்டால் மத்தள விமான நிலையம் போன்று அதுவும் சர்வதேச விமானங்களின் வரவுகளற்ற ஒரு விமான நிலையமாக மாற்றமடையும் என்ற கருத்து பொது மக்களிடையே இருப்பதால், விமான நிலைய அபிவிருத்தி தவிர்ந்த வேறேதேனும் காரணங்களுக்காக 'விமான நிலைய அபிவிருத்தி' என்ற போர்வையில், அம்மக்களின் காணிகள் இராணுவ மற்றும் அரசியல் நோக்கங்களுக்காக நட்டஈடு கொடுக்கப்படாமல் இராணுவ ஆக்கிரமிப்பால் அபகரிக்கப்படுகிறது என்ற கூற்றை ஏற்றுக் கொள்கிறீர்களா? இன்றேல் ஏன்?

9. விமான நிலையம் மாத்திரம் அபிவிருத்தி செய்யப்படுவதற்கும் காங்கேசன்துறை துறைமுகம் அபிவிருத்தி செய்யப்படாமைக்குமான காரணம் யாது?

பொறுப்புமிக்க அமைச்சர் என்ற அடிப்படையில், நீங்கள் இவற்றுக்கான பதில்களை வெகுவிரைவில் வழங்குவீர்கள் என்ற நம்பிக்கையில் விடைபெறுவது, தமிழ் மக்களின் ஒரேயோர் உண்மையான பிரதிநிதி வைத்தியர் இராமநாதன் அர்ச்சுனா!

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1.

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදන ප්‍රමාණය (රුපියල් මිලියන) |
|---|---|
| ප්‍රාග්ධන වත්කම් | 157 |
| ප්‍රාග්ධන ව්‍යාපෘති | 494 |
| මුළු ප්‍රතිපාදන ප්‍රමාණය | 651 |

2025 වර්ෂයේ සැප්තැම්බර් 21වන දින දක්වා වියදම් කරන ලද මුදල - රුපියල් මිලියන 150

2.
- 2025 වර්ෂයට වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන - රුපියල් මිලියන 3,455
- 2025.09.21 දිනට අය වැය මඟින් ගෙවීම් සිදු කර නොමැත.

ඉල්ලුම් කළ අය වැය ප්‍රතිපාදන වියදම් නොවීමට හේතු පහත පරිදි වේ.

2025 වර්ෂය සඳහා අය වැය ප්‍රතිපාදන ඉල්ලුම් කරනු ලබන්නේ එම වර්ෂයට පෙර වර්ෂයේදීය. ඒ, 2024 වර්ෂයේ අපේ ආණ්ඩුව පැමිණීමට පෙරයි, ගරු කථානායකතුමනි. ඒ වන විට පහත ඉදිරිපත් කර ඇති කරුණු නිසා කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය නතර වී තිබූ අතර, එවකට සාකච්ඡා මට්ටමේ පැවැති, ඉන්දියානු රජය විසින් යෝජනා කරන ලද මූල්‍ය ප්‍රදානය මඟින් මෙම ව්‍යාපෘතියේ කටයුතු නැවත පටන් ගෙන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා 2025 වසරේ අත්තිකාරම් ගෙවීම - advance payment - සිදු කිරීමට හා උපදේශන සේවා කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීමට ඇති සන්ධිස්ථාන ගෙවීමට - milestone payment එකට - අදාළව රුපියල් මිලියන 3,455ක මුදලක් වෙන් කර ගැනීමට ඉල්ලීම් සිදු කරන ලදී. නමුත්, එසේ අප උපකල්පනය කළ පරිදි මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොවූ අතර, වෙන් කරන ලද ප්‍රතිපාදන ද වියදම් වීමක් සිදු නොවුණි.

**කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමට නොහැකි වී ඇති කරුණු:**

කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ඉදිකිරීමේ වගකීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පැවරීම 2017.05.02 දින පැවැති කැබිනට් රැස්වීමේදී තීරණය විය. ඒ අනුව අදාළ මූලික කටයුතු ඉන්දියාවේ Exim Bank එක හරහා සිදු කළ අතර 2020 ඔක්තෝබර් මස උපදේශන සේවා කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කටයුතු ආරම්භ විය. මෙම ව්‍යාපෘතිය සඳහා සැලසුම් සකස් කිරීම උපදේශන සමාගමේ සහභාගිත්වය ඇතිව සිදු කළ අතර, සැලසුම් කළ පරිදිම අදාළ කටයුතු සිදු කෙරිණි. නමුත්, හදිසියේ ඇති වූ

කොවිඩ් වසංගතය නිසා සහ වරාය පිහිටි ප්‍රදේශයේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය නිසා එම සැලැස්මට යම් යම් බාධා ඇති වුවද, මේ වන විට උපදේශන කොන්ත්‍රාත්තුව යටතේ ව්‍යාපෘති ඉදිකිරීම් ආරම්භයට පෙර සිදු කළ යුතු උපරිම වැඩ කටයුතු අවසන් කර ඇත.

2016දී ඇස්තමේන්තුගත මුදල 2021 වසරේදී සමාලෝචනයෙන් පසු ඇමෙරිකානු ඩොලර් මිලියන 45.27 සිට ඇමෙරිකානු ඩොලර් මිලියන 61.5 දක්වා ඉහළ යන ලදී. මේ සඳහා බලපාන ලද හේතු පහත පරිදි වේ.

- මෙම ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුමට අනුව සියයට 75ක භාණ්ඩ හා සේවා ඉන්දියාවෙන් ආනයනය කළ යුතු අතර, එම වියදම 2012 වර්ෂයේදී කරන ලද ඇස්තමේන්තුවට අතිරේකව ගෙවීමට වන වියදමක් බැවින්, සමාලෝචිත ඇස්තමේන්තුවට එම පිරිවැය එකතු කිරීමට සිදු වීම.
- උපදේශන සේවා කොන්ත්‍රාත්තුව යටතේ සිදු කළ 3D ආකෘතිය - 3D model එක - සලකා බැලීමේදී උපකල්පිත බැවුම් අගය, කැණීම් කටයුතුවල ප්‍රමාණය හා සැලසුම්වල කිරීමට සිදු වූ වෙනස්කම්වලට අදාළව පිරිවැය වැඩි වීම.

ඒ අනුව කැබිනට් මණ්ඩලයෙන් නිර්දේශ කළ පරිදි එම මුදල පියවීමට ණය මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 61.5 දක්වා ඇමෙරිකානු ඩොලර් මිලියන 16.23කින් ඉහළ දැමීමට ඉන්දියානු එක්සිම් බැංකුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ නමුත්, මේ වන තුරු ප්‍රතිචාර ලැබී නොමැත.

තවද, ඔවුන් වෙත ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ පෙර සුදුසුකම් පරීක්ෂා කිරීමේ ලේඛනයට අනුමැතිය සඳහා 2022 ජනවාරි මස ඉදිරිපත් කළ නමුත්, මේ සඳහාද එක්සිම් බැංකුව මඟින් අනුමැතිය මේ වන තුරු ලබා දී නොමැති අතර, සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සඳහා පමණක් 2022 නොවැම්බර් මස 07 වන දින අනුමැතිය ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතියේ කටයුතු නැවත පටන් ගැනීමට ඉන්දියානු රජය විසින් මූල්‍යමය ප්‍රදානයක් ලබා දීමට යෝජනා වූ අතර, මේ පිළිබඳවද තවම අවසන් තීරණයක් දන්වා නොමැත.

ඉහත කී අනුමැතිය නොමැතිව මෙම ව්‍යාපෘති ඉදිරියට ගෙනයෑම අපහසු වී ඇති අතර, අනුමැතියක් නොලැබීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ හැකි දිනයක් නිශ්චිතව සඳහන් කළ නොහැකි වී ඇත.

3. ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරත් මම කලින් ලබා දුන් පිළිතුරේම තිබෙනවා.

4. 1950දී සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව විසින් සැලසුම් අංක PPA 1597 යටතේ නීත්‍යානුකූලව අක්කර 349යි, රූඩ් 03යි, පර්චස් 35.9ක් අත් පත් කරගෙන ඇත. ඒ සඳහා වන්දි ගෙවා ඇත. එම ගෙවීම්වලට අදාළ තොරතුරු යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව ඇත. අනෙකුත් අත් පත් කර ගැනීම් සිදු කරමින් සිටින්නේ සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව හෝ එහි අනුප්‍රාප්තිකයා වන සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් නොවේ. එම නිසා ඒ පිළිබඳ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසීම සුදුසුය.

5. පලාලි ගුවන් තොටුපළ පුළුල් කිරීම නමින් ඉඩම් අත් පත් කර ගැනීම දැනට සිදු කරමින් පවතින්නේ ආරක්ෂක අමාත්‍යාංශය විසිනි. ඒ පිළිබඳ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසීම සුදුසුය.

6. උතුරු, නැඟෙනහිර හැර වෙනත් කොතැනක හෝ පෞද්ගලික ඉඩම් අත් පත් කර ගැනීමක් වාර්තා වී නොමැත.

7. ජාත්‍යන්තර මට්ටමේ වරායක් වීමට එය ජාත්‍යන්තර නාවික ප්‍රජාවගේ අරමුණු සඳහා සේවය කළ යුතු අතර, කලාපයේ අනෙකුත් රටවල් අතර මෙන්ම, අනෙකුත් කලාපවල ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ විය යුතු වේ. කන්කසන්තුරේ වරාය යනු, ප්‍රධාන වශයෙන් උතුරු ප්‍රදේශයට සීමා වූ අභ්‍යන්තර ප්‍රදේශයකට සේවා සැපයිය හැකි කලාපීය වරායයක් වන අතර, මූලික වශයෙන් එය ජාත්‍යන්තර මට්ටමේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් යැයි දැනට සැලකිය නොහැක. ඒ අනුව එය ශ්‍රී ලංකාව වැනි රටකට මූල්‍යමය වශයෙන් ශක්‍ය නොවිය හැකිය.

පලාලි ගුවන් තොටුපොළ මේ වනවිට ලාභ උපයන බැවින් කන්කසන්තුරේ වරාය තත්ත්වය සමඟ සියයට 100ක් පලාලි ගුවන් තොටුපොළේ තත්ත්වය සමාන නොවේ. පලාලි ගුවන් තොටුපොළ සම්බන්ධ තත්ත්වය පහත පරිදි දැක්විය හැකියි.

| වර්ෂය | ශුද්ධ ලාභය (රු.මිලියන) |
|---|---|
| 2022 | -82 |
| 2023 | 15 |
| 2024 | 76 |
| 2025 අගෝස්තු දක්වා | 85 |

කන්කසන්තුරේ වරායේ පිටත ගැඹුර මීටර් 10ත්, 12ත් අතර පවතින බැවින් එම ගැඹුර වැඩි කිරීමට ඉතා අධික පිරිවැයක් දැරීමට සිදු වේ. මෙම වරායේ අනාගත ඉල්ලුම හා අපේක්ෂිත මෙහෙයුම් ප්‍රමාණය සසඳා බැලීමේදී කන්කසන්තුරේ වරාය ජාත්‍යන්තර වාණිජ වරායක් බවට පත් කිරීම ආර්ථික වශයෙන් දැනට පවතින තත්ත්වය අනුව ඵලදායී නොවන බව නිරීක්ෂණය වේ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව තිබෙන කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, කන්කසන්තුරේ, ඔලුවිල් කියන වරායන් 5න් ලාභ උපයන්නේ කොළඹ වරායත්, යම් මට්ටමකින් ත්‍රිකුණාමලය වරායත් පමණයි. අනෙක් සියලු වරායන් පාඩුයි. ඔලුවිල් වරාය ගත්තොත්, එතැන වරායක තත්ත්වයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එය සිදු කිරීමටත් තාක්ෂණික වශයෙන් නොහැකි බව තමයි පෙනී ගොස් තිබෙන්නේ. ගාලු වරායත් එහෙමයි. එයත් ඉතා දුර්වල මට්ටමකට පත් වී තිබෙනවා. කන්කසන්තුරේ වරාය තුළ operations කරනවා. ඒ කියන්නේ මඟී ප්‍රවාහනය කරනවා, යම් කාලයකට. මට කියන්න ඕකෑකම තිබෙන්නේ මේකයි. දැනටත් කොළඹ වරායෙන් උපයන ධනයෙන් තමයි ගාලු වරායේත්, ඔලුවිල් වරායේත්, කන්කසන්තුරේ වරායේත් සියලු දේවල් නඩත්තු කරන්නේ. අපේ අමාත්‍යාංශය ගත්තොත් ඒ යටතේ වරායවල් තුනක් විතර තිබෙනවා. කන්කසන්තුරේ වරාය ගත්තොත්, ඒක historical වරායක්. ඒකේ යම්කිසි වැදගත්කමක් තිබෙනවා, එක සීමාවකින්. නමුත් ඔලුවිල් සහ ගාල්ල ගත්තොත්, එම වරායවල ආදායම අඩු නිසා ඒවා වැය බරක් වී තිබෙනවා.

එහෙම තමයි ගුවන් තොටුපොළ සම්බන්ධව තිබෙන තත්ත්වයත්. අපේ අමාත්‍යාංශයට මත්තලත් තිබෙනවා, ඔලුවිල් වරායත් තිබෙනවා. ගුවන් තොටුපොළක් වශයෙන් ගත්තොත් මත්තල අතිවිශාල පාඩුවකින් යන්නේ. වරාය කියන්නේ ව්‍යාපාර, බිස්නස්. ඒවා පිළිබඳව ප්‍රාදේශීය වශයෙන් හැඟීමක් තිබෙන්න පුළුවන්. නමුත් ඒවාට රාජ්‍ය මුදල් වැය වෙනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

අපි උතුරු පළාතට අතිවිශාල මුදලක් වෙන් කර තිබෙනවා, සංවර්ධන කටයුතු වෙනුවෙන්. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේදී කන්කසන්තුරේ වරාය පිළිබඳව විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් කර තිබුණා. එහිදී පැහැදිලිව සඳහන් කරලා තිබුණා, "මේක ව්‍යාපාරික වශයෙන් සාර්ථක වීමට ඉඩකඩ ඇත්තේ අවම වශයෙනි" කියලා. ඔබතුමා හිතන්න, මත්තල ගුවන් තොටුපොළ කවුරු හරි අපට නොමිලේ හදලා දුන්නත් ඒක නඩත්තු කරන්නත් වියදමක් දරන්න ඕනෑ. අපි දැන් ඒක තමයි කරමින් ඉන්නේ. අපි බලාපොරොත්තු වන දේ මෙයයි. දැන් season එක එන නිසා කන්කසන්තුරේ වරාය ආශ්‍රිතව facilities වැඩි කරගෙන යනවා. අපි කන්කසන්තුරේ වරාය දක්වා rail track එක දික් කරනවා. අපි එතැන යම් ප්‍රතිසංස්කරණ ප්‍රමාණයක් කරනවා. නමුත් අතිවිශාල ධනයක් එතැනට යොමු කිරීම ව්‍යාපාරික වශයෙන් සාර්ථක නැහැ කියන එක තමයි විද්වතුන් කියන්නේ. දේශපාලන තීරණ මත වරායවල් හදන්න බැහැ කියන අදහසේ තමයි මම ඉන්නේ.

8. පලාලි ගුවන් තොටුපොළ සාපේක්ෂව ලාභ උපයමින් තිබෙන නිසා, පලාලි ගුවන් තොටුපොළ සීමිත ආකාරයකට සංවර්ධනය කරන්න පටන් අරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, පලාලි ගුවන් තොටුපොළට වසරකට එන්නේ මගීන් 38,000යි. මාසයකට 2,000ක්, 2,500ක්, 3,000ක් විතර. අපි බලාපොරොත්තු වෙන්නේ, එහි ක්‍රමානුකූලව වර්ධනයට සාපේක්ෂව දියුණු කරන්නයි. ඒකට වියදම් කරන්නේත් කටුනායක ගුවන් තොටුපොළින් ලැබෙන ආදායම. උතුරු පළාත සම්බන්ධව ගත්තොත් අපි මොනවාද කරන්න කියන එක ගැන කිසිම සැකයක් තියා ගන්න දෙයක් නැහැ. මේ 4වැනි දා Long Islandවලට, නයිනතිව්වලට යන්න අවශ්‍ය කුරිකට්ටුවාන් ජැටියට 1.2 billion වියදම් කරලා අපි ඒ ජැටිය සම්පූර්ණයෙන්ම renovate කරනවා. ඒ නිසා එහෙම ප්‍රශ්නයක් නැහැ. ව්‍යාපාරික වශයෙන් කළ යුතු දේවල් ව්‍යාපාරික වශයෙන් කළ යුතුයි කියන එක තමයි කියන්න තිබෙන්නේ.

9. මෙහිදී ඉඩම් පිළිබඳ ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයක් තිබෙනවා. ගුවන් තොටුපොළ පමණක් සංවර්ධනය කිරීම සහ කන්කසන්තුරේ වරාය සංවර්ධනය නොකිරීම හමුදා සහ දේශපාලන අරමුණු සඳහා මහජන ඉඩම් පැහැර ගැනීමක් බවට වූ මහජනතාවගේ ප්‍රකාශය පිළිගන්නවාද කියලා අහලා තිබෙනවා.

ඒ ප්‍රදේශයේ මහජනතාව නිතර අපව මුණ ගැහෙනවා. ඒ මහජනතාව අපටත් මුණ ගැහෙනවා. ඔවුන් පැහැදිලිව කියලා තිබෙනවා, ඒවා දියුණු කරනවා නම් ඔවුන්ගේ ඉඩම් දෙන්න පුළුවන් කියලා. ඒ ඉඩම් පිළිබඳ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයෙන් ගන්න.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, පොඩි කරුණු පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ சபாநாயகர் அவர்களே, "சண்டியன் இல்லாத இடத்தில் நொண்டியனும் சண்டியன்தான்" என்று சொல்வார்கள். யாழ்ப்பாணம் என்பது NPPஇன் வெற்றிலைப் பெட்டியல்ல. நான் கேட்ட கேள்விகளில் ஒன்றுக்கேனும் ஒழுங்கான பதில் கிடைக்கவில்லை. அதாவது, நான் கேட்ட கேள்விகளில் ஒன்றுக்கேனும் சரியான பதிலை சொல்லத் தெரியவில்லை. அந்த அமைச்சிடம் அல்லது இந்த அமைச்சிடம் கேட்குமாறுதான் சொல்லப்படுகின்றது. வடக்கில் 'அபிவிருத்தி' என்ற போர்வையில் மக்களுடைய காணிகள் அபகரிக்கப்பட்டு இருக்கின்றன. அந்த மக்கள் தங்களுடைய காணிகளைக் கோரி சாகும்வரை உண்ணாவிரதம் இருக்கிறார்கள். எவ்வளவு பொய் சொல்கிறார் என்று பாருங்கள்!

என்னுடைய ஒரேயொரு கேள்வி என்னவெனில், ஏன் நீங்கள் ம. பிரதீபனை பதவி நீக்கம் செய்யவில்லை? என்பதுதான். அவர் 'ஊழல்வாதி' என்று ஆளுநர்கூட கடிதம் எழுதியிருக்கிறார். இருந்தும், நீங்கள் அவரைப் பதவி நீக்கம் செய்யவில்லை. பரவாயில்லை! கடந்த ஒரு வருட காலப்பகுதியில் கூட்டப்பட்ட DCC meetingsஇல் அபிவிருத்தி தொடர்பில் எடுக்கப்பட்ட தீர்மானத்தின் அடிப்படையில் யாழ்ப்பாணத்தில் செய்த ஒரு வேலையை உங்களால் சொல்ல முடியுமா? அதைவிடுத்து, அடிக்கல் நாட்டுவது என்று சும்மா பேய்க்காட்டக் கூடாது. இந்த பேய்க்காட்டுகின்ற வேலையை யாழ்ப்பாணத்தில் வைத்துக்கொள்ளக் கூடாது. ஏனென்றால், வருகிற நேரம், போகிற நேரம் எல்லாம் சாப்பிடுவதற்கு யாழ்ப்பாணம் அவரவர்களின் வெற்றிலைப் பெட்டியல்ல.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු බිමල් රත්නායක මැතිතුමා. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කෝ, උත්තර නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රකාශය කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අප රජය බලයට පත්වන විට,- *[බාධා කිරීමක්]* ඒ ward එකටම ඔබතුමාවත් යවන්න වෙයි. *[බාධා කිරීම්]* පස්සේ කියන්නම්. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේ Colleaguesලා. ඔබතුමන්ලාගේ මිත්‍රයන්ගේ තිබෙන quality එක තමයි පෙනෙන්නේ. So, are you proud of him? - *[Interruption.]* ගරු කථානායකතුමනි, මම ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට උත්තර දෙනවා. මම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැහැ. මම අද මේ හතරවැනි ප්‍රශ්නයට උත්තර දෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, - *[බාධා කිරීමක්]* කරුණාකරලා මට උත්තර දෙන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]* එහෙම නැත්නම් මේ බාධා කරන එක්කෙනාව එළියට දමන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම question එකක් ඇහුවා. ගරු ඇමතිතුමා උත්තර දුන්නේ නැහැ. දැන් කියනවා,- *[බාධා කිරීමක්]* ඒක වහාම ඉවත් කර ගන්න කියන්න. ලජ්ජයි නේ. ප්‍රශ්නයක් ඇහුවාම උත්තරයක් දෙන්න කියන්න, ඔබතුමන්ලාගේ ඇමතිට. ලජ්ජයි. ඊට වඩා හොඳයි කොහේ හරි ගිහිල්ලා වඩයක් විකුණලා වත්කම්, බැරකම් සොයා ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාට කරුණු පැහැදිලි කර ගැනීමට - *[බාධා කිරීමක්]*

ගරු ඇමතිතුමා.

## මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටස ඉදිකිරීමේදී සිදුවී ඇති අක්‍රමිකතා: ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## மத்திய அதிவேக நெடுஞ்சாலையின் கடவத்தை - மீரிகம பகுதியின் கட்டுமானத்தின்போது இடம்பெற்ற முறைகேடுகள்: போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று

## IRREGULARITIES IN CONSTRUCTING KADAWATHA-MIRIGAMA SECTION OF CENTRAL EXPRESSWAY: STATEMENT BY MINISTER OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, අප රජය බලයට පත් වන විට සියලු දෙනාම දන්නා පරිදි මධ්‍යම අධිවේගී මාර්ගය ඉදි කිරීම් ව්‍යාපෘතියේ වැඩ කටයුතු ඇනහිට තිබුණා. මධ්‍යම අධිවේගී මාර්ගය කොටස් කිහිපයකට බෙදා දක්වන්න පුළුවන්. එනම්,

1. කඩවත සිට මීරිගම දක්වා කොටස
2. මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස
3. පොතුහැර සිට රඹුක්කන දක්වා කොටස
4. රඹුක්කන සිට ගලගෙදර දක්වා කොටස වශයෙන්.

ඒ අතරින් මීරිගම-කුරුණෑගල කොටස පමණක් වැඩ නිම කර ජනතා අයිතියට පත් කර තිබුණා. නමුත්, කඩවත සිට මීරිගම දක්වා කොටස සම්පූර්ණ වී තිබුණේ නැති නිසා මධ්‍යම අධිවේගී මාර්ගයේ ප්‍රතිලාභ නිසි ලෙස ජනතාවට ලබා ගැනීමට නොහැකි වී තිබුණා. මීට අමතරව වසර ගණනාවක් මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටසේ වැඩ ඇනහිටීම නිසා විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මහ ජනතාවට විඳින්නට සිදු වූ ගංවතුර පීඩා, ඉදි කිරීම් කටයුතු අතරමඟ නැවතීම නිසා සිදු වූ පීඩා සහ පරිසර හානිය විශාලයි.

මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටසේ ඉතිහාසය ගැන කියනවා නම්, 2015 අගෝස්තු මස 4 වැනි දින කිසිම මුදල් සැපයීමක් නොමැතිව - එවැනි එකඟතාවකින් තොරව - සම්පූර්ණ කිලෝමීටර 37ක කොටසෙන් කිලෝමීටර 4ක් පමණක් ඉදිකිරීම සඳහා චීන කොන්ත්‍රාත්කරුවෙකු සමඟ එවකට පැවැති ආණ්ඩුව ටෙන්ඩර් කැඳවීමකින් තොරව ගිවිසුම්ගත වෙලා තිබෙනවා. 2015 අගෝස්තු 4වැනි දා අත්සන් කරන ලද එම ගිවිසුම වසරක් ඇතුළත මුදල් නොලැබුණහොත් අවලංගු වීමට තිබුණා. නමුත් වසරක් ඉක්මවා ගොස් තිබියදීත්, 2016 ජුනි 20වන දින එම කොන්ත්‍රාත් සමාගම සමඟම තවත් කිලෝමීටර 32ක් සඳහා ටෙන්ඩර් කැඳවීමකින් තොරව unsolicited විධියට නව ගිවිසුමකට ගිහිල්ලා තිබෙනවා. නමුත් 2019 වනතෙක් මුදල් සැපයුම සොයාගත නොහැකි වූ නිසා වසරෙන් වසර පස් වතාවක් ගිවිසුම් දීර්ඝ කිරීම් සිදු වෙලා තිබෙනවා. එහිදී ගිවිසුම් කාලය දීර්ඝ කළත් ගිවිසුම් කොන්දේසි නොවෙනස්ව පැවතිලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, කොන්ත්‍රාත්කරුට අප ගෙවන ඩොලර් ප්‍රමාණය තීරණය කරන කොන්දේසියට අනුව ඔහු කරන වැඩවලට අදාළ බිල්පතට අදාළ රුපියල් අගය ඩොලර්වලට පරිවර්තනය කරන්නේ, 2015දී ගිවිසුම් අත්සන් කළ දිනයට අදාළව ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය වන රුපියල් 135ට සාපේක්ෂව. ඒ අනුව 2022දී ඩොලරය රුපියල් 370ට යන විටත් බිල්පත්වලට ගෙවීමට අදාළ ඩොලර් ප්‍රමාණය ගණනය කරනු ලැබුවේද 2015දී ගිවිසුම්ගත වන විට ඩොලරයේ අගය වූ රුපියල් 135ට සාපේක්ෂවයි. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් කරන ලද වැඩවලට අදාළව වැඩි ඩොලර් ප්‍රමාණයක් පසුගිය කාලයන්හිදී ගෙවීමට සිදු වුණා. ගරු කථානායකතුමනි, මෙය ඉතා වැදගත් කාරණයක්.

2015දී ටෙන්ඩර් කැඳවීමකින් තොරව unsolicited විධියට ගිවිසුම අත්සන් කළා. දෙවනුව, නිශ්චිත මූල්‍ය සැපැයුමක් පිළිබඳව එකඟත්වයක් නැතුව ගිවිසුම් අත්සන් කළා. 2015දී ගිවිසුම් අත්සන් කළාට, පටන් ගත්තේ 2020දී. හැබැයි, 2020දී පටන් ගන්නකොටත් 2015 ගිවිසුමම තමයි බලපවත්වා ගත්තේ; 2015 අගෝස්තු මාසයේදී අත්සන් කළ ගිවිසුම. ඒ ගිවිසුමේ තිබෙන්නේ මොකක්ද, ගරු කථානායකතුමනි? කවදා හරි මේ ව්‍යාපෘතියට මුදල් ගෙවද්දී අපි ගෙවිය යුත්තේ, ඩොලර් එකක් රුපියල් 135ක් ලෙස සලකලා. එතකොට වෙන්නේ මොකක්ද? ඩොලර් එක රුපියල් 300 වුණත් ඊට අනුව නොවෙයි රුපියල් 135න් බෙදලා තමයි ගෙවන්න වෙන්නේ, ගරු කථානායකතුමනි. එතකොට වැඩි ඩොලර් ප්‍රමාණයක් ගෙවන්න අපට සිදු වෙනවා. ඒකට හේතුව, 2015දී අත්සන් කරන ලද ගිවිසුමේ තිබෙන බරපතළ, වැරදි සහගත තත්ත්වය. ඒක තමයි මේ සරලව කිව්වේ.

2019 මාර්තු 22වන දින චීන එක්සිම් බැංකුව විසින් වරණීය ගැනුම්කරුවන්ගේ ණය ගිවිසුමකට එකඟ වෙනවා. ඒ අනුව

[ගරු බිමල් රත්නායක මහතා]

ගිවිසුම්ගත වී වසර පහකට පසුව, 2020 සැප්තැම්බර් 15වන දින වැඩ අරඹනු ලැබුවා. ආර්ථික අර්බුදය සමඟ 2022 අප්‍රේල් 12වන දින විදේශ ණය ගෙවීම අත්හිටුවීම නිසා චීන එක්සිම් බැංකුවද මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් නිදහස් කිරීම අත්හිටුවා තිබෙනවා. එම නිසා ඉදිකිරීම් කටයුතු වසරක පමණ කාලයක් අඩාළ වී තිබුණු අතර, ඒ වන විට කොන්ත්‍රාත්කරුට ගෙවීමට තිබූ හිඟ බිල්පත් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 189.51ක්. එම බිල්පත් නොගෙවීම නිසා 2023 අගෝස්තු මස ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නැවතුණා. 2024 අවසානයේ වත්මන් රජය බලයට පත් වන විට කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවූ හිඟ බිල්පත් නිසා දිනකට රුපියල් මිලියන 20ක පමණ පොලියක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුව තිබුණා. දවසක පොලිය රුපියල් මිලියන 20යි. මේ ගිවිසුම් සියල්ල අත්සන් කළේ 2015 යහ පාලන ආණ්ඩුව කාලයේ.

මෙම පොලී මුදල සහ මධ්‍යම අධිවේගී මාර්ගය නිසි සම්බන්ධතාවය නොමැති නිසා රජය පත්වූ දා සිට කඩවත මීරිගම කොටස නැවත ඇරඹීමට රජය උත්සාහ කරනු ලැබුවා.

- ඒ අනුව කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කිරීමට සහ කොන්ත්‍රාත්තුවේ වර්තමාන තත්ත්වය සොයා බැලීම සඳහා 2025.05.19 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක: අමප/25/0754/809/056 මඟින් කමිටු දෙකක් පත් කරන ලදී.
- එම කමිටු සාමාජිකයන් විසින් 2025.08.04 දින සහ 2025.09.02 දින කමිටු වාර්තා 2ක් ඉදිරිපත් කරන ලදී.
- කැබිනට් සන්දේශ අංක 40/2025 දරන සන්දේශය මඟින් එම කමිටු වාර්තා දෙක අමාත්‍ය මණ්ඩලයට 2025.09.02 දින ඉදිරිපත් කරන ලදී.
- ඒ අනුව, කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු හිඟ මුදල වන ඇමෙරිකානු ඩොලර් මිලියන 189.51ට අදාළ රුපියල් අගය ගෙවීමට 2025.09.08 දිනැති කැබිනට් තීරණය අංක: අමප/25/1659/809/056-1 මඟින් අනුමැතිය ලබා දී ඇත.
- එක්සිම් බැංකුවෙන් ණය මුදල් නොලැබීම නිසා කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට ඇති හිඟ මුදල වන රුපියල් බිලියන 57, 2025.09.15 දින ගෙවා නිම කරන ලදී.
- මේ වන විට ණය ගිවිසුමට අනුව, චීන එක්සිම් බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ට අදාළ යුවාන් ප්‍රමාණයක ණය මුදලක් ලබා දීම සඳහා එකඟතාවට පත්වී ඇත.

ගරු කථානායකතුමනි, අප ආණ්ඩුව බලයට පත්වූ දා සිටම මෙම අධික වියදම් සහිත ව්‍යාපෘතිය අවසන් කර ගැනීමට අප උපරිම උත්සාහ කරලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා පත් වූ පළමු මොහොතේ එතුමාගේ පළමු මුණගැසීම ගරු චීන තානාපතිතුමා සමඟ සිදු වුණා. මමත් ඒ සාකච්ඡාවේ සිටියා. මට මතක විධියට ඒ සැප්තැම්බර් අග හෝ 2024 ඔක්තෝබර් මුල. එදා සිට අපි මේ ප්‍රශ්නය ගැන කථා කරන්න පටන් ගත්තා. චීන ජනාධිපති ෂී ජිංපිං මැතිතුමා මුණ ගැසුණු වෙලාවේත් අපේ ප්‍රධාන ඉල්ලීම වුණේ, මේ ව්‍යාපෘතිය පටන්ගන්න කියන එක. මොකද, දිනපතා රුපියල් මිලියන 20ක් ලෙස මාසයකට රුපියල් මිලියන 600ක් පොලිය වශයෙන් එකතු වෙනවා. හදපු beams මේ වන විට කඩාගෙන වැටිලා. ඒ කැඩුණු ඒවා හදන්න අපි කෝටි 790ක් දුන්නා. මේ අවසාන මාස තුනෙහි විස්තර තිබුණාට, මුළු මාස 10 තුළම ඔය චීන තානාපති කාර්යාලය, ඒ රටේ ජනාධිපතිතුමා, අපේ අනුර දිසානායක සහෝදරයා ඇතුළු මුදල් අමාත්‍යාංශය, අපි කරන ලද සාකච්ඡා ප්‍රමාණය, studies ප්‍රමාණය නිමක් නැහැ. මේකට අදාළව ටොන් ගණන් කරුණු කට පාඩමින් කියන්න පුළුවන් තරම් අපි මහන්සි වෙලා තිබෙනවා, මේ පරණ ආර්ථික ඝාතන විසඳන්න.

අප මෙම තීරණය ගත්තේ ඇයි? මෙම තීරණය ගැනීමට හේතු වූ කාරණා ලෙස ව්‍යාපෘතිය අවසන් කිරීමේ පිරිවැය, ව්‍යාපෘතිය අවසන් කිරීමට ගතවන කාලය සහ නීතිමය තත්ත්වයන් බලපානු ලැබුවා. ඒ අනුව චීන සමාගම සමඟ මෙම කොන්ත්‍රාත්තුව සිදු කරගෙන යෑමේදී හිඟ බිල්පත් නිසා ගෙවීමට සිදුවන පොලිය රුපියල් බිලියන 34ක්, ව්‍යාපෘති කාල සීමාව දිගු කිරීම නිසා තවත් රුපියල් බිලියන 8ක පමණ මුදලක් සහ ඉතිරි වැඩකටයුතු සිදු කිරීම සඳහා රුපියල් බිලියන 175ක් -පාරේ ඉතිරි ටික හදන්න- ඇතුළුව සමස්ත වියදම රුපියල් බිලියන 217ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණා.

මෙම චීන සමාගමේ කොන්ත්‍රාත්තුව අවසන්කොට ඔවුන් වෙනුවට වෙන කණ්ඩායමක් එක්ක ගියා නම්, නැවතත් ප්‍රසම්පාදන කටයුතු සිදුකොට මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට වුණා නම් මෙම චීන සමාගමේ ව්‍යාපෘතිය අවලංගු කිරීමේ වියදම - termination cost, ව්‍යාපෘතියට අදාළව ගෙන්වන ලද උපකරණ සහ අමුද්‍රව්‍ය සඳහා වූ වියදම ද ඇතුළුව රුපියල් බිලියන 88ක් ගෙවීමට සිදුවන බව ගණන් බලා තිබුණා. ඒ අනුව ඉතිරි වැඩකටයුතු, හිඟ බිල්පත් නිසා ගෙවීමට සිදුවන පොලිය සහ හිමිකම් ඇතුළුව ඇස්තමේන්තු කරන ලද සමස්ත මුදල රුපියල් බිලියන 263ක් වනවා. ඒ කියන්නේ, අපි වෙනම ගියා නම් අපට රුපියල් බිලියන 46ක් වැඩිපුර යනවා, මේ පාර හදලා ඉවර කරගැනීම ප්‍රමාද වීම නිසා ගෙවන්න වෙන දේවල් ඇතුළු ඒ අලාභයන් පැත්තක තැබුවත්. ඒ අනුව වියදම, කාලය සහ නීතිමය තත්ත්වයන් සලකා බලා චීන සමාගම සමඟ මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට කමිටුව විසින් තීරණය කරනු ලැබුවා.

විවිධ පාර්ශ්ව සමාජ මාධ්‍ය හරහා අසත්‍ය ප්‍රකාශ සිදු කරමින් මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් බිලියන 450ක් වැය වන බව ප්‍රකාශ කරමින්, ඔවුන් විසින්ම සිදු කරන ලද රටට අවාසි සහගත ගිවිසුම් නිසා සිදු වූ හානිය වෙනුවට වත්මන් රජයට බොරු චෝදනා එල්ල කරමින් සිටිනවා. ගරු කථානායකතුමනි, ඉන් එකක් තමයි, මෙහි කිලෝමීටරයකට රුපියල් බිලියන 12ක් වියදම් කරනවා කියන එක. ගරු කථානායකතුමනි, මෙහි තිබෙන්නේ කිලෝමීටර 36.475යි. ඒ මාර්ගයේ කිලෝමීටරයක් හදන්න දැන් යන මුදලේ average එක ගත්තොත්, රුපියල් බිලියන 6.29යි. ඒ නිසා රුපියල් බිලියන 12යි දශම ගණනක් යන්නේ නැහැ. ඒ රුපියල් බිලියන 6.29ත් වැඩියි. ඒ වැඩිකමට හේතුව මොකක්ද? 2015දී මේ ගිවිසුම අත්සන් කරද්දී ඉතාම අතාර්කික, ඉතාම වැරදි සහගත කොන්දේසි ගොඩක් එක්ක, ඉතාම නපුරු කොන්දේසියකටත් එකඟ වෙලා තිබෙනවා. ඒ මොකක්ද? අපි 2015 වසරේ තිබෙන රුපියලේ අගය මත තමයි යන්නේ කියන එක. මේ ව්‍යාපෘතිය 2020 වසර වෙනකල් පටන්ගත්තේ නැහැ. අඩු ගණනේ එතකොට මේක වෙනස් කරන්න තිබුණා. 2019දී තමයි loan එකට Exim Bank එක එකඟ වෙන්නේ. අවුරුදු 5ක් තිබුණා. ආර්ථික ඝාතකයන්ගේ ආර්ථික ඝාතන නිසා තමයි මේ මුදල රුපියල් බිලියන 6.29ක් වෙලා තිබෙන්නේ. ඒ කාලයේ ඒ වගකීම් දරපු පුද්ගලයින්ම දැන් කොහේහරි කියනවා මම දැක්කා, කිලෝමීටරයකට රුපියල් බිලියන 12.5ක් යනවා කියලා.

ගරු කථානායකතුමනි, මේකේ තිබුණු තවත් තර්කයක් තමයි, මේ මාර්ගයේ තිබුණු ගසක් නිසා මේ ව්‍යාපෘතියෙන් ඉවත් වන්න සිදු වුණා කියන එක.

ගරු කථානායකතුමනි, අපි සංවර්ධන කටයුතු සිදු කරන්නේ පරිසර තත්ත්ව වාර්තාවන්ට අනුවයි. මොකද, පරිසරය කියන්නේත් රටේ ජනතාවට අත්‍යවශ්‍ය දෙයක්. එම නිසා පරිසර වාර්තා මත පදනම් වෙලා තමයි වැඩ කරන්න ඕනෑ. එහෙම නොකළාට පස්සේ වෙන විනාශයන්ට හොඳම උදාහරණයක් තමයි, මත්තල. අද වන විට මුළු හම්බන්තොට දිස්ත්‍රික්කයේම සම්පූර්ණයෙන්ම අලි-මිනිස් ගැටුමක් ඇතිවෙලා තිබෙන්නේ ඒකත් එක්ක. ඒ වාගේ ඇති තරම් දේවල් තිබෙනවා. දැන් වහින්න පටන් ගත්තාම ඒවා පෙනෙනවා. එතකොට ඒවා කරපු කණ්ඩායම් එතැනට ගිහිල්ලා voice-cuts දෙනවා. ඒ නිසා ඕනෑම ව්‍යාපෘතියක් අපි කරන්නේ පරිසර වාර්තා අරගෙනයි. එම සිද්ධියේදී හිටපු පරිසර නිලධාරිනියක් අපේ දේශපාලන ව්‍යාපාරයට සම්බන්ධයි කිව්වා. නමුත් එහෙම එකක් නැහැ. මේ අය කිව්වේ මොකක්ද? ගහක් ඉවත් කරන්න බැරි වෙච්ච නිසා මේ ව්‍යාපෘතිය නතර වුණා කියලා ලොකු මතයක් හදනවා; "බයි" මතයක් හදනවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ ගැන කියන්නම්. ඇත්තටම මම ඒක ගැන සොයා බැලුවා. මේවා උත්තර දෙන්නවත් වැදගත් දේවල් නොවෙයි. නමුත්, නොයෙක් මත හදනවා නේ. ගරු කථානායකතුමනි, මෙම මුළු ව්‍යාපෘතියේ දුර කිලෝමීටර 37යි. ඒ කිලෝමීට 37ක ව්‍යාපෘතියෙන්, ඔය කියන ගස නිසා මීටර් 200ක සංවර්ධන කටයුතු තමයි ටික දවසකට නතර කර තිබෙන්නේ. ඒක ඒ කාලයේ කරපු දෙයක්. මේවා අපි කරපු දේවල් නොවෙයි. ඉතිරි මුළු කිලෝමීටර ප්‍රමාණයේම වැඩ කරනවා. ඒ මීටර් 200ක ප්‍රශ්නය පිළිබඳවත් ඊට පස්සේ කැබිනට් මණ්ඩලය තීන්දුවක් අරන් වැඩ පටන්ගෙන තිබෙනවා. මේ ගස ඉවත් කළාට පස්සේත් මේ ව්‍යාපෘතියේ වැඩ කළා. ඒ නිසා මේ කරන හැම අපහාසයක්ම මේ රටේ පරිසරයට විරුද්ධව කරන ප්‍රකාශ. ඒ දේ තමයි මේ වෙන්නේ. ඊට පස්සේ අලි හැප්පුණාම, අලි මැරුණාම ඒකට වෙනම කථා කරනවා. මොකක්ද මේ කරන්නේ? ඒ නිසා අපට කියන්න තිබෙන්නේ මේකයි. මේ ව්‍යාපෘතිය මීට වඩා ඉතාම ලාභදායී කොන්දේසි මත කරගන්න තිබුණා. නමුත්, ඒවායේ තිබිච්ච වංචනික කරුණුත්, දූෂිත හේතුත්, ගිවිසුම අත්සන් කරද්දී වෘත්තීමයභාවයෙන් කටයුතු නොකිරීම නිසාත් තමයි යම්කිසි වැඩි මුදලක් ගෙවීමට ලාංකීය ජනතාවට සිදුවෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් කිලෝමීටරයක් රුපියල් බිලියන 5කට, පහමාරකට කර ගන්න පුළුවන් වටපිටාවක් තිබියදී තමයි රුපියල් බිලියන 6.29කට යන්න වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අපි ඉදිරි කාලයට අදාළවත් චීනයේ Exim Bank එක සමඟ සාකච්ඡා කරලා මේ පොලිය තවත් අඩු කර ගන්න කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මධ්‍යම අධිවේගී මාර්ගයේ ගලගෙදර දක්වා කොටස 2028 වසරේ මැද භාගය වන විට සම්පූර්ණයෙන්ම අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම 2026 දෙසැම්බර් හෝ 2027 ජනවාරි වෙනකොට රඹුක්කන දක්වා කොටස සම්පූර්ණ කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන්න අවශ්‍ය වුණේ එය සමාජයට වැදගත් නිසා. මොකද, අපි දැන් ඒ වැඩ කටයුතු පටන්ගෙන තිබෙනවා.

ගරු කථානායකුතමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශය නිවේදනය, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) හිනිදූම සුනිල් සෙනෙවි මහතා.

## තයිඉට්ටි හි පෞද්ගලික ඉඩමක තිස්ස රජමහා විහාරය ඉදිකිරීම: බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## தையிட்டியில் தனியார் காணியில் திஸ்ஸ ரஜமஹா விகாரை நிர்மாணம்: புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று

CONSTRUCTION OF TISSA RAJAMAHA VIHARAYA ON A PRIVATE LAND IN THYIDDY: STATEMENT BY MINISTER OF BUDDHASASANA, RELIGIOUS AND CULTURAL AFFAIRS

**ගරු (ආචාර්ය) හිනිදූම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ 2025.03.06වන දින අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් උතුර තයිඉට්ටි ගම්මානයේ තිස්ස විහාරය නමින් විහාරස්ථානයක් තිබෙනවා. එය ලියාපදිංචි කර නොමැත. ඉඩමේ අයිතිය පිළිබඳ කරුණු සොයා බැලිය යුතුයි.
2. මේ පිළිබඳව ලිඛිතව අමාත්‍යාංශයට වාර්තා කර නැත. අපි ජනමාධ්‍ය ඔස්සේ දකින තොරතුරු ප්‍රමාණයක් තමයි ඒ සම්බන්ධයෙන් තිබෙන්නේ.
3. ඇත්තටම මෙය ඉඩම් අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ කරුණක්. මෙය බුද්ධශාසන අමාත්‍යාංශයට අයිති නැහැ. මේ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශයෙන් කළ විමසීමේදී අත්පත් කර ගැනීමක් ක්‍රියාත්මක වී නොමැති බවත්, එබැවින් ඒ සඳහා අත්පත් කර ගැනීමේ පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කර නොමැති බවත් වාර්තා කර තිබෙනවා.
4. එසේ අත්පත් කරගෙන නැති නිසා එබඳු ගැසට් නිවේදනයක් නැහැ.
5. අත්පත් කර ගැනීමක් සිදුවී නොමැති නිසා නැවතත් පිළිතුර අදාළ වෙන්නේ නැහැ.
6. ඇත්තටම මේ සම්බන්ධව මැදිහත්වීම් රාශියක් කරලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා අප කැඳවා මේ ගැන දීර්ඝ සාකච්ඡාවක් කළා. ඒ වාගේම යාපනය ප්‍රදේශයේ යම් පිරිස් විටින් විට අපව මුණ ගැහෙන්න අමාත්‍යාංශයට පවා ආවා. ඒ අය සමඟ අප දීර්ඝ වශයෙන් සාකච්ඡා සිදු කරනු ලැබුවා. ඒ වාගේම මේ කණ්ඩායම මේ සම්බන්ධව මැදිහත්වීම් කරන්නට කමිටුවක් හැටියට පත් කරලා තිබෙනවා. ජාතික සමඟිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයේ, එහෙම නැත්නම් ONUR ආයතනයේ විජිත් රොහාන් ප්‍රනාන්දු මහත්මයාගේ සභාපතිත්වයෙන් යුතුව සහ අප අමාත්‍යාංශයේ ලේකම්තුමා ලේකම් විධියටත්, කමිටු සාමාජිකයන් තව 5දෙනෙකු සහිතවත් මේ කමිටුව පත් කරලා තිබෙනවා. එතුමන්ලා ඒ කමිටුව හරහා මේ පිළිබඳව කරුණු සොයා ගෙන යනවා.

ගරු කථානායකතුමනි, මම කලිනුත් සඳහන් කළා වාගේම බුද්ධ ශාසන අමාත්‍යාංශයට තදානුබද්ධව ඉඩම් අමාත්‍යාංශය

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

ඇතුළු අමාත්‍යාංශ සහ ව්‍යුහයන් ගණනාවක් මේකත් එක්ක ඒකාබද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේක තනි තැනකින් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. ඒ වාගේම ONUR ආයතනය සහ ගරු අධිකරණ අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු පිරිසක් යාපනයට ගිහිල්ලා මේ සඳහා දීර්ඝ මැදිහත් වීමක් සිදු කළා. ඒකේ වාර්තාවත් දැනට මා සතුව මෙතැන තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධ ගැටලුව ඉඩම් අත්පත් කර ගැනීම සහ ගැසට් නිවේදන නිකුත් කිරීම වාගේ තැනක තිබෙනවා. ඒක අප අමාත්‍යාංශය සහ ඉඩම් අමාත්‍යාංශය එකතුව කරන්නට ඕනෑ. නමුත්, ගරු පාර්ලිමේන්තුවට මා මේ කාරණය අවධාරණය කරනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අප මේ සම්බන්ධව අරගෙන තිබෙන අවංක උත්සාහය දිහා බලන්න කියලා.

මම දැක්කා, උතුරු පළාතේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී පවා මේ ප්‍රශ්නය මතු වනවා. ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීවරු, අමාත්‍යවරු එතැනදී ඉතා පැහැදිලිව කරුණු කිව්වා. උතුරු පළාතේ තිබෙන මේ ගැටලුව විසඳන්න ඉතා අවංක වුවමනාවක් අපට තිබෙනවා. ඒකට අවශ්‍ය කරන අවංක මැදිහත්වීම් අප කරමින් ඉන්නවා. නමුත්, ඒක ක්ෂණිකව, කෙටියෙන් විසඳලා පිළිතුරු දෙන්න පුළුවන් තත්ත්වයක නොවෙයි තිබෙන්නේ. මම ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු එකතු කළා. යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර ප්‍රදේශයේ තිස්ස විහාර කියලාම කීපයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, සමහර ඒවා ලියාපදිංචි වෙලා තිබෙනවා. නමුත්, සමහර ඒවා ලියාපදිංචි වෙලා නැහැ. ඒ නිසා ලියාපදිංචියේ ඉඳලාම සංකීර්ණතාවක් තිබෙන මේ ප්‍රශ්නය විසඳා ගන්නට ඕනෑ. අපි පත් කරලා තිබෙන කමිටු කිහිපය හරහා මේ පිළිබඳව මැදිහත්වීම් කරමින් ඉන්නවා.

බොහොම ස්තුතියි.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විසර්ජන පනත් කෙටුම්පත, 2026
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
### APPROPRIATION BILL, 2026

"2026 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැකසීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ වැඩබලන මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.***

***2025 නොවැම්බර් 07වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்திப் பதில் அமைச்சர் மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 நவம்பர் 07, வெள்ளிக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Anil Jayantha, Acting Minister of Finance, Planning and Economic Development; to be read a Second time upon Friday, 07th November, 2025*

*and to be printed; and to be referred to the Committee on Public Finance.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා.

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම
## பாராளுமன்ற நிலையியற் கட்டளைகளைத் திருத்துதல்
## AMENDMENTS TO THE STANDING ORDERS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වන මතු දැක්වෙන සංශෝධනය පිළිගත යුතු ය:-

දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 (4) පළමුවැනි ඡේදයට ඉක්බිතිවම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමට :
-

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතළ මූල්‍ය වංචා හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය."

**ගරු කංචන විජේසේකර** 

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊට අනුකූලව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව, ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ යෝජනාව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා. You have 14 minutes for the Debate.

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව
## அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் நான்காவது அறிக்கை
## FOURTH REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

[පූ.භා. 11.20]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 ප්‍රකාරව පිහිටුවා ඇති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද ව්‍යාපාරයක ගිණුම් විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි.

දසවන පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ මෙතෙක් පැවති පරීක්ෂා කිරීම් පිළිබඳව අවධානයට ලක් කිරීමේදී විවිධ මට්ටමේ දූෂණ ක්‍රියා අනාවරණය විය. එහිදී හෙළි වූ විශාලතම ගැටලුව වන්නේ, නිසි සැලසුම් සහ ඉලක්ක කරා ගමන් කරමින් සංවර්ධන ප්‍රතිලාභ සමස්ත ජනතාවට අත්පත් කරදීමට හැකියාව තිබියදී පෞද්ගලික ප්‍රතිලාභ හෝ වෙනත් අනුමත කළ නොහැකි කරුණු හෝ හේතු මත ජාතික වැදගත්කමකින් යුත් ව්‍යාපෘති රටට බරක් සහ සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට බාධාවක් වී තිබීමයි.

මෙම තත්ත්වය මනාව වටහා ගනිමින් මෙවැනි වැරදි සහගත ක්‍රියා සඳහා වැරදි උපදෙස් ලබා දෙන පිරිස් සඳහා නීතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමටත්, මින් ඉදිරියේ මේ ආකාරයේ කටයුතු සිදුවීම වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීමේ අරමුණින් යුතුව ගෙවූ වසර පිළිබඳ කාරක සභාව විසින් 2025.09.23වන දින සභාගත කරන ලද, දසවන පාර්ලිමේන්තුවට අදාළ මෙම සිව්වැනි වාර්තාවේ ඇති කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම අපි මීට පෙර අවස්ථා කිහිපයකදීම අදහස් දක්වා තිබෙනවා, මේ සමාජයේ කෝප් කමිටුව පිළිබඳව තිබෙන මතයත්, ඒ වාගේම කෝප් කමිටුව විසින් කරන කාර්යභාරයත් සම්බන්ධව. විශේෂයෙන්ම කෝප් කමිටුවේ මුහුණත පෙනුම, එහෙම නැත්නම් මේ සමාජය මේක දකින ආකාරය ගත්තාම, බොහෝ තැන්වල තිබෙන මතය වන්නේ, "මේකට යම් ආයතනයක් ගෙන්වනවා, බණිනවා, යවනවා. එච්චරයි" කියන එකයි. ඒ වාගේ අදහසක් තමයි සමාජයට මේ ගැන තිබෙන්නේ. හැබැයි, අපි කෝප් කමිටුව භාරගෙන ඒ කටයුතු පවත්වාගෙන යද්දි අපිට දැනෙන දේ තමයි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට මේ රටේ මහජනතාව ලබා දී තිබෙන පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරන්න පුළුවන්, මේ රටේ මූල්‍ය වගකීම, මූල්‍ය විනය ගොඩනැඟීමේ ක්‍රියාවලියට දායක වෙන්න පුළුවන් වැදගත්ම කාරක සභාව කෝප් කමිටුවයි කියන එක. ඒ නිසා තමයි අපි මීට සුළු මොහොතකට කලින් මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කරන්න යම් යෝජනාවක් ඉදිරිපත් කළේ. මෙන්න මේ මුහුණත පෙනුම සමාජය දකින ආකාරය වෙනස් කරලා, අපි විසින් අනාවරණය කරගන්න තොරතුරු මත මේ රටේ සිදු වන මූල්‍ය වංචා, එහෙම නැත්නම් මූල්‍ය අවභාවිතා වැනි කටයුතු සම්බන්ධව යම් නීතිමය ක්‍රියාමාර්ග කරා නිශ්චිත ලෙස එළැඹීමේ හැකියාව මේ කෝප් කමිටුව කෙරෙහි ලබා ගත යුතුව තිබෙනවා. ඒ නිසා අපි එවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා තමයි අද මේ විවාදයේ කටයුතු ආරම්භ කරන්නේ.

ගරු කථානායකතුමනි, ආණ්ඩුවක් විධියට අපි විගණනය පිළිබඳව දැවැන්ත විශ්වාසයක් තබපු දේශපාලන ව්‍යාපාරයක්. මේ රටේ වංචාව, දූෂණය, නාස්තිය, හොරකම ගැන දශක ගණනාවක් තිස්සේ  කථා කළත්, මේ රටේ සංවර්ධනයට, මේ රටේ මහජනතාවගේ පැවැත්මට පවා ඉතාම හානිකර වුණු වංචාව, දූෂණය, නාස්තිය, හොරකම මහ හරවා ගත යුතුයි, ඒ වෙනුවෙන් මේ සමාජය පෙළ ගැසිය යුතුයි කියන දේශපාලන වැඩ පිළිවෙළ සමාජය ඉස්සරහා තිබ්බේ අපි. ඒ නිසා අපි අදටත් විශ්වාස කරනවා, මේ රටේ මහජනතාව මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිත වන ඒ සියලු ක්‍රියා නැවැත්වීම වෙනුවෙන් අවශ්‍ය මතය මේ සමාජයේ  පවත්වාගෙන යනවා කියලා. ඒ නිසා මේ රට සංවර්ධනය කරන්න ගන්නා සියලු ක්‍රියාමාර්ගවලට සමාන්තර ලෙසම විගණනය ශක්තිමත් කළ යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා.

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

කෝප් කමිටුව යටතට ගැනෙන SOEs 457ක් තිබෙනවා. ඒ සියලු ආයතනවල මූල්‍ය විනය පවත්වා ගැනීම කියන කාරණය සම්බන්ධව අපි විශේෂ අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන් පසුගිය දවස්වල කරන ලද පරීක්ෂණවලින් අපි අනාවරණය කර ගත්තා, රාජ්‍ය ව්‍යාපාරවල - SOEs - තිබෙන පොදු දුර්වලතා සමූහයක්. දැන් අපි විශේෂ වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවා, ඒ රාජ්‍ය ව්‍යාපාර 457හිම නියෝජිතයන් ගෙන්වලා, ඒ හඳුනා ගත්ත ප්‍රධාන දුර්වලතා පිළිබඳව යම් සාකච්ඡාවක් කරලා, ඒ අඩුපාඩු නිවැරදි කර ගනිමින් කටයුතු කරන්න. ලබන මාසයේ දෙවැනිදා මේ පාර්ලිමේන්තු සංකීර්ණය ඇතුළේම එය ක්‍රියාත්මක කරන්න දින යොදාගෙන තිබෙනවා. ඒ නිසා සමාජය හිතාගෙන ඉන්නවා වාගේ, ගෙන්වලා කෑ ගහලා යවන ආකෘතියක් නොවෙයි අපේ තිබෙන්නේ. අපි ඒවා සංවර්ධනාත්මකව ගොඩ නඟන්න මැදිහත් වන ආයතනයක් ලෙසයි කටයුතු කරන්නේ.

විශේෂයෙන් ඒ ආයතන තෝරා ගැනීමේ ක්‍රියාවලිය ගත්තොත්, දැනට randomly තමයි තෝරා ගන්නේ. ආයතන නාම ලේඛනයෙන් නමක් තෝරාගෙන තමයි අපි කැඳවන්නේ. හැබැයි ඒ තත්ත්වයෙන් වෙනස් වෙලා, යම් විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව කෝප් කමිටුව වෙත ආයතන කැඳවා ගැනීමේ ආකෘතියක් අප මේ දවස්වල ඉදිරිපත් කරමින් ඉන්නවා. ඒ ආයතන 457න් බොහෝ ආයතන දන්නවා, තමන් කෝප් කමිටුව හමුවට කැඳවෙන්නේ නැහැ කියලා. මොකද, කාලය, ඒ සඳහා වැය කරන්න පුළුවන් ශ්‍රමය -සියල්ල- සැලකිල්ලට ගත්තාම බොහෝ ආයතන විශ්වාස කරනවා, අපි නම් ඕවාට එන්නේ නැහැ කියලා. හැබැයි, අපි දැන් විශේෂයෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ත්‍රෛවාර්ෂික වාර්තාව පදනම් කරගෙන, සියලු ආයතනවලට අදාළව මේ වන විට ලිඛිත පරීක්ෂණ ආරම්භ කරලා තිබෙනවා. ඔවුන්ට ඒ සඳහා පිළිතුරු දෙන්න දින නියම කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි මේ වන විට කෝප් කමිටුවේ ලිපි ශීර්ෂය යටතේ ඔවුන්ට -ආයතන 457ටම- දැනුම් දීලා තිබෙනවා.

ඒ වාගේම ඒ ආයතනවල තිබෙන පොදු ව්‍යුහාත්මක කරුණු පිළිබඳව අපි විශේෂ online assessment එකක් සූදානම් කරලා තිබෙනවා. එතකොට ඒකෙන් ලැබෙන ලකුණුත්, ඒ වාගේම අර ත්‍රෛවාර්ෂික වාර්තාව පදනම් කරගෙන සිදු කරන ලිඛිත පරීක්ෂණයේදී ඔවුන් විසින් ලබා දෙන ලිඛිත සටහනුත් මත පදනම්ව අපි කමිටුවක් ලෙස ඒකාබද්ධ වෙලා කරනු ලබන විමර්ශනවලත් ප්‍රතිඵලයක් වශයෙන් තමයි මින් ඉදිරියට කෝප් කමිටුව හමුවට ආයතන කැඳවන්න යෝජනා කරන්නේ.

ඒ වාගේම මේ වන විට අපි ආයතන 14ක් පූර්ණ වශයෙන් විමර්ශනය කරලා තිබෙනවා. අපි හඳුනාගෙන තිබෙනවා, විශේෂ කාරණා ගණනාවක්. විශේෂයෙන්ම ඒ ආයතන යම් පනතක් හෝ ලිඛිත නීතියක් මත පිහිටුවා තිබෙන්නේ. ඒ පනතේ හෝ ලිඛිත නීතියේ තිබෙන යම් වගන්ති, එක්කෝ ඔවුන්උල්ලංඝනය කරනවා; එක්කෝ වැරදි ලෙස අර්ථකථනය කරමින් ක්‍රියාමාර්ග ගන්නවා; එක්කෝ නොසලකා හරිනවා. එවැනි වැරදි ගණනාවක් මත තමයි මුදල් අවභාවිතවීම් සිදු වෙන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, LRC එක තමන්ගේ පනතේ සඳහන් නොවන, තමන්ගේ පනත මඟින් බලය පැවරිලා නැති කාර්යයක් වන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ක්‍රියාවලියකට අත ගැහුවා. ඒ පිළිබඳව කරුණු ඉදිරියේදී සාකච්ඡාවට සම්බන්ධ වන අපේ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා විසින් ඉදිරිපත් කරයි.

නමුත්, මූලික අදහසක් විධියට තිබෙන්නේ එම ක්‍රියාවලිය කරන්න, ඒ අදාළ අමාත්‍යවරයා කොහොමද මේ LRC කියන ආයතනය මෙහෙයවූයේ කියන එක. අර පනතට පිටින් වැඩ කරන්න කොහොමද මේ කාරණයට මෙහෙයවූයේ කියන කාරණය අපි මේ ක්‍රියාවලිය තුළ අනාවරණය කරගෙන තිබෙනවා. එම ආයතනයම ගත්තත්, මේ හදලා තිබෙන පනතේ වගන්තියක් තිබෙනවා, එම සේවකයන්ට නේවාසික පහසුකම් සැලසිය යුතුයි කියලා. හැබැයි ඒ වෙනුවට කරන්නේ LRC එක සතුව තිබෙන ඉඩම්වලින් පර්චස් දහය ගණනේ බෙදා දෙනවා, වැඩි මුදලකට විකුණා ගන්න. එවැනි වැරදි අර්ථකථන - misinterpretations - කර ගැනීම් හරහා එම පනත හෝ ලිඛිත නීතිය ඉක්මවා කටයුතු කරන ආකාරයක් අප දැක්කා.

ගරු කථානායකතුමනි, බොහෝ ආයතනවලට සංයුක්ත සැලැස්මක් තිබිය යුතු වුවත්, එක්කෝ සංයුක්ත සැලැස්මක් නැහැ; එක්කෝ සංයුක්ත සැලැස්ම සකස් කරලා තිබෙන්නේ බාහිර පාර්ශ්වයක් විසින්. එය outsource කරලා තමයි හදලා තිබෙන්නේ. එම නිසා සමහර අවස්ථාවල ඔවුන්ට සංයුක්ත සැලැස්මේ තිබෙන කරුණු පිළිබඳව අවබෝධයක්වත් නැහැ. සංයුක්ත සැලැස්ම rolling plan එකකුත් නොවෙයි. ඊළඟ වර්ෂ පහ සඳහා හැම විටම සංයුක්ත සැලැස්ම තිබිය යුතු වුවත්, එසේ සකස් කර ගැනීමක් ඇත්තේම නැහැ. ඒ සංයුක්ත සැලැස්මට පදනම් වෙලා වාර්ෂික සැලැස්මක්, ඒ මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මක්, ඒ මත පදනම් වුණු ප්‍රසම්පාදන සැලැස්මක් ඔවුන් සතුව බොහෝ අවස්ථාවල නැහැ. අපි ඔක්තෝබර් මස 02වැනි දා සියලුදෙනා කැඳවලා ඒ අඩුපාඩු සම්බන්ධව සාකච්ඡා කරනවා.

ඊළඟ කාරණය තමයි, විශේෂයෙන්ම එම ආයතනවල අභ්‍යන්තර විගණනය. අපි විගණන ක්‍රියාවලියට විශේෂ සැලකිල්ලක් දක්වන ආණ්ඩුවක් විධියටම තමයි මේ කාරණයත් මතු කර ගන්නේ. විශේෂයෙන්ම ඒ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා. ඉතාම යට ගිය ක්‍රියාවලියක් විධියට තමයි මේ ක්‍රියාවලිය තිබෙන්නේ. විශේෂයෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන ක්‍රියාවලියත්, අභ්‍යන්තර විගණන ක්‍රියාවලියත් අතර නිසි සම්බන්ධීකරණයක් නැහැ; සම්බන්ධයක් නැහැ. ඒ නිසා අපි උත්සාහ කරමින් ඉන්නවා, ඉතා විනිවිදභාවය සහිත ක්‍රමයක් එකතු කර ගන්න; ආයතනවල අභ්‍යන්තර විගණනය ශක්තිමත් කරමින්, එය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් අතර සහසම්බන්ධයක් ගොඩනඟන්න.

මෙවැනි ගැටලු තිබෙන අතරේ සමහර SOEs විගණන ක්‍රියාවලියෙන් ඉවත්වීම සඳහාම වැඩ කරමින් ඉන්න බවත් විශේෂයෙන් කියන්න ඕනෑ. එවැනි ආයතන කිහිපයක් අපි මේ ක්‍රියාවලිය ඇතුළේ දකිනවා. උදාහරණයක් කිව්වොත්, අපි පසුගිය දවස්වල පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවට කැඳෙව්වා, මහපොළ භාරකාර අරමුදල. එම අරමුදලෙන් දුන් රුපියල් මිලියන 500කුත්, අරන් දීපු රුපියල් මිලියන 175ක ණයකුත් පාවිච්චි කරලා SLIIT එක ගොඩනඟලා තිබුණා. හැබැයි ගිවිසුම් කිහිපයක් හරහා SLIIT එක මුළුමනින්ම විගණකාධිපතිතුමාගේ නිරීක්ෂණ ලබාගත නොහැකි වන ලෙස ගලවා ගෙන තිබෙනවා. එහෙම කොහොමද කරන්නේ? පාර්ලිමේන්තුවට තිබෙනවා මහජනතාවගේ ධනය - public funds - පිළිබඳ සම්පූර්ණ වගකීමක්. එතකොට ඒ වගකීමෙන් ගලවන්න විධියක් නැහැ. හැබැයි, ඔවුන් යම් ගිවිසුම් කිහිපයක් හරහා කුමන්ත්‍රණකාරී ලෙස එම ආයතනයේ පරිපාලනය ගලවා තිබෙනවා. දැන් ඒකේ ණය ගෙවනවා. රජයේ අරමුදල් සහ ඉඩම භාවිත කරලා ආයතනයක් ගොඩනඟලා, එම ආයතනයට ලැබෙන මුදල් ටිකෙන් අර ණය ගෙවලා, දැන් ඒකේ ලාභය පෞද්ගලික කණ්ඩායමක් අතට යනවා. එහෙම තත්ත්වයක් රටේ තිබෙන්නේ. මේ, එක ආයතනයක් ගැන මම කිව්වේ. එම ආයතනයේ ක්‍රියාකාරිත්වය රටට හොඳයි. හැබැයි, මේ මහජන මුදල් අවභාවිත කරන ක්‍රමය නවතින්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, මට තව විනාඩි කිහිපයක් දෙන්න.

පසුගිය දවසක අපි සාකච්ඡා කළා, Lanka Transformers Limited එක පිළිබඳව. විදුලිබල මණ්ඩලය - CEB එක - සතුව ඔවුන්ගේ කොටස්වලින් සියයට 63ක් තිබුණා. ඒ වාගේම තවත් පෞද්ගලික ආයතනයක් සතුව සියයට 27ක් තිබුණා.

හැබැයි, LTL එකේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කොටසකටම ඒ LTL එකේ තිබෙන දේපොළ උගසට තියලා ලබා ගත්තු ණයක් හරහා වෙනම පෞද්ගලික ආයතනයක් ගොඩනඟන්න සහ අර කියපු ඉතිරි කොටස් සියයට 27 මිල දී ගන්න අවස්ථාව සලසනවා. ඊට පස්සේ ඒ සමාගමත් මැදිහත් වෙලා තවත් සමාගම් ගොඩනඟමින් අර CEB එක සතුව තිබුණු සියයට 63 ප්‍රමාණය අඩු කර ගන්නවා. අඩු කරගෙන ඊට පස්සේ කියනවා, "අපි විගණනයට එන්නේ නැහැ. විගණකාධිපතිවරයාට මේක නිරීක්ෂණය කරන්න අයිතියක් නැහැ" කියලා. එහෙම කොහොමද කියන්නේ? ඒවා රාජ්‍ය දේපොළ; මහ ජනතාවගේ ධනය. හැබැයි, ඔවුන් ඒක අවභාවිත කරමින් ඉන්නවා.

ඒ වාගේම තමයි, අපි සහාගත කළ සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේ වාර්තාව පිළිබඳවත් අද දවසේ විශේෂයෙන් සාකච්ඡා කරන්න ඕනෑ. 2007 වර්ෂයේ ඉඳලා සැලසුම් සකස් කරනවා ගුවන් මගී ධාරිතාව වැඩි කරන්න. 2017දී තමයි යන්තම් ගිවිසුමක් අත්සන් කර තිබෙන්නේ. එහිදී මිලියන 6 ඉඳලා මිලියන 12 දක්වා මගී ධාරිතාව වැඩි කරන්න සැලසුම් සකස් කරනවා. ටික දවසක් යනකොට ඒක නොවෙයි කියනවා; ආයෙත් වැඩි කරනවා; ආයෙත් සැලසුම් හදන්න කියනවා; ආයෙත් වැඩි කරනවා. එහෙම එහෙම වෙනස් කරමින් ගිහිල්ලා දැවැන්ත මුදලක් -රුපියල්වලින් කොටස විතරක් ගත්තත්, රුපියල් මිලියන 1,672.8ක්- වැය කර තිබෙනවා. ඊට අමතරව USD සහ ජපන් යෙන් මුදල් ප්‍රමාණයකුත් ගෙවා තිබෙනවා. දැවැන්ත කාලයක් ගත වෙලා තිබෙනවා. 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වසර 10ක පමණ කාලයක් සැලසුම් සකස් කරමින් විතරක් ඉන්නවා, රටේ මහ ජනතාවගේ ධනය, දේපළ සහ කාලය විනාශ කරමින්. ඊට පස්සේ ගොඩනැඟුවා ව්‍යාපෘතියක්. ඒ ව්‍යාපෘති දෙකම අතිශය අසාර්ථකයි. දැන් තමයි ඒවා ක්‍රමානුකූල කරන්න උත්සාහ කරන්නේ. හදලා තිබෙනවා, ගුවන් යානා නැවතුම් අංගණයක්. තවම එහි ගුවන් යානා නවත්වන්න බැහැ. හදන්න ගිහින් තිබෙනවා, මගී පර්යන්ත ගොඩනැඟිල්ලක්. සියයට 5යි වැඩ ඉවර වුණේ. සියයට 30ක විතර මුදල් ගෙවලා තිබුණා. එහි වැඩ නැවතිලා තිබෙනවා. දැන් තමයි එය restart කරන්න පටන් ගෙන තිබෙන්නේ. ඒ, මේ ආණ්ඩුව ආවාට පසුවයි. හැබැයි, ඒ විධියට විනාශ කරපු ධනයක් තිබෙනවා. මෙන්න මේ මහජන ධනය විනාශ කරන ක්‍රියාවලිය මුළුමනින් නැවැත්විය යුතුයි.

අද උදේත් මේ පාර්ලිමේන්තුවේදී සමහර ගරු මන්ත්‍රීවරු තර්ක කරමින් කියන්න උත්සාහ කළා, මේ මඟින් විශේෂයෙන් මේ රටේ රාජ්‍ය සේවකයන් අධෛර්යයට පත් වෙනවා කියලා. මේ විමර්ශන හරහා අධෛර්යයට පත් විය යුතු කණ්ඩායමක් ඉන්නවා. මෙවැනි වැඩ කරපු කණ්ඩායම අධෛර්යයට පත් විය යුතුයි. ඒක කිසිදු පැකිළීමක් නැතිව ආණ්ඩුවක් ලෙස අපි ප්‍රකාශ කරනවා. හේතුව, ඔවුන් අධෛර්යයට පත් වෙන්නේ නැත්නම් අධෛර්යයට පත් වන්නේ, නිවැරැදි ලෙස මේ අණ පනත්වලට අනුව තමන්ගේ කාලය, ශ්‍රමය, ධනය පවා පෞද්ගලිකවත් වැය කරමින් මේ රටේ සංවර්ධනයට වෙනුවෙන් දායක වන රාජ්‍ය සේවකයනුයි. අප විශ්වාස කරන්නේ ඔවුන් ධෛර්යයට පත් වෙන්න ඕනෑ කියලායි. ඔවුන් ධෛර්යවත් විය යුතුයි. හැබැයි, මෙතෙක් කාලයක් පැවැති ආණ්ඩු විසින් පවත්වා ගෙන ගිය ක්‍රමය යටතේ, වංචනික ලෙස කටයුතු කරපු ඉතා සුළු පිරිසක් ධෛර්යයට පත් කර තිබුණා, සැබෑ ලෙස මේ රටේ සංවර්ධනය වෙනුවෙන් පෙනී සිටින රාජ්‍ය සේවකයා අධෛර්යයට පත් වන විධියට. අපි ඒක අනෙක් පැත්ත හරවමින් ඉන්නවා. දැන් අපි අධෛර්යයට පත් කරනවා, එවැනි හොරකම්, වංචා, නාස්ති, දූෂණ වෙනුවෙන් මැදිහත් වෙච්ච, ඒ වෙනුවෙන් කටයුතු කරපු නිලධාරින්. අපි ධෛර්යවත් කරමින් ඉන්නවා, මේ ක්‍රියාවලිය ඇතුළේ ඊට හාත්පසින් විරුද්ධ ලෙස මේ රටේ මහ ජනතාවගේ ධනය ආරක්ෂාව වෙනුවෙන් කාලය, ශ්‍රමය, ධනය කැප කරපු නිලධාරින්. අපි ඔවුන් දිරිමත් කරනවා. අපි ඔවුන්ට කියනවා ඔබ කිසිසේත් මේ විගණන ක්‍රියාවලිය පිළිබඳව කිසිදු බයක් සැකක් තියා ගන්න ඕනෑ නැහැ කියලා. අපි මේ සම්බන්ධයෙන් ඉතා නිවැරැදිව කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම, අපි ඉදිරි කාලය ඇතුළත මේ රටේ මෙතෙක් කල් දැවැන්ත අඩු පාඩුවක් වෙලා තිබුණු නිවැරැදි විධියට කරන කාර්ය සාධන විගණන ක්‍රියාවලියත් ආරම්භ කළ යුතුව තිබෙනවා. ඒ වාගේම පරිසර විගණනයන්ද - environmental audits - කළ යුතුව තිබෙනවා. ඒ ගැන තමයි කලිනුත් කථා කළේ. කාර්යක්ෂම ලෙස වැඩ කරන, මහ ජනතාවගේ මුදල් අවභාවිත නොකරන රාජ්‍ය යන්ත්‍රණයක් නිර්මාණය කිරීම වෙනුවෙන් තමයි මේ රටේ ජනතාව අපේ ආණ්ඩුව පත් කළේ. අපි ඒ වගකීම ඉෂ්ට කරමින් ඉන්නවා; COPE එකට පැවරිලා තිබෙන සමස්ත කාර්යභාරය ඇතුළේ අපි මේ වන විට ඒ මුළු කාර්යයටම අත තියලා තිබෙනවා.

අපි මේ රටේ ජනතාවට සතුටින් ප්‍රකාශ කරනවා, ඉදිරි කාලය තුළ, මෙතෙක් කල් මේ රටේ කරපු හොරකම්, වංචාව, නාස්තිය, දූෂණය ආදි සියල්ල නැවතුණු, ඒ සියල්ල වෙනුවට මේ රටේ මහ ජනතාවගෙන් කොටසක් වන රාජ්‍ය නිලධාරින් ඇතුළු රාජ්‍ය සේවකයන් සියලු දෙනා කාර්යක්ෂම ලෙස වැඩ කරන, වංචාව, හොරකම, නාස්තිය, දූෂණයෙන් වැළකුණු ඉතාම හොඳ රාජ්‍යයක් අප ඉදිරියේ නිර්මාණය වන බව. අපි විපක්ෂයේ සියලු කණ්ඩායම්වලිනුත් ඉල්ලීමක් කරනවා, අද දවසේ මේ මාතෘකාව වෙනත් පැතිවලට ගෙන යන්නේ නැතිව මේ මාතෘකාවට අදාළවම කථා කරමු කියලා. අද දවසේ සිදු වන මේ සාකච්ඡාව විශේෂ වැදගත්කමක් තිබෙන සාකච්ඡාවක් කොට සලකා මේ සාකච්ඡාවට තමන්ගේ කරුණු දැක්වීම කරන්න කියාත් ඉල්ලා සිටිනවා. මේ සඳහා මේ රටේ සමස්ත ජනතාවගේ සහාය ද අපේක්ෂා කරමින් මම නිහඬ වෙනවා, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. M.K.M. Aslam. You have nine minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.40]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තුතියි මට මේ අවස්ථාව ලබා දුන්නාට. අපේ COPE එකේ ගරු සභාපතිතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා.

මගේ කථාව පටන් ගන්න ප්‍රථමයෙන් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. බදාදා රාත්‍රි කාලයේ අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැල්සිරිපුර "නා උයන" ආරණ්‍ය සේනාසනයේ සිදු වෙච්ච ඒ අනතුර ගැන අපි කම්පාවට පත් වෙනවා. එම අනතුරින් මැල්සිරිපුර ආරාමයේ බෞද්ධ දර්ශනය දීර්ඝ ලෙස අධ්‍යයනය කරමින් සිටින අපේ ස්වාමීන් වහන්සේලා හත්නමක් අපවත් වුණා. අපි සියලු දෙනා ආගම් භේදයෙන් තොරව ඒ පිළිබඳව කම්පාවට පත් වෙනවා. ඒ සිදුවීම සම්බන්ධයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියලුම ජනතාව වෙනුවෙන් මම ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ COPE එකේ සභාපතිතුමාගේ කථාවේදී එතුමා සඳහන් කළ පරිදි අපි COPE එක වෙනුවෙන් කණ්ඩායමක් තෝරා ගත්තා. අපි යම් යම් කරුණු කෙරෙහි අවධානය යොමු කළා. COPE එක විසින් තමන්ගේ ව්‍යුහය වෙනස් කිරීමට යම් යම් තීන්දු තීරණ ගන්න ඕනෑ කියන එක අපි දැක්කා. ඒ වාගේම, අපි පරීක්ෂාවට ලක් කරන්න, එහෙම නැත්නම් විභාග කරන්න කැඳවන ආයතන යම් විද්‍යානුකූල ක්‍රමවේදයකට අනුව තෝරා ගන්න ඕනෑ කියන තත්ත්වයත් අපි දැක්කා. අද කථිකයන් රාශියක් සිංහල භාෂාවෙන් කථා කරන්න නියමිතයි. එම නිසා ඔබතුමාගේ අවසරය ඇතිව මම දමිළ භාෂාවෙන් කථා කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது நாட்டில் அரசாங்கத்தால் முழுமையாக அல்லது பகுதியளவில் நிதியளிக்கப்பட்ட நிறுவனங்களின் கணக்குகளை monitor பண்ணுவதற்குச் சில அமைப்புகள் உள்ளன. அவற்றில் COPE முக்கியமான ஓர் அமைப்பாகும். நாங்கள் COPEஇன் உறுப்பினர்களாகத் தெரிவுசெய்யப்பட்ட பின்னர் முதலில் அவதானித்த விடயம் என்னவென்றால், குழு தனக்குள் சில மாற்றங்களை கொண்டுவர வேண்டும் என்பதைத்தான். ஏனென்றால், கடந்த காலங்களில் மூன்று மாதங்களுக்கு ஒருமுறை தொகையாக - wholesaleஆக- அறிக்கைகளைச் சமர்ப்பிப்பார்கள். அதன் பின்னர் அந்த அறிக்கைகள் வெறுமனே Libraryக்கு மட்டும்தான் போகும். அதுமாத்திர மன்றி, கணக்குகளைப் பரிசோதனை செய்வதற்காக அரச நிறுவனங்களைத் தெரிவுசெய்வதற்கான ஓர் ஒழுங்கும் காணப்படவில்லை. மேலும், நிறுவனங்களின் கணக்கு களைப் பரிசோதனைக்கு உட்படுத்தும்போது சில பொதுவான பிரச்சினைகளையும் நாங்கள் கண்டறிந்தோம். விசாரணைகளை மேற்கொண்டு அறிக்கை சமர்ப்பித்த பின்னர், ஊழல்வாதிகளுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதற் குரிய சட்ட ஏற்பாட்டையும் நாங்கள் உருவாக்க வேண்டும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැකලා තිබෙනවා නේ පාසලේ පන්ති කාමරවල අවසාන row එකේ ඉන්න ළමයි. ඒ ළමයි සමහර වෙලාවට කියනවා, පුළුවන් නම් මට උගන්වලා පෙන්නන්න කියලා. ඒ වාගේ, කෝප් කමිටුවට එන සමහර නිලධාරින්, පුළුවන් නම් අපෙන් උත්තර ගන්න බලන්න; අපෙන් කරුණු ගන්න බලන්න කියනවා වාගේ ගල් ගැහිලා ඉන්නවා. අපි මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. අපේ රටේ බොහෝ රාජ්‍ය නිලධාරින් ඉතාම කාර්යක්ෂමව, ඉතාම විනිවිදභාවයෙන් යුතුව, නිර්දේශපාලනිකව, නිර්ආගමිකව කටයුතු කරනවා. හැබැයි, ඇතැම් නිලධාරින් ඒ තත්ත්වයේ නැහැ කියන එකත් අපි කියන්න ඕනෑ.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உண்மையிலேயே COPEஇல் எவ்வாறான மாற்றங்களைக் கொண்டுவர வேண்டும் என்பதைப் பார்ப்போம். COPEக்கு விஞ்ஞான ரீதியாக நிறுவனங்களைத் தெரிவுசெய்து அழைக்க வேண்டும். அதேநேரம், அந்த நிறுவனங்களுக்குள் என்ன பிரச்சினைகள் காணப்படுகின்றன என்பதையும் நாங்கள் கண்டறிய வேண்டும். மிக முக்கியமாக, நிறைய ஊழலுக்குப் பின்னால் அரசியல்வாதிகள்தான் இருக்கிறார்கள். அரசியல்வாதிகள் சில விடயங்களைச் சாதிப்பதற்காக தன்னிச்சையாகச் சில முடிவுகளை எடுத்துவிட்டு, அவற்றை நடைமுறைப்படுத்து மாறு அரச அதிகாரிகளை கட்டாயப்படுத்துகிறார்கள். நாங்கள் COPEக்கு National Youth Corpsஐ அழைத்தோம்; NMRAஐ அழைத்தோம்; AASLஐ அழைத்தோம். கஞ்சனவாக இருக்கலாம், மனுஷவாக இருக்கலாம், வேறோர் அரசியல் வாதியாக இருக்கலாம், இந்நிறுவனங்களை விசாரணை செய்கையில் அரசியல் இலாபத்துக்காகத் தீர்மானங்கள் எடுக்கப்பட்டுள்ளமை தெளிவாகத் தெரிந்தது. அரச அதிகாரிகளை எடுத்துக்கொண்டால், குறிப்பிட்ட சிலர்தான் ஊழலுக்கு உடந்தையாக இருந்திருக்கிறார்கள். அரச அதிகாரிகளின் உதவி இல்லாமல் ஊழல் நடைபெறுவதில்லை என்பது வெளிப்படையாகத் தெரிகின்றது.

அரச நிறுவனங்களில் உள்ளகக் கணக்காய்வாளர் தெரிவானது மிகவும் பிழையான முறையிலேயே இடம்பெற் றுள்ளது. சில அரச நிறுவனங்களில் பல மாதங்களாக உள்ளகக் கணக்காய்வாளர் இல்லாத நிலைமை காணப்படுகின்றது. மேலும், உள்ளகக் கணக்காய்வாளர், கணக்காய்வாளர் நாயகத்துடன் எந்தத் தொடர்புமில்லமால் தன்னிச்சையாகச் செயற்பட்டிருப்பதை நாங்கள் கண்டறியக்கூடியதாக இருந்தது. நான் ஆரம்பத்தில் குறிப்பிட்டதுபோல, COPEஇன் அறிக்கை இனிமேல் Libraryக்கு மாத்திரம் செல்லாது. COPE தொடர்பில் சட்டத்திருத்தங்களைக் கொண்டுவந்து, Standing Ordersஐ மாற்றி, ஊழல்வாதிகளுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுத்த பின்னர்தான் அக்குழுவின் அறிக்கையைச் சமர்ப்பிப்போம் என்பது எம் அனைவரினதும் முக்கிய நோக்கமாக உள்ளது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மாண்புமிகு சனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் பொதுச் சபையின் 80ஆவது கூட்டத்தொடரில் பேசிய விடயங்கள் தொடர்பில் நான் இங்கு கருத்துத் தெரிவிக்க வேண்டும். அவர் அங்கு ஊழலுக்கு எதிராகவும் வறுமைக்கு எதிராகவும் போதைப் பொருளுக்கு எதிராகவும் பேசியுள்ளார். மிக முக்கியமாக, பலஸ்தீனத்துக்காகக் குரல்கொடுத்து இருக்கிறார். பலஸ்தீன் விவகாரம் தொடர்பில் மிகவும் உணர்வுபூர்வமான கருத்துக்களையும் தெரிவித்திருக்கிறார்.

பாராளுமன்றத்தில் ஐக்கிய மக்கள் சக்தியின் ஒரு குழுவினர் பலஸ்தீனுக்காக முதலைக்கண்ணீர் வடித்ததை நாங்கள் பார்த்தோம். அக்கட்சியின் உறுப்பினரான சுஜீவ சேனசிங்ஹ பலஸ்தீன் நட்புறவுச் சங்கத்தை உருவாக்குகிறார். இவர்கள் இரட்டை வேடத்துடனேயே செயற்படுகின்றார்கள். பாராளு மன்றத்துக்கு உள்ளேயும் வெளியேயும் மாற்றத்தைக் கொண்டுவரக்கூடிய வகையில் தேசிய மக்கள் சக்தியினர் செயற்படுகின்றனர். மாண்புமிகு சனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் பொதுச் சபையின் 80ஆவது கூட்டத்தொடரில் பலஸ்தீனுக்காகக் குரல்கொடுத்து முஸ்லிம்களை கௌரவித்துள்ளார். மேலும், பலஸ்தீனில் முஸ்லிம்களுக்கு

நடைபெறுகின்ற அநியாயத்துக்கு எதிராகக் குரல்கொடுத் திருக்கிறார். இதனை நாங்கள் முக்கியமானதொரு மைல்கல்லாகவே பார்க்கின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது நாட்டில் Cabinet அமைச்சர்களாக முஸ்லிம்கள் பலர் இருந்திருக் கிறார்கள். ஆனாலும், முஸ்லிம்களின் பிரச்சினைகள் அவர்களுக்குப் பிரச்சினையாகத் தெரியவில்லை. நேற்றைய தினம் நடைபெற்ற கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் எடுக்கப்பட்ட முக்கியமானதொரு தீர்மானத்தை நான் இந்தச் சபையில் கூற விரும்புகின்றேன். அதாவது, முஸ்லிம் மாணவிகள் தங்களது கலாசாரத்தைப் பேணக்கூடிய வகையிலான ஆடைகளை அணிந்து, சிங்களம், தமிழ், ஆங்கில மொழிமூல பாடசாலைகளுக்குச் செல்ல முடியுமென்ற முக்கியமானதொரு தீர்மானம் கௌரவ பிரதம அமைச்சர் ஹரினி அமரசூரிய அவர்களால் எடுக்கப்பட்டது. இந்த நிலைமையை நாங்கள் கடந்த பல வருடங்களாக இந்த நாட்டில் காண முடியவில்லை.

2019ஆம் ஆண்டு நடைபெற்ற Easter attackக்குப் பின்னர், சில Provincial Directors தன்னிச்சையாக முடிவுகளை எடுத்து, பாடசாலை சீருடை விடயத்தில் முஸ்லிம்களின், தமிழர்களின், சிங்களவர்களின் கலாசாரத்துக்கு இடமளிக்கக் கூடாதென Zonal Directorsக்கு Circular அனுப்பி இருக்கிறார்கள். இந்த நிலையை மாற்றி, இனிவரும் காலங்களில் முஸ்லிம் மாணவிகள் பாடசாலைக்குத் தமது கலாசாரத்தைப் பேணி ஆடைகளை அணிந்து செல்லக்கூடிய வாய்ப்பை தேசிய மக்கள் சக்தி அரசாங்கம் வழங்கியுள்ளது என்பதை நான் மிகவும் சந்தோஷத்துடன் தெரிவித்து விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Nalin Bandara. You have 12 minutes.

[පූ.භා. 11.50]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, COPE වාර්තාව පිළිබඳව තමයි අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළේ. ඒ පිළිබඳව වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

මේ COPE වාර්තාවෙන් ආයතන කිහිපයක් ගැන කථා කළා. ලංකා විදුලිබල මණ්ඩලයට කොටස් සතු LTL එක ගැනත් අද කථා කළා අපි දැක්කා. හැබැයි අපට කියන්න තිබෙන්නේ, LTL එක අද අපේ රටේ තිබෙන හොඳ model එකක් කියලායි. ඔවුන් සතුව දේශීය සහ විදේශීය විදුලි බලාගාර තිබෙනවා. ඔවුන් සතුව හොඳ තාක්ෂණයක් තිබෙනවා, හොඳ කණ්ඩායමක් ඉන්නවා. ඒ වාගේම ඔවුන් රජයට dividends දීලා තිබෙනවා, ආදායම් දීලා තිබෙනවා, බදු ගෙවලා තිබෙනවා. මේ හැම අතින්ම ගත්තාම, අපේ රටට බරක් නොවුණු හොඳ model එකක් විධියට තමයි අපි LTL ආයතනය දකින්නේ. COPE එකට LTL එක සම්බන්ධ යම් ප්‍රශ්න කිරීමක් කරන්න ඕනෑ නම්, විදුලිබල මණ්ඩලයට ඒවාට උත්තර දෙන්න පුළුවන්. විදුලිබල මණ්ඩලයේ නිලධාරින් ඇවිල්ලා ලිස්සලා ගිහිල්ලා හරියන්නේ නැහැ. එක පැත්තකින් විදුලිබල මණ්ඩලය LTL එක පිළිබඳව jealous. මොකද, විදුලිබල මණ්ඩලය ඉබි ගමනේ යද්දී අද LTL එක ජාත්‍යන්තරය ජය අරගෙන තිබෙනවා. LTL එක ලෝක වෙළඳ පොළේ විදුලි බලාගාර ක්ෂේත්‍රයේ ලොකු ඉඩකඩක් විවර කරගෙන තිබෙනවා. ඒ නිසා විදුලිබල මණ්ඩලය LTL *එකට* jealous කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

ඒ වාගේම මෙතැනදී කියැවුණා, ඒ සේවකයන් සතු කොටස් උගසට තියලා සමාගමක් ගොඩනැඟුවා කියලා. ඇත්තටම ඒ කොටස් ඒ සේවකයන්ට ලැබුණේ කොහොමද? කලින්, LTL එකේ බදු සමාගමක් තමයි ABB එක. ඒ, ජාත්‍යන්තර සමාගමක්. ABB ආයතනය LTL එකේ JV එකක් විධියට තමයි ක්‍රියාත්මක වුණේ. ඔවුන් - ABB එක - අපේ රටින් යද්දී ඔවුන් සතු කොටස් එතැන හිටපු සේවකයන් 150කට විතර ගන්න අවස්ථාව උදා වුණා. ඉතින්, ඒ අවස්ථාව තමයි ඔවුන් ලබා ගත්තේ. මේ ආණ්ඩුව නිතරම කොරහේ කිඹුල්ලු දකිනවා. පෞද්ගලික ව්‍යවසායකයන් දිහා බලන්නේ වපර ඇහෙන්. රජය සතු අර්ධ සමාගම් දිහා බලන්නේ වපර ඇහෙන්. වැඩි ආදායම් ලබන අය දිහා බලන්නේ වපර ඇහෙන්. රජයට ආදායම් ගේන අය දිහා - ඔවුන් මීට වඩා ආදායම් ගේනවා කියලා හිතලා - බලන්නේ වපර ඇහෙන්. ඒකත් මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම COPE එකෙන් පරණ ඒවා විතරක් නොවෙයි, වර්තමානයේ ඒවාත් බලන්න ඕනෑ. අපි දන්නවා, පිල්ලෙයාන්ගේ ගෝලයෙක් LRC එක සතු, පාසිකුඩාවල ඉඩම් අක්කර 250ක් අරගෙන තිබුණු බව. ඒ LRC එක සතු ඉඩම් නැවත ලබා ගන්න කියලා LRC එකේ සභාපතිවරයාට නියෝගයක් ලැබිලා තිබෙනවා. අවුරුද්දක් ගත වෙලා තිබෙනවා, ඒ සභාපතිවරයා ඒ ඉඩම් අත්පත් කර ගෙන තිබෙනවාද? තවම අත්පත් කරගෙන නැහැ. ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවායේ වංචා, දූෂණ තිබෙන නිසා තමයි අද මේ විධියට කටයුතු සිද්ධ වෙන්නේ. ඒ වාගේ බරපතළ ගැටලු පිළිබඳව තවදුරටත් අපට ප්‍රශ්න කරන්න සිද්ධ වෙනවා.

වරාය අධිකාරිය ගත්තොත්, කන්ටේනර් තුන්සිය විසි ගණනක් පිට කර තිබුණා. ඒ ගැන ප්‍රශ්න කෙරෙනවාද, පරීක්ෂණ පවත්වනවාද, COPE එකට ගෙන්වනවාද කියලා අපි අහනවා. මීද්දෙනියේදී හමුවුණු රතු එළි දැක්වුණු කන්ටේනර් දෙක පිළිබඳව විදේශ ඔත්තු සේවා warn කර තිබුණා; ඒ පිළිබඳව අවධානය යොමු කර තිබුණා. විදේශ බුද්ධි සේවා මේ ගැන කියලත්, red lights පත්තු කරලත්, අපේ රටට බැරිව ගියා ඒවා අල්ලා ගන්න. එහෙම ම තමයි පාස්කු ප්‍රහාරයටත් වුණේ. විදේශ බුද්ධි සේවා වැඩේ ගැන දැනුවත් කළා. නමුත්, අල්ලා ගන්න බැරිව ගියා. ඒ නිසා අපට පේනවා, මේ ආණ්ඩුවත් කළ යුතු දේවල් නොවෙයි කරන්නේ කියලා.

පසුගිය කාලයේ crude oil විශාල ප්‍රමාණයක් අපේ රටට ආනයනය කළා. Crude oil bottle කරලා දෙන්න බැහැ. ඒවා bottle කරනවා නම් refine කරලා තමයි කරන්න ඕනෑ. හැබැයි ඒ වාසිය අරගෙන, VAT එක, CESS එක ගෙවන්නේ නැතුව රුපියල් බිලියන 5ක් වාගේ විශාල මුදලක් අය විය යුතු ගනුදෙනුවක් සිදු වුණා. ඒ පිළිබඳව පසුගිය කාලයේ කථා කළා. අගමැතිතුමිය කිව්වා, ඒවා අත්පත් කරගන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැනුවත් කරලා තිබෙනවා කියලා. හැබැයි, මේ දක්වා ඒවා අත්පත් කර ගෙන නැහැ. එයට අදාළ ලියකියවිලි මම **සභාගත*** කරනවා.

අවුරුද්දක් ගත වෙලත් ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා මේ රජය මොනවාද කරන්නේ කියන එක පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

අද රට යන්නේ පොලිස් රාජ්‍යයකට. මේ රටේ නීතිය තමන්ගේ අතට ගන්න ඔබතුමන්ලා කටයුතු කරමින් ඉන්නවා. පොලීසියේ SIලා, IPලා සියයට වැඩි ප්‍රමාණයක් transfer කරලා තිබෙනවා. මොකද, තමන්ට වුවමනා පුද්ගලයන් ඒ ඒ තැන්වලට ස්ථානගත කරන්න. සමහර මහෙස්ත්‍රාත්වරු ඉල්ලා අස් වෙනවා. මට අද ආරංචි වුණා, බලපෑම්වලට යටත් වෙන්න බැරි නිසා හලාවත මහෙස්ත්‍රාත්වරයා ඉල්ලා අස්වෙන්න කටයුතු කරනවා කියලා. ඔබතුමන්ලා කොහේටද මේ යන්න හදන්නේ? පැරණි කොමියුනිස්ට්වාදී රටවල් කරපු විධියට අද කටයුතු කරන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතන්න එපා. අද එහෙම කරන්න බැහැ. නේපාලයේ කරන්න ගියේත් එහෙම නේ. එකින් එකට අත තියලා අන්තිමට ප්‍රජාතන්ත්‍රවාදයට අත තිබ්බාම වැඩේ වැරදුණා. අද සිටින තරුණයෝ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරනවා; ඔවුන්ට තිබෙන නිදහස අගය කරනවා. ඒ නිසා ඔබතුමන්ලා එකින් එකට අත තියමින් ගිහිල්ලා, යම් තැනකදී විනාශයක් කර ගන්න තමයි හදන්නේ.

අද රාජ්‍ය නිලධාරින් වැඩ කරනවාද බලන්න. අද රාජ්‍ය නිලධාරින් වැඩ කරන්නේ නැහැ. ඒ මොකද? රාජ්‍ය නිලධාරියෙක් සද්භාවයෙන්, ඉක්මනින් වැඩක් කළොත්, ඔබතුමන්ලාගේ චක්‍රලේඛවල නීතිරීතිවලට යටත්ව ඒ නිලධාරියාට හිරේ යන්න වෙනවා. ඒක තමයි අද වෙලා තිබෙන්නේ. COPE එකට ආවාම රාජ්‍ය නිලධාරින්ව අසරණ කරන එක තමයි කරන්නේ. රාජ්‍ය නිලධාරින්ව අසරණ කරන එක තමයි අද COPE එක කරන්නේ. පරීක්ෂණ පවත්වන්න, හොයලා බලන්න. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ ක්‍රියාවලිය තුළින් රාජ්‍ය නිලධාරින්ව අසරණ කරනවා කියලා අපට පෙනෙනවා. ඊයේ පෙරේදා නිකුත් කරන ලද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ පත්‍රිකාවකින් හෙළි වුණා, 2024 මැයි 25වන දා ඉඳලා 2025 මැයි 25වන දා දක්වා වෛද්‍යවරු, හෙද සහායක සේවයේ අය, තාක්ෂණ නිලධාරින් රට යෑම හරහා සිදු වූ මූල්‍ය අලාභය විතරක් බිලියන 12.5යි කියලා. නිලධාරින් රට යෑම නිසා ඒ සා විශාල මූල්‍ය අලාභයක් සිදුවෙලා තිබෙනවා. මොකද, ඔවුන් මේ විධියට රට යන්නේ? අද රෝහල්වල බෙහෙත් ටිකක් ගන්න තිබෙනවාද? අද, ජාතික රෝහලේ වේදනා නාශක පෙත්ත නැහැ. ප්‍රතිජීවකවලින් භාගෙට භාගයක් නැහැ. MOH එකේ කැල්සියම් පෙත්ත නැහැ, ගැබිනි මාතාවන්ට, අම්මලාට දෙන්න. ඔබතුමන්ලා කියනවා, බෙහෙත් තිබෙනවා කියලා. නමුත් බෙහෙත් නැහැ. ඊට අමතරව තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මේකයි. වෛද්‍යවරු වෙනදාට බෙහෙත් නැත්නම්, මෙන්න මේ බෙහෙත ෆාමසි එකෙන් ගන්න කියලා භය නැතිව ලියලා දෙනවා. නමුත්, අද වෛද්‍යවරු ෆාමසි එකෙන් ගන්න කියලා බෙහෙත් ලියන්නේ නැහැ. තිබෙන බෙහෙතක් දීලා යවනවා. මොකද, එහෙම කළේ නැත්නම් වෛද්‍යවරුන්ට හිරේ යන්න වෙනවා. මේ විධියට අද රෝහල් ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, හැම ක්ෂේත්‍රයකම සිටින නිලධාරින් වැඩ කරන්නේ නැහැ. නිලධාරින්ට අවංකව වැඩ කරන්න, සද්භාවයෙන් වැඩ කරන්න, වේගවත්ව වැඩ කරන්න අවශ්‍ය යන්ත්‍රණයක් මේ ආණ්ඩුවෙන් ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ ඇතුළේ සිද්ධ වෙන්නේ නැහැ. ඔවුන් භයයි. ඔවුන්ව භය කරලා තිබෙනවා.

මේ සේරම හොරු නොවෙයි. 225දෙනාම හොරු කිව්වා නේ. එහෙම නේ කිව්වේ. මේ රටේ ඉන්න සේරම හොරු නොවෙයි නේ. පාර්ලිමේන්තුවේ සිටින 225දෙනාම හොරු කිව්වා නේ. මේ පාර්ලිමේන්තුවේ නොවෙයි, ගිය පාර්ලිමේන්තුවේ. ඒකේ අපේ හරිනි අගමැතිතුමියත් හිටියා, ජනාධිපතිතුමාත් හිටියා, අපිත් හිටියා, ගයන්ත මන්ත්‍රීතුමාත් හිටියා, මනෝ මන්ත්‍රීතුමාත් හිටියා. හොරු නම් අපි තුන්දෙනාව හිරේ දමන්න එපැයි. සියලුම රාජ්‍ය නිලධාරින්ව භය කරලා, ඔවුන්ට වැඩ කරන්න දෙන්නේ නැතිව ඔවුන්ගේ කොඳු කඩලා මේ රට ඉස්සරහට අරගෙන යන්න බැහැ. අද ඒක බොහොම පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් රංග දිසානායක මහතා ගැන හිටපු JVP නායකයකු වන නන්දන ගුණතිලක මහත්මයා ඊයේ මොනවාද කිව්වේ? එතුමා කිව්වා, ඔහු JVP එකේ නීති කමිටුවේ හිටියා කියලා. මම දන්නා ආකාරයට නීති අංශයේ නායකයා විධියට හරි, ලේකම් විධියට හරි හිටපු නන්දන ගුණතිලක මහත්මයා තමයි එහෙම කිව්වේ. JVP එකේ නීති අංශයේ හිටපු ප්‍රධානියා කියනවා, JVP එකේ නීති අංශයේ හිටපු කෙනෙක් තමයි මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කියලා. *[බාධා කිරීමක්]* වටගල මහත්මයාත් හිටියාද? ඔන්න බලන්න. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන වෙන්න ඕනෑ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය දැන් කෝ? මේ සම්බන්ධව ආණ්ඩුව මොකක්ද කියන්නේ? ආණ්ඩුව මේක පිළිගන්නවාද? එතකොට අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ විසින් ක්‍රියාත්මක වෙන මර්දනයෙන්, ප්‍රතිවිරුද්ධ දේශපාලන ව්‍යාපාරවල සිටින අය මර්දනය කරන්න භාවිත කරන මෙවලමක් විධියට. මේක, මම අර කියපු ඔබතුමන්ලාගේ ඒකාධිපති පාලන ස්වරූපයේ එක කොටසක් විතරයි, තවත් එක අංගයක් විතරයි. ඒ නිසා අපිට කියන්න තිබෙන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අද දේශපාලනීකරණය වෙලා තිබෙනවා කියලායි. ආණ්ඩුව තමන්ගේ විරුද්ධවාදීන් මර්දනය කරන්න පාවිච්චි කරන ආයතන ගණනාවක් තිබෙනවා. ඒකෙන් එකක් බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අද පත් වෙලා තිබෙනවා.

මේ විධියට බලනකොට අපට බොහොම පැහැදිලියි, ආණ්ඩුව කටයුතු කරමින් යන්නේ කොමියුනිස්ට් පාලනයක් සඳහා කියන එක; one country, one party system එකක් මේකේ apply කරන්න හදනවා.

අපේ සභානායකතුමා කියනවා දැක්කා, හෙට අනිද්දා ඉඳලා vehicle number plates නිකුත් වනවා කියලා. මේ vehicle number plates contract එක දුන්නේ කාටද, මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි? මේ vehicle number plates contract එක දුන්නේ චීන සමාගමකට. එයාලාගේ qualifications fulfil වෙන විධියට match කරලා තමයි ටෙන්ඩර් එක හැදුවේ; ඒගොල්ලන්ගේ qualifications match කරලා තමයි ටෙන්ඩර් එක හැදුවේ. ඒ, චීනය සතුටු කරන්න, චීනයේ වුවමනාවට. අනෙක් කාටවත් ඒ ටෙන්ඩරය දමන්න බැරි වෙන්න. මොකක්ද මේ වෙන්නේ? චීනයේ වුවමනාව සම්පූර්ණ කරන්න ගිහිල්ලා අන්තිමට අපට ඉන්දියාවෙන් කන්න වෙන එකයි වෙන්නේ. මේ රට ස්වාධීන රටක් විධියට, නොබැඳි රටක් විධියට ඉස්සරහට යන්න නම් මේ විධියට අත යට ගේම් ගහලා බැහැ. ඔබතුමන්ලා මේ රටේ චීන කොමියුනිස්ට් පාලනයක් කරන්න ඕනෑ කියලා හිතනවා ඇති. නමුත්, ඒක කරන්න ලැබෙන්නේ බැහැ. එහෙම කරන්න ගියොත් නේපාලනයට වෙච්ච දේ තමයි අපටත් වෙන්නේ. ඒ නිසා කරුණාකරලා රාජ්‍ය යන්ත්‍රණය යථාවත් කරන්න මේ system එක ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් සකස් කළේ නැත්නම්, ඔබතුමන්ලාට ආර්ථික වර්ධනයක් ලබා ගන්න ලැබෙන්නෙත් නැහැ, COPE එකේ වාර්තා එළියට දාලා රට දියුණු කරන්න ලැබෙන්නෙත් නැහැ කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Jagath Manuwarna. You have nine minutes.

[අ.භා. 12.02]

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අද දවසේ ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඊයේ දවසේ අපේ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 80වන සැසිවාරය ආමන්ත්‍රණය කරමින් කියපු වාක්‍යයක් තිබෙනවා. ඒ තමයි, "දූෂණයට එරෙහි සටන භයානකයි. එහෙත් දූෂණයට එරෙහිව සටන් නොකර සිටීම ඊටත් වඩා භයානකයි" කියන එක. අපි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විධියට පසුගිය කාලයේ ආයතන 14කට ආසන්න ප්‍රමාණයක් විමර්ශන කටයුතු සඳහා කාරක සභාව හමුවට කැඳවා තිබුණා. එයින් සිව්වැනි වාර්තාව තමයි අද සභාගත කළේ.

මට පෙර කථා කළ මන්ත්‍රීතුමා බොහොමයක් කාරණා කිව්වා. අපි "කොරහේ කිඹුල්ලු දකිනවා" කිව්වා. එත් එක්කම ලංකා විදුලිබල මණ්ඩලය - CEB - සහ LTL එක කියන ආයතන දෙක සම්බන්ධයෙන් සඳහන් කරමින් කිව්වා, "LTL ලාභ ලබන ආයතනයක්, මේ ආයතනය තමයි දියුණු කරන්න ඕනෑ, ඒ නිසා මේ ගැන ප්‍රශ්න කරන්න එපා" කියලා. නමුත්, ඔබතුමා දන්නවාද CEB සහ LTL කියන ආයතන දෙකේම සභාපතිවරයා එකම කෙනෙකු බව? එතකොට එකම සභාපතිවරයෙකු ඉන්න ආයතන දෙකෙන් එක ආයතනයක් පාඩු ලබන්නත්, අනෙක් ආයතනය ලාභ ලබන්නත් හේතුව මොකක්ද කියලා තමයි අපි හොයන්නේ. ඒ නිසා කලබල නොවී ඉන්න. ඒ සම්බන්ධයෙනුත් අදාළ වාර්තාව ඉදිරියේදී අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

මට කලින් අපේ COPE එකේ සභාපතිතුමා, අපි කමිටුවට කැඳවූ Airport and Aviation Services (Sri Lanka) (Pvt.) Ltd. එක සම්බන්ධයෙන් අදහස් දැක්වූවා. මේ ආයතනයේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් 2017දී තමයි යෝජනා ගෙනාවේ. ඒ යෝජනා ගෙනැල්ලා සංවර්ධන කටයුතු පටන් ගත්තා. ගුවන් තොටුපළේ මගීන් හැසිරවීමේ ධාරිතාව වාර්ෂිකව මිලියන 6 සිට මිලියන 12 දක්වා වැඩි කරන්න කියලා තමයි මගී පර්යන්ත ගොඩනැඟිල්ලක් ඉදිකිරීම ආරම්භ කළේ. ඒ ගොඩනැඟිල්ල ඉදිකිරීම ආරම්භ කරලා ටික කාලයක් ගිහිල්ලා, මගී ධාරිතාව වාර්ෂිකව මිලියන 6 සිට 12 දක්වා නොව මිලියන 6 සිට 15 දක්වා වැඩි කරන්න ඕනෑ කියලා ආපසු වතාවක් මේ සැලැස්ම වෙනස් කළා. විටින් විට, විටින් විට මේ සැලසුම් වෙනස් කරමින් හවුල් සමාගමක් වශයෙන් JAC/NK සමාගම් දෙකට කොන්ත්‍රාත් පිරිනමලා, මේවා ක්‍රියාත්මක කරගෙන යද්දී ආණ්ඩු මාරු වුණා.

මේ වාර්තාවෙන් කියනවා, "වාස්තු විද්‍යාත්මක වෙනස්කම් සිදු කිරීම සඳහා මගී පර්යන්ත ගොඩනැඟිල්ලේ පිරිසැලසුම් වෙනස් කිරීම, වහලයේ සැලසුම් වෙනස් කිරීම, "B" පැකේජයේ වැඩ සඳහා ඉදිකිරීම් අධීක්ෂණ සේවා කාලය දීර්ඝ කිරීම, "A" පැකේජය ක්‍රියාත්මක කිරීමේ සැලසුම් වෙනස් කිරීම ආදිය සඳහා 2016 සහ 2023 වර්ෂවලදී සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ අවශ්‍යතාව මත සැලසුම් වෙනස් කරමින් ගිවිසුම් සංශෝධනය කිරීම හේතුවෙන් ඒ සඳහා මූලික උපදේශන සේවා ගාස්තුවට අමතරව ඇමෙරිකානු ඩොලර් 178,589ක්, ජපන් යෙන් මිලියන 1,612.4ක් සහ රුපියල් මිලියන 808.6ක් ගෙවීමට සිදු වී තිබුණු අතර, ගිවිසුම් කාල සීමාව මාස 47 සිට මාස 131 දක්වා මාස 84කින් හෙවත් අවුරුදු 7කින් දීර්ඝ වී තිබුණි. ඒ අනුව, 2014 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාල සීමාව තුළ සැලසුම් සහ උපදේශන සේවා ගාස්තුව ලෙස ජපන් යෙන් මිලියන 2,425.2කට සමාන රුපියල් මිලියන 3,884.8ක් උපදේශන සේවා සමාගමට ගෙවා තිබුණි" කියලා. මේ, සැලසුම් වෙනස් කිරීම සඳහා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සැලසුම් වෙනස් කර තිබෙන්නේ ඇයි? "මගී පර්යන්ත ගොඩනැඟිල්ලේ පියස්සේ හැඩය, අදාළ කාලය තුළ බලයේ සිටි දේශපාලන අධිකාරියේ අවශ්‍යතාවය අනුව වෙනස් වූ බව කාරක සභාවට නිරීක්ෂණය විය. 2012 වසරේදී පියස්සේ හැඩය නෙළුම් මල් පෙතිවල හැඩයට සැලසුම්කොට තිබූ නමුත්, 2015 වසරේදී එය අරලිය පත්‍රයේ හැඩයට වෙනස් කොට සැලසුම් කොට තිබුණි" යනුවෙන් මෙම වාර්තාවේ තවදුරටත් සඳහන් වනවා.

දැන් මොකක්ද මේ වෙලා තිබෙන්නේ? කලින් බලයේ හිටපු අයට තිබුණා නේ, නෙළුම් අමාරුවක්. එක්කෝ නෙළුම් පොහොට්ටුවක්, එක්කෝ නෙළුම් පෙත්තක්, නෙළුම් කුලුනු, නෙළුම් පොකුණු. මේ වහලයත් නෙළුම් පෙති හැඩයට හදා ගන්න වුවමනාවක් තිබුණා. අවසානයේ අපට ඉතුරු වුණේ නෙළුම් අලය! කොහොම හරි හැඩය වෙනස් කරන්න හැදුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපට කියනවා නේ, දේශපාලන පළිගැනීම් කරනවා කියලා. පසුගිය දවස්වල drug lordsලා අල්ලලා හිරේ දැම්මා, අපරාධකාරයෝ අල්ලලා හිරේ දැම්මා. අපට කියනවා, පළිගන්නවා කියලා. නමුත්, මේ මොකක්ද කරලා තිබෙන්නේ? මේ, එතුමන්ලා කලින් ආණ්ඩුවෙන් පළිගත්ත විධිය. එතුමන්ලා කලින් ආණ්ඩුවෙන් පළිගත්තේ කොහොමද? කලින් ආණ්ඩුව සැලැස්මක් හදනවා, ගුවන් තොටුපොළේ මගී පර්යන්තයේ වහලය නෙළුම් පෙතිවල හැඩයට හදන්න කියලා. ඒ ආණ්ඩුවත් එක්ක තිබෙන තරහට ඊළඟට එන ආණ්ඩුව ඒ වහලයේ හැඩය වෙනස් කරනවා. කවුද මේවායේ මිල ගෙවන්නේ? මිල ගෙවන්නේ ජනතාව. මිනිස්සු මේවාට මිල ගෙවන්න ඕනෑ. එතුමන්ලා කලින් ආණ්ඩුවෙන් පළිගන්නවා. ඒකට මිල ගෙවන්නේ මිනිස්සු. මෙහෙම තමයි මේ මිලියන, බිලියන ගණන් නාස්ති කරලා තිබෙන්නේ.

නැවත වතාවක් මම මේ කාරණය කියනවා. අපේ ගරු ජනාධිපතිතුමා කිව්වා වාගේ, දූෂණයට විරුද්ධවීම භයානකයි වාගේම දූෂණයට විරුද්ධ නොවී සිටීම අතිශය භයානක වෙන්නේ 2021-2022 කාලයේදී අපි අත්වින්දේ මේවායේ ප්‍රතිඵල වීම නිසායි. එදා ධනය නාස්ති කළ නිසා තමයි මිනිස්සු පාරට වැටුණේ.

ඊට පස්සේ COPE එක කියනවා, මේ ගැන විමර්ශනයක් කරන්න කියලා. ඒ විමර්ශනයෙන් පස්සේ අපි සොයා ගන්නවා, මේ ගොඩනැඟිල්ලේ ස්ථාන 18ක වාස්තු විද්‍යාත්මක නොගැළපීම් 640ක් තිබෙනවා කියලා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, කලින් අවධානය යොමු වෙලා තිබෙන්නේ මොකකටද? මේ වාස්තු විද්‍යාත්මක නොගැළපීම් කියන්නේ තාක්ෂණික දෝෂ. ඒ වාගේම තමයි, ගුවන් යානා නැවැත්වීමේ අංගණයේ තිබුණු දුර්වලතා. ඒ කියන්නේ ගුවන් යානය land කරන්න යද්දි ඒ ගුවන් යානයේ රත් වූ ඉදිරිපස රෝදය ගිහිල්ලා නතර වෙන්නේ කොතැනද? තෙල් ටැංකිය - oil pit එක - උඩ. ඒවා ගැන අවධානය යොමු කරලා තිබුණේ නැහැ. වහලයේ හැඩය නෙළුම් පෙතිද, අරලිය කොළයද වාගේ ඒවාට තමයි අවධානය යොමු කරලා තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අපි ගෙන්වපු වෙනත් ආයතනවලින් LRC එක, ජාතික තරුණ සේවා සභාව, NMRA එක වාගේ ආයතන ගැන බැලුවාම තේරෙනවා, ඒවායේත් දූෂණ, වංචා සිදු වෙලා තිබෙන බව. කලින් කිව්වා නේ අපි රාජ්‍ය නිලධාරීන් මර්දනය කරන්න හදනවා, ඔවුන් භය කරනවා කියලා. එහෙම නැහැ. භය වෙලා ඉන්නේ මේ දූෂණවලට

[ගරු ජගත් මනුවර්ණ මහතා]

හවුල් වුණු අය. ඔබතුමන්ලාට මතක ඇති, මීට පෙර වර්ෂවල COPE එකට කැඳවලා ප්‍රශ්න කරන්න ඕනෑ මිනිස්සු COPE එකට ඇවිල්ලා වාඩි වෙලා හිටියා. ඒ කියන්නේ COPE එකට උත්තර බඳින්න ඕනෑ අය තමයි COPE එකේ හිටියේ. එහෙම සභාපතිලාත් හිටියා. COPE එකට උත්තර බඳින්න ඕනෑ මිනිස්සු ඉස්සර COPE එකේ හිටියා. දැන් කියනවා, නිලධාරින් භය කරනවා කියලා, නිලධාරින් නොවෙයි භය වෙලා ඉන්නේ. අපි මේ රටේ ජනතාවට කියනවා, ඉදිරියේදී කිසිම විධියකින් නිලධාරින් අපහසුතාවට පත් වෙන්නේ නැත, භය වෙන්න ඕනෑ ඒවාට අනුබල දීපු, දේශපාලනය මෙහෙයවපු මිනිස්සු කියලා. එහෙම නම් දේශපාලන අධිකාරියයි භය වෙන්න ඕනෑ. නිලධාරින්ට කිසිම හානියක් වෙන්නේ නැහැ. ඔවුන්ගෙන් ප්‍රශ්න කරනවා, ඒක හරි. මොකද, ඇත්ත එළි කර ගන්න ඕනෑ නිසා.

මම කලින් කිව්වා වාගේ NMRA එක, LRC එක වාගේ ආයතනවල අර්බුද හදලා, ඒ අර්බුද තුළ ජාවාරම් කරලා තිබෙනවා. LRC එකේ පොහොර බිස්නස් එකක් හදලා තිබෙනවා. මතකද, එක්තරා කාලයක පොහොර ගිහගයක් තිබුණා. ඒ කාලයේ LRC එක පොහොර බිස්නස් එකක් පටන් ගන්නවා, ඇමතිවරයෙකුගේ වුවමනාවට. NMRA එක ඖෂධ අර්බුදයක් හදලා ඖෂධ ජාවාරමක් කරනවා. ඒ විධියට තමයි පාලකයෝ මේ ආයතන අස්සේ බිස්නස් කරලා තිබෙන්නේ. ඒවාට රාජ්‍ය නිලධාරින් හවුල් කරගෙන තිබෙනවා. දැන් සිද්ධ වෙනවා වාගේ හාල්මැස්සෝ නොවෙයි, තෝරු මෝරු අහු වෙන්නේ අනාගතයේ දවසක. ඒකට අවශ්‍ය ක්‍රියා පිළිවෙළ, වැඩ පිළිවෙළ අපේ COPE එකේ ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉතාම සාර්ථකව ඉස්සරහට කරගෙන යනවා, ඒකට අදාළ සංශෝධන අපි ගේනවා. ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කළ යුතු සියලු දේවල් කරනවා. COPE එකේ ගරු සභාපතිතුමා ඇතුළු අප සියලුදෙනාම උත්සාහ කරමින් ඉන්නේ ඒ ආයතන තවත් කාර්යක්ෂම කරන්නයි.

අපි COPE එකට ගෙන්වා ප්‍රශ්න කරන ආයතන 457ක් තිබෙනවා. COPE එක හමුවට එන්නේ නැති ආයතනත් තිබෙනවා. අනාගතයේදී එම ආයතනත් මේ කමිටුවට කැඳවන්න ඕනෑ. ඒවාට අදාළ නීති රීති, අණ පනත් අපි සම්මත කර ගන්න ඕනෑ. එහෙම නැති වුණොත් ඒ ආයතනවල නිලධාරිනුත් අයාලෙ යනවා. කෙසේ හෝ මෙම ආයතනවල තිබෙන සියලු දූෂණ, වංචා සෙවීම තමයි අපේ අරමුණ වෙන්නේ. ඒක නිසා තමයි ගරු සභාපතිතුමා සඳහන් කළා වාගේ අපි written submissions කැඳවා තිබෙන්නේ. ඒ කියන්නේ, අපට අහම්බෙන් තෝරාගෙන මේ වැඩේ කරන්න බැරි නිසා අපි කලින් ඒ අයගේ වාර්තා කැඳවා, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ත්‍රෛමාසික වාර්තාවට අනුව ඒවාට උත්තර ගෙන්වාගෙන ඒවා අනුව තෝරනවා, ඉදිරියේදී මොන ආයතනද කැඳවන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය විධියට අපි මේ රටේ මිනිසුන්ට කිව්වා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කෙසේ හෝ උරුම කරලා දෙනවා කියලා. ඒ සඳහා තමයි සියලුදෙනා වැඩ කරමින් ඉන්නේ. මේ රටේ ජනතාවට අපි කියනවා, ඒ සඳහා වූ විශ්වාසයකින් යුතුව ජීවත් වෙන්න, ඔබ පැතූ ලෝකය ගොඩනඟන එක තමයි අපේ වගකීම වන්නේ කියලා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Thurairasa Ravikaran. You have 16 minutes.

[பி.ப. 12.12]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஈழத் தமிழர்களின் உரிமைக்காக ஐந்து அம்சக் கோரிக்கைகளை முன்வைத்து அஹிம்சை வழியில் உண்ணா நோன்பிருந்து உயிர்துறந்த 'தியாக தீபம்' திலீபன் அவர்களுக்கு இந்த உயரிய சபையில் முதற்கண் எனது அஞ்சலியைச் செலுத்துகின்றேன். இராசையா பார்த்தீபன் என்னும் இயற்பெயரைக் கொண்ட 'தியாகச் செம்மல்' திலீபன் அவர்கள் தமிழர்களின் உரிமைக்காகத் தனது இன்னுயிரைத் துறந்து 38 வருடங்களாகின்றது. ஆனாலும், ஈழத் தமிழர்கள் தற்போதும் உரிமைகள் மறுக்கப்பட்ட நிலையிலேதான் தமிழர் தாயகப் பரப்பில் வாழ்ந்து வருகின்றனர். தமிழர் தாயகப் பரப்பில் திட்டமிட்ட சிங்களக் குடியேற்றங்கள் தற்போதும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. தொடர்ந்தும் தமிழ் அரசியல் கைதிகள் சிறைகளிலே தடுத்து வைக்கப்பட்டுள்ளனர். தமிழர் தாயகப் பரப்பில் அதிகரித்த இராணுவ மயமாக்கல் செயற்பாடுகள் தொடர்ந்தும் முன்னெடுக்கப்பட்டு வருகின்றன. 'தியாக தீபம்' திலீபன் எந்த நோக்கத்துக்காகப் பசித்திருந்து தனது இன்னுயிரைத் தியாகம் செய்தாரோ அந்த நோக்கமும் அவரின் எண்ணமும் இதுவரை நிறைவேறவில்லை. அந்த வகையில், பார்த்தீபன் இப்போதும் பசியோடுதான் இருக்கின்றான் என்று தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, கிவுல் ஓயா திட்டம் பற்றி கூற விரும்புகின்றேன். வவுனியா வடக்குப் பிரதேசத்தில் தமிழ் மக்களின் பூர்வீக நிலங்கள் ஆக்கிரமிக்கப்படுகின்ற நிலைமைகள் காணப்படுகின்றன. அந்த வகையில், மகாவலி அதிகாரசபை கிவுல் ஓயா திட்டத்தின் பெயரில் பெருமளவான தமிழர்களின் பூர்வீகக் காணிகளைச் சூறையாடுகின்றது. மகாவலி 'எல்' வலயத்தில் முன்னெடுக்கப்படவுள்ள கிவுல் ஓயா திட்டத்தால் எமது தமிழ் மக்களுக்கு ஏற்படவுள்ள பாரிய பாதிப்பு நிலை தொடர்பில் இந்த உயரிய சபையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். மா ஓயா அல்லது பெரிய ஆறு, சூரியன் ஆறு ஆகியவற்றை மறித்துப் பாரிய அணைக்கட்டு அமைக்கப்பட்டு, கிவுல் ஓயா திட்டம் ஆரம்பிக்கப்படவுள்ளதாக அறிய முடிகின்றது. இந்தப் பாரிய நீர்ப்பாசனத் திட்டத்தில், 6,000 ஏக்கர் நீர்ப்பாசன விவசாயக் காணிகள் வெலி ஓயாவில் அத்துமீறிக் குடியேறிய பெரும்பான்மை இனத்தவர்களுக்கு வழங்கப்படவுள்ளதாக அறிய முடிகின்றது.

இவ்வாறாக கிவுல் ஓயா திட்டத்தைச் செயற்படுத்தினால் வவுனியா வடக்கிலுள்ள தமிழர்களின் பூர்வீக விவசாயக் குளங்கள் மற்றும் அவற்றின் கீழுள்ள வயல் நிலங்கள், தமிழர்களின் பூர்வீகக் கிராமங்கள் பலவும் நீரில் மூழ்கும் அபாயம் ஏற்படும் என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்த வகையில், இராமன்குளம், கொட்டோடைக்குளம், ஒயாமடுக்குளம், வெள்ளான்குளம், பெரியகட்டுக்குளம், பனிக்கல்மடுக்குளம், சன்னமுற்றமடுக்குளம், கம்மாஞ்சிக்குளம், குறிஞ்சாக்குளம், புலிக்குட்டிக்குளம், திரிவைச்சகுளம் முதலான சிறிய நீர்ப்பாசனக் குளங்களும், வெடிவைத்தகல்லு குளத்தின் கீழுள்ள வயல் காணிகள் பகுதியளவிலும், நாவலர்பாம், கல்லாற்றுக்குளம், ஈச்சன்குளம், கூழாங்குளம் வயல் காணிகளும், வவுனியா வடக்கிலுள்ள பழந்தமிழ் கிராமங்களான காட்டுப்பூவரசங்குளம் கிராமம், காஞ்சூரமோட்டை கிராமம், மருதோடை கிராமத்தின் ஒருபகுதி உள்ளிட்ட பகுதிகளும் குறித்த நீர்ப்பாசன அணைக்கட்டின் நீரேந்து பகுதிகளாக மாறும் அபாயம் ஏற்படும்.

அதேவேளை, தமிழர்களின் 'இதயபூமி' எனப்படுகின்ற பூர்வீக மணலாற்றுப் பிரதேசத்தை வெலிஓயாவாக மாற்றிவிட்டு, அங்கு அத்துமீறிக் குடியேற்றப்படவுள்ள பெரும்பான்மை இனத்தவர்களே இந்த கிவுல் ஓயா நீர்ப்பாசனத் திட்டத்தால் பயன்பெற உள்ளனர். தற்போது ஆட்சிபீடத்தில் இருக்கின்ற தேசிய மக்கள் சக்தி அரசாங்கமும் இந்த கிவுல் ஓயா திட்டத்தைச் செயற்படுத்துவதில் அதிக அக்கறையோடு செயற்படுவதாக அறிய முடிகின்றது. தமிழ் மக்களின் சிறிய பூர்வீக விவசாயக் குளங்கள் மற்றும் அவற்றின் கீழுள்ள வயல் நிலங்கள், தமிழ் மக்களின் பூர்வீகக் கிராமங்கள் என்பவற்றை விழுங்குகின்ற இந்த கிவுல் ஓயா திட்டத்தை தயவுசெய்து உடனடியாக நிறுத்துமாறு இந்த உயரிய சபையூடாகக் கோருகின்றேன்.

அத்தோடு, மகாவலி அதிகாரசபை இந்தத் திட்டத்துக்கென ஆக்கிரமித்து வைத்திருக்கின்ற தமிழர்களது பூர்வீக சிறிய விவசாயக் குளங்கள் மற்றும் அவற்றின் கீழுள்ள விவசாய நிலங்களையும் பூர்வீக தமிழ் கிராமங்களையும் உடனடியாக விடுவிக்குமாறும் இந்த உயரிய சபையைக் கோருகின்றேன். மேலும், எமது தமிழ் மக்கள் தங்களது பூர்வீக வாழ்விடங்களில் நிம்மதியாக வாழ்வதற்கும் பூர்வீக விவசாய நிலங்களில் விவசாயத்தைக் கொண்டு தன்னிறைவு பெறுவதற்கும் வழிவகைகளை ஏற்படுத்துமாறும் இந்த உயரிய சபையைக் கோருகின்றேன்.

அடுத்து, மன்னார் காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை நிறுத்துமாறும் இந்த உயரிய சபையைக் கோருகின்றேன். மன்னார் தீவில் காற்றாலை மின் உற்பத்திக் கோபுரங்கள் அமைக்கப்படுவதை நிறுத்தக் கோரி, மன்னார் மக்கள் இன்றுடன் 55 நாட்களாக தொடர் போராட்டத்தில் ஈடுபட்டு வருகின்றனர். இந்த நிலையில், மக்களின் எதிர்ப்பால் இடைநிறுத்தி வைக்கப்பட்டு இருந்த காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை அரசாங்கம் மக்களின் விருப்பத்துக்கு மாறாக, மீள முன்னெடுக்கும் செயற்பாட்டில் ஈடுபட்டுள்ளதாக அறிய முடிகின்றது. அந்த வகையில், மன்னார் தீவிலுள்ள சவுத்பார், தாழ்வுபாடு, கொன்னையன் குடியிருப்பு தொடக்கம் நடுக்குடா வரையான பகுதிகளில் 20 மெகாவோட் மற்றும் 50 மெகாவோட் கொள்திறன்கொண்ட மொத்தம் 14 காற்றாலை மின் உற்பத்திக் கோபுரங்களை மக்களின் விருப்பத்துக்கு மாறாக நிறுவுவதற்கு அரசாங்கம் துரித நடவடிக்கைகளை மேற்கொண்டு வருவதாக அறிகின்றோம்.

குறிப்பாக, கடந்த ஓகஸ்ட் மாதம் 13ஆம் திகதி மன்னார் மாவட்டத்தைச் சேர்ந்த பிரதிநிதிகள் மற்றும் வன்னித் தேர்தல் மாவட்ட நாடாளுமன்ற உறுப்பினர்கள் அடங்கிய குழுவினர் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்து, குறித்த காற்றாலை மின் உற்பத்தித் திட்டம் மன்னார் தீவில் முன்னெடுக்கப்படக் கூடாதெனக் கோரியிருந்தார்கள். இந்த நிலையில், குறித்த காற்றாலை மின் உற்பத்தித் திட்டம் தொடர்பில் மக்களுக்குத் தெளிவுபடுத்துவதெனவும் அதுவரை அந்தத் திட்டத்தை இடைநிறுத்துவதெனவும் தீர்மானிக்கப்பட்டது. அதைத் தொடர்ந்து, 05.09.2025 அன்று மன்னார் தீவிலுள்ள சாந்திபுரம், தாழ்வுபாடு, தோட்டவெளி, ஓலைத்தொடுவாய், பேசாலை ஆகிய பகுதிகளில் கூட்டங்கள் ஒழுங்கு செய்யப்பட்டு கௌரவ வலுசக்தி அமைச்சர் குமார ஜயகொடி அவர்கள் தலைமையிலான குழுவினர், மக்களுக்கு காற்றாலை மின் உற்பத்தித் திட்டம் தொடர்பில் தெளிவுபடுத்தும் செயற்பாடுகளை முன்னெடுத்தனர். இதன்போது அனைத்து இடங்களிலும் மக்களால் காற்றாலை மின் உற்பத்தித் திட்டத்துக்கு கடுமையான எதிர்ப்பு வெளியிடப்பட்டது. அதிலும், பேசாலையில் கூட்டத்தை நடத்த முடியாத அளவுக்கு மக்கள் மிகவும் கடுமையான எதிர்ப்பை வெளியிட்டிருந்ததை நான் இச்சந்தர்ப்பத்தில் குறிப்பிட்டுச் சொல்ல விரும்புகின்றேன். இதனைத் தொடர்ந்து இம்மாதம் 19ஆம் திகதி மன்னார் மாவட்ட மக்கள் பெருமளவில் ஒன்றுதிரண்டு சனாதிபதி செயலகத்துக்கு முன்பாக எதிர்ப்பு ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டனர்.

மன்னார் மக்கள் காற்றாலை மின் உற்பத்தித் திட்டத்துக்கு எதிரானவர்கள் அல்லர். மன்னார் தீவில் மக்கள் குடியிருப்புப் பகுதிகளுக்குள் காற்றாலை மின் உற்பத்திக் கோபுரங்களை அமைப்பதையே அவர்கள் எதிர்க்கின்றனர். குறிப்பாக, 32 கிலோமீற்றர் நீளமும் 4 கிலோமீற்றர் அகலமும் உடைய குறைந்தளவு நிலப்பரப்பைக் கொண்ட மன்னார் தீவில் ஏற்கனவே 30 காற்றாலை மின் உற்பத்திக் கோபுரங்கள் அமைக்கப்பட்டுள்ளன. இந்த நிலையில், மேலதிகமாக காற்றாலை மின் உற்பத்திக் கோபுரங்கள் அமைக்கப்பட்டால், மன்னார் தீவில் மக்கள் வாழ முடியாத நிலை ஏற்படும் என்பது அந்த மக்களின் கருத்தாக உள்ளது. இதுதவிர, வங்காலை, நறுவிலிக்குளம் ஆகிய இடங்களில் 6 காற்றாலை மின் உற்பத்திக் கோபுரங்கள் அமைக்கப்பட்டுள்ளதுடன், மன்னார் மாவட்டத்தில் மொத்தமாக 36 மின் உற்பத்திக் கோபுரங்கள் ஏற்கனவே அமைக்கப்பட்டுள்ளன.

எனவே, நாட்டின் பொருளாதாரத்துக்கும் நாட்டின் மின்சாரத் தேவைக்கும் மீள் புதுப்பிக்கத்தக்க சக்திக்கான இலக்கை அடைவதற்கும் ஏற்கனவே பங்களிப்பை நல்கியுள்ளதாக அந்த மக்கள் கருதுகின்றனர். இத்தகைய காரணங்களுக்காகவே மன்னார் தீவினுள் காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை அமுல்படுத்துவதை மக்கள் எதிர்க்கின்றனர். இத்தகைய சூழலில் மன்னாரில் இடைநிறுத்தி வைக்கப்பட்டிருந்த குறித்த காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை உடனடியாக மீள முன்னெடுக்குமாறு சனாதிபதியின் செயலாளர், வலுசக்தி அமைச்சையும் மன்னார் மாவட்ட செயலகத்தையும் அறிவுறுத்தியுள்ளதாக அறிய முடிகின்றது. மக்களின் வாழ்க்கையைப் பாதிக்கின்ற, மக்கள் ஏற்றுக்கொள்ளாத இத்திட்டத்தை அவர்களின் விருப்பத்துக்கு மாறாக, அடாவடித்தனமாக வலிந்து ஏற்படுத்த முயல்வதைப் பொருத்தமற்ற ஒரு செயற்பாடாகவே நாங்கள் பார்க்கின்றோம். எனவே, மக்கள் ஏற்றுக்கொள்ளாத இக்காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை உடனடியாகத் தடுத்து நிறுத்துமாறு இவ்வுயரிய சபையின் ஊடாக உரியவர்களைக் கோருகின்றோம். அத்துடன், மன்னார் மக்களுடைய எதிர்ப்பை தேசிய மக்கள் சக்தி அரசாங்கம் தேடிக்கொள்ள வேண்டாமெனவும் கேட்டுக்கொள்கின்றோம்.

அடுத்து, மீனவர் பிரச்சினை ஒன்றை நான் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன். கௌரவ கடற்றொழில் அமைச்சருக்கு ஏற்கனவே இதனைத் தெரியப்படுத்தி விட்டோம். நான் கடந்த 15ஆம் திகதி மீனவர்களோடு கடலுக்குச் சென்று, அங்கு சட்டவிரோதமாகவும் திருட்டுத்தனமாகவும் நடைபெறுகின்ற கடற்றொழில் நடவடிக்கைகளை நேரடியாகப் பார்வையிட்டேன். கரையிலிருந்து சுமார் 15 கிலோமீற்றர் தூரத்தில் இவ்வாறான செயற்பாடுகளைப் பார்க்க முடியும். இது தொடர்பான செய்திகள் ஊடகங்களில் வெளிவந்தன. கடற்றொழில் அமைச்சர்கூட, உடனடியாக குறித்த செயற்பாடுகளை நிறுத்தும்படி அமைச்சின் செயலாளருக்குப் பணித்திருந்தார். ஆனாலும், அதனை கடற்படையினரோ, கடற்றொழில் திணைக்களத்தினரோ கவனத்தில் எடுக்கவில்லை. அப்படியென்றால், கடற்படை நித்திரை கொள்கின்றதா? எனக் கேட்கின்றேன். தற்பொழுது,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

இச்சபையில் பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்கள் இல்லை. அவருடைய கவனத்துக்கும் இந்த விடயத்தை நான் கொண்டுவருகின்றேன்.

" நிச்சயமாக ஊழலை ஒழிப்போம்" என தேசிய மக்கள் சக்தி அரசாங்கம் செயற்பட்டுக்கொண்டு இருக்கும் இந்த நேரத்தில், பட்டப்பகலில் ஊழல் நடைபெறுவதுபோல, இலங்கையின் கடற்பரப்பில் குறிப்பாக முல்லைத்தீவு கடற்பரப்பில் 1,000க்கும் மேற்பட்ட படகுகள் வந்து அங்குள்ள கடல்வளத்தைக் கொள்ளையடித்துக்கொண்டு செல்கின்றது. இதற்கு பாதுகாப்புப் பிரதி அமைச்சர் என்ன பதில் சொல்வார்? கடற்றொழில் அமைச்சர் என்ன பதில் சொல்வார்? கடற்றொழில் திணைக்களத்தினர் என்ன பதில் சொல்வார்கள்? எனக் கேட்கின்றேன். மீனவர்கள் கரையோரத்தில் கூடிநின்று பார்க்கக்கூடிய அளவுக்கு நிலைமை மோசமாக இருக்கின்றது. எங்களுடைய மீனவர்களால் உழைக்க முடியவில்லை. மீனவக் குடும்பங்களின் நிலையை சற்று சிந்தித்துப் பாருங்கள்! மீனவர்களுக்கு வாழ்வாதாரம் கிடைக்காமல் செய்யும் நடவடிக்கைகளையே இவர்கள் செய்கின்றார்கள். இந்தத் திருட்டுத் தொழிலை ஏன் கட்டுப்படுத்த முடியவில்லை? கடற்றொழில் அமைச்சர் இதனைக் கவனத்தில் கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தப் பிரச்சினையை உங்களுடைய கவனத்துக்கும் கொண்டு வருகின்றேன். தற்பொழுது, இந்தச் சபையில் கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் இல்லை. ஆனாலும், அமைச்சர் அவர்கள் கவனத்தில் எடுக்கக்கூடியவர் என்பதால் சொல்லி வைக்க விரும்புகின்றேன். தயவுசெய்து, கடலில் இடம்பெறுகின்ற சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளை நிறுத்துங்கள்! அவற்றை நிறுத்தாவிட்டால் எங்களுடைய மீனவக் குடும்பங்கள் பட்டினிச்சாவை எதிர்நோக்க வேண்டி ஏற்படும் என்பதை நான் இங்கு சொல்லிவைக்க விரும்புகின்றேன்.

அடுத்து, கேப்பாப்பிலவு மக்கள் பெருமளவு போராட்டங்களை நடாத்தியதன் விளைவாக அவர்களுடைய கூடுதலான காணிகள் விடுவிக்கப்பட்டு உள்ளன. ஆனால், 190 ஏக்கர் காணிகள் இன்னும் விடுவிக்கப்படாமல் உள்ளன. அந்தக் காணிகள் விடுவிக்கப்பட வேண்டும். இது பற்றி அரசாங்க அதிபரிடம் கேட்டால், கூடிய விரைவில் அவை விடுவிக்கப்படுமெனச் சொல்கின்றார். அதேபோல, இது பற்றி கௌரவ கடற்றொழில் அமைச்சரிடம் கேட்டால், கௌரவ ஜெகதீஸ்வரன் அவர்களிடம் கேட்டால், கௌரவ திலகநாதன் அவர்களிடம் கேட்டால், கௌரவ உபாலி சமரசிங்க அவர்களிடம் கேட்டால், கூடிய விரைவில் அவை விடுவிக்கப்படுமெனச் சொல்கின்றார்கள். ஆனால், இன்னும் அவை விடுவிக்கப்படவில்லை. இதனால் அங்கு 60 குடும்பங்கள் மீள்குடியேற முடியாமல் அழுகின்றன. ஏன் இந்த நிலைமை?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one minute, Sir.

தயவுசெய்து, அந்த மக்களை மீள்குடியேற்றுங்கள்! ஏனெனில், அந்த மக்கள் இப்போதும் அகதிகளாகவே இருக்கின்றார்கள். தேசிய மக்கள் சக்தி அரசாங்கம் கூடுதலாக நல்ல செயற்பாடுகளையே செய்து வருகின்றது என்பதை நான் தொடர்ந்து சொல்லி வருகின்றேன்.இந்த அரசாங்கத்தின் செயற்பாடுகளை நான் வரவேற்கின்றேன். அந்த வகையில், தயவுசெய்து கூடிய விரைவில் அந்த மக்களை மீள்குடியேற்றம் செய்யுமாறு கேட்டு விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ ජනතාවගේ මූල්‍ය බලය පැවරී තිබෙන පාර්ලිමේන්තුව තුළ ඒ වෙනුවෙන් පෙනී සිටින, අපේ රටේ ජනතාවගේ පොදු මුදල් වියදම් කරන රාජ්‍ය ව්‍යාපාර 457ක් පිළිබඳව විමර්ශනය කරමින් කටයුතු කරන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගරු සභාපති (වෛද්‍ය) නිශාන්ත සමරවීර මැතිතුමා විසින් අද දින සභාව කල්තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද යෝජනාව පදනම් කරගෙන, ආයතන කීපයකට අදාළව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාව පිළිබඳව අදහස් දැක්වීමට මට අවස්ථාව ලබා දීම ගැන මම පළමුව ස්තුතිවන්ත වෙනවා. අද දවසේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලය සහ සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම කියන ආයතන සාකච්ඡාවට ලක් කෙරෙනවා. මීට පෙර COPE එකේ සාමාජිකයන් එම ආයතන සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා.

විශේෂයෙන්ම සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම පසුගිය කාල පරිච්ඡේදය තුළ තමන්ගේ විශාලම ව්‍යාපෘතියක් ලෙස කටුනායක ගුවන් තොටුපොළ නවීකරණය කිරීමේ දැවැන්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කළා. එහි මගින් හැසිරවීමේ ධාරිතාව මිලියන 6 සිට මිලියන 12 දක්වා වැඩි කිරීම වෙනුවෙන් තමයි ජපානයේ JICA ආයතනයත් සමඟ ණය ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණේ. එම ව්‍යාපෘතිය වෙනුවෙන් 2012 ජුනි මාසයේ 28වැනි දා ජපානයේ JAC/NK කියන උපදේශක සමාගමත් සමඟ ගිවිසුම්ගත වෙනවා. එම උපදේශන කටයුතු වෙනුවෙන් රුපියල් ලක්ෂ 3,445ක් -කෝටි 34ක මුදලක්- ඒ සමාගමට ගෙවන්න

එකඟ වී තිබෙනවා. මිලියන 12ක් දක්වා වැඩි කරන්න නියමිත වෙලා තිබුණු මගීන් හැසිරවීමේ ධාරිතාව, 2012-2016 දක්වා වූ වසර 4කට ආසන්න කාලයක් ගත වුණාට පසුව මිලියන 15ක් දක්වා නැවතත් වෙනස් කරනවා; ඒ සඳහා අලුත් තීන්දුවක් ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එවැනි දැවැන්ත ව්‍යාපෘතියක් ආරම්භ කරද්දී අඩුම තරමින් රටේ අනාගතය පිළිබඳව කල්පනා කරලා, රටේ ඉදිරිය පිළිබඳව කල්පනා කරලා, හෙට දවසේ රටේ අවශ්‍යතාව පිළිබඳව කල්පනා කරලා බුද්ධිමත්ම තීන්දු ගත යුතු දේශපාලන නායකත්වයක් තිබිය යුතුයි. නමුත් එවන් නායකත්වයක් අහිමි වීමේ ප්‍රතිඵලයක් විධියට තමයි ඒ සැලැස්ම වසර 4කින් නැවතත් වෙනස් කරන්නේ. එය නැවත සැලසුම් කිරීම සඳහා ලක්ෂ 5,196ක් -කෝටි 51ක්- වැය කරනවා. ඉන්පසුව 2023දී එම එකඟතාවේ ගිවිසුම නැවත සංශෝධනය කරනවා. එම ගිවිසුම සංශෝධනය කිරීම වෙනුවෙන් නැවත ලක්ෂ 8,080ක - කෝටි 80ක - මුදලක් වැය කරනවා. ඒ අනුව ඒ ගතවුණු වසර 10 තුළ සැලසුම් කිරීම වෙනුවෙන් විතරක් ලක්ෂ 16,728ක් - කෝටි 167ක්- වැය කර තිබෙනවා. ඒ හිටපු දේශපාලන අධිකාරිය අවුරුදු 10කට ආසන්න කාලයක් ගත කර තිබෙන්නේ එම ව්‍යාපෘතිය අවසන් කරන්න නොවෙයි. අද මේ ආණ්ඩු පක්ෂය ගැන ප්‍රශ්න කරන වර්තමානයේ විපක්ෂයේ ඉන්න බොහෝ දේශපාලන නායකයන් බලය දරපු කාල සීමාව තුළ එම ව්‍යාපෘතිය සැලසුම් කරන්නම අවුරුදු 10කට ආසන්න කාලයක් ගත කරලා තිබෙනවා. ඒ නිසා දැවැන්ත මහජන මුදල් නාස්තියක් එම ව්‍යාපෘතිය ඇතුළේ සිදු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහෙම තමයි මේ මහත්වරුන්ගේ සංවර්ධනය ගත වෙච්ච දශකය තුළ ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ඒ කාලය තුළ මහජන බදු මුදල් නාස්ති කිරීමේ, හොරකම් කිරීමේ සීමාවක් නැහැ. එම නිසා මේ ගතවෙච්ච කාල පරිච්ඡේදය පුරාම අප විසින් COPE එකේදී හෙළිදරවු කරපු කාරණා අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා.

ඒ වාගේම තමයි ජාතික ඖෂධ නියාමන අධිකාරියත්. දෙකෝටි විසිලක්ෂයක් වෙච්ච මේ රටේ ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීම වෙනුවෙන්, ඔවුන්ට ඉතාම හොඳ ඖෂධ ලබා දීම වෙනුවෙන් රාජ්‍ය නියාමනය සහිතව තිබෙන ප්‍රධානම ආයතනය තමයි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය. පසුගිය කාල පරිච්ඡේදය පුරා එය මහා ඛේදවාචකයකට ලක් කර තිබුණා. සාමාන්‍යයෙන් ඖෂධයක් ලියාපදිංචි කරලා මාස නවයකට ආසන්න කාලයක් යනවා ලංකාවට ගෙන ඒම සඳහා. ලියාපදිංචි කරලා, පරීක්ෂණ පවත්වලා, ඒ ඒ රාජ්‍යයන්ට ගිහිල්ලා, අදාළ lab testings කරලා - ඒ සියල්ල කරලා - ඇණවුම් කරලා ලංකාවට ගෙන ඒම සඳහා සාමාන්‍යයෙන් මාස නවයකට ආසන්න කාලයක් යනවා. ඒ නිසා විශේෂ අවස්ථාවලදී ඒ තත්ත්වයට මුහුණ දීම වෙනුවෙන් විශේෂ වැඩසටහනක් තිබුණා, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතුව. ඒ තමයි Waiver Of Registration - WoR - කියන වැඩසටහන. විශේෂ කමිටුවකින් තමයි ඒකට අනුමැතිය ලබා ගත්තේ. 2022දී බලයට පත් වුණු රනිල් වික්‍රමසිංහ මහත්මයා යටතේ හිටපු සෞඛ්‍ය ඇමතිවරයා - කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයා - ඒ Waiver Of Registration, WoR, කියන වැඩසටහනත් වෙනස් කරලා special pathway එකක්, විශේෂ වැඩසටහනක් යෝජනා කරනවා, "දින 45ක් ඇතුළත ලංකාවට ඖෂධ ගෙන එන්න ඕනෑ. එහෙම නැත්නම් විශාල ඖෂධ හිඟයක් ඇති වෙනවා. ඒ වාගේම සෞඛ්‍ය උපකරණවල හිඟයකුත් තිබෙනවා" කියමින්. ඒ නිසා ඔවුන් විසින් නම් කරන ලද පෞද්ගලික සමාගමක් හරහා දින 45ක් ඇතුළත ඖෂධ ගෙන ඒම සඳහා මැදිහත් වෙනවා. ඒ නිසා ඒකේ ප්‍රතිඵලය අපි පසුගිය කාලයේ දැක්කා. එහි ප්‍රතිඵලය තමයි ව්‍යාජ ඖෂධ, බාල ඖෂධ ලංකාවට ගෙනැල්ලා අපේ රටේ ජනතාවගේ ජීවිත ගණනාවක්ම උදුරා ගැනීම. ගැබිනි මව්වරු දෙන්නෙක් මිය ගියා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිළිගත්තා, පාසල් දරුවන් ඇතුළු 27දෙනෙකුගේ ඇස් අන්ධ වුණා කියලා.

එවැනි දූෂිත ඉතිහාසයකට නායකත්වය දුන්නු නායකයෝ තමයි අද විපක්ෂයේ වාඩි වෙලා ඉන්නේ. ඔවුන් මේ පාර්ලිමේන්තුව තුළදී අපව ප්‍රශ්න කරනවා. පසුගිය කාලයේ ඔවුන් ඉතාම දුර්වල උත්සාහයක් දැරුවා, ආණ්ඩුවට එරෙහිව වැඩ වර්ජන සංවිධානය කරන්න; පාර්ලිමේන්තුවේ කාලය විනාශ කරන්න. ආණ්ඩුව දුර්වල කරන්න ඔවුන් නොගත් උත්සාහයක් නැහැ. ඔවුන් ඒ වෙනුවෙන් දුම්රිය වැඩ වර්ජනය, තැපැල් වැඩ වර්ජනය, වෛද්‍ය වැඩ වර්ජනය ආදි දේවලට දේශපාලන නායකත්වය දුන්නා. ආසන්න වැඩ වර්ජනය තමයි, විදුලි වැඩ වර්ජනය. ඒ ඔක්කෝම අසාර්ථක වුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකට හේතුව තමයි, ආණ්ඩුව ගන්නා තීන්දු තීරණ ආරක්ෂා කිරීම වෙනුවෙන් මේ රටේ මහ ජනතාව ආණ්ඩුවත් එක්ක පෙළගැහිලා ඉන්න එක. ඒ නිසා ඒ වැඩ වර්ජන හැම එකක්ම ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවා. ඒ පිළිබඳව ප්‍රතිචාර ඕනෑවටත් වඩා මාධ්‍යවල පළ වුණා. අද විපක්ෂය වැඩ වර්ජනයේ අත්වැල අල්ලාගෙන නැඟිටින්න උත්සාහ කළත් ජනතාව ඔවුන් මුළුමනින් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

අද උදේ වරුවේ අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීවරු විවේචන කිහිපයක් කළා. නන්දන ගුණතිලක කියන පුද්ගලයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ **සභාපතිවරයා** පිළිබඳව කරුණු ඉදිරිපත් කළා කිව්වා. ඒක, එකක්. අපි කියන්න කැමැතියි, ඒ අය දේශපාලන ජීවිතය විතරක් නොවෙයි, තමන්ගේ පෞද්ගලික ජීවිතයත් නන්නත්තාර කර ගත්තු, විනාශ කර ගත්තු, අරාජික කරගත්තු, UNP එකේ ලැගලා නන්නත්තාර වෙලා සිටින අය බව. එවන් දේශපාලන ජීවිත හිමි ඔවුන් ඉදිරිපත් කරන කාරණාවලට උත්තර දෙන්න අවශ්‍ය නැහැ. මොකද, මේ රටේ ජනතාව මුළුමනින්ම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා, නන්දන ගුණතිලක වාගේ චරිත.

ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීවරයා ප්‍රකාශ කළා, තනි පක්ෂ පාලනයක් ගොඩ නඟන්න හදනවා කියලා; කොමියුනිස්ට් පාලනයක් නිර්මාණය කරන්න හදනවා කියලා. අපි එතුමාට කියන්න කැමැතියි, තමුන්නාන්සේලා විපක්ෂයක් විධියට දිගටම ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන්න උත්සාහ කරන්නේ මෙවැනි අසාර්ථක ක්‍රමයකට නම් තනි පක්ෂ පාලනයක් නිර්මාණය කරන්නේ අපි නොවෙයි මේ රටේ ජනතාවයි කියන එක. ඊළඟ මැතිවරණයේදී තමුන්නාන්සේලා ඔය තිබෙන තත්ත්වයට වඩා පහළ වැටෙන එක වළක්වන්න බැහැ. එම නිසා, තනි පක්ෂ පාලනයක් නිර්මාණය කරන්නේ මේ රටේ ජනතාවයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අවසන් තත්පර කිහිපය ගන්නේ.

ඊළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීවරයා ප්‍රකාශ කළා, "මට්ටක්කුලිය-සොයිසාපුර 155 bus route එකේ බස් ධාවනය වෙන්නේ නැහැ, ඔබතුමන්ලා ලොකු සද්දයක් දාලා බස් එකක් දැම්මා. නමුත්, දැන් බස් එක ධාවනය වෙන්නේ නැහැ" කියලා. එතුමා ඒ විධියට පට්ටපල් කෙබරයක් ඇද බෑවා. සාමාන්‍යයෙන් මුජිබුර් රහුමාන් කියන මන්ත්‍රීවරයා දවසකට එක බොරුවක් කියන්න උත්සාහ දරනවා. මේ කිව්වේත් එක බොරුවක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේත් මට්ටක්කුලිය-සොයිසාපුර 155 bus route එකේ පෞද්ගලික බස් රථයකුත්,

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ හයකුත් ධාවනය වෙලා තිබෙනවා. ගමන් වාර 20ක් ගිහිල්ලා තිබෙනවා. පසුගිය කාලයේ ආණ්ඩු බලය තිබෙන විට 155 bus route එක ගැන හිතපු නැති, කල්පනා කරපු නැති මහත්වරු, දැන් ඒ ප්‍රශ්නය විසඳුවාට පස්සේ කිඹුල් කඳුළු හෙළනවා, බොරු ප්‍රචාර කරනවා. ඒ නිසා අපි ඒ මහත්මයාට කියන්න කැමැතියි, පසුගිය කාලයේ ඔය විධියටම ජනතාවගේ ප්‍රශ්න ගැන හෙව්වා නම්, තමුන්නාන්සේ කොළඹ මහ නගර සභාව පරදින්නේත් නැහැ, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පරදින්නේත් නැහැ කියන එක. ඒවා ගැන හෙව්වේ නැති නිසා තමයි, තමුන්නාන්සේලාට ඔය විධියේ ඉරණමක් අත් වෙලා තිබෙන්නේ. වර්තමාන ආණ්ඩුව ජනතාවගේ හැම අපේක්ෂාවකටම, ඉල්ලීමකටම කන් දීලා ඒ සඳහා මැදිහත් වෙලා තිබෙනවා.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.10]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, COPE වාර්තාව පිළිබඳ විවාදයට යොමු වෙන්න කලින් මම කාරණයක් කියන්න ඕනෑ. මම පෙරේදා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ආරම්භ කළා, ලංකාවේ ප්‍රධාන ගුවන් විදුලි නාළිකාවට විරුද්ධව. මොකද, මමත් මගේ බිරිඳගේ තාත්තාත් සම්බන්ධ කරලා, පාතාලය සම්බන්ධ කරලා කරපු චෝදනාවකට විරුද්ධව තමයි අපි අධිකරණයට ගියේ. අපි බලාපොරොත්තු වෙනවා, අධිකරණයේදී ඒකට සාධාරණත්වය ලබා ගන්න. ඒ නිසා මම මේ පාර්ලිමේන්තුවේ ඉන්න ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් 159දෙනාටත් කියනවා, යම් කිසි චෝදනාවක් කරද්දී පාර්ලිමේන්තුවෙන් එළියේදි ඒක කරන්න කියලා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සියලුදෙනා දැන් තීරණය කරලා තිබෙනවා, මේ මඩ ගහන කිසිම දෙයක් තවදුරටත් ඉවසන්නේ නැහැ, අපි අධිකරණය තුළදී තමයි ඒ සියලු දේ බේරා ගන්න බලාපොරොත්තු වෙන්නේ කියලා. ඒ නිසා ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේදී කියන ඕනෑම දෙයක් එළියේදීත් කියන්න. එහෙම නැතුව වරප්‍රසාද ඇතුළේ හැංගිලා ඒවා කියන්න එපා කියන එකත් මම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම, මම සාමාජ මාධ්‍ය ක්‍රියාකාරින් කිහිපදෙනෙකුටත් letters of demand යැව්වා; YouTubersලා දෙදෙනෙකුට යැව්වා. ඔවුනුත් අධිකරණය හමුවට ගෙන එන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, COPE එකේ ගරු සභාපතිතුමා අද ඉදිරිපත් කළ වාර්තාව ගත්තොත්, එහි ගුවන් තොටුපළ ගැන කථා කරනවා. ඒ වාගේම සංවර්ධන ව්‍යාපෘති ගැන කථා කරනවා. මම සභාපතිතුමාට යෝජනා කරන්න කැමැතියි, මේ ඔක්කොම කඩාකප්පල් වෙන්න හේතුව පොඩ්ඩක් කල්පනා කරලා බලන්න කියලා. පළමුවෙන්ම ගුවන් තොටුපළ ගනිමු. 2012දී තමයි JICA එකෙන් ඒකට loan එක ලබා ගන්නේ. JICA එකෙන් loan එකක් අරගෙන ආරම්භ කරපු ඒ ව්‍යාපෘතිය කඩා වැටෙන්නේ ඇයි? ලංකාවේ 2015 වර්ෂයට කලින් theme එකක් තිබුණා. ඒ තමයි Lotus theme එක. ඒ නෙළුම් මල කියන theme එක, පොහොට්ටුව නිසා හැදුණු එකක් නොවෙයි. මොකද, පොහොට්ටුව හැදෙන්නේ 2018දී. 2015 වර්ෂයට කලින් තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එහෙම නැත්නම් එක්සත් ජනතා නිදහස් සන්ධානය. ඒ කාලයේ තිබුණේ බුලත් කොළය ලකුණ. එහෙම නම් අපි හදන්න ඕනෑ බුලත් කොළයක්. ඒ කියන්නේ නෙළුම් කුලුනක් නොවෙයි, මොකක් හරි බුලත් කොළයක් හදන්න ඕනෑ. එහෙම නම් මගී පර්යන්තයේ වහලයත් ගහන්න ඕනෑ බුලත් කොළයේ හැඩයට. නමුත් එහෙම එකක් වුණේ නැහැ. ලංකාවේ හැදුවා, Lotus කියන theme එක. ඒකට අනුව නෙළුම් කුලුන හදනවා, ඊට පස්සේ ගුවන් තොටුපළ හැදෙනවා, ශාලා හැදෙනවා. මේ ඔක්කොම theme එකකට හැදුණේ. හැබැයි, 2015දී තිබුණේ ඔබතුමන්ලා හදපු ආණ්ඩුව. අපි නොවෙයි එදා බලයේ හිටියේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔය කියන theme එක තමයි ඒ කාලයේ පටන් ගත්තේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඔව්, ඒක තමයි. මේ රට විනාශ කරන්න එළියට බැස්සේ අපි නොවෙයි. 2015දී තිබුණු ආණ්ඩුව හැදුවේ ජනතා විමුක්ති පෙරමුණ. ඔබතුමන්ලාත් එකතු වෙලායි ඒක හැදුවේ. අන්තිමට ඒ ව්‍යාපෘතිවලට මොකද වුණේ? Port City එක හදන්න ලංකාවේම ගල් ටික කඩන්න වෙනවා, සීගිරියත් කඩන්න වෙනවා කියලා කවුද ඒක නැවැත්තුවේ? ඊට පස්සේ බලන්න උමා ඔය ව්‍යාපෘතිය නැවැත්තුවේ කවුද කියලා, සාම්පූර් සූර්ය විදුලි බලාගාර ව්‍යාපෘතිය නැවැත්වූයේ කවුද කියලා, පඬු කරද ගස් හෙව්වේ කවුද කියලා. අපිද?

ඒවා හෙව්වේ ඔබතුමන්ලා. ගණන් හදලා බැලුවොත්, ඩොලර් බිලියන 10කට වැඩියි මේවායේ පාඩුව. උමා ඔයේ පාඩුව විතරක් ඩොලර් මිලියන 480ක්. මේවා ගැනත් සොයන්න කෝප් එකේ ගරු සභාපතිතුමනි.

ඊට අමතරව, මේ ආණ්ඩුව කාලයේ ලංකා ඉතිහාසයේ ලොකුම වංචාව වෙලා තිබෙනවා. ඒ, කන්ටේනර් වංචාව; කන්ටේනර් 323ක වංචාව. අද වෙනතුරු ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා, ජනාධිපතිතුමා විසින් පත් කරපු ඒ කමිටුවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. මෙතැන ඉන්නවා, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. එතුමා ඒ වාර්තාව ඉදිරිපත් කළා. ජනාධිපතිතුමා මෙතුමාට දුන්නාද දන්නේත් නැහැ, ආණ්ඩුවේ අයට බැරි හින්දා. කොහොම හරි ඔන්න එතුමා ඒ වාර්තාව ගෙනැල්ලා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාර්තාවේ තිබෙන කරුණු ටික බැලුවොත්, ඒ පළමුවෙනි කාරණාවේම තිබෙනවා, අධ්‍යක්ෂ ජනරාල්වරයාට නැති බලයක් ආරෝපණය කරගෙන තමයි එතුමා වැඩ කරලා තිබෙන්නේ කියලා. කමිටු වාර්තාවේ දෙවැනි කරුණ හැටියට තිබෙනවා, බහලුම් නිදහස් කිරීමේ කමිටුව විනිවිදභාවයෙන් තොරව තමයි වැඩ කරලා තිබෙන්නේ කියලා. තුන්වෙනි කාරණයේ තිබෙනවා, ඒ කමිටුව - ඒ කමිටුවේ සභාපතිවරයා හැටියට හිටියේ මම හිතන හැටියට බිමල් රත්නායක මහත්තයා - සීමාවෙන් පිට තමයි වැඩ කරලා තිබෙන්නේ කියලා. හතරවෙනි කරුණ යටතේ තිබෙනවා, මේක ඇතුළේ ඇත්තටම තදබදයක් තිබිලා නැහැ කියලා. පස්වෙනි කරුණ යටතේ කියනවා, ඇත්තටම තදබදයක් තිබුණෙත් නැහැ, මේ කන්ටේනර් ටික එළියට දාපු එකෙන් ප්‍රශ්නය විසඳිලාත් නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට කියනවා මේ කන්ටේනර් එළියට දාන්න ආනයනකරුවන් 65දෙනෙක් තෝරාගෙන තිබෙනවා කියලා. අපි අහනවා, කොහොමද මේ 65දෙනා තෝරා ගත්තේ කියලා. ඒ 65දෙනා තෝරා ගත්ත විධිය ඇහුවාම, එහෙම ක්‍රමයකුත් නැහැ කියනවා. ඒ 65දෙනා තෝරා ගත්ත විධිය ඇහුවාම ඒකට උත්තරයකුත් නැහැ. මේ 65දෙනාගේ පරණ වැරදි පිළිබඳ තොරතුරු ඒ කමිටුවෙන් ඉල්ලනකොට ඒ තොරතුරුත් වසන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කමිටුව නිගමන 4ක් දෙනවා. පළමුවෙනි නිගමනයෙන් කියනවා, සාමාන්‍ය කාර්යක්ෂමතාවෙන් යුතුව වැඩ කළා නම් මේ කිසිම තදබදයක් ඇති වෙන්නේ නැහැ කියලා. දෙවන නිගමනයෙන් කියනවා මේක කෘත්‍රිමව නිර්මාණය කරපු අර්බුදයක් බව. තුන්වෙනි නිගමනය යටතේ, රතු කන්ටේනර් එළියට දැමීමේ අවශ්‍යතාවයක් තිබුණේ නැති බව සඳහන් වෙනවා. හතරවෙනි නිගමනය, ජාතික ආරක්ෂාවට බලපාන ආයුධ, මත්ද්‍රව්‍ය, ඒ වාගේම සෞඛ්‍යයට බලපාන බාල බෙහෙත් තිබෙන්න පුළුවන්, රෝගුවට පාඩු වෙන දේවල් තිබෙන්න පුළුවන් කියන එක. මේවා තමයි නිගමන. ඒ වාගේම මේ කමිටුව නිර්දේශ කරනවා, වෝහාරික විගණනයක් පැවැත්විය යුතුයි කියලා. දැන් කෝ, වෝහාරික විගණනය? කෝ CID පරීක්ෂණ? ඇයි මේවා හංගන්නේ? කෝ COPE එකේ පරීක්ෂණ? මේ කිසි දෙයක් කරන්නේ නැහැ. ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමති කෙනෙක් කිව්වා මේවා එළියට දාන්න එතුමා උපදෙස් දුන්නා කියලා. ඒක හින්දා පරීක්ෂණ නැහැ.

අද මේ කමිටුව කියනවා, ඒවායේ මත්ද්‍රව්‍ය තිබුණා කියලා. කමිටුවෙන් කියනවා, ඒවායේ බාල බෙහෙත් තිබුණා කියලා. කමිටුවෙන් කියනවා, මේ කන්ටේනර්වල ආයුධ තිබුණා කියලා. අනික් පැත්තෙන් බුද්ධි අංශ, United Nations Office on Drugs and Crime මඟින් කියලා තිබෙද්දී, කුඩු කන්ටේනර් එළියට දානවා. මේවාට කෝ පරීක්ෂණ? ආණ්ඩුව කන්ටේනර් එළියට දානවා; පරීක්ෂණ නැහැ. COPE එකේ පරීක්ෂණත් නැහැ. මේ ගැන ආණ්ඩුවේ පරීක්ෂණත් නැහැ, CID එකේ පරීක්ෂණත් නැහැ, පොලීසියේ පරීක්ෂණත් නැහැ. මේ හරහා අද රටේ ජනතාවට බාල බෙහෙත් ගෙනැල්ලා තිබෙනවා. ආයුධ ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, මේ දේවල් සම්බන්ධයෙන් කිසිම සාධාරණයක් ඉටු වෙන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.18]

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, පොදු ව්‍යාපාර කාරක සභාවේ - COPE එකේ - සිව්වැනි වාර්තාව පදනම් කරගෙන අද පවත්වන්නට යෙදෙන මෙම විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැල්සිරිපුර "නා උයන" ආරණ්‍ය සේනාසනයේ ඩක්කුවක් අනතුරට ලක්වීමෙන් භික්ෂූන්වහන්සේලා හත් නමක් අපවත්වීම පිළිබඳව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජීවත් වෙන සෑම ජාතියකම, ආගමකම ජන කොටස්වල සංවේගය, කනගාටුව මේ මොහොතේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම හිතන විධියට පසුගිය වසරකට ආසන්න කාලය තුළ ආයතන ගණනාවක් COPE එක හමුවට කැඳවා තිබෙනවා. විශේෂයෙන්ම ජාතික තරුණ සේවා සභාව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල, ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වාගේ ආයතන ගණනාවක් පසුගිය කාලය තුළ COPE එක හමුවට කැඳවා තිබෙනවා. ඒ ආයතන තුළ සිදු වෙච්ච යම් යම් අවභාවිතයන්, නාස්තිය වාගේ බොහෝ දේවල් පාර්ලිමේන්තුව තුළ සිටින මහජන නියෝජිතයින් හැටියට අපි දැක්කා. ඒ වාගේම රටේ ජනතාවත් මේ සම්බන්ධව යම් අවබෝධයක් ලබා ගත්තා. ඒ ආයතන තුළ සිදු වුණු දූෂණ, වංචා, නාස්තිය වාගේ දේවල් සමහර වෙලාවට ඒ ආයතන තුළ සිටින සුළුතරයක් වූ ඇතැම් නිලධාරින්ගේ ක්‍රියාකාරකම්, ඒ ආයතනවලට නායකත්වය දුන් දේශපාලන අධිකාරියේ දේශපාලනඥයන්ගේ මැදිහත් වීම මත සිදු වුණාය කියලා අපි හිතනවා. විශේෂයෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීමේ ඉඩ ප්‍රස්ථාව; අයිතිය තිබෙනවා අපේ රටේ ක්‍රියාත්මක වන රාජ්‍ය හෝ ඒ හා සමාන ආයතන 457ක්.

පසුගිය කාලය තුළ මේ රටේ පාලකයෝ මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිත කර තිබෙන හැටි අපි දකිනවා නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉහත කැඳවූ ආයතන නියෝජනය කළ ඇතැම් ඇමතිවරු තමන්ගේ බල්ලන්ට බෙහෙත් ගෙනෙන්න A/C buses අරගෙන ගියා. මේ රටට නායකත්වය දුන් සමහර නායකයෝ බල්ලෝ ගෙනෙන්න අපේ ගුවන් සේවාවල ගුවන් යානා අරගෙන ප්‍රංශය වාගේ රටවලට ගමන් කර තිබෙනවා. ඒ වාගේම මහා දවාලේ මේ රටේ සිදු වෙච්ච දැවැන්තම බැංකු මංකොල්ලය -මහ බැංකු මංකොල්ලය- සිදු කරපු සමහර නායකයෝ අදත් මන්ත්‍රීවරු හැටියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා අපි දකිනවා. අපේ රට පාලනය කරපු නායක නායිකාවන් අතරින් සමහර නායිකාවන් අපේ රටට ආවේ විහාර මහා දේවිය වාගෙයි. ඒ වාගේම "හොරු අල්ලනවා, හොරු අල්ලලා ගෝල් ෆේස් එකට ගෙනැල්ලා හම ගහනවා, එල්ලනවා" කියලායි අපේ රටේ ජනතාව රැවැට්ටුවේ. අපි පොඩි කාලයේ බලාගෙන සිටියා, හොරු අල්ලලා ගෝල් ෆේස් පිට්ටනියට ගෙනැල්ලා හම ගහලා එල්ලනකල්. හැබැයි, අවසානයේ මොකද වුණේ?

පසුගිය ආණ්ඩු කාලවල හිටපු සමහර දූෂිත ඇමතිවරු ඉඩම් කොල්ල කාපු හැටි අපි දැක තිබෙනවා. එවැනි අයටත් ඇමතිකම් ලබා දෙන තැනට මේ රට පාලනය කරපු ඒ නායක නායිකාවන් කටයුතු කළා. අපි දැක්කා, පසුගිය කාල පරාසය තුළ විශේෂයෙන්ම ඒ සමහර නායිකාවන් විහාර මහා දේවිය වාගේ ඇවිල්ලා සිංහාසනයෙන් බැහැලා යනකොට, ඔවුන්ව බලයට ගෙනෙන්න කටයුතු කරපු ඇතැම් පුද්ගලයන් නම් දුන්නේ "චෞර රැජින" කියලා. එහෙම තමයි මේ රටේ හිටපු සමහර නායක නායිකාවෝ අපේ රටේ සම්පත් හොරා කෑවේ. එක් රැයකින් සිදු වෙච්ච හොරකම තමයි මහ බැංකු හොරකම. හැබැයි, හොරු අල්ලනවා කියලා මේ රටේ ජනතාවගේ ඡන්දය ගත්ත ඇතැම් නායකයෝ අවසානයේ ඒ හොරුන්ව බලයට ගෙනෙන්න ඡන්දය දීලා මේ රටේ මහ පුටුවේ වාඩි කෙරෙව්වා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එහෙම කරපු අය තමයි මේ වසරක කාල පරාසය තුළ අපි මොනවාද කළේ කියලා අපෙන් ප්‍රශ්න කරන්නේ.

මේ වසරකට ආසන්න කාලය තුළ මේ රටේ විනිවිදභාවය, මූල්‍ය විනය වාගේ දේවල් ආරක්ෂා කරන්න අපි මැදිහත් වුණා. අපි මේ රටේ රාජ්‍ය ආයතන බංකොලොත් කළේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ වාගේම අපි සමහර

[ගරු සුජීව දිසානායක මහතා]

ආයතන ලාභ උපදවන ආයතන බවට පත් කළා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විශේෂයෙන්ම ලංකා ඛනිජ වැලි සමාගම, මිල්කෝ සමාගම, ජාතික කඩදාසි සමාගම, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, කාර්මික සංවර්ධන මණ්ඩලය වාගේ ආයතන අපි ලාභ ලබන ආයතන බවට පත් කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ වාගේම, අපි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ මුදල් අවභාවිත කළේ නැහැ. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ නියෝජිතයන්, නිලධාරින් COPE එකට කැඳෙව්වා අපි දැක්කා. ඔවුන් කැඳවා අධීක්ෂණය කරද්දී අපට තේරුණා මේ රටේ මුදල් කොච්චර ප්‍රමාණයක් අවභාවිත කර තිබෙනවා ද කියලා. ඇතැම් පෞද්ගලික ආයතනවල පැවැත්ම වෙනුවෙන් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ මුදල් ඔවුන් වැය කර තිබුණා. මාලබේ සමහර පෞද්ගලික විශ්වවිද්‍යාල වෙනුවෙන් ඒ මුදල් ලබා දීලා, රජයට ලැබිය යුතු ආදායම් මාර්ග අවහිර කළ ආකාරය අපි දැක්කා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, අපේ පාලන සමය තුළ අවුරුදු ගණනකට පස්සේ මේ රටේ විශ්වවිද්‍යාල තුළ ආදායම් නැති දෙමව්පියන්ගේ දරුවන්ට ලබා දුන් රුපියල් 5,000ක මහපොළ ශිෂ්‍යත්ව අරමුදල රුපියල් 7,500 දක්වා වැඩි කරන්න අපි සමත් වුණා. ඒ වාගේම, කරන්න බැරිව අතහැර තිබුණු, බංකොලොත් වෙලා තිබුණු මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු අපි නැවත පටන් ගත්තා. හොරකම, වංචාව, දූෂණය, නාස්තිය නැති වටපිටාවක් තුළ තමයි අපි ඒ දේවල් නැවත පටන් ගත්තේ. විශේෂයෙන්ම ඒ වෙනුවෙන් රුපියල් බිලියන 20කට ආසන්න වන්දියක් අපි ගෙව්වා. ඒ වන්දිය ගෙවලා තමයි මේ වැඩ කටයුතු අපි පටන් ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය අවුරුද්දක කාල පරාසය ගත්තාම විශේෂයෙන්ම අපි මේ රටේ ආදායම සහ වියදම සමබර කරගෙන ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. 2024 මුල් කාර්තුවට අදාළව මේ රටේ ආදායම රුපියල් බිලියන 2,156යි. හැබැයි, 2025 මුල් කාර්තුව තුළ අපේ ආදායම රුපියල් බිලියන 2,279 දක්වා වැඩි කර ගන්න අපි සමත් වුණා. ඒ වාගේම, මේ අවුරුද්ද ඇතුළත අපි මොනවාද කළේ කියලා අහන මහත්වරුන්ට අපි මේකත් කියන්න ඕනෑ. 2024 මුල් භාගයේ අපේ රටේ වියදම රුපියල් බිලියන 3,034යි. හැබැයි, 2025 මුල් කාර්තුව අවසන් වෙනකොට රුපියල් බිලියන 3,291ක වියදමක් සම්පූර්ණ කරන්න අපි සමත් වුණා. ඒ කියන්නේ අපි හොයන දේට සාපේක්ෂව මේ රටේ මුදල් වියදම් කළා. අපි හොරකම් කළේ නැහැ; නාස්ති කළේ නැහැ; වංචා කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟ අවුරුද්ද වෙනකොට අපි යෑමට තීරණය කර තිබෙන ඉලක්ක තිබෙනවා. ඉන් එකක් තමයි, දැනට සියයට 18ක් ලෙස තිබෙන VAT එක 2026, 2027 වෙනකොට සියයට 15ක මට්ටමට ගෙන ඒමේ ඉලක්කය. අපි ඒ මට්ටමට අපේ රට අනිවාර්යයෙන්ම ගේනවා. අපේ රටේ ජනතාවට අපි බදු සහන දෙනවා. අපි මේ අවුරුද්දේ, මේ අය වැයේදී අපේ රටේ ජනතාවට බදු පනවන්නේ නැතිවයි අය වැය ක්‍රියාවලිය සකස් කළේ. ඒ වාගේම අය වැය හිඟය, අය වැය පරතරය මේ අවුරුද්දට සාපේක්ෂව ඊළඟ අවුරුද්දේදී අපි අවම කර ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විශේෂයෙන්ම 2026 අවුරුද්ද වන විට අපේ ආර්ථික ඉලක්ක යම් පමණකින් සම්පූර්ණ කර ගැනීම තමයි අපේ රජයේ ප්‍රතිපත්තිය. කාර්යක්ෂම රාජ්‍ය සේවයක්, ආයෝජනයන්ට හිතකර පරිසරයක්, නව කාර්මීකරණයක්, සමාජ ආරක්ෂණය, ග්‍රාමීය ආර්ථිකය සවිබලගැන්වීම, ඩිජිටල්කරණය, යටිතල පහසුකම් දියුණු කිරීම කියන ක්ෂේත්‍ර පදනම් කර ගත්ත පුළුල් වූ ආර්ථික දැක්මක් එක්ක යන ආර්ථික වැඩ පිළිවෙළක් තමයි අපට තිබෙන්නේ. අපේ මූල්‍ය විනය ඉතාම හොඳ මට්ටමේ තිබෙනවා. ඒ වාගේම අය වැය පරතරය අඩු කර ගන්නත් අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම විදේශගත අයටත්, අපේ දේශීය ආයෝජකයන්ටත්, ඕනෑම කෙනෙකුට මේ රටේ ආයෝජනය කරන්න පුළුවන් ආකාරයට විනිවිදභාවයක් අපේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ තිබෙනවා. ඒ වාගේම වංචාව, දූෂණය නැති කරලා ඉතාම හොඳ ආර්ථික ප්‍රතිපත්තියක් අපි අනුගමනය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අපේ COPE එකේ සභාපතිතුමා ඇතුළු ඒ සාමාජිකයන් මේ රටේ සිදු වෙච්ච මූල්‍ය වංචා පිළිබඳ අධ්‍යයනය කරලා හොඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම වාර්තාව ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටපිටාව අපි සකස් කරන බව ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම නතර කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුජිබූර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.27]

**ගරු මුජිබූර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව සම්බන්ධව කථා කරන මොහොතේ, ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ පාර්ලිමේන්තුවේ තිබෙන ඉතා වැදගත්ම ආයතනයක් තමයි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව. පසුගිය කාලයේ ඉඳලාම තිබුණු ප්‍රශ්නය මේකයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගොඩාක් දේවල් සාකච්ඡා වෙනවා. නමුත් එසේ සාකච්ඡා කිරීමෙන් පස්සේ තීන්දු තීරණ ගත්තාට, ඒ සම්බන්ධව තිබෙන ගැටලු හා අක්‍රමිකතා සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි පසුගිය පාර්ලිමේන්තුව තුළත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තිබෙන ගොඩක් කරුණු කාරණා ගැන කථා කළා; කථා කරමින් ඒ ගැන සාකච්ඡා කළා. නමුත්, ඊට එහා ක්‍රියාමාර්ගවලට යන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී හෙළිදරව් වන කරුණු කාරණා සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග පැත්තටත් ගමන් කරන්න ඕනෑ කියලා අපි හිතනවා. මොකද, ඒක තුළ තමයි මේ වංචාව, දූෂණය අවම කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න අපට පුළුවන් වන්නේ.

ඊයේ අපේ ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා සමුළුව අමතමින් කළ කථාවේ දීත් එතුමා වංචා, දූෂණ පිළිබඳව කථා කළ ආකාරය අපි දැක්කා. විශේෂයෙන්ම අපි 2023දී දූෂණ විරෝධී පනත ගෙනාවා. ඒ දූෂණ විරෝධී පනතට අපි සියලු දෙනාම ඡන්දය දුන්නා. මේ රටේ දූෂණය අවම කර ගන්න ඕනෑ කියන අදහසින් තමයි අපි හැම කෙනෙක්ම ඒ ඡන්දය දුන්නේ.

ඒ වාගේම තමුන්නාන්සේලාටත් මේ රටේ විශාල ජන වරමක් හම්බ වුණා. ඒ ජන වරම ලබා දුන්නේත් මේ රටේ ජනතාවයි. විශේෂයෙන්ම එදා මේ රටේ පැවති රාජ්‍ය පාලනය පිළිබඳව තිබුණු අවිශ්වාසය, වංචා දූෂණ සම්බන්ධව ජනතාව අතර තිබුණු

විරෝධය නිසා 2022 වසරේ විශාල වශයෙන් ඇති වූ ජනතා නැඟිටීම තමුන්නාන්සේලාට මේ රටේ බලයට එන්න මහ පැදුව, ඒක ආස්වාදයක් වුණා. ඒ තුළ තමුන්නාන්සේලාත් මේ රටේ ජනතාවට පොරොන්දු විශාල ප්‍රමාණයක් දුන්නා. එහිදී system change එකක් ගැන කථා කළා. රාජ්‍ය පාලනයේ පාරදෘශ්‍යභාවය -විනිවිදභාවය- ගැන කථා කළා. ඒ වාගේම ඒකේ තිබෙන යහ පාලනයක් ගැන කථා කළා. නීතියේ ආධිපත්‍යය ගැන කථා කළා. පසුගිය කාලයේ මැතිවරණ වේදිකාවල තමුන්නාන්සේලාත් ඒවා ගැන කථා කළා, අපිත් කථා කළා. නමුත්, රටේ ජනතාව බහුතර බලයක් දීලා තමුන්නාන්සේලාව තමයි බලයට ගෙනාවේ. එසේ ගෙන ඒම තුළ ඒ ඇති කරනවා කියපු විනිවිදභාවය -පාරදෘශ්‍යභාවය- ගැන දැන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ විනිවිදභාවය -පාරදෘශ්‍යභාවය- තමුන්නාන්සේලා ඇත්තටම, අවංකවම ක්‍රියාත්මක කරනවා ද, එහෙම නැත්නම් ඒ විනිවිදභාවය -පාරදෘශ්‍යභාවය-, නීතියේ ආධිපත්‍යය තිබෙන්නේ තමුන්නාන්සේලාට එරෙහිව ඉන්න විරුද්ධවාදීන්ට පමණක් ද කියන ප්‍රශ්නය දැන් පැන නැඟී තිබෙනවා. ඒ ප්‍රශ්නය පැන නඟින්නේ වෙන මොකක්වත් හින්දා නොවෙයි. වර්තමාන ආණ්ඩුව තුළ දැන් යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙන නිසායි. මෙම ආණ්ඩුව තුළ ගෙන තිබෙන ඒ ක්‍රියාමාර්ගවලට විරුද්ධව ආපු චෝදනාවලට එරෙහිව ආණ්ඩුව තීන්දු තීරණ නොගැනීම නිසාම ආණ්ඩුවේ පාරදෘශ්‍යභාවය -විනිවිදභාවය- පිළිබඳව, ආණ්ඩුවේ අවංකභාවය පිළිබඳව දැන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ජාත්‍යන්තරයේ විතරක් නොවෙයි, ලංකාවේ තිබෙන හැම රැස්වීමකටම ගිහිල්ලා ජනාධිපතිතුමාත් හැමදාම කථා කරන්නේ පාරදෘශ්‍යභාවය -විනිවිදභාවය- හා නීතියේ ආධිපත්‍යය ගැනයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප සියලුදෙනාම දන්නවා, මේ ආණ්ඩුව බලයට ආ පසු චෝදනා කීපයක් ගෙනා බව. ඉස්සෙල්ලාම ආපු චෝදනාව තමයි, මන්නාරම සුළං විදුලි බලාගාරය පිළිබඳ චෝදනාව. මන්නාරම සුළං විදුලි බලාගාරයට සම්බන්ධ ටෙන්ඩර් ක්‍රියාවලියෙන් එම ව්‍යාපෘතිය ලැබුණු සමාගමට එම අවස්ථාව නොදී ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් පරිබාහිරව වෙන සමාගමකට ඒ අවස්ථාව ලබා දුන්නා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හිතවතෙකුට. ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිලි තිබෙනවා. තවම ඒ පැමිණිලි විභාග කරන්නේ නැහැ. ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් තොරව, ප්‍රතික්ෂේප වෙච්ච සමාගමකට ඒක දුන්නා. ඒක ගැන කථා කරන්නේ නැහැ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව.

ඊළඟට, කන්ටේනර් 309 සිද්ධිය ගන්න. අපි දන්නවා, කන්ටේනර් 309ක් වරායෙන් පිට කළ බව. ඒ කන්ටේනර් 309 පිට කිරීම සම්බන්ධව රටේ විශාල ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වුණා. ඒ චෝදනාව ගෙන ආවේ රේගු නිලධාරින්ගේ සංගමය. මේ පිළිබඳව විමර්ශනය කරන්න ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා. එම කමිටුවේ වාර්තාවත් එළියට ආවා. හැබැයි ආණ්ඩුව පැත්තෙන් ඒ වාර්තාව එළියට දැම්මේ නැහැ. ආණ්ඩුවෙන් එම වාර්තාව එළියට දැම්මේ නැති හින්දාම අපට එය එළියට දාන්න සිද්ධ වුණා. ඒ වාර්තාවේ පැහැදිලිව කියනවා, "ඒ කන්ටේනර් 309 එළියට දාන්න කිසිදු ආකාරයේ තදබදයක් තිබුණේ නැහැ, ඒ කන්ටේනර් 309 තුළ 'රතු කන්ටේනර්' කියලා ලේබල් ගහපු ඒවා, 'කහ කන්ටේනර්' කියලා ලේබල් ගහපු ඒවා කිසිදු ආකාරයේ පරීක්ෂාවකින්, ස්කෑන් පරීක්ෂාවකින් තොරව පිටමං කරලා තිබෙනවා" කියලා.

අපි දැක්කා, ඊයේ පෙරේදා කන්ටේනර් දෙකක් අහු වුණු ආකාරය. අන්තිමට වාර්තා වුණා, ඒවායේ අයිස් මත් ද්‍රව්‍යය තිබුණා කියලා. ඒ කන්ටේනර් දෙක පිටමං කරපු උසස් රේගු නිලධාරියෙක් ඇවිල්ලා කියනවා, අපි පරීක්ෂා කරලා තමයි ඒවා එළියට දැම්මේ කියලා. Police Narcotics Bureau එකෙන් ඇවිල්ලා පරීක්ෂා කළා කියලාත් කියනවා. පරීක්ෂා කරපු කන්ටේනර් දෙකේ අයිස් මත් ද්‍රව්‍යය තිබුණා නම් පරීක්ෂා නොකර යවපු කන්ටේනර් 309 ගැන මොන කථාද? ඒ කන්ටේනර්වල මොනවා තිබුණාද කියලා කවුරුවත් දන්නේ නැහැ. ඒ විධියට, කන්ටේනර් 309ක් ගිහිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනෙක් කාරණය මෙයයි. ඒ කන්ටේනර් 309 එළියට දැම්මා කියලා චෝදනා ලබපු හිටපු සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරයාව පත් කරනවා, අධ්‍යක්ෂ ජනරාල් විධියට. ඒකේ තිබෙන විනිවිදභාවය -පාරදෘශ්‍යභාවය- මොකක්ද? ඒකේ තිබෙන නීතියේ ආධිපත්‍යය මොකක්ද? චෝදනාවට ලක් වෙලා ඉන්න මනුස්සයාට විරුද්ධව විනය පරීක්ෂණ කරන්නේ නැතිව ඔහුට දුන්නා, promotion එකක්. ඇයි, ඔහුට promotion එකක් දුන්නේ? Promotion එකක් දුන්නේ සමහර විට ඔහු වැඩේ කරපු හින්දාද කියලා සැකයක් දැන් තිබෙනවා. මොකද, ඔහු කන්ටේනර් යවන්න කියපු හින්දා යැව්වා. ඒ කන්ටේනර් යවපු නිසා අධ්‍යක්ෂ ජනරාල් හැටියට ඔහුට මේ උසස් වීම දුන්නාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව කන්ටේනර් දෙකක් එළියට යැව්වා නේ. ඒ කන්ටේනර් ගෙනාපු මිනිස්සු ඔක්කෝම අල්ලා ගත්තා. වටේ ගිහිල්ලා ඔක්කෝම දැන් අල්ලාගෙන ඉවරයි. නමුත්, ඒ කන්ටේනර් දෙක එළියට දමපු මිනිස්සුන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නේ නැහැ.

ඒ කන්ටේනර් දෙක එළියට යවපු අයත් අත්අඩංගුවට ගන්න එපායැ. කන්ටේනර්වල තිබුණු බඩු ටික හොයාගෙන, ඒවා ගෙන්වපු මිනිස්සු හොයාගෙන ඉතා ඉක්මනින් ඒ වැඩ කරගෙන යනවා. බොහොම හොඳයි. ඒ වාගේම එම කන්ටේනර් එළියට දාපු මිනිස්සු ගැන මොකක්ද කියන්නේ? ඇයි, ඒ ගැන ආණ්ඩුව නිහඬ? ඔවුන් අත්අඩංගුවට ගැනීම තවම ප්‍රමාද ඇයි? අනික් ඒවා ටික ඔක්කෝම හොයාගෙන යන්න පුළුවන් නම්, අනික් ඒවා ටික දවසෙන් දෙකෙන් කොටු කර ගන්න පුළුවන් නම්, ඒ කන්ටේනර් දෙක වරායෙන් එළියට දමන්න අත්සන් කරපු නිලධාරින් අත්අඩංගුවට නොගන්නේ ඇයි? අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිලධාරින් අත්අඩංගුවට ගත්තාම සමහර විට කියන්න පුළුවන්, මට ඉහළින් සිටින මෙන්න මේ පුද්ගලයා තමයි මේ කන්ටේනර් එළියට දමන්න කිව්වේ කියලා. ඒක නිසාද දන්නේ නැහැ, ඒ නිලධාරින්ට අත තියන්නේ නැත්තේ? නැත්නම් එහෙම වෙන්න විධියක් නැහැ නේ. ඒ කන්ටේනර් දෙක උඩින් ඇවිල්ලා මිද්දෙනියට වැටුණේ නැහැ නේ. වරාය හරහා නේ ආවේ; ශ්‍රී ලංකා රේගුව හරහානේ ආවේ. රේගු නිලධාරින් පිළිගන්නවා නේ, ඒවා පරීක්ෂා කළා - check කළා - කියලා. Check කළා නම්, ඒවා check කරපු මිනිස්සු කවුද? මොකක්ද, ඒකේ තිබෙන විනිවිදභාවය? එම කන්ටේනර් දෙක සම්බන්ධව ජාත්‍යන්තර නිවේදනයකුත් නිකුත් කර තිබුණා. නමුත් ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

එතුමාගේ තවත් හිතවතෙකුට දුන්නා, මත්පැන් හදන ඉස්කාගාරයක් හදන්න ලයිසන් එකක්. ටෙන්ඩර් කැඳෙව්වාද? මොකක්ද, විනිවිදභාවය? කොහේද ඒ තීන්දු ගත්තේ? ඒ කිසිවක් නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒක හිතවතෙකුට දුන්නා. ඒක අල්ලසක් නොවෙයිද? ඒක විනිවිදභාවය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයිද? ඒක මේ රටේ තව කෙනෙකුට දීපු කප්පමක් නොවෙයිද? අපට මතකයි, ඉස්සර ජනාධිපතිවරුන් මේවා කළාම අනුර කුමාර දිසානායක මැතිතුමා මෙතැනදි ඒ ජනාධිපතිවරුන්ව පට්ට ගැහුවා. කලින් හිටපු ජනාධිපතිවරුන් මේවා කරපු හින්දා තමයි අලුත් ජනාධිපතිවරයෙක් ගෙනැල්ලා මේ system එක මාරු කර ගන්න ජනතාව තමුන්නාන්සේලාට වරමක් දුන්නේ. නමුත්, ඒ වරම ඒ විධියට යන්නේ නැහැ. දැන් නැවතත් යන්නේ පරණ system එකටමයි. තමුන්නාන්සේලා සමාජයට පෙන්වනවා, අපි මේ වංචා, දූෂණවලට සම්බන්ධ වුණු අය අල්ලනවා, අත්අඩංගුවට ගන්නවා කියලා. එසේ පෙන්වන ගමන් තමන්ගේ ආණ්ඩුවේ සිදු වන වංචා, දූෂණවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඕක තමයි හැම ආණ්ඩුවක්ම කළේ. තමන්ගේ එකා කළාම ආරක්ෂා කළා. ඊළඟ ආණ්ඩුව එන්න ඕනෑ, තමුන්නාන්සේලාගේ ඒවා අල්ලන්න. ඒක නොවෙයි system change කිව්වේ. තමන්ගේ එකා කළත්, කවුරු කළත් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියලා තමයි 2024දී තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව ජන වරමක් දුන්නේ. නමුත්, ඒ system එක change වෙලා නැහැ. අර පරණ system එකම තමයි දැනුත් යන්නේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට විරුද්ධව දැන් පැමිණිල්ලක් ඇවිල්ලා තිබෙනවා. මොකක්ද ඒ පැමිණිල්ල? අපි දැක්කා, ජනතා විමුක්ති පෙරමුණේ හිටපු ලේකම්වරයෙක්, පූර්ණ කාලීනයෙක්, ඒ වාගේම 1999දී ජනාධිපතිවරණයට තරග කළ කෙනෙක් වන නන්දන ගුණතිලක මැතිතුමා ඊයේ චෝදනාවක් කළ ආකාරය. ඔහු දැන් යූඑන්පීකාරයෙක් වෙන්න පුළුවන්. ඔබතුමන්ලාත් ඉස්සර මහින්ද රාජපක්ෂත් එක්ක හිටියා. වර්තමාන ජනාධිපතිතුමා ඉස්සර මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවේ ඇමතිකම් දැරුවා. කෘෂිකර්ම ඇමතිකම දැරුවා නේ. දැන් මොකද ඒක ගැන කියන්නේ? එතකොට ඒක හරිද? තමුන්නාන්සේලා චන්ද්‍රිකා මැතිනිය එක්ක එකතු වෙලා හිටියා, චන්ද්‍රිකා මැතිනිය එක්ක ආණ්ඩු හැදුවා, චන්ද්‍රිකා මැතිනිය එක්ක එකතු වෙලා බුලත් කොළය ලකුණෙන් ඡන්දය ඉල්ලුවා. එතකොට ඒවා හොඳයි. නන්දන ගුණතිලක දැන් යූඑන්පීකාරයෙක් වෙන්න පුළුවන්. නමුත් එතුමා දේශපාලනය පටන් ගත්තේ ජනතා විමුක්ති පෙරමුණෙන් නේ. ජනතා විමුක්ති පෙරමුණේ නීති අංශයේ හිටපු ලේකම්වරයා හැටියට එතුමා අද චෝදනාවක් කරනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් වන රංග දිසානායක මහතාව ජනතා විමුක්ති පෙරමුණේ නීති අංශයේ වැඩ කරන්න කැඳෙව්වා කියලා. එය බරපතළ චෝදනාවක්. අපි උදේ ඇහුවා, ඒක ගැන. නමුත් උත්තරයක් දුන්නේ නැහැ. මම හිතනවා, ආණ්ඩුවට මේ සම්බන්ධව වගකීමක් තිබෙනවා කියලා. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මේ වාගේ කොමිෂන් සභා ගොඩනැඟුවේ මේ රටේ ස්වාධීනව වැඩ කරන ආයතන හැටියට ඒවා පත් කර ගන්න.

පාර්ලිමේන්තුවේ තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. ඒ සභාව ස්වාධීන කොමිෂන් සභාවල පත් කිරීම් සඳහා ගෙනෙන නාම යෝජනා අනුමත කරන්නේ ඔවුන්ට ස්වාධීන පුද්ගලයන් හැටියට වැඩ කරන්න අවස්ථාව දෙන්න. දැන් අපට සැකයක් තිබෙනවා, රංග දිසානායක විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන්ගේ ගනුදෙනු ඔක්කෝම හොයන්නේත්, මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ දේවල් හොයන්නේ නැත්තේත් ඇත්තටම එතුමා ජේවීපීකාරයෙක් හින්දාද කියලා. එහෙම හිතන්න පුළුවන් නේ. මොකද, පැමිණිලි ගොඩක් තිබෙනවා. එතුමා ඒවා ගැන විමර්ශනය කරන්නේ නැත්තේ ඇත්තටම එතුමා ජේවීපීකාරයෙක් හින්දා ද? මේ වාගේ චෝදනා කලින් ආණ්ඩුවලටත් එල්ල වෙලා තිබුණා. ඒකයි මම මේ කියන්නේ. කලින් ආණ්ඩු පත් කළ නිලධාරින් සමහර තැන්වලදී තමන්ගේ ආණ්ඩුවේ අය කරන දේවල් හෙව්වේ නැහැ, අනෙක් අයගේ ඒවා හෙව්වා. නමුත් ඒ දෙකම එපා, මේ රටේ විනිවිදභාවයකින් -පාරදෘශ්‍යභාවයකින්- යුතුව ස්වාධීනව වැඩ කරන්න ඕනෑය කියලා මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට විශාල ජන වරමක් දුන්නා. අන්න ඒ ජන වරම දැන් අවභාවිත - misuse - කරන්න එපා. අපට ජේනවා, ඒ ජන වරම අවභාවිත වෙන බව. මොකද, තමුන්නාන්සේලාගේ අය ගැන හොයන්නේ නැහැ, අනෙක් අය ගැන හොයනවා.

නන්දන ගුණතිලක කරපු චෝදනාව ඉතාම බරපතළයි. ඒ චෝදනාව ගැන කියද්දි තව කාරණයක් අපට මතක් වෙනවා. විශේෂයෙන්ම අද ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එදා පොහොර සංස්ථාවේ සභාපතිවරයාව සිටියදී එතුමාට විශාල දූෂණ චෝදනාවක් එල්ල වෙලා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව එතුමාට විරුද්ධව නඩු දාන්න යනවා කියලා පසුගිය දා පුවත් පත්වල පළ වුණා. ඒක පුවත් පත්වල පළ වෙලා දැනට මාසයක් වෙනවා. නමුත් තවම නඩු දැම්මේ නැහැ. එහෙම නඩු නොදා ඉන්නේ ඒ තමන්ගේ කෙනෙක් හින්දාද? පරීක්ෂණ ඔක්කෝම ඉවරයි, නඩු දානවා කියලා පුවත් පත්වල පළ වුණා. නමුත් නඩුව වැටෙන්නේ නැහැ. අපට ආරංචියක් තිබෙනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාව කැඳවා මේ නඩුව දාන්න එපා කියලා කියපු බවට. එහෙම කථාවකුත් තිබෙනවා. නඩුව නොවැටෙන්නේ ඒක හින්දාද දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විධියට මේ රට ඉදිරියට ගෙනයන්න බැහැ. මොකද, මේ විධියට තමයි පසුගිය කාලයේත් කළේ. හැම ආණ්ඩුවක්ම ඇවිල්ලා තමන්ගේ මිනිහාව ආරක්ෂා කරන එක තමයි කළේ. ඒකට තමයි මේ රටේ ජනතාවගෙන් විශාල විරෝධයක් ආවේ, ඒකයි ජනතාව කැරලි ගැහුවේ. දැන් තමුන්නාන්සේලාත් ඇවිල්ලා ඒකම කරනවා නම් අපි ඔක්කෝටම නැවත වතාවක් කැරැල්ලකට මුහුණ දෙන්න වෙයි. ගිය පාර නම් මේ පාර්ලිමේන්තුවේ හිටියේ වෙන මිනිස්සු නේ. දැන් ඉන්නේ තමුන්නාන්සේලායි, අපියි නේ. ඊළඟට අපි ඔක්කෝම එකතු කරලා මේක වට කරයි, තමුන්නාන්සේලාත් අර පරණ system එකටම යනවා නම්. අපට ජේනවා, දැන් ඒ system එක තමයි යන්නේ කියලා.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් ලැබූ විශාල ජයග්‍රහණයක්. ඒ පනත යටතේ ඉල්ලීම් කළාට, ඒවා ඉටු වන්නේ නැහැ. ජනාධිපති

ලේකම් කාර්යාලයට ඉල්ලීම් දෙකක් යොමු වුණා. ඉන් එකක් යොමු වුණා, ජනාධිපතිතුමාගේ මාධ්‍ය අංශයේ වැඩ කරන අයගේ විස්තර ලබා දෙන්න කියලා. නමුත් ඒවා දෙන්න බැහැ කියලා ප්‍රතික්ෂේප කළා. ඊළඟට තව ඉල්ලීමක් කළා, ජනාධිපතිතුමා මේ රට ඇතුළේ කළ සංචාරවලට ගිය වියදම දෙන්න කියලා. ඒකත් ප්‍රතික්ෂේප කළා. කලින් හිටපු ජනාධිපතිවරුන් තමන්ගේ මාධ්‍ය අංශයේ වැඩ කළ අයගේ තොරතුරු දුන්නා. ඇයි, වර්තමාන ජනාධිපතිතුමාට ඒවා දෙන්න බැරි? මේ ජනාධිපතිතුමා තරම් විනිවිදභාවය -පාරදෘශ්‍යභාවය - ගැන, අවංකභාවය ගැන කථා කළ ජනාධිපතිවරයෙක් - මෙතුමා තරම් ඒවා ගැන කථා කළ කෙනෙක් - පසුගිය ඉතිහාසයේම ඉඳලා නැහැ කියලායි මම හිතන්නේ. එතුමා ජාත්‍යන්තරයට ගිහිල්ලාත් ඒවා ගැන කථා කරනවා. නමුත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ එතුමාගේ කාර්යාලයේ ඉන්න අය ගැන තොරතුරු ඉල්ලුවාම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තොරතුරු දෙන්නේ නැහැ. ඒවා වසන් කරනවා. ඇයි, වසන් කරන්නේ? තොරතුරු වසන් කළාම තමයි සැකයක් ඇති වෙන්නේ. ඉල්ලපු තොරතුරු දුන්නා නම් ප්‍රශ්නයක් නැහැ. හිටපු ජනාධිපතිවරු තොරතුරු දීලා තිබෙනවා. නමුත්, මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ තොරතුරු දෙන්නේ නැහැ. ඒ, මම කිව්වේ තොරතුරු නොදීමේ ප්‍රශ්නය ගැන.

ඊළඟට, රාජ්‍ය සේවයේ උසස්වීම් ලබා දීම පිළිබඳ ප්‍රශ්නය ගනිමු. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, පසුගිය කාලයේ රාජ්‍ය සේවය පිළිබඳව විශාල වශයෙන් චෝදනා තිබුණු බව. තමුන්නාන්සේලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ රාජ්‍ය සේවය සම්බන්ධව තිබෙනවා. එහි පැහැදිලිව කියනවා, රාජ්‍ය සේවයේ ඉන්න කුසලතා, දක්ෂතා, අවංකභාවය තිබෙන අයට තමයි උසස්වීම් ලබා දෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් රාජ්‍ය සේවයට දැන් වෙලා තිබෙන දේ අපි දැක්කා නේ. ජනාධිපතිතුමා පත් වුණු ගමන් තමන්ගේ හිතවතෙක්ව ගෙනැල්ලා දා ගත්තා, ජනාධිපති ලේකම් හැටියට. ඒ තනතුර සඳහා සුදුසුකම් තිබුණු අය ඔක්කෝම දැන් pool එකේ ඉන්නේ. ඊළඟට, විගණකාධිපතිවරයා හැටියට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිටපු අධ්‍යක්ෂවරයෙක්ව පත් කරන්න ගියා. වාසනාවකට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒක අනුමත කළේ නැහැ. මම කවදාවත් හිතුවේ නැහැ, අනුර කුමාර දිසානායක වාගේ කෙනෙක් එවැනි යෝජනාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යවයි කියලා. ඒ කියන්නේ, රාජ්‍ය සේවයට සම්බන්ධයක් නැති, රාජ්‍ය සේවයේ හිටපු නැති කෙනෙක්ව මේ රටේ විගණකාධිපති හැටියට පත් කරන්න එතුමා යෝජනා කරයි කියලා මම කවදාවත් හිතුවේ නැහැ. අන්තිමට එම යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී පරාජයට පත් වුණා. ඒ, ජනාධිපතිතුමාගේ යෝජනාව. එහෙම නම් මොකක්ද ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියලා තිබෙන්නේ? ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව කියා තිබෙනවා, "නිපුණතා, දක්ෂතා, කුසලතා තිබෙන අයට දේශපාලන භේදයකින් තොරව ඉදිරියට යන්න ඉඩ දෙනවා" කියලා. නමුත්, අද වනකොට ඒ පොරොන්දුව කඩ කරලා තිබෙනවා.

ඊළඟට, විදේශ සේවය - Foreign Service - ගනිමු. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව තිබෙනවා, Foreign Service එක ගැන. එහි මොකක්ද කියන්නේ? "විදේශ සේවයේ ඉන්න අයව තමයි තානාපතිවරුන් හැටියට පත් කරන්නේ" කියලා ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා. නමුත්, කාවද පත් කළේ? පසුගිය දා නවදෙනෙක් පත් කළා. ඒ නවදෙනාගෙන් එක් කෙනෙක් හැරෙන්න අනික් අටදෙනාම Foreign Service එකේ නොවන අය. ඒ අයගෙන් එක් කෙනෙක් තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලපු කෙනෙක්. ඒ පුද්ගලයාව කියුබාවට පත් කළා. ඊළඟට, පසුගිය සතියේ ජනතා විමුක්ති පෙරමුණේ cadre එකේ කෙනෙක්ව පත් කළා. ඒ, කොහේටද? ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් තනතුරට. ඒකත් දේශපාලන පත්වීමක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

මම ඒ කාරණා විස්තර කළේ තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව ජන වරමක් දුන්නේ මොකටද කියන එක හොඳට මතක් කර ගන්න. ජනතාව එම ජන වරම ලබා දුන්නේ විනිවිදභාවයකින් වැඩ කරන්න; පාරදෘශ්‍යභාවයකින් වැඩ කරන්න; මේ රටේ නීතියේ ආධිපත්‍යය හදන්න; මේ රටේ රාජ්‍ය පාලනය සම්බන්ධව විනිවිදභාවයක් තියා ගන්න. ඒකට තමයි ඒ ජන වරම තමුන්නාන්සේලා ඉල්ලුවේ. නමුත්, ජන වරම ඉල්ලපු අරමුණුවලට හාත්පසින්ම වෙනස් වූ ක්‍රියාදාමයක් දැන් තමුන්නාන්සේලා කරගෙන යනවා. ඒ නිසා එම ක්‍රියාදාමය තුළ නැවත වතාවක් රට තුළ නැඟිටීමක් එන්න පුළුවන් කියන ඒ අනතුරු ඇඟවීම කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.45]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විසින් පසුගිය දිනක සභාගත කරපු වාර්තාව හා ඊට අදාළ ආයතන සම්බන්ධව සිදු කරන මෙම සභාව කල් තැබීමේ විවාදයේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඇති වූ සිද්ධි ටික තහනම් වචනය වාගේ මට මතක් වෙනවා. ඒවා කථා නොකර ජනතාවට අපි දුන් පොරොන්දු ගැන කථා කරනවා. ඒක හොඳයි. ඒ ගැන නැවත නැවතත් මතක් කරනවා. ඒකත් හොඳයි. යෝජනාවේ මාතෘකාව ගැන කථා නොකර ඒවා මතක් කරන එක හොඳයි. මොකද, මේ රටේ ජනතාව දන්නවා, පසුගිය අවුරුද්ද තුළ අපි ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරමින්, අපේ රට ආර්ථික වශයෙන් ස්ථාවර කරමින්, ජනතාවගේ විශ්වාසය දිනා ගන්න කටයුතු කරමින් සිටින බව. ජනතාව සුන්බුන් විපක්ෂය එක මිටකට අරගෙන විසි කරමින්, ප්‍රතික්ෂේප කරමින් ඉන්නේ.

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

අපි විපක්ෂයේ ඉන්නකොට ජනතාවත් එක්ක මොන තරම් ක්‍රියාකාරකම් කළාද? දැන් මේගොල්ලන්ට පුළුවන්ද, ජනතාව එකතු කරගෙන සතියකට එක ක්‍රියාකාරකමක්වත් කරන්න? පටන් ගන්නවා, දිය වෙලා යනවා. ආරම්භ කරනවා. නමුත්, නායකයෝත් නැහැ, වග කියන කෙනෙකුත් නැහැ. ඒක රටේ ජනතාවත් දන්නවා. වෘත්තීය සමිතිත් දන්නවා. මොකද, මේගොල්ලන්ට වෘත්තීය සමිතියකට නායකත්වය දෙන්නත් බැහැ; ජනතාවට නායකත්වය දෙන්නත් බැහැ; විපක්ෂයකට නායකත්වය දෙන්නත් බැහැ. මෙතැන ඉතින් කථා කරන්න වෙලාව හම්බ වෙනවා නේ. එම නිසා ඒ වෙලාවෙන් හොඳට ප්‍රයෝජන අරගෙන සභාවේ කාලය නාස්ති කරමින් ඉන්නවා. ඒකම තමයි මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඔයගොල්ලන්ට කරන්න පුළුවන්. ඒ වාගේම ඔයගොල්ලන්ට හොඳටම කරන්න පුළුවන් දේ තමයි, බොරු කියන එක. ඒ නිසා දිගටම ඔහොම කරගෙන යන්න. නමුත්, අපි ජනතාවත් එක්ක එකතුවෙලා, ජනතාවට දුන් පොරොන්දු ටික ඉෂ්ට කරමින්, මේ රට ස්ථාවර කරමින්, අපේ රටේ ජනතාවට ඕනෑ විධියට ජයග්‍රහණය කරා මේ රට ගෙනියනවා. ඒ නිසා ඔය විධියටම බොරු කියමින් ඉන්න. ඒක තමයි ඔයගොල්ලන්ට ජනතාව උරුම කරපු දේ. ඒ පැත්තෙන් අපිට සතුටුයි. අවුරුද්දක් ගත වුණත් මේ සුන්බුන් විපක්ෂයට බැරි වුණා, එක පැත්තකින්වත්, එක දෙයකින්වත් ජනතාවගේ විශ්වාසය දිනා ගන්න. අන්තිමට ඉතුරු වුණු ශේෂ පත්‍රය ඒකයි.

ඊළඟට මම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගැන කථා කරන්න කැමතියි. එය අපේ දසවන පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වන ඉතා සක්‍රිය කාරක සභාවක්. අපි ආයතන කිහිපයක නිලධාරීන් පසුගිය කාලයේදී මේ කාරක සභාවට ගෙන්වූවා, ඒ විගණන වාර්තා පදනම් කරගෙන. එලෙස ගෙන්වපු ආයතන 14ක විගණන වාර්තා විමර්ශනය කරද්දී නිලධාරීන් අපහසුතාවට පත් වන හැටි අපි දැක්කා. ඒ වාගේම අද මේ උඩ පැන පැන කථා කරන, මේවාට සම්බන්ධ දේශපාලනඥයන් කොහොමද හැංගිලා ඉන්නේ කියන එක අපි දැක්කා. මේ විගණන වාර්තා කෝප් කමිටුවේදී විමර්ශනය කරද්දී අපි දැක්කා, පසුගිය කාලයේදී ජනතාවගේ මුදල් මොන තරම් ප්‍රමාණයක් විනාශ කරලා තිබෙනවාද කියලා. මේ පාර්ලිමේන්තුවත් ඒක දැක්කා, රටේ ජනතාවත් දැක්කා. ඒ නිසා අපිට ඕනෑ වුණා, මේ කෝප් කමිටුවේ කරන කාර්යභාරය පවා වෙනස් කරන්න හා ඒ කාර්යභාරය තවත් විධිමත් කරන්න. පසුගිය කාලයේ අපි දිගටම දැක්කා, කෝප් කමිටුවට ආයතනවල නිලධාරීන් ගෙන්වලා විමර්ශනය කරනවා. ඊට පස්සේ අපිට කරන්න තිබෙන්නේ මාස තුනකට වතාවක් පාර්ලිමේන්තුවට වාර්තාවක් සභාගත කරන එකයි. ඒ වාගේම ඒ වාර්තාව පිළිබඳව විවාද කරන්න පුළුවන්. ඊට පස්සේ නීතිපතිට යොමු කරන්න පුළුවන්. එහෙම නැත්නම් අපේ පුස්තකාලයේ එය වාර්තාවක් විධියට තබන්න පුළුවන්. හැබැයි, ඉන් එහාට අපි යන්න ඕනෑ. ඇයි, ඒ? මේ ආයතන පිළිබඳව විමර්ශනය කරද්දී කෝප් කමිටුවට ඇවිල්ලා ඇත්තටම කරුණු දැක්වූයේ ඒ නිලධාරීන් තමයි. හැබැයි, නිලධාරීන් මේ කරුණු දක්වද්දී ඒවාට නියෝග දීලා තිබෙන්නේ, අයථා විධියට නියෝග කරන්න උපදෙස් දීලා තිබෙන්නේ කවුරු කියලාද කිව්වේ? අමාත්‍ය මණ්ඩල ලේකම්වරු, එහෙම නැත්නම් දේශපාලනඥයන්, අමාත්‍යවරු. ප්‍රසිද්ධියේ මේවා හෙළිදරව් වුණා. ඒ නිසා අපිට ඒ පිළිබඳව වගකීමක් තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරු මතක් කරලා දුන්නා නේ, අපි කරන්න ආපු කාර්යභාරය. අපි කරන්න ආපු කාර්යභාරය තමයි, ජනතාවගේ මුදල්වලට වග කියන එක. අපි අවුරුද්දක් ඒ වගකීම ඉටු කළා. ඒ වාගේම ජනතා මුදල් ආරක්ෂා කරන්න ඕනෑ. හොරුන්ට දඬුවම් දෙන්න ඕනෑ. අපි මේ විපක්ෂයෙන් අහන්නේ, ඒ තුනම අපි කළේ නැද්ද කියන එකයි. ඔයගොල්ලන් කියන ඔක්කොම දේවල් කරන්න අපිට තව කල් තිබෙනවා. ඒ වාගේම අපි ජනතාවට දීපු පොරොන්දු තුනක් තිබෙනවා. ඒ පොරොන්දු තුන අපි ඉතා හොඳින් ඉෂ්ට කරලා තිබෙන්නේ. ඔබ කියනවාද, ඒවා අපි ඉෂ්ට කරලා නැහැ කියලා? අපි ඒවා ඉෂ්ට කරලා නැහැ කියලා කියන්න බැහැ. ඒ නිසා මින් ඉදිරියට මේ කාරක සභාවේ ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යන්න ඕනෑ. ඒ සඳහා ඕනෑ නම් කෝප් කමිටුවේදී කරුණු දැක්වූවාට පස්සේ නැවතත් අමාත්‍යවරයාට පුළුවන්, අපි මෙහෙම කළා, මෙහෙම කළා කියලා අමතරව වාර්තාවක් ලබා දෙන්න. ඉන් එහාට යනවා නම් මේකට ක්‍රියාමාර්ග ගත යුතුයි කියලා අපි හිතනවා. මොකද, නිලධාරියෙක් වරදක් කළා නම් ඔහුට අභ්‍යන්තර විගණනයක් කරලා, ඒ විගණනය තුළින් අධිචෝදනාවක් පැවරෙනවා. එතකොට අධිචෝදනාවක් ගෙවන්න වෙනවා. එහෙම නැත්නම් අභ්‍යන්තර විගණනයෙන් ඔහු වැරදිකරු වුණොත් සේවයෙන් පහ කරනවා. නැත්නම් ඔහුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්නවා. හැබැයි, පසුගිය කාලයේ එක මිටකට එකතු වෙලා මේ සියලු ආයතන කඩා වට්ටන්න කටයුතු කළ කට්ටිය, මේ කැඟහන කට්ටිය මේ හොරකම්වල පිටුපසින් නොවෙයි, ඉදිරියෙන් හිටියේ. ඉදිරියෙන් ඉඳලා නිලධාරීන්ට ඒ හොරකම්වලට උදවු කරපු, නිලධාරීන් අපහසුතාවට පත් කරපු, ඉතාම කීර්තිමත් නිලධාරීන් පවා මේ උගුලට හසු කරගත්ත මේ දේශපාලනඥයින්ට මොකද කරන්නේ? ඒකයි අපි අහන්න ඕනෑ. මේ දේශපාලනඥයින්ට මොකද කරන්නේ? මේ වැරැදිකරුවන්ට මොකද කරන්නේ? ඒ සඳහා අපේ කාලය තුළ අපට තිබෙන සියලු ආයතන -ආයතන 457ම- යම්කිසි ලිඛිත පරීක්ෂණයකට, විමර්ශනයකට භාජන කරලා නිගමන ලබා දෙන්න කෝප් කමිටුව විධියට අපි උත්සාහ කරනවා. ඒ නිසා ඒ සියලු ආයතන පුළුවන් තරම් විමර්ශනයට ලක් කරන්න අපි උත්සාහ කරනවා. ඒ වාගේම ඒ නිසි වාර්තා දීලා, ඒ කෝප් කමිටුවේ විමර්ශන අනුව අමාත්‍යවරයා හෝ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඒ ආයතන ක්‍රියා කරන්නේ නැත්නම් ඉන් එහාට ගිහිල්ලා -මොකද, අභ්‍යන්තර පරීක්ෂණ පවත්වන්න පුළුවන්- ඔවුන්ට ඒ සඳහා පරීක්ෂණයක් කරලා, නීතිමය කටයුතු කරන්න පුළුවන්. අපි දන්නවා ඒ නීතිමය කටයුතු කරන්න යද්දී ඉතිහාසයේ මේ ආයතනවල සිදුවූ සියලු දේට වගකියන්න ඕනෑ මේ දේවල්වලට සම්බන්ධ වෙලා හිටපු මේ විපක්ෂයේ කණ්ඩායම් බව.

පසුගිය කාලයේ වුණු සිදුවීමක් ගැන මම කියන්නම්. අපි "විගමණික හරසර" කියන වැඩසටහන හඳුනා ගත්තේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේයි. මේ වැඩසටහන 2024 ක්‍රියාකාරී වැඩ සැලැස්මේ නැහැ. මේගොල්ලන් ඡන්දය වෙනුවෙන් කඩිමුඩියේ කරපු දේවල්, මේ. මේ වැඩසහටන අධ්‍යක්ෂ මණ්ඩලයේ කිහිප දෙනෙකුට ඕනෑ නිසා අනුමත කරගෙන සුබ පැතුම් පත් තුනක් සඳහා මිලියන 1.9ක් වියදම් කරනවා. ශ්‍රමිකයන් ප්‍රවාහනය කිරීම සඳහා මිලියන 8.2ක් වියදම් කරනවා. ආහාරපාන සඳහා, රැස්වීම් ශාලාව සඳහා මිලියන 6.2ක් වියදම් කරනවා. විගණනයේදී කියනවා, මෙච්චර වියදම් කරලා ශ්‍රමිකයන්ට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නැත කියලා. මොනවාටද මේ වියදම් කළේ? ඒ වාගේම ඒ විගණන වාර්තාවේ පෙන්වලා දෙනවා, "ජයගමු ශ්‍රී ලංකා - Glocal Fair" කියලා වැඩසටහන්, job fairs කරලා තිබෙනවා කියලා. මේ වැඩසටහනේ ශ්‍රමිකයින් 336ක් හඳුනා ගන්න බිලියන ගණනක් වියදම් කරනවා. මොවුන් job fairs කළා; "Glocal Fair" කළා. ඒ අතර විගමණිකයින් සඳහා "Smart Youth" කියලා වැඩසටහනකුත් කරලා තිබෙනවා. මේ වැඩසටහන් තුනටම වියදම් කරපු මුදල බිලියන ගණනක් වුණත්, ඇත්තටම හඳුනාගෙන තිබෙන්නේ ශ්‍රමිකයින් 335කටත් අඩු ප්‍රමාණයක්. දැන් අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ විගණන වාර්තා අනුව පසුගිය කාලයේ විශාල මුදල් අවභාවිතාවක් කරලා තිබෙනවා. හැබැයි, තීන්දු අරගෙන තිබෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඕනෑ විධියට. මේ ගැන වැඩියෙන් අධ්‍යයනය කරද්දී

අපට පැහැදිලි වුණා, මේ ව්‍යාපෘති සඳහා ඉඳලා තිබෙන්නේ ඒ කාලයේ හිටපු ඇමතිවරයා හා ඔහුගේ සහචරයන් කියලා. මේවා ඡන්දයට කරපු fairs.

ඒ වාගේම අද මේ කෑගහන කට්ටිය පසුගිය කාලයේ මොකක්ද කරලා තිබෙන්නේ? Job fairs නොවෙයි ඇත්තටම කරලා තිබෙන්නේ, ICE fairs. Job fairs කළා නම් අපේ රටේ රැකියා අවස්ථා වැඩි වෙන්න ඕනෑ නේ. Job fairs කරලා නැහැ; ICE fairs කරලා තිබෙන්නේ; "අයිස්" කර්මාන්තශාලා දාලා තිබෙන්නේ. ශ්‍රමිකයින් නොවෙයි හදලා තිබෙන්නේ. "අයිස්" කර්මාන්තශාලා හදලා තිබෙන්නේ. ඒවාට සම්බන්ධ පක්ෂ විධියට හෙළිදරව් වෙලා ඉන්න කට්ටිය, පක්ෂ නියෝජිතයින් විධියට හෙළිදරව් වෙලා තිබෙන කට්ටිය අද අපට ඇඟිල්ල දිගු කරනවා. හැබැයි අපට කොච්චර ඇඟිල්ල දිගු කළත්, පිටුපස හැරිලා බලන්න, ඔයගොල්ලන්ගේ පිටුපස ඉන්නේ ඔයගොල්ලන්ගේ ICE fairsවලට උදවු කරපු කට්ටිය.

අද කෝප් කමිටුව හරහා අපි කරන්න හදන්නේ මොකක්ද? අපට ඕනෑ මේ අපරාධකරුවන්ට දඬුවම් දෙන්නයි. ඇත්තටම, ජනතාවගේ මුදල් හොරකම් කරපු, අවභාවිත කරපු දේශපාලනඥයනුත් මේකට වගකියන්න ඕනෑ. ඔවුන්ටත් මේ සම්බන්ධයෙන් දඬුවමක් දෙන්න ඕනෑ. ඒ සඳහා තමයි අපි මේ යෝජනාව කරන්නේ. ඕනෑම කෙනෙකුට පුළුවන්, මේ අනාවරණය වුණු තොරතුරු ටික අරගෙන ගිහිල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කරන්න. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන්න පුළුවන්. ඒකට අවශ්‍ය ඇත්ත තොරතුරු ටික කෝප් කමිටුව තුළ ඉතාම හොඳින් විමර්ශනය කරලා ජනතාවට ලබා දෙනවා. ඒ තොරතුරු අරගෙන, ඔබේ මුදල් හොරකම් කරපු, මේ රට "අයිස්" කන්දක්, අපායක් බවට පත් කරපු, අද මේ බොරුවට කෑ ගහන දේශපාලනඥයින්ට විරුද්ධව කටයුතු කරන්න කියලා ජනතාව දැනුවත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.58]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගුවන් සේවා ක්ෂේත්‍රය, ගුවන් සේවා අධිකාරිය, ගුවන් තොටුපොළ ගැන සාකච්ඡාවට භාජන වෙන මේ අවස්ථාවේ මම කැමැතියි, විෂයභාර ඇමතිවරයාට විශේෂයෙන්ම ගුවන් ක්ෂේත්‍රයට අදාළ යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න. ඇත්ත වශයෙන්ම සතුටුයි කියන්න, අපේ රටේ ගුවන් ගමන්වල air safety එක ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා. ICAO Universal Security Audit Programme එකේ aviation security score එක අපේ රටට තිබෙනවා, සියයට 92ක. ඒ වාගේම අනෙකුත් රටවල් එක්ක සන්සන්දනය කරනකොට අපේ රටේ ගුවන් සේවා ක්ෂේත්‍රයේ ආරක්ෂිතභාවය සම්බන්ධයෙන් අපි ඉහළ මට්ටමක ඉන්නවා. හැබැයි, රටක් හැටියට ගුවන් සේවයේ ආරක්ෂිතභාවය මීට වඩා වර්ධනය කිරීම සඳහා අපි පියවර ගත යුතුයි. විශේෂයෙන්ම දේශීය වශයෙන් ක්‍රියාත්මක වෙන ගුවන් ගමන්වල - domestic aviationහි - ආරක්ෂිතභාවය තහවුරු වීම ඉතාම වැදගත් කියන එක අපට පැහැදිලි වෙනවා. Bell 212 helicopter crash එකක් වුණා, 2025 මැයි මාසයේ. 2021දී Cessna 172 crash එකක් වුණා. PT-6 trainer aircraft crash එකක් වුණා, 2020 සහ 2023 දී. මේ විධියට දේශීය වශයෙන් යම් යම් අනතුරුදායක සිදුවීම් ගුවන් ගමන් ක්ෂේත්‍රයේ සිදු වෙලා තිබෙනවා. ඒ නිසාම මම මේ අවස්ථාව උපයෝගී කරගන්නවා, ගුවන් ගමන්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා ඉතාම ඉක්මනින් ගත යුතු පියවර කිහිපයක් පිළිබඳ යෝජනා කිහිපයක් වර්තමාන විෂයභාර ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට.

ඇත්ත වශයෙන්ම අපේ රටේ හදිසි අවස්ථා ප්‍රතිචාර සහ ආරක්ෂක යටිතල පහසුකම් ක්ෂේත්‍රයෙන් අප හුඟක් දියුණු වෙන්න අවශ්‍යයි. ඒකට කියනවා, emergency response and safety infrastructure කියලා. හදිසි වෙලාවකදී ප්‍රතිචාර - emergency response - දක්වන්න නම්, ප්‍රාදේශීය මට්ටමින් - Jaffna, Palali, Trincomalee, Hambantota, Mattala, Kandy, මේ යනාදී වශයෙන් - ඒවා පිහිටුවන්නට කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා ඉක්මන් පියවරක් හැටියට හදිසි අවස්ථා ප්‍රතිචාර සහ ආරක්ෂක යටිතල පහසුකම් - emergency response and safety infrastructure - ක්ෂේත්‍රය අපි රටක් හැටියට වැඩි දියුණු කරන්න ඕනෑ. ඒ වාගේම සොයා බැලීම් සහ මුදා ගැනීම් - search and rescue - වැඩ පිළිවෙළ දියුණු කරන්නට, ඒ හැකියාව ප්‍රවර්ධනය කරන්නට අපි අනිවාර්යයෙන්ම කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම 1974දී සිදු වුණු Martinair crash එකත් එක්ක අපට අත්දැකීම් ලැබුණා. ඒ නිසා search and rescue helicopters ප්‍රාදේශීය මට්ටමින් ස්ථාපනය කිරීම අතිශයින්ම වැදගත් වෙනවා.

ඒ වාගේම, GPS-based Aircraft Tracking for All Flights System එක ක්‍රියාත්මක කරන්න කියලා අපි යෝජනා කරනවා. Air Traffic Control and Navigation Enhancement - ගුවන් ප්‍රවාහනය පාලනය සහ නාවික ප්‍රවණතාව වර්ධනය කිරීම - ද කළ යුතුයි. දැනට අපට තිබෙනවා, primary and secondary radar 200 nautical miles coverage එකක්. හැබැයි, භූගෝලීය පරතර තිබෙනවා; limited coverages තිබෙනවා. විශේෂයෙන්ම යාපනයට එහා තිබෙන coastal areasවල, නැගෙනහිර පළාතේ, දකුණු බල ප්‍රදේශයේ දෙවුන්දර තුඩුවේ, ඒ වාගේම මධ්‍යම කඳුකරයේ යම් යම් ප්‍රදේශවල භූගෝලීය පරතර - geographical gaps - අපට පෙනෙන්නට තිබෙනවා. අපි ඒ අඩු පාඩුව මඟ හරවා ගන්නට ඕනෑ, air traffic control and navigation enhancement සිදු කරලා. ඒ වාගේම, වැඩිදියුණු කළ නාවික පද්ධතියක්, නාවිකකරණ පද්ධතියක් - enhanced navigation system ඒකක් - අපට තිබෙන්නට ඕනෑ. මේ යටිතල පහසුකම් වර්ධනය කිරීම ගුවන් ගමන් ක්ෂේත්‍රය වඩාත් සුරක්ෂිත කිරීමට, වඩාත් ආරක්ෂා කිරීමට ඇත්ත වශයෙන් අතිශයින් වැදගත් වෙනවා. ඒ වාගේම maintenance and technical support distribution - නඩත්තු සහ තාක්ෂණික සහාය බෙදා හැරීම - ද අවශ්‍යයි. ඒක කොළඹ ප්‍රදේශය පමණක් කේන්ද්‍ර කරගෙන, එහෙම නැත්නම් මාලදිවයින පමණක් කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක වන එක ප්‍රමාණවත් මදි. ඒක උතුරේ Jaffna, පලාලිවලත් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ වාගේම, Chaina Bay airport maintenance capability එක වැඩි කරන්න ඕනෑ. Mattala Airport එක දියුණු කරන්න ඕනෑ, ගුවන් ගමන්, ගුවන් නියමුවන් පුහුණු කරන airport එකක් හැටියටත්, සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන airport එකක් හැටියටත් සහ maintenance centre එකක් හැටියටත්. දක්ෂිණ කලාපයම planesවල නඩත්තු කටයුතු - maintenance - ක්‍රියාත්මක කරන hub එකක් හැටියට පවත්වාගෙන යන්න පුළුවන්.

ඒ වාගේම, ජංගම නඩත්තු ඒකක - mobile maintenance units- ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ වාගේම අපේ ගුවන් ගමන් ක්ෂේත්‍රයේ communication infrastructure improvements

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සඳහා - සන්නිවේදන යටිතල පහසුකම් වැඩි දියුණු කරන්න - අනිවාර්යයෙන් කටයුතු කරන්න ඕනෑ. මොකද, VHF radio coverage එක විශේෂයෙන් කඳුකර ප්‍රදේශවල බොහොම සීමා සහිතයි. ඒ නිසා satellite communication backup systems ක්‍රියාත්මක කරන්න ඕනෑ. Emergency frequency monitoring at all airports ක්‍රියාත්මක කරන්න ඕනෑ. Digital communication systems for remote areas වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාගේම, දත්ත සම්බන්ධක පද්ධති - data link systems - ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඕනෑ. Data links extend කරන්නට ඕනෑ, අපේ රටේ තිබෙන controlled airspace එක සම්පූර්ණයෙන් ආවරණය වන ආකාරයට. ඒ වාගේම, ආරක්ෂිත ගුවන් ගමන් සඳහා real time weather data transmissions ක්‍රියාත්මක වීම අතිශයින් වැදගත් වනවා. ඒ වාගේම, අපි මේ අවස්ථාවේදී යෝජනා කරනවා, කාලගුණ නිරීක්ෂණය සහ අනාවැකිකරණය - weather monitoring and forecasting - ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම අවශ්‍යයි කියලා. විශේෂයෙන්ම mountain-based weather stations, automated weather stations in Nuwara Eliya, Badulla and Kandy, enhanced weather reporting and windshear detection ක්‍රියාත්මක කිරීම වැදගත් වෙනවා. Windshear ගුවන් ගමන්වලට ඉතාම අනාරක්ෂිත තත්ත්වයක්. ඒ වාගේම, lightening detection සහ microburst detection යන අනාරක්ෂිත තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීම සඳහා වන වැඩි දියුණු කිරීම් ද බෙහෙවින්ම වැදගත් වෙනවා.

Regional weather Centres - කලාපීය කාලගුණ මධ්‍යස්ථාන - ස්ථාපනය කිරීම ද අතිශයින්ම වැදගත් වෙනවා. ඒ වාගේම training and human resource distribution - පුහුණුව සහ මානව සම්පත් බෙදා හැරීම - අපේ රට තුළ ගුවන් ගමන් ආරක්ෂා කිරීම සඳහා අතිශයින්ම වැදගත් වෙනවා. Local expertise development - දේශීය විශේෂඥ සංවර්ධනය - අපි තහවුරු කරන්නට ඕනෑ. ඒ වාගේම, technology integration for efficiency - කාර්යක්ෂමතාව සඳහා තාක්ෂණ ඒකාග්‍රතාව - තහවුරු කරන්නට ඕනෑ. Real-time engine and system monitoring for all aircraft, nationwide ADS-B coverage, ඒ වාගේම digital solutions, විශේෂයෙන්ම Lufthansa Technik වාගේ solutions, ලබා දීම සඳහා වන වැඩ පිළිවෙළකට අපි යන්නට ඕනෑ. ඒ වාගේම, මධ්‍යගත ආරක්ෂණ කළමනාකරණ වැඩ පිළිවෙළකට අපි යොමු වෙන්නට ඕනෑ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ රටට අදාළ ගුවන් ගමන් ක්ෂේත්‍රයේ ආරක්ෂිතභාවය ඉතාම හොඳින් ශක්තිමත්ව තහවුරු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන සතුටු වෙනවා. නමුත් අපේ රටේත් තිබිය යුතුයි, පැහැදිලි aircraft accident investigation system එකක්. ඇමෙරිකා එක්සත් ජනපදයේ එවැන්නක් තිබෙනවා, NTSB කියලා. මේ යනාදී වශයෙන් අපේ රටටත් ඒ වාගේ දෙයක් අවශ්‍යයි. නෛතිකව තිබෙනවා. Civil Aviation Authority of Sri Lankaහි Aircraft Accident Investigation Board එකක් පිහිටුවා තිබෙනවා. නමුත්, ඒවායේ reporting system එක, investigation scope එක පිළිබඳව නිසි කුසලතාව, දක්ෂතාව, හැකියාව තිබෙනවාද කියන එක බරපතළ ගැටලුවක්.

අද දවසේ ගුවන් ගමන් පිළිබඳ මේ මාතෘකාව මා ඉදිරිපත් කළේ, අපේ ගුවන් ගමන් ක්ෂේත්‍රය පිළිබඳව වෙනත් දෘෂ්ටිකෝණයකින් මේ විවාදයට කරුණු දක්වමින්, රටක් හැටියට ගුවන් ගමන් ආරක්ෂිතාව තවදුරටත් තහවුරු කිරීම සම්බන්ධයෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත් කරන්නටයි. අපි විශ්වාස කරනවා මේ යෝජනා ක්‍රියාත්මක කරන්නට ලොකු මුදලක් වැය වෙනවා කියලා; ලොකු පිරිවැයක් දරන්නට සිද්ධ වෙනවා කියලා. මේ හැම දෙයක්ම එක සැරේම කරන්න පුළුවන් කියලා අපි කියන්නේ නැහැ. නමුත්, ජීවිත ආරක්ෂාව උදෙසා මේ ඉදිරිපත් කළ යෝජනා සියල්ල සත්‍යයක් කියන එක අපි හැමෝම අවබෝධ කර ගත යුතුයි. අපි ප්‍රාර්ථනා කරනවා, ඉතාම කෙටි කාලයක් තුළ මේ යෝජනා ක්‍රියාත්මක කරන්නට මේ රජයට හැකියාව ලැබේවා කියා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද දවසේ විශේෂයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව සම්බන්ධයෙන් සහ එම කාරක සභාවේ අනෙකුත් වාර්තා සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ අපට හොඳ යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමාට ස්තුති කරන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමනි, මම හිතනවා ඔබතුමාගේ යෝජනා වඩා ගුණාත්මක ගුවන් ගමන් සේවාවක් වෙනුවෙන් සාධනීය ආකාරයෙන් සලකා බලන්න අපේ ආණ්ඩුවට අවස්ථාවක් ලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝකයේ වෙනත් රටක ඉඳලා නැවත මව්බිමට එනකොට, ගුවන් යානයේ ඉඳලා අපේ මේ පුංචි රට දිහා බලන කොට 'මේ මගේ රට, මේ මගේ මාතෘභූමිය නේද' කියලා කොච්චර නම් අභිමානයක් අපට දැනෙනවාද කියලා අපි දන්නවා. ඒ වාගේම ලෝකයේ ඕනෑම රටක ඉන්න කොට අපේ රටේ ජාතික ගීය ඇහෙද්දී 'මේ මගේ රටේ ජාතික ගීය නේද' කියලා අපට කොච්චර නම් අභිමනයක් දැනෙනවාද කියලා අපි දන්නවා. එච්ට අපේ රට ගැන අපට දැනෙන අභිමානය වචනවලින් කියලා නිම කරන්න බැහැ.

COPE එකේ සිව්වැනි වාර්තාව ගැන විශේෂයෙන් කථා කරන මේ අවස්ථාවේ එක්තරා කවියක් කියන්න ඕනෑමයි කියලා මට හිතුණා. "ග්ලැසියරයක ප්‍රේමය" නමැති මෙය නුවන් තොටවත්ත නමැති නූතන කවියා ලියූ බොහොම අපූරු කාව්‍ය නිර්මාණයක්. මේ කාව්‍ය නිර්මාණයේ පුංචි දරුවෙකුගෙන් ගුරුවරිය අහනවා මෙන්න මෙහෙම:

"බැරි මොකද

සීරුවෙන් ඉන්නට

කුඹී කනවාද කකුල?"

එතකොට ළමයා මෙහෙම කියනවා:

"ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි කියද්දී

කොහොම ඉන්නද හිටගෙන?

කන්න මොකවත් වේල් දෙකකින්

තිබුණේ නැති කොට ගෙදර හරියක"

වේල් තුන කාපු ළමයාට වේල් දෙක කන්න වෙච්ච අතීතයක ඉඳලා තමයි, අපි මේ ආණ්ඩුව අරගෙන ආර්ථික, සමාජයීය, සංස්කෘතික යනාදී සෑම පැතිකඩකම ධනාත්මක ප්‍රගතියක් වෙනුවෙන්, ධනාත්මක වර්ධනයක් වෙනුවෙන් බොහොම ප්‍රගතිශීලිව මේ ගමන යන්නේ. ජාතිය ගැන, ආගම ගැන, රට ගැන විශාල අභිමානයක් තිබෙන මේ රටේ ඕනෑම කෙනෙකුට ජාතික ජන බලවේගයේ මේ අලුත් ප්‍රතිපත්ති රාමුවත් එක්ක එකතු වෙලා මේ ගමනට සහයෝගය දක්වන්න පුළුවන්. ඒ නිසා විපක්ෂ නායකතුමාගේ මේ යෝජනා පිළිබඳවත් අපට බොහොම සාධනීය දෘෂ්ටි කෝණයකින් බලන්න පුළුවන්.

දැන් මම මගේ කථාවට එන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි දන්නවා මේ මොහොතේත් මේ රටේ පාරවල්වල, පාසල්වල, උපකාරක පන්තිවල, පන්සල්වල, ආගමික සිද්ධස්ථානවල, ඒ වාගේම බස්වල, කෝච්චිවල, බස් නැවතුම් පොළවල කියන මේ හැම තැනකම විවිධ ගණයේ අපරාධ සිද්ධ වෙන බව. අපරාධ සියයට 100ක් අඩු කළ රටක් හඳුන්න බැරි වුණත්, මේ සිද්ධ වෙන අපරාධවලට වඩා භයානකයි සුදු කරපටි අපරාධ. සුදු කරපටි අපරාධ සම්බන්ධ යම් විමර්ශනයක් කරන්න පුළුවන් හොඳම තැනක් විධියට තමයි අපි COPE එක හඳුනාගෙන තිබෙන්නේ. මෙච්චර කාලයක් මේ COPE එක හරහා කරපු දේවලට මොකද වුණේ කියලා මේ රටේ මිනිසුන්ට අපෙන් ප්‍රශ්න කරන්න, COPE එකෙන් ප්‍රශ්න කරන්න අයිතියක් තිබෙනවා. විගණකාධිපති වාර්තාව අනුව, යම් පොදු ව්‍යාපාරයකට අදාළ ආයතනයක් COPE එකට කැඳවලා විමර්ශනයක් කරලා, මාස තුනකට වරක් මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තාව ගැන විවාද කරලා අවසානයේදී අවශ්‍ය නම් කථානායකතුමාට පුළුවන් නීතිපතිවරයාට ඒක යොමු කරන්න. එහෙම නැත්නම් බොහෝවිට මේ විමර්ශනය අවසානයේ COPE එකෙන් දෙන වාර්තාව තිබෙන්නේ පාර්ලිමේන්තුවේ ලිපි ගොනුවක. අමාත්‍යාංශයේ ලේකම්වරයාට අවශ්‍ය නම් පුළුවන්කම තිබුණා මේ නිර්දේශ අනුව තමන්ගේ ආයතනයට, නිලධාරීන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්න. එහෙම නීතිමය ක්‍රියාමාර්ග ගත්ත අවස්ථා තිබුණා. රාජ්‍ය නිලධාරීන්ට දඬ ගැහුවා, සේවයෙන් පහ කළා, අවවාද කළා, අධිහාර පැනෙව්වා. නිලධාරීන්ට නීතිය අකුරටම ක්‍රියාත්මක වුණා. නමුත් රටේ මහජනතාවට තවම ප්‍රශ්නයක් ඉතුරු වෙලා තිබෙනවා. ඒ මොකක්ද? ඒ තමයි රාජ්‍ය නිලධාරීන්ට විතරද නීතිය ක්‍රියාත්මක විය යුතු? නිලධාරීන්ට මුල්‍ය අවභාවිත කරන්න, වංචා කරන්න උඩගෙඩි දුන්නු, අනුබල දුන්නු, පොළඹවපු, බලපෑම් කළ දේශපාලන අධිකාරියට මොකක්ද ක්‍රියාත්මක වෙච්ච නීතිය? තවම එතැන හිස්තැනක් තිබෙනවා. හැබැයි අද මේ විවාදය කරන වෙලාවේ අපට ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට කියන්න පුළුන්කමක් තිබෙනවා, අපි දැන් සාධනීය පියවරක් අරගෙන තිබෙන බව. තවදුරටත් මේ වාර්තා පාර්ලිමේන්තුවේ ලිපි ගොනුවක හෝ පුස්තකාලයේ හිර වෙන්නේ නැහැ. මෙතැනින් එහාට මේ වාර්තාව අවශ්‍ය නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යොමු කරලා නිලධාරීන්ට පමණක් නොවෙයි දේශපාලන අධිකාරියට එරෙහිවත් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අපි මේ වෙද්දී පියවර අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නිලධාරියා මේ කමිටුවට එනවා; අපි ප්‍රශ්න කරනවා; නිලධාරීන් භයෙන් උත්තර දෙනවා; කමිටුව අවසන් වෙනවා; වාර්තාව ඉදිරිපත් කරනවා. නමුත් ජනතාව අහන්න පුළුවන් මේක හුදෙක් මාධ්‍ය සංදර්ශනයක් විතරයි නේද කියලා. එහෙම ප්‍රශ්න කරන අවස්ථා තිබෙනවා. පෙරේදා COPE එකට කැඳවපු විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් COPE එකේ සියලුදෙනා ඉදිරියේ කියනවා, “සභාපතිතුමනි, අපි ඇත්තටම ලැස්ති වෙලා ආවේ බැණුම් අහලා යන්නයි. මේ ප්‍රශ්න කිරීම් ඉවර වුණාම මේක මෙතැනින් ඉවරයිද, මෙතැනින් එහාට මොකක්ද වෙන්නේ?” කියලා. ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයා විවෘතව එහෙම අහනවා. නිලධාරීන් ලැස්තිවෙලා එනවා බැණුම් අහලා යන්න. එතකොට මේ ක්‍රියාවලිය එතැනින් අවසන්ද? ඔවුන් අහන ප්‍රශ්නයත් ඒක. රටේ ජනතාව අහන ප්‍රශ්නයත් ඒක. හැබැයි අපි විශ්වාසයෙන් කියනවා මේ දසවන පාර්ලිමේන්තුවේ COPE වාර්තා තවදුරටත් ලිපි ගොනුවක හිර වෙන වාර්තා නොවෙයි, මෙතැනින් එහාට ඒවා සම්බන්ධව නීතිය අකුරටම ක්‍රියාත්මක වෙනවා කියලා. මොකද, යම් අකටයුත්තක් කළා නම් රාජ්‍ය නිලධාරීන් විතරක් ඇයි මේ දඬුවමට ලක් විය යුතු? ඔවුන්ට අනුබල දුන්නු, ඒ පසුබිම හදපු ඒ දේශපාලන බලධාරීන්ටත්, මහජන නියෝජිතයන්ටත් නීතිය අකුරටම ක්‍රියාත්මක විය යුතුයි. ජනතාව නීතිය පිළිබඳව, මේ රටේ ව්‍යවස්ථාදායකය පිළිබඳව, අධිකරණය පිළිබඳව දැඩි විශ්වාසයක් තබාගෙන ඉන්නවා. නමුත් අපි දකිනවා හොඳට ඇඳ පැළඳ ගත්ත දේශපාලන නායකයෝ තවමත් ආරක්ෂකයන් පිරිවරාගෙන, සුඛෝපභෝගී වාහනයේ නැඟලා විසිහතර පැයම හොරකමේ යනවා, වංචා කරනවා, දූෂණ කරනවා කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ නිසා මම හිතනවා, මෙතැනින් එහාට ඉතාම නම්‍යශීලිව COPE එක හරහා අපට මේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙනවා කියලා.

කියන්න සතුටුයි, අපි ආයතන 14ක් දසවැනි පාර්ලිමේන්තුවේ COPE එකට කැඳෙව්වා. ඉස්සර නම් දවසකට ආයතන තුන හතරක් කැඳවනවා. නිලධාරීන් එනවා, වාර්තා ටික දිගහැර ගන්නවා, මොනවා හරි ඇහුවාම, "ඔව් සර්", "ඇයි සර්", "එහෙමයි සර්" කියලා කියනවා. ඊට පස්සේ වාර්තාව ලිපි ගොනුවට යනවා. එච්චරයි. හැබැයි, දැන් දවසකට කැඳවන්නේ එක ආයතනයයි. අපට ඒ සඳහා යම් කාලයක් යනවා. මොකද, අපි හරියට homework කරලා තමයි COPE එකට යන්නේ. අපි හරියට අධ්‍යයනයක් කරලා තමයි COPE එකට යන්නේ. විගණකාධිපති දෙපාර්තමේන්තුව මේ කණ්ඩායමත් එක්ක එකතුවෙලා මේ වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරනවා. එම නිසා අපට යම් කාලයක් යනවා. අපි හරියට විමර්ශන කටයුතු කරනවා. ඒ වාගේම COPE එකේ නිර්දේශ අනුව එම ආයතන කටයුතු කරනවාද, නැද්ද කියලා සොයා බලනවා. ඒ නිසා අපට කාලයක් යනවා. හැබැයි, ඒ කාලය අපතේ යන්නේ නැහැ. මේ පස් අවුරුදු කාලය තුළ එම ආයතන හරහා දේශපාලන නායකයන්ගේ මඟපෙන්වීම් යටතේ යම් යම් අකටයුතුකම් වුණා නම්, අපි ඒවාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම රාජ්‍ය නිලධාරීන්ගෙනුත් ඉල්ලීමක් කරන්න ඕනෑ. ඔබ කිසිසේත් බිය විය යුතු නැහැ. ඔබ ගන්නා වැටුපට අනුව ඔබට පැවරුණු රාජකාරියට ඔබ අවංකව සාධාරණයක් කරනවා නම්, ඔබ COPE එකට එන්න කිසිසේත් බිය විය යුතු නැහැ. ඔබට පැවරුණු රාජකාරිය අනුව නීත්‍යානුකූලව කටයුතු කරනවා නම්, මේ ප්‍රශ්න කිරීම් හමුවේ කිසිසේත් අකාර්යක්ෂම විය යුතු නැහැ, අඩපණ විය

[ගරු නිතිෂා නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

යුතු නැහැ. රාජ්‍ය සේවයේ තවත් අකාර්යක්ෂම වීමක් වෙන්නේ මේ COPE එක හරහා කියලා ජනතාව තුළ මොකක් හෝ ගැටලුවක් තිබෙනවා නම්, අපි ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. මේ රාජ්‍ය සේවය මේ විධියට විශ්වාසවන්තව මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළට දායක කර ගැනීම සඳහාම තමයි අපේ COPE එක ක්‍රියාත්මක වෙන්නේ. එම නිසා සියලු රාජ්‍ය නිලධාරින්ටත්, ඒ වාගේම රට ගොඩනඟන්න කැමැත්තක්, ඇල්මක් තිබෙන සියලු ජනතාවටත් අපි මේ සඳහා බොහොම විවෘතව ආරාධනා කරනවා. "දූෂණයට එරෙහි වෙන්න ඕනෑ. දූෂණයට එරෙහි සටන භයානකයි. හැබැයි, දූෂණයට එරෙහිව සටන් නොකර සිටීම ඊටත් වඩා භයානකයි" කියලා ජනාධිපතිතුමා කරපු ඒ ප්‍රකාශය අදටත් වලංගුයි, හෙටටත් වලංගුයි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.19]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற 'கோப்' குழுவின் அறிக்கை தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்து கொள்வதையிட்டு நான் மிகவும் மகிழ்ச்சி அடைகின்றேன். அரச நிறுவனங்களின் கணக்குகளைப் பரிசீலனை செய்து, அவற்றில் இருக்கின்ற பிரச்சினைகளையும் ஊழல்களையும் அடையாளம் காண்கின்ற ஒரு நல்ல பணியை 'கோப்' குழு செய்கின்றது. இன்று நாங்கள் விமான சேவைகள் மற்றும் விமானப் போக்குவரத்துடன் சம்பந்தப்பட்ட நிறுவனங்களின் பிரச்சினைகள் பற்றி பேசிக்கொண்டு இருக்கின்றோம்.

மட்டக்களப்பு விமான நிலையம் சர்வதேச விமான நிலையமாக - international airportஆக - gazette பண்ணப்பட்டு இருக்கின்றது. இருந்தாலும், அந்த விமான நிலையத்துக்கு இதுவரை எந்தவொரு வெளிநாட்டு விமானமும் வரவில்லை. அங்கு வெளிநாட்டு விமானங்கள் வருவதற்குத் தேவையான வசதிகள் இன்னும் செய்யப்படவில்லை. அங்கு செய்யப்பட்டிருக்கின்ற terminal facilities, parking facilities இன்னும் அதிகரிக்கப்பட வேண்டும். அங்கு மக்கள் வந்து போவதற்கான terminal facilities போதாமை காரணமாக உள்ளூர் விமானங்கள்கூட வருவதில்லை.

பல ஆண்டுகளுக்கு முன்பு இலங்கை விமானப் படை - Sri Lanka Air Force - விமான சேவைகளை மேற்கொண்டது. வாரத்தில் 3 - 4 நாட்கள் அந்த விமான சேவை இடம்பெற்றது. மிகக் குறைந்த கட்டணத்தில் பாதுகாப்போடு இலங்கை விமானப் படையின் விமானங்களில் இரத்மலானையில் இருந்து மட்டக்களப்புக்கு, திருகோணமலைக்கு, பலாலிக்கு என அதிகமான மக்கள் சென்று வந்தார்கள். கடந்த சில ஆண்டுகளாக அந்த விமான சேவை முற்றாக நிறுத்தப்பட்டு இருக்கின்றது. இதனால் ஓர் அவசர தேவைக்குக்கூட வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு குறிப்பாக, அம்பாறை மாவட்டத்துக்குப் போவதற்கு நாங்கள் மிகவும் கஷ்டப்பட வேண்டி இருக்கின்றது.

தற்பொழுது, இச்சபையில் கௌரவ அமைச்சர் அவர்களும் கௌரவ பிரதி அமைச்சர் அவர்களும் இருக்கிறார்கள். தயவுசெய்து, நீங்கள் இந்த விமான சேவையை மீண்டும் ஆரம்பிப்பதற்கு முயற்சி செய்யுங்கள்! ஏனென்றால், சில நேரங்களில் தனியார் விமானங்கள் சேவையில் ஈடுபடுவதில்லை. அதுமாத்திரமன்றி, அதிக கட்டணமும் அறவிடப்படுகின்றது. எங்களைப் போன்றவர்கள்கூட அவற்றில் பயணிக்க முடியாத நிலைமை இருக்கின்றது. எனவே, மட்டக்களப்பு, அம்பாறை, திருகோணமலை, பலாலி போன்ற இடங்களுக்கான Sri Lanka Air Forceஇன் விமான சேவையை மீண்டும் ஆரம்பிக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் Saudia Airlines இலங்கையிலிருந்து தனது சேவையை மேற்கொண்டது. கடந்த பல ஆண்டுகளாக அந்த விமான சேவை நிறுத்தப்பட்டு இருக்கின்றது. இதனால், இலங்கையிலிருந்து ஹஜ்ஜுக்குச் செல்கின்ற, உம்ராவுக்குச் செல்கின்ற, தொழில்வாய்ப்புக்காக மத்திய கிழக்கு நாடுகளுக்குச் செல்கின்ற ஆயிரக்கணக்கானவர்கள் அதிக கட்டணத்தைச் செலுத்தி ஏனைய airlinesக்குச் சொந்தமான விமானங்களில் செல்லவேண்டி இருக்கின்றது. ஏனைய airlinesஇன் கட்டணத்துடன் ஒப்பிடும்போது, Saudia Airlinesஇன் கட்டணம் மிகவும் குறைவாகும். மிகுந்த அனுபவமுள்ள ஒருவர் சவூதி அரேபியா நாட்டுக்கான இலங்கை தூதுவராக இருக்கிறார். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அவருடன் கலந்துரையாடி, சவூதி அரேபியா அரசாங்கத்துடன் தொடர்புகளை ஏற்படுத்தி, அந்த விமான சேவையை மீண்டும் ஆரம்பிக்க வேண்டும். ஏனென்றால், இன்று நாம் உள்நாட்டில் சர்வதேச முதலீடுகளை நிறைய எதிர்பார்க்கின்றோம். அந்த முதலீடுகளை நாம் பெற வேண்டுமாக இருந்தால், வசதியுள்ள நாடுகளுடன் உடன்படிக்கைகளை மேற்கொள்ள வேண்டும்.

அண்மையில் நாங்கள் ஐக்கிய அரபு அமீரகத்துடன் உடன்படிக்கை செய்துகொண்டோம். அதேபோன்று, நாங்கள் சவூதி அரேபியா அரசாங்கத்தோடும் ஓர் உடன்படிக்கையைச் செய்ய வேண்டும். சவூதி அரேபியாவின் investors இங்கு வந்து முதலீடுகளைச் செய்வதன் ஊடாக எங்களுடைய நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு நாங்கள் முயற்சிக்க வேண்டும். அதற்குத் தேவையான வசதிகளைச் செய்து கொடுக்க வேண்டும். அவர்களுக்கும் எங்களுக்கும் இடையிலுள்ள பிரச்சினைகளைத் தீர்க்க வேண்டும். கடந்த 2 - 3 வாரங்களுக்கு முன்னர்கூட, சவூதி அரேபியா நாட்டின் தேசிய தின நிகழ்வில் இலங்கையும் சவூதி அரேபியாவும் ஒன்றுசேர்ந்து செயற்பட வேண்டுமென நாங்கள் பேசினோம். கௌரவ அமைச்சர் அவர்களே, கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயங்களில் அதிக கவனம் செலுத்த வேண்டும். எங்களுக்கு இருக்கின்ற மிகப் பெரிய வாய்ப்பு என்னவெனில், சவூதி அரேபியாவின் முதலீடுதான். நாங்கள் அதைப் பயன்படுத்திக்கொள்ள வேண்டும். எமது நாட்டின் பொருளாதாரத்தை முன்னேற்றுவதற்கு, நாட்டில் வளர்ச்சியை ஏற்படுத்துவதற்கு நாங்கள் வழிவகைகளைச் செய்ய வேண்டும். அதற்கென விசேட உடன்படிக்கைகளை நீங்கள் மேற்கொள்ள வேண்டும். அதனூடாக எமது நாட்டில் பொருளாதார முன்னேற்றத்தை ஏற்படுத்த வேண்டும். Saudia Airlinesஇன் சேவைகளை மீண்டும் இலங்கையிலிருந்து operate

பண்ணுவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். அதன்மூலம் எங்களுடைய நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியும்.

சவூதி அரேபியா அரசாங்கம் இலங்கையில் பல வேலைகளைச் செய்திருக்கிறது. குறிப்பாக, பல்கலைக்கழக கட்டிடங்களை அமைத்தல், பாலங்களை அமைத்தல், highways அமைத்தல் போன்றவற்றைச் செய்திருக்கிறது. இப்பொழுதுகூட, மிகப் பெரிய வேலைத்திட்டங்களுக்கான பேச்சுவார்த்தைகள் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றன. கடந்த 4 - 5 மாதங்களுக்குள் சவூதி அரேபியாவுக்கு 2 - 3 குழுக்கள் சென்று பேச்சுவார்த்தை நடத்தியிருப்பதையிட்டு நாங்கள் உண்மையிலேயே சந்தோஷம் அடைகின்றோம். எனவே, சவூதி அரேபியா அரசாங்கத்துடனான உறவை மேலும் பலப்படுத்தி, அதனூடாக எதிர்காலத்தில் எங்களுடைய நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு நாங்கள் முயற்சிக்க வேண்டும். Sri Lanka Air Forceஇன் விமானங்களைப் பயன்படுத்தி மட்டக்களப்பு சர்வதேச விமான நிலையத்தை உயனடியாக இயக்குவதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.26]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මේ වෙනකොට එක පැත්තකින් COPE එක ඉතාම හොඳින් අපේ රටේ රාජ්‍ය ආයතන පිළිබඳව විමර්ශන සිදු කරමින් සිටිනවා. ඒ හරහා මේ වෙනකොටත් රට තුළ සිදු වුණු සිදුවීම් ගණනාවක් සහ විවිධ ගැටලු ගණනාවක් පිළිබඳව තොරතුරු හෙළිදරව් වෙමින් තිබෙනවා. ඉතින්, දූෂිතයින් කලබල වන එක ගැන අහන්න දෙයක් නැහැ.

ඒ වාගේම අපේ රටේ අධිකරණ පද්ධතිය තමන්ගේ කාර්යභාරය මැනවින් ඉටු කරමින්, වංචනිකයින්ට, දූෂිතයින්ට දඬුවම් කරන ක්‍රියාවලිය ඉතාම හොඳින් සිදු කරමින් යනවා. ඉතින්, දූෂිතයින් කලබල වන එක ගැන අහන්න දෙයක් නැහැ. වෙන්නප්පුවේ බැංකුවක රුපියල් ලක්ෂ 500කට වඩා වංචා කරලා අද නඩු තිබෙන මහත්වරු කලබල වන එක ගැන අහන්න දෙයක් නැහැ. ඔවුන් කියනවා අපි දැක්කා, "රාජ්‍ය සේවකයින් අකර්මණ්‍ය වෙලා, ඔවුන් වැඩ කරන්නේ නැහැ, මේ ආණ්ඩුවේ ක්‍රියාවලිය නිසා ඔවුන් දුර්මුඛ වෙලා" කියලා. නැහැ, අවංකව තමන්ගේ රාජකාරිය ඉටු කරන කිසිදු රාජ්‍ය සේවකයෙක් කිසිවකට බිය වෙන්න ඕනෑ නැහැ. හැබැයි, අදටත් වැරදි කරනවා නම්, වංචා, දූෂණවල යෙදෙනවා නම් ඔවුන් බය වෙන්න ඕනෑ.

මම කැමැතියි, අද දවසේ එක් කාරණයක් පිළිබඳව විශේෂයෙන්ම වචන කිහිපයක් කථා කරන්න. මොකද, පසුගිය දවසක මේ පාර්ලිමේන්තුව ඇතුළේත්, කාලයක් තිස්සේ විවිධ මාධ්‍ය හරහාත් අප පිළිබඳව ගොතන ලද නඩු ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය 24වැනි දා -එම හැන්සාඩ් වාර්තාවත් මා ළඟ තිබෙනවා- ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් දින 2ක් සඳහන් කර කියා තිබුණා, වසන්ත සමරසිංහ ඇමතිතුමාත්, මමත්, රන්ජන් ජයලාල් නගරාධිපතිතුමාත් අත්අඩංගුවට ගන්න නියෝග කර තිබෙනවාය කියලා. මා සතුව ඒ සම්පූර්ණ නඩු ගොනුව තිබෙනවා. ඒ වාගේම මා සතුව තිබෙනවා, ඒ අදාළ කාර්ය සටහන්. මේ කොතැනකවත් සඳහන් කරලා නැහැ, වසන්ත සමරසිංහවත්, මහින්ද ජයසිංහවත්, රන්ජන් ජයලාල්වත් අත්අඩංගුවට ගන්න කියලා. එහෙම නම් ඇයි මේගොල්ලන් මෙහෙම කරන්නේ? ඇයි, මේගොල්ලන් මෙහෙම කියන්නේ? ඒ වෙන කිසිවක් නිසා නොවෙයි.

අපට මතකයි, ඉතිහාසය. රාජපක්ෂවරු නීතියට අත තිබ්බ විධිය. රාජපක්ෂවරු මේ පාර්ලිමේන්තුවට ගොඩපෙරකදෝරුවෝ ගෙනැල්ලා ඔවුන් ලවා නඩු අහපු විධිය අපට මතකයි. එදා රාජපක්ෂලා හිටගෙන කරපු දේ අද සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාගේ ගෝලබාලයෝ ටික දුව-දුව කරනවා. එදා රාජපක්ෂලා හිටගෙන කරපු එක, අද මේ මහත්වරු ටික දුව-දුව කරනවා. මොකක්ද, මේගොල්ලන්ගේ වුවමනාව? මේගොල්ලන්ට වුවමනා වෙලා තිබෙනවා, මේ රටේ නිවැරදි ලෙස තීන්දු තීරණ ගන්නා මහෙස්ත්‍රාත්වරුන්ට, විනිශ්චයකාරවරුන්ට දේශපාලන ලේබල් අලවන්න. අපි දැක්කා, මීට සුළු මොහොතකට කලින් කථා කළ විපක්ෂයේ මහත්වරුන් පවා කළේ මොකක්ද කියලා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ රංග දිසානායක මහත්මයාට දේශපාලන ලේබල් අලවන්න උත්සාහ කළා. ඒගොල්ලන්ට අමතකයි, රංග දිසානායක පුත්තලමට මාරු කරපු එක. ඒගොල්ලන්ට අමතකයි, ප්‍රසන්න අල්විස් අර හද්දා වන්නියට මාරු කරපු එක. ඒ, ඒගොල්ලන්ගේ දේශපාලන වුවමනා මත. මොකක්ද, මේ වුවමනා වෙලා තිබෙන්නේ? මේ වෙන කිසිවක් නොවෙයි. මේගොල්ලන් මේ රටේ ජනතාව තුළ මතයක් හදන්න උත්සාහ කරනවා, අධිකරණය ස්වාධීන නැහැ කියලා. අධිකරණය දේශපාලන වුවමනා මත තීන්දු තීරණ ගන්නවාය කියන මතය තමයි මේ හදන්න උත්සාහ කරමින් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අධිකරණ සේවා කොමිෂන් සභාව කියන්නේ ස්වාධීන ආයතනයක්. එම ආයතනයට අත තියන්න, එම ආයතනයට නියෝග කරන්න අධිකරණ ඇමතිට තබා ජනාධිපතිවරයාටවත් අයිතියක් නැහැ. අද මේ විපක්ෂය සිදු කරමින් තිබෙන්නේ අධිකරණය පිළිබඳව වැරදි මතයක් සෑදීමේ කාර්යභාරය. මේගොල්ලන්ගේ දූෂිත යහළුවන්ට විරුද්ධව කිසිදු පැකිළීමක් නැතුව ක්‍රියාමාර්ග ගන්නට අද අල්ලස් කොමිසමේ සභාපති රංග දිසානායක මහත්මයා ඇතුළු කණ්ඩායම කටයුතු කරමින් ඉන්නවා. ඉතින් කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ. දී කිරට බළල්ලුත් සාක්කි වාගේ තමන්ගේ යහළුවන්ට අදාළව තීන්දු තීරණ ගන්නකොට කලබල වෙනවා. ඒ ගැන අපට පුදුම වෙන්න දෙයක් නැහැ. ඒ නිසා තමයි අද මේ අය මෙහෙම හැසිරෙන්නේ. නමුත් අපි ඉතාම වගකීමෙන් යුතුව කියන්න ඕනෑ, අධිකරණ පද්ධතිය අද වඩාත් නිවැරදිව, නිවැරදි දිශාවට ගමන් කරන බව. මේ රටේ ජනතාව මාලිමා ආණ්ඩුවට බලය ලබා දීමෙන් බලාපොරොත්තු වුණේ රටේ නීතිය ස්වාධීනව ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය පරිසරයක් හදන එකයි. ඒ බලාපොරොත්තුව ඉහළින්ම ඉටු කරමින්, අද ඉතාම නිවැරදි තීන්දු තීරණ ගනිමින් අධිකරණ පද්ධතිය ස්වාධීනව ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ නිසා තමයි මේ අය කලබල වෙලා ඉන්නේ.

මේ කියපු නඩුව අද දවසේත් තිබුණා. මට ආරංචි විධියට, තොරතුරු තිබෙන විධියට පිටු 4කට වඩා සඳහන් වන නියෝගයක් ඒ සඳහා ලබා දීලා තිබෙනවා. නමුත් ඒකේ මොකක්ද කියන්නේ? ඒකේ සඳහන් කරනවා, "පොලිස් විමර්ශනවලින් අපරාධ වරදක් හෙළි නොවී ඇති බැවින්, අත්අඩංගුවට ගැනීමට

[ගරු මහින්ද ජයසිංහ මහතා]

නියෝගයක් නිකුත් කළ නොහැක" කියලා. ඒක තමයි අද දවසේ ගල්කිස්ස අධිකරණයේ පැවති නඩුවේ තීන්දුව බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා තවදුරටත් කවුරු හරි කියන බොරුවක්, කවුරු හරි දෙන තොරතුරක් මත මේ පාර්ලිමේන්තුව ඇතුළේ වැරදි තොරතුරු සභාගත කරනවා නම්, මම හිතන විධියට ඒක තරම් මේ පාර්ලිමේන්තුවට කරන අගෞරවයක්, මේ රටේ ජනතාවගේ ජන වරමට කරන අගෞරවයක් තවත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා UN එකේදී කිව්වා වාගේ දූෂිතයන්ගේ වෛරයට වඩා ජනතාවගේ ආදරය බලවත්. ඒ නිසා අපි ඒ හැම දූෂිතයෙකුටම කියන්න ඕනෑ, ඔබේ වෛරයට වඩා ජනතාවගේ ආදරය බලවත් කියලා. ඒ ජනතා ආදරයට පාත්‍ර වෙමින් දවසින් දවස ජාතික ජන බලවේග -මාලිමා- ආණ්ඩුව මේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කරමින් ඉදිරියට යනවා කියන එක සනිටුහන් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීවරුනි, ස්ථාවර නියෝග 91(ඊ)හි සඳහන් වෙනවා, "... අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කරනු නොලැබිය යුත්තේ ය. ..." කියලා. ඒක මතක තියාගෙන කථා කරමු.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මොකක්ද ඔබතුමාගේ point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එහෙම කථා කරලා තිබෙනවා නම් expunge කරන්න ඕනෑ නේද? ඒක expunge කරන්න කථානායකතුමාට යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එහෙම කථා කරලා තිබෙනවා නම් මම ඒක කථානායකතුමාට යොමු කරන්නම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දැන් කියපු කාරණාව නිසාම මම සඳහන් කරන්න හිටපු දේ අත්හරිනවා. ඒ ගැන කියන්න තව කාරණා ගණනාවක් තිබෙනවා. ඒ කාරණාව ගැන නීතිපතිවරයාට ෆයිල් යැව්වාට පසුව කොහොමද මහෙස්ත්‍රාත්වරු කථා කළේ කියලා මට කියන්න පුළුවන්. නමුත්, ඔබතුමිය කියපු කාරණය හින්දාම මම ඒ ගැන කියන එක අත්හරින්නම්. මා ළඟ ඔක්කෝම දේවල් තිබෙනවා. සැකකරුවන් ඇවිල්ලා තමන්ගේ නඩුව ගැන මෙතැන කථා කරන එක තමයි මට තිබෙන ප්‍රශ්නය. කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා, අපේ COPE එකේ සභාපතිතුමාට. අවබෝධයක් ඇතුව, යම්කිසි ක්‍රියාමාර්ගයක් ගැන වැදගත් විධියට වැඩ කරන නායකයෙක් විධියට මම එතුමාට ගරු කරනවා වාගේම ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ සභාපතිවරුන් මීට කලිනුත් COPE එකේ හිටියා. අපි COPE එකේ සභාපතිවරුන් එක්ක අවුරුදු ගණනාවක් වැඩ කරලා තිබෙනවා. මම 2004 ඉඳන් COPE එකේ ඉන්න කෙනෙක්. සභාපති හැටියට විපක්ෂයේ කෙනෙක් ආපු වෙලාවක ආණ්ඩුවෙන් විශාල තර්ජනයක් ආවා. නමුත් ඒවාට සැලුණේ නැහැ, විජයදාස රාජපක්ෂ මැතිතුමා, ඩිව් ගුණසේකර මැතිතුමා, මහාචාර්ය චරිත හේරත් මැතිතුමා වාගේ අය. එතුමන්ලා කටයුතු කළේ අභියෝග මැද. සමහර අයට සභාපතිකමත් නැති වුණා. නමුත් එතුමන්ලා ඉතාම ශක්තිමත්ව වැඩ කළා.

මම ස්තුතිවන්ත වෙනවා, අපේ සභාපති වෛද්‍ය නිශාන්ත සමරවීර මැතිතුමාට සහ විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලුම මන්ත්‍රීතුමන්ලාට. මේ ක්‍රියාමාර්ග ගන්න කොට කාගේවත් පරණ තොරතුරු ඇද්දාය කියලා අපි ඒවාට මැදිහත් වෙන්න ගියේත් නැහැ, අපි කවදාවත් මැදිහත් වෙන්නේත් නැහැ. මම විපක්ෂයේ ඉඳලා අද වෙනතුරුත් වැඩ කරන්නේ ඒ විධියට. COPE එක කියන්නේ ඉතා බලවත් තැනක් වාගේම ඉතාම ස්වාධීනව කටයුතු කරන්න ඕනෑ තැනක්. මේ වෙලාවේ COPE එක නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තුතියත්, ගෞරවයත් පුද කරනවා.

අද මේ වාර්තාව ගැන කථා කිරීමේදී මට කරුණු ගණනාවක් කියන්න තිබෙනවා. නමුත් මට ලැබී තිබෙන කාලය මදි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය ගැන මෙහි සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ගිවිසුම අත්සන් කරන්නේ 2012 මාර්තු 28වැනි දා. දෙවන ගිවිසුම අත්සන් කරනවා, 2016 මාර්තු 24වැනි දා. ජපාන යෙන් මිලියන 74,397ක්, නැත්නම් රුපියල් බිලියන 158ක් එහි වැඩ කටයුතු සඳහා වෙන් කරලා තිබෙනවා. ඒක පටන් ගන්නකොට නෙළුම් ආකෘතියක් තිබුණා කියලා 2015දී බලයට ආ ආණ්ඩුව එම වහල කෙසෙල් කොළයක හැඩයට සකස් කෙරුවා. මොන කොළය තිබුණත් අපට අදාළ නැහැ. කොහෙන් හරි මේක හැදෙන්නයි ඕනෑ. අද ලක්ෂ ගණනක් ගුවන් තොටුපළට එනවා, යනවා. අපි උත්සාහ කරනවා, සංචාරකයන් ලක්ෂ 25කට, 30කට ආසන්න පිරිසක් රටට ගෙන්වා ගන්න. හැබැයි, ඒ ගිවිසුම 2012දී අත්සන් කළත්, 2016 ඉඳලා ඒ වැඩ පිළිවෙළ හිර වෙලා තිබෙන්නේ. මේ වාර්තාවේ පැහැදිලිව සඳහන් වෙනවා, ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම, ඒ වාගේම උපදේශන සමාගම වගකීම් විරහිතව කටයුතු කර තිබෙනවා කියලා. මොකද, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 5.44යි. ව්‍යාපෘතියේ පිරිවැයෙන් සියයට 40ක් මේ සමාගමට ගෙවා තිබෙනවා. ඊට

පස්සේ ඒ ක්‍රියාවලිය අවසන් වෙනවා. අපිට මතකයි, පසුගිය ආණ්ඩුවේ හිටපු ඇමතිවරයෙකුටත් චෝදනාවක් එල්ල වුණා, මේ තායිසේ සමාගමෙන් සල්ලි ගත්තා කියලා. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් මත තමයි මේ ව්‍යාපෘතිය අවසන් වුණේ. කෙසේ වෙතත්, තායිසේ සමාගම මේ ව්‍යාපෘතිය නවත්වපු එක ගැන මම සතුටු වෙනවා. ඒ ව්‍යාපෘතිය තිබුණා නම් එහෙම expressway එකට වුණු වැඩේ තමයි වෙන්නේ. චීන සමාගමට තවත් බිලියන ගණනක් ගෙවන්න වෙනවා. මොකද, ඒගොල්ලන් ඒක නතර කර දාලා යන්න ගියා, තේරුමක් නැහැ කියලා. මට මතක හැටියට ඒකේ සේවකයෝ 400 ගණනක් හිටියා. ඒ සේවකයන් ප්‍රමාණය 70 ගණනක් දක්වා අඩු කරලා, ඒගොල්ලන් ඒක අත්හැරියා. ඒ, 2022 අවුරුද්දේ අපේ රටට ආර්ථික වශයෙන් crisis එක ආපු වෙලාවේ. ඒ එක්කම තමයි මේ ව්‍යාපෘතිය නතර වුණේ.

ඒ සමඟ දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන ඊට වඩා භයානක කථාවක් තමයි මට කියන්න තිබෙන්නේ. 2024 සැප්තැම්බර් 04වැනි දා මේ සම්බන්ධව ලංසුවක් ඉදිරිපත් වෙනවා. ඒ ලංසුව ඉදිරිපත් කිරීමේ කාලය තුන් වතාවක් දීර්ඝ කරනවා. එකක් තමයි, 2024 සැප්තැම්බර් 04 සිට 2024 දෙසැම්බර් 24 දක්වා. ඊළඟ එක, 2024 දෙසැම්බර් 24 සිට 2025 මාර්තු 18 දක්වා. ඊළඟ එක, 2025 මාර්තු 18 ඉඳලා 2025 මාර්තු 25 දක්වා. ඒකට දෙපාර්ශ්වයක් ඉදිරිපත් වෙනවා. අපි කලින් කියපු කොම්පැනියයි, තව කොම්පැනියකුයි; Sojitz කියලා කොම්පැනියක්. මේකේ මූලික කාරණය මේකයි. මේ Sojitz කියන කොම්පැනිය trading කොම්පැනියක් කියලා ප්‍රශ්නයක් එනවා. දැන් CANC එක හඳුන්වන්නේ high-level procurement committee කියලා.

2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනතේ 3.1(අ) වගන්තිය යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක දී ලියා අත්සන් කරනු ලබන සෑම ඇටෝර්නි බලපත්‍රයක්ම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කළ යුතු ය."

එකී පනතේ 3. (2) වගන්තියේ තවදුරටත් සඳහන් වෙනවා, "එම ලියාපදිංචිය සටහන්කොට ඇති වෙළුමට සහ පත්ඉරුවට යොමුවක් සමඟ සටහන් කොට, එම ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපත ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙතම ආපසු භාරදිය යුතුය." කියලා. ඒ කියන්නේ, එක කාරණයක් හැටියට වලංගු ඇටෝර්නි බලපත්‍රයක් තිබිය යුතුයි. දෙවැනි එක තමයි, ඒ බලපත්‍රය තමන් සතුව තිබිය යුතුයි. හැබැයි, මේ දෙකම නැති නිසා මේ Sojitz කියන කොම්පැනිය මේ CANC එකෙන්, එහෙම නැත්නම් වර්තමාන ආණ්ඩුව යටතේ තිබෙන high-level procurement committee එකෙන් ප්‍රතික්ෂේප කරනවා. හැබැයි, ඒ කාරණය එසේ තිබියදී, 2025 මාර්තු 25වන දා දක්වා මේ ටෙන්ඩරයේ කාලය දීර්ඝ කරන්න කියලා ඒ අය ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම හිතන විධියට වේලාව ඉක්මනින් අවසන් වුණා.

මෙහිදී එක් පාර්ශ්වයක අයිතියක් ඇතිව, මේ කොම්පැනිය ඉල්ලපු නිසාම තව දවස් ගණනක් දීර්ඝ කරනවා. ඒක දීර්ඝ කරන්න ඇත්තටම ඉල්ලන්නේ ඉරිදා දවසක. අඟහරුවාදා වෙනකොට දීර්ඝ කරනවා. ඒ විධියට තමයි ඒක සිදු වෙන්නේ. ඊට පස්සේ දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය මේකයි. ටෙන්ඩරයේ වලංගු කාලය පිළිබඳව මේ ඇති වුණු තත්ත්වය සම්බන්ධව හා මේ ඇටෝර්නි බලපත්‍රය සම්බන්ධව නීතිපතිතුමාගේ වාර්තාවේ කියනවා, මාස තුනක් ඇතුළත මේක තිබුණාම ඇති කියලා. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? ටෙන්ඩරයේ වලංගු කාලය 2025 අගෝස්තු 22 දක්වා දින 150කින් දීර්ඝ කරනවා. ඊට පස්සේ ආපසු ඒක 2025 දෙසැම්බර් 20 දක්වා දීර්ඝ කරනවා, තව දින 120ක්. එතකොට අර ඇටෝර්නි බලපත්‍රයේ සුදුසුකම් සම්පූර්ණයෙන් අහෝසි වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ Sojitz කියන කොම්පැනිය Larsen & Toubro Construction Limited - L&T - කියලා කොම්පැනියක් ගන්නවා. ඒ කොම්පැනියට විරුද්ධව ලෝකයේ හැම රටකම චෝදනා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ කොම්පැනිය භාගයක් වැඩ කරලා දාලා ගිහිල්ලා තිබෙන්නේ. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ගත්තාම, එහි දින 1,640ක ප්‍රමාදයක් තිබෙනවා. මේ විධියට තමයි මේ කොම්පැනිය ලෝකයේ හැම රටකම වැඩ කරලා තිබෙන්නේ. මේ Sojitz කියන කොම්පැනිය ඊජිප්තුවට ගියාම, ඊජිප්තුවෙනුත් ඒක ඉවත් කරනවා. මේ විධියට දාලා තිබෙන ටෙන්ඩරය තවත් දීර්ඝ කරලා, මේ ආණ්ඩුව යටතේ ඉන්න ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගමේ අය මේ කරන විහිළුව මොකක්ද කියලා මට තේරෙන්නේ නැහැ. ඒ නිසා නැවත තවත් අවුරුදු ගණනාවක් ගිහිල්ලා, මේ ටෙන්ඩරය විනාශ කරලා, මේ කරන ව්‍යාපෘතිය නතර කරන්න ලැහැස්ති වෙන්න එපා කියලා මම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි.

ඊට අමතරව විශේෂයෙන් මම තවත් කාරණයක් කියන්න කැමැතියි. මම පාර්ලිමේන්තුවට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා, අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමාටත්, ඒ වාගේම ගරු කථානායකතුමාටත් විදේශීය ව්‍යවහාර මුදල්, cryptocurrency 3,000කුත්, US Dollars 1,850කුත් තිබෙනවාය කියලා. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ බොහොම පැහැදිලිව තිබෙනවා, "තුටු පඬුරු යන්නට මේ ඡේදයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ වලංගු මුදල ලෙසින් එම මුදල් පිළිගන්නේ ඇත්තේද, නොමැත්තේද යන්න නොසලකා, වලංගු මුදල් ලෙස පිළිගෙන ඇති ඩිජිටල් හෝ පරිගණක ආකෘතියකින් යුතු මුදල්..." කියලා. ඒක දූෂණයක්. මේ පනතේ ඒ ගැන බොහොම පැහැදිලිව තිබෙනවා. එහෙම නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පුළුවන්, ඒක ක්‍රියාත්මක කරන්න.

ඒ වාගේම අපි දන්නවා නන්දන ගුණතිලක මැතිතුමා ඊයේ විශාල චෝදනාවක් කළ බව. එතුමා කිව්වා, රංග දිසානායක මැතිතුමා ඔවුන්ගේ නීති කමිටුවේ හිටපු කෙනෙක් කියලා. සභාපති විධියට වටගල මැතිතුමා හිටියාය කිව්වා; එතුමාත් හිටියාය කිව්වා. මම කියන්න කැමැතියි, කරුණාකරලා ඒ සම්බන්ධව ප්‍රකාශයක් කරන්න කියලා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා. මොකද, මේ යන ක්‍රියාමාර්ග පිළිබඳව අපට විශාල අර්බුදයක් තිබෙනවා. මේ රටේ දූෂිතයෝ අනිවාර්යයෙන් අත්අඩංගුවට ගත යුතුයි. ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. හැබැයි, නීතිය ක්‍රියාත්මක කිරීමේදී කිසියම් විධියකට පුද්ගලයන් හඹාගෙන ගිහිල්ලා, තෝරාගෙන, pick කරලා නැත්නම් ඒ පුද්ගලයාව හොයාගෙන ගිහිල්ලා කටයුතු කරන එක නොවෙයි කරන්න ඕනෑ; සියලුදෙනාට නීතිය ක්‍රියාත්මක කරන්න. එහෙම නැතුව ආණ්ඩුවේද, විපක්ෂයේද කියන එක අපට අදාළ නැහැ. අන්න එහෙම නිවැරදි තැනකට මේ කටයුතු ගෙනෙන්න ඕනෑ.

අනෙක් කාරණය මේකයි. මම දැක්කා, අපේ ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 80වැනි සැසිවාරයේදී කළ

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ප්‍රකාශය හැම කෙනෙකුම උලුප්පා දක්වා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සැසිවාරය අමතා එතුමා ප්‍රකාශ කරලා තිබුණා, දූෂණ මර්දනය පිළිබඳව ඉතාම වැදගත් අදහසක්. නමුත් ඒක ඇත්තටම ඊට පෙර නයිජීරියාවේ අබුජාහිදී, National Democracy Day Anti-Corruption Summit එකේදී Rwandan President මෙන්න මේ විධියට ප්‍රකාශ කරලා තිබෙනවා:

> "The fight against corruption is dangerous. Not fighting corruption is even more dangerous."

මීට කලින් එතුමා තමයි ඒක කියලා තිබෙන්නේ. නමුත්, අනුර දිසානායක මැතිතුමා ඒක copy කිරීම පිළිබඳව, එහෙම එකක් එකතු කර ගැනීම පිළිබඳව මම ගොඩක් සන්තෝෂ වෙනවා. එහෙම නැතුව ඒක එතුමාගේ නිර්මාණයක් නොවෙයි. Government of Nigeriaහි website එකක බොහොම පැහැදිලිව ඒ ගැන තිබෙනවා. නමුත් මම සන්තෝෂ වෙනවා, ඒ ගැන. ඒ නිසා කොහෙන් හරි ඡේදයක් උපුටා ගත්තාම, "අපේ ජනාධිපතිතුමා මෙහෙම එකක් කිව්වා" කියලා ඇවිල්ලා කියන එක නොවෙයි කරන්න ඕනෑ. ඒ ගැන ඊට වඩා කල්පනා කරන්න ඕනෑ. වෙනත් රටක ජනාධිපතිවරයෙකුත් - රුවන්ඩාවේ ජනාධිපතිතුමා - ඒ ගැන කථා කරලා තිබෙනවා. නමුත් එහෙම එකක් අපේ ජනාධිපතිතුමා එකතු කර ගැනීම ගැන අපි සන්තෝෂ වෙනවා; copy කිරීම හොඳයි. නමුත්,- *[බාධා කිරීමක්]* හොඳ ඒවා copy කරන්න ඕනෑ. හැබැයි, පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න බැහැ, "අපේ ජනාධිපතිතුමා මෙහෙම කථාවක් කිව්වා"ය කියලා. ඒ නිසා copy කිරීම හොඳයි. නමුත් "සම කළ නොහැක. Copy කළ හැක" කියලා තමයි අවසාන වශයෙන් අපට කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී භවානන්දරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.45]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී භවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர், எனக்கு இந்த நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அரசாங்கப் பொறுப்புமுயற்சிகள் பற்றிய - COPE - குழுவின் அங்கத்தவர் என்ற வகையிலே, அக்குழுவிலே நாங்கள் இதுவரை மேற்கொண்ட நடவடிக்கைகள் சிலவற்றை விபரித்துவிட்டு ஏனைய விடயங்களுக்குப் போகலாமென்று நினைக்கின்றேன். அந்த வகையிலே, எமது குழுவின் அதிகாரத்துக்கு உட்பட்ட 457 நிறுவனங்களில் கடந்த 6 மாதங்களில் நாங்கள் கணக்காய்வுகளைப் பரிசீலனை செய்த சுமார் 14 நிறுவனங்களிலே இடம்பெற்ற பல்வேறு வகையான மோசடிகள், வீண் விரயங்கள், ஊழல்கள் பற்றி மிகவும் தெளிவாக அவதானிக்கக்கூடியதாக இருந்தது. பொதுமக்களின் பணம் வீண் விரயங்களுக்கு உள்ளாக்கப்பட்டதையும், அங்கு நிதித் துஷ்பிரயோகம் நடைபெற்றதையும் மிகவும் துலாம்பரமாகக் கணக்காய்வாளர் தலைமை அதிபதி எங்களுக்கு விபரித்திருந்தார். நான் ஒரு மருத்துவ அதிகாரி என்ற வகையிலே, இந்த விடயங்களுடன் தொடர்புபட்ட NMRA என்று அழைக்கப்படுகின்ற தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தல் அதிகாரசபையிலே ஏற்படுத்தப்பட்டிருந்த முறைகேடுகளில் சிலவற்றை இந்தச் சபையிலே தெரிவிக்க விரும்புகின்றேன்.

NMRA என்ற இந்த நிறுவனம் எமது நாட்டில் நோயாளருக்கும் பொதுமக்களுக்கும் தேவையான மருந்துகள் மற்றும் அழகுசாதனப் பொருட்களை இறக்குமதி செய்வதற்காக ஒழுங்கமைக்கப்பட்ட ஒரு நிறுவனமாகும். அந்த நிறுவனத்தின் முக்கிய பணியாக இருப்பது, quality - தரமான, safety - பாதுகாப்பான, efficacy - செயற்றிறன்மிக்க மருந்துகளையும், சம்பந்தப்பட்ட அழகுசாதனப் பொருட்களையும் இறக்குமதி செய்வதற்கு அனுமதி வழங்குவது ஆகும். ஆனால், அந்த நிறுவனம் எதிர்மறையாகவே தொழிற்பட்டு, எமது வைத்தியசாலைகளுக்கும் பொதுமக்களுக்கும் தேவையான தரமான மருந்துகளைத் தருவதில் ஊழல்களையும் முறைகேடுகளையும் நடத்தியிருப்பது எங்களுக்குத் தெரிய வந்திருக்கின்றது.

அந்த வகையிலே, இந்த மருந்துகளின் இறக்குமதி விவகாரத்திலே அண்மையிலே கைதுசெய்யப்பட்டு விளக்கமறியலில் வைக்கப்பட்ட முன்னாள் சுகாதார அமைச்சரும் அவருடைய செயலாளரும் ஏனைய சில அதிகாரிகளும் தரமற்ற immunoglobulin என்ற ஒரு மருந்தைப் போலியாகத் தயாரித்து, அதாவது, அந்த மருந்துக்குப் பதிலாக normal saline அல்லது distilled water போன்றவற்றை அடைத்து சுமார் 43 மில்லியன் ரூபாய்க்கு அதை எமது அரச வைத்தியசாலைகளுக்கு விநியோகித்திருந்தது உங்களுக்குத் தெரிந்திருக்கும். அது மக்களின் நோய்களைக் குறைப்பதற்கு மாறாக, அதிகரிக்கத்தான் வழிவகுத்தது. அத்துடன், Prednisolone eye drops என்ற ஒரு மருந்தும் இறக்குமதி செய்யப்பட்டிருந்தது. அதுவும் ஊழல் நடவடிக்கையாகவே அமைந்து, அதிலும் கலப்படம் செய்யப்பட்டிருந்ததால் அதனைப் பயன்படுத்திய அநேகமான நோயாளிகளுக்கு தங்களது கண் பார்வையைக்கூட இழக்கவேண்டிய நிலைமை ஏற்பட்டிருந்தது.

ஆனால், இன்று இந்த நாட்டுக்கு வருகின்ற போதைப்பொருட்களிலோ அல்லது அவற்றின் உற்பத்திக்கான இரசாயனப் பொருட்களிலோ எவ்வித கலப்படமும் செய்யப்படுவதாகத் தெரியவில்லை. ஊழல், அதிகாரத் துஷ்பிரயோகம் என்பவற்றைப் பாவித்து அவை நேரடியாகவே இறக்குமதி செய்யப்பட்டு மக்கள் மத்தியிலே விநியோகிக்கப்படுவது ஏற்றுக்கொள்ளப்பட முடியாத ஒன்றாகும். அத்தோடு, மருந்து இறக்குமதிகளில் நடைபெற்ற ஊழல் நடவடிக்கைகளும் என்றுமில்லாதவாறு அவற்றின் விலை அதிகரிப்பதற்குக் காரணமாக இருந்தது. அந்த வகையில், இருதய சத்திரசிகிச்சைக்குப் பயன்படுத்தப்படும் piperazine hydrochloride மருந்தின் ஒரு vial சுமார் 35,000 - 72,000 ரூபாய் வரை தனியார் துறையினரால் விற்பனை செய்யப்பட்டிருந்தது. அதனை அரச வைத்தியசாலைகளுக்கு வழங்காமல் தனியார் துறைக்கு மட்டுமே வழங்கியிருந்தார்கள். ஆனால், தற்போது அந்த மருந்தினை 370 ரூபாய்க்கு இறக்குமதி செய்து வைத்தியசாலைகளுக்கு வழங்கக்கூடியதாக இருக்கின்றது.

அதேபோன்று, இலஞ்ச, ஊழல் நடவடிக்கைகளினூடாக வழங்கப்பட்ட அனுமதியின்மூலம் இறக்குமதி செய்யப்பட்ட தரமற்ற அழகுசாதனப் பொருட்கள் காரணமாக அநேகமானவர்களுக்கு ஒவ்வாமை ஏற்பட்டதுடன் சிலர்

இறந்த சம்பவங்களையும் இங்கு நாங்கள் சொல்லாம். அதுமட்டுமல்ல, நாட்டில் மருந்துகளுக்குத் தட்டுப்பாடு ஏற்படும் வகையில், தேவையான நேரத்தில் இறக்குமதிக்கான அனுமதியைக் கொடுக்காமல் மருந்துகள் முற்றாகத் தீர்ந்ததன் பின்னர் அனுமதி கொடுத்து, மருந்து இறக்குமதி செய்யப்படுவதற்கு மூன்று அல்லது நான்கு மாதங்களாகும்வரை இருந்துவிட்டு அவற்றின் விலையை அதிகரிப்பதற்கும் செயற்கையான தட்டுப்பாட்டை ஏற்படுத்தவும் இந்த NMRA என்ற நிறுவனம் காரணமாக இருந்திருக்கிறது. அதற்குச் சில அரசியல்வாதிகளின் அழுத்தமே காரணமாக இருந்ததாக அதன் அதிகாரிகள் தெரிவித்திருந்தார்கள். இவ்வாறாக COPE குழுவின்மூலம் நாங்கள் பல்வேறு விடயங்களை அவதானிக்கக்கூடியதாக இருந்தது.

மேலும், fast track எனும் முறையைப் பயன்படுத்தி - அதாவது, Certificate of Analysis, Certificate of Pharmaceutical Product, Stability Report எவையும் இல்லாமல் தரமற்ற மருந்துகள் இறக்குமதி செய்யப்பட்டு மக்களுக்கு விநியோகிக்கப்பட்டதன்மூலம் மக்களுக்கு எதிர்மறையான விடயத்தையே செய்யக்கூடியதாக இருந்தது. அதற்கு ஊழலும் அதிகாரத் துஷ்பிரயோகமும்தான் காரணமாக இருந்தது. அரசியல்வாதிகளின் அழுத்தங்களுக்கு அடிபணிந்து சில அதிகாரிகள் செய்த காரியத்தினால் இவ்விடயத்துடன் சம்பந்தப்படாத அனேகமான அதிகாரிகளும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். சிலர் தற்கொலை முடிவைக்கூட எடுத்திருக்கின்றார்கள். அந்த வகையில், குறித்த விசாரணையைத் துரிதப்படுத்தி, பாதிக்கப்பட்டவர்களுக்கு நிவாரணத்தைக் கொடுக்க வேண்டும். இந்த COPE குழுவின் தவிசாளராக இருந்து அதன் நடவடிக்கைகளைத் திறம்பட நடாத்திக்கொண்டிருக்கின்ற கௌரவ நிஷாந்த சமரவீர அவர்கள் பாராட்டுக்குரியவர். ஏனென்றால், அவர் ஒரு நாளில் சுமார் 18 மணித்தியாலங்கள் வரை இந்த COPE குழுவின் வேலைகளைத்தான் செய்துகொண்டிருப்பார். அதுபோல, COPE குழுவின் அங்கத்தவர்களுக்கும் நான் எனது நன்றியையும் பாராட்டினையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அத்துடன் எமது வட மாகாணத்தில் காணப்படுகின்ற சில மருத்துவ நிலைமைகள் பற்றி கூறுவதற்கும் நான் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்துகின்றேன். பொதுவாக நாட்டில் காணப்படுகின்ற வைத்தியசாலைகளில் ஊழியர்களின் பற்றாக்குறை நிலவுவதற்கு முக்கிய காரணம் நீண்டகாலமாக cadre revision செய்யப்படாமல் இருப்பதாகும். வெகுவிரைவில் cadre revision செய்து தேவையான ஆளணி வளங்களை எமது வைத்தியசாலைகளுக்கு வழங்குவோம். அதன்மூலம் பதவி உயர்வு, இடமாற்றங்கள் இன்றி மன உளைச்சலுக்கு ஆளாக்கப்பட்டு இருக்கின்ற ஊழியர்களுக்குத் தகுந்ததொரு தீர்வை விரைவில் வழங்குவோமெனக்கூறி, இந்தச் சந்தர்ப்பத்தை அளித்தமைக்கு மீண்டும் நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHAMPIKA HETTIARACHCHI took the Chair.*

[අ.භා. 2.55]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන එහි සභාපති ගරු වෛද්‍ය නිශාන්ත සමරවීර මැතිතුමා සහ ඒ කණ්ඩායමට මගේ ශුභාශිංසන පිරිනමනවා. ඒගොල්ලන් බොහොම අමාරු කාර්යභාරයක් හොඳින් කරන බව පෙනී යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ඉදිරිපත් කර තිබෙන වාර්තාවට එහා ගිහිල්ලා කාරණා දෙකක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. එකක් තමයි මම ඊයේ ගත් කාරණාව. ඒ තමයි වී අළෙවි මණ්ඩලය විසින් ගත්ත වී CWE එක හරහා කොටන්නත්, ඒ කොටපු සහල් ලංකා සතොස හරහා විකුණන්නත් ටෙන්ඩර් එකක් දාලා තිබෙනවා. මෙය අද වෙනකොට සිද්ධ වෙන දෙයක් නිසා කරුණාකරලා ඒ ගැන අවධානය යොමු කළොත් හොඳයි. මම ඊයේ පෙන්වා දුන්නා, මේ ටෙන්ඩර් එක හදලා තිබෙන්නේ කුඩා හා මධ්‍යම සහල් මෝල් හිමියන්ව අයින් කරලා තෝරාගත් යම් කණ්ඩායමකට මේ ටෙන්ඩරය ලබා දෙන්නට කියලා. ඒකට හේතුව හැටියට, සාක්ෂි හැටියට මම පෙන්වා දුන්නා, කොයි විධියටද ඒ කොන්දේසි ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. අද වෙනකොට තත්ත්වය ඊටත් වඩා භයානක තැනකට ගිහිල්ලා තිබෙනවා. මොකද, වී අළෙවි මණ්ඩලයේ හිටපු සාමාන්‍යාධිකාරී සමන් පාලිත මහත්තයා, හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනයේ දුමින්ද ප්‍රියදර්ශන මහත්තයා, පසු අස්වනු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු රත්නායක මහත්මයා හම්බ වෙලා තිබෙනවා, මේ bids ඉදිරිපත් කරපු කණ්ඩායම්. ඔවුන්ට අද කියලා තිබෙන විධියට මේ කොන්දේසි තවත් දැඩි වෙලා තිබෙනවා. පැයකට වී කිලෝ 15,000ක් අඹරන්න පුළුවන් ආයතනවලට විතරයි මේ ටෙන්ඩර් එකට ඉදිරිපත් වෙන්න පුළුවන් කියලා අර ඊයේ කියපු කාරණාවලටත් වඩා එහාට ගිහිල්ලා තිබෙනවා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන කථා කරන්නේ ඇයි? "ශක්ති" සහල් ව්‍යාපාරය හරහා මේ රටේ කුඩා හා මධ්‍යම සහල් මෝල් හිමියන් 300කට අධික ප්‍රමාණයක් සමුපකාරයක් හැටියට එකට එකතු කරලා එදා රුපියල් 85ට හාල් විකුණන්න මූලික වෙච්ච කෙනෙක්, මම. ඒ නිසා මම කොළඹ හිටියාට මේ පිළිබඳව සෑහෙන අවබෝධයක් තිබෙනවා, ඒ කට්ටියත් එක්ක කථා කරලා තිබෙන නිසා. අනික් එක තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරෙන් සහ දකුණෙන් ගත්ත නාඩු වී දැන් ගබඩා කරලා තිබෙනවා. මේකෙන් අනිවාර්යයෙන් සියයට 65ක් හාල් ගන්න පුළුවන්. හැබැයි, කොන්දේසිය දාලා තිබෙන්නේ සියයට 63ක් හාල් ගන්න ඕනෑ කියලා. කොහොමද එහෙම වෙන්නේ? අනික් එක, පැයකට වී කිලෝ 15,000ක් අඹරන්නත්, ඒ අඹරන හාල්වලින් රජයට ලබා ගත යුතු ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් ලබා ගන්නත් වාගේ කොන්දේසි දැම්මේ කවුද? ඒ නිසා ඒක දූෂණයක් වෙන්න කලින් අපි මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා, අද මේ සාකච්ඡා කරන කාරණා අතරේ.

ඊළඟ කාරණාව මේකයි. පෙරේදා පාර්ලිමේන්තුවේ ගරු රවුෆ් හකීම් මැතිතුමා විසින් කරපු ප්‍රකාශයක් ප්‍රකාරව මම විගණකාධිපතිතුමාට ඊයේ ලියුමක් යොමු කළා. ඒ ලියුමේ තිබෙන්නේ මෙහෙමයි; "Report of the Committee on Public Finance on outsourcing online visa and passport application services between the Consortium and the Department of Immigration and Emigration ....". අර අසරණ හර්ෂ ඉලුක්පිටිය මහත්මයා රිමාන්ඩ් එකේ හිටියා, මෙච්චර කල්. දැන් තව අවුරුදු දෙකකට එතුමාව හිරේ දාලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 3ක කාලයක් අමතරව ලබා දෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම ස්තුතියි.

එතුමා තව අවුරුදු 2කට හිරේ දමලා තිබෙනවා. මොකටද? For contempt of court. මෙහි ඉතිහාසය සමහර විට ඔබතුමා දන්නේ නැතුව ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රජයේ මුදල් පිළිබඳ කමිටුවේදී තමයි මේ කාරණය සාකච්ඡා වුණේ. ඒ සාකච්ඡා වන අතරවාරයේදී අතිශය විශාල අභියෝගවලට මුහුණ පාන්න අපට සිදු වුණා. එහි සභාපතිවරයා හැටියට, මගේ ආරක්ෂාව කථානායකවරයාගේ අතේ තිබෙනවාය කියන කාරණයත් මට කියන්න සිද්ධ වුණා. ඒ කෙසේ වෙතත් අපි බොහොම අමාරුවෙන්, පිටු 660 ගණනක වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළ වාර්තාවේ ප්‍රථම නිර්දේශය ලෙස තිබෙන්නේ මොකක්ද? අපි නොයෙකුත් දේවල් නිරීක්ෂණය කළා. ඒ වාර්තාවේ තිබෙන recommendation එකක් මම කියවන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ. It is a main recommendation. I quote:

> "The Committee recommends that the Auditor-General undertakes a comprehensive forensic audit of the entire procurement process, utilizing the findings outlined in this report. It was revealed during the COPF meeting on June 04, 2024 that the Auditor-General had already initiated such an audit. The Committee requests this audit be completed at the earliest opportunity.
>
> The findings should serve as the foundation for determining necessary action. Such action could involve the abrogation of the Consortium Outsourcing Agreement or amending specific Clauses within the same."

එතැනදී අපි Public Finance Committee එක වශයෙන් දීපු නිර්දේශය තමයි කරුණාකරලා මේ සම්බන්ධව වෝහාරික විගණනයක් කරන්න කියන එක. මොකද, අපට එදා තිබිච්ච දත්තවලට එහා ගිය දත්ත,- ඇත්ත වශයෙන්ම කැඳවලා ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න විගණකාධිපතිතුමාට හැකියාවක් තිබෙනවා, නෛතිකව ඒ responsibility එක තිබෙන නිසා.

ගරු රවුෆ් හකීම් හිටපු ඇමතිතුමා එදා ප්‍රශ්න කළා පාර්ලිමේන්තුවේදී, ඒ audit එකට මොකද වුණේ කියලා. මමත් දිගින් දිගටම ඒ audit එක සම්බන්ධයෙන් අහනවා. ඊයේ යවපු ලියුමට ජාතික විගණන කාර්යාලයේ Acting Auditor-General අද අපට ලියුමක් එවා තිබෙනවා. ඊයේ යවපු මගේ ලියුම ප්‍රකාරව එහි මෙන්න මෙවැනි දෙයක් කියා තිබෙනවා: "This is to inform you that the first draft of the report on the above subject was issued to the Secretary, Ministry of Public Security and Parliamentary Affairs on 14th March, 2025 and the reply for the draft report was received on 28th May, 2025." ගරු ඇමතිතුමාට මාර්තු 14වැනි දා ඔහුගේ වෝහාරික විගණනය ඉදිරිපත් කරලා, ඇමතිතුමාගේ reply එකක් ඇවිත් තිබෙනවා කියනවා, මැයි මාසයේ 28වැනි දා. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා: "Accordingly, a discussion was held with the Controller General of Immigration and Emigration on 17th July, 2025 to clarify certain matters in the reply and the amended draft report was issued on 25th August, 2025 to the Secretary, Ministry of Public Security and Parliamentary Affairs requesting to reply within seven days on receipt of the report." ඒ කියන්නේ, ඒ ඉල්ලපු අලුත් දත්ත සම්බන්ධයෙන් ලැබුණා, ඒවා සම්බන්ධයෙන් Department of Immigration and Emigration එකත් එක්ක ජූලි මාසයේ 17වැනි දා සාකච්ඡා කරලා, අගෝස්තු මාසයේ 25වැනි දා දවස් 7කින් පණිවුඩයක් අත්‍යවශ්‍යයි කියා amended report එක නැවතත් ගරු ඇමතිතුමාගේ ලේකම්තුමාට ඉදිරිපත් කළා කියලායි. ඊට පසුව මෙහෙම කියනවා: "Further, on the request of the Controller General of Immigration and Emigration, a meeting was held on 03rd September, 2025 and at that meeting, the Controller General had requested to extend the time period to reply to the amended draft till 17th September, 2025." ඒ කියන්නේ, 'හරි අපි සාකච්ඡා කළා, සැප්තැම්බර් 17වැනි දා වනකල් ඒ කට්ටියට කල් දෙන්න කියා සඳහන් කළා' කියලායි. ඒ වාගේම, මෙසේ ද සඳහන් වනවා: "However, no reply has been received for the amended draft repot even as at 24th September, 2025." ඊයේ වනකොටත් මේ සම්බන්ධයෙන් වාර්තාවක් ලැබී නැහැ කියා තිබෙනවා.

එතකොට, මෙතැන තිබෙන ගැටලුව කවුරු ආණ්ඩුවේ ඉන්නවාද කියන එක නොවෙයි. අපේ පාර්ලිමේන්තුව විසින් නියෝගයක් දීලා තිබෙනවා නම් ඒ නියෝගය ක්‍රියාත්මක කරන්න, ඒ ආයතන බැඳී සිටිනවා ඒකට. ඒ බැඳීමට මොකද වුණේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් අපි දූෂණය සම්බන්ධයෙන් නොයෙකුත් දේවල් කථා කරනවා. හැබැයි, මේ විසා ගැටලුව කියන්නේ රටේ කථා වෙච්ච දෙයක්. නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිම දෙයක් සිදු වන පාටක් අපට පෙනෙන්නේ නැහැ. අද අප මේ ගැන කථා කරනවා වාගේම රජය පාර්ශ්වයෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙනුත් ක්‍රියාත්මක වෙන්න කියලා. එහෙම නැති වුණොත්, නොයෙකුත් පුද්ගලයන් එල්ල කරන චෝදනා පිළිබඳව යම් යම් සැක සංකා පහළ වනවා කියන එක මෙතැනදී අතිශයෝක්තියෙන් කියන්න අවශ්‍යතාවක් නැහැ. ඒක එහෙම වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවශ්‍ය වුණේ මෙන්න මේ කාරණා දෙක පෙන්වා දෙන්නයි. එක, මම කලිනුත් කිව්වා වාගේ, කුඩා හා මධ්‍ය පරිමාණයේ වී මෝල් හිමියන් ආරක්ෂා කරනවා කියලා තමයි ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" Manifesto එකේ තිබුණේ. එහෙම නැතුව ඒකේ කිව්වේ නැහැ, 'අපි ඔය කට්ටියව අයින් කරලා තෝරා ගත් මෝල් හිමියන් හතරපස්දෙනෙකුට අවස්ථාව දෙනවා' කියලා. හැබැයි, අද වනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? මම ඉතාම වගකීමෙන් මේ කියන්නේ. කුඩා සහ මධ්‍යම පරිමාණයේ හාල් මෝල් එකකටවත් ඇතුළු වෙන්න බැරි විධියේ ටෙන්ඩරයක් හදලා රජය සතු සියලු වී තොග නිකුත් කරන්න යනවා, තෝරාගත් පුද්ගලයන්ට. ඒ විතරක් නොවෙයි. සියයට 65ක් ගන්න පුළුවන් හාල් එක සියයට 63ට අඩු කරලා තවත් උපරිම ලාභයක් ලබාගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. මම ඒක කියන්නේ, "ශක්ති" ව්‍යාපාරයේ නිර්මාතෘ හැටියට. එදා අපට පුළුවන් වුණා කුඩා සහ මධ්‍ය පරිමාණයේ සහල් මෝල් හිමියන් අමාරුවේ වැටී සිටි වෙලාවේ ඒ අය අපේ system එක තුළට අරගෙන ඒ අයගේ ව්‍යාපාර නැවත ආරම්භ කරවන්න. ඔවුන් ජීවත් කරවන්න හැකියාවක් අපට තිබුණා. ඒ නිසා අපි රජයට අභියෝග කරමින් කියනවා, ඔබ බලයට ආවේ කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් ආරක්ෂා කරන්න නම්, ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න කියලා. එහෙම නැතිව ඒ අයට පයින් ගහලා එළියට දමලා ලොකු මෝල් හිමියන් දෙතුන්දෙනෙකු ආරක්ෂා කරනවා කියලා නොවෙයි ඔබ රටට පොරොන්දු වුණේ. ඒ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.06]

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප මේ කථා කරන්නේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව ගැනයි. මේ විවාදය අතරතුර සමහර අවස්ථාවල විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ පැත්තෙන් මේ පිළිබඳව සාකච්ඡා කරනවා වෙනුවට, තමන්ට මතු කර ගන්න ඕනෑ කාරණා පිළිබඳව තමයි කථා කරන්න යෙදුණේ. ආණ්ඩුව තමන්ට එකඟ, තමන් අනුමත කරන මෝල් හිමියන්ට වී නිකුත් කරන්න වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා කියා, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා යම් යම් කරුණු පදනම් කරගෙන, සිදුවීමක් පදනම් කරගෙන පූරෝකථනයන් සහිතව දැනුත් යම් කරුණු දැක්වීමක් කළා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඔබතුමා කලබල වෙන්න එපා. ඔබතුමා ඔය සැක කරන විධියේ කිසිදු ක්‍රියාමාර්ගයකට යන්න අපේ ජනාධිපතිතුමාගේ සිට අමාත්‍ය මණ්ඩලය ප්‍රමුඛ ආණ්ඩුව ඇතුළු අප කිසිම කෙනෙකුගේ කිසිදු සූදානමක් නැහැ. කළ යුතු සියල්ල කළ යුතු ආකාරයට අපේ පැත්තෙන් අපි සිදු කරනවා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා සැක පහළ කරලා මතු කරන කාරණය සම්බන්ධයෙන් තව පොඩි කාලයක් ඉවසන්න. ඒ කාලයත් ඉවසා සිටියාට පසුව ඔබතුමාටම බලාගන්න පුළුවන් වේවි, මොකක්ද සිදු වෙන්නේ කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම කියපු නිසා මට පොඩි වේලාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. ඇත්තටම ඒක තමයි වෙන්න ඕනෑ. වෙන්න කලින් තමයි මම ඒක කිව්වේ. ඒ නිසා කොන්දේසි වෙනස් කර ගැනීමක් සිදු කරන්න වෙනවාමයි. මේක අද වෙච්ච සාකච්ඡාවක්. එහෙම නම් කොන්දේසි වෙනස් කරන්න. කුඩා සහ මධ්‍ය පරිමාණයේ සහල් මෝල් හිමියන්ටත් ඒ අවස්ථාව දෙන්න.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කලබල වෙන්න එපා. මොකද, ඔබතුමා මීට පෙරත් ඔවැනිම කථාවක් කියලා, ජනාධිපතිතුමාගේ කථාවකදීත් එතුමා ඒක මතු කළා. ඒ නිසා මේ ආණ්ඩුව සම්බන්ධයෙන් පූරෝකථන කරද්දී practice එක බලලා පූරෝකථන කළා නම් හොඳයි. නැත්නම් අපරාදේ ඒ කියපු ඒවා අකුලා ගන්න වෙනවා. ඒ වාගේ ගොඩක් කාරණා සමහර තැන්වලදී සමහර මන්ත්‍රීවරු මතු කළා. මම ඒවා එකින් එකට මතු කරන්න යන්නේ නැහැ.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගැන කථා කරද්දී කිව යුතු කාරණා කීපයක් තිබෙනවා. මුළු රටම එය දන්නේ "COPE එක" කියලායි. අප ආණ්ඩුව භාර ගත්තාට පසුව COPE එකේ සභාපති ධුරය අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් භාර ගත්තා. ඒකට හේතුවක් තිබුණා. මෙතෙක් මේ රට ආපු ගමන් මඟ පිළිබඳව අපට බරපතළ ගැටලුවක් තිබෙනවා. මේ ආණ්ඩුව නිර්මාණය වෙන්න, මේ ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් ලැබෙන්න බලපෑ මූලික කාරණාව වන්නේත් මේ රට ගමන් කරපු විධියයි. විශේෂයෙන්ම අපේ රට මෙතෙක් පාලනය කරපු පාලකයන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ක්‍රියාමාර්ගවල තිබුණු වැරැදිසහගත බව සහ ඒ දේශපාලකයන්, ඒ පාලකයන් අනුගමනය කරන ලද වැරැදි දේශපාලන සංස්කෘතිය නිසා තමයි අපේ රට මේ විධියට මේ තරම් අගාධයට ඇදගෙන ගියේ. එම නිසා එහි වෙනසක් බලාපොරොත්තුවෙන් තමයි අපේ රටේ ජනතාව ජනාධිපති ධුරය වාගේම, අතිවිශාල බලයක් සහිතව -

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

මන්ත්‍රී ධුර 159ක් ලබා දෙමින්- මේ ආණ්ඩුව පිහිටුවනු ලැබුවේ. අපේ රටේ ජනතාව මේ ආණ්ඩුව පිහිටුවීමේ අරමුණ ජයග්‍රහණය කරවීම වෙනුවෙන්, මේ ආණ්ඩුවේ අපේ මන්ත්‍රීවරු 159දෙනාම කැප වෙමින් සිටිනවා. එහි හොඳම සාක්ෂියක්, හොඳම උදාහරණයක්, practice එකක් තමයි COPE කමිටුව කියලා කියන්නේ.

මේක දසවන පාර්ලිමේන්තුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතෙක් මේ රටේ තිබුණු සෑම පාර්ලිමේන්තුවකම COPE කමිටුවට පැවරුණු කාර්යයක් තිබුණා. ඒ කාර්යය තමයි, ඒ කමිටුවට විමර්ශනය සඳහා පැවරෙන ආයතන 457හි ගිණුම් පදනම් කරගෙන විමර්ශනය කරලා, ඒ විමර්ශන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුව සම්මත කරලා, ඒක පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගියා; එහෙම නැත්නම්, කථානායකවරයා අත්සන් කරලා ප්‍රසිද්ධියට පත් කළා. ඒ හැර එතැනින් එහාට මොනවත් වුණේ නැහැ. විශේෂයෙන් යම් පමණකට මේ කටයුතු ඉදිරියට අරගෙන යන්න මැදිහත් වුණා, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා COPE එකේ සභාපතිවරයා ලෙස හිටපු අවස්ථාවේ. එදා තවදුරටත් එහාට ගිහිල්ලා යම් යම් ක්‍රියාමාර්ග ගන්න උත්සාහ කළා. ඒ වාගේම අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාමාර්ග ගන්නත් සමත් වෙනවා. අද අපි එතැනිනුත් එහාට ගිහිල්ලා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ COPE එක තිබුණාට වඩා ව්‍යුහාත්මකව වෙනස් වෙන දිනයක් බවට අද දිනය පත් වෙනවා. මේ විවාදයත් සමඟ අපි අද COPE එකේ බලව්‍යුහය, බලසීමාව පුළුල් කරලා තිබෙනවා. පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරලා ඒ වාර්තාව සම්මත කරන කාරණයට වඩා එහාට ගිහිල්ලා, COPE එක කරන විමර්ශන ඇතුළේ සාධාරණ ලෙස හැඟී යනවා නම් මේ තුළ වංචාවක් තිබෙනවා, එහෙම නැත්නම් දූෂණයක් තිබෙනවා කියලා, COPE එකට පැවරෙනවා, ඒක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමු කරන්න. එහෙම නැත්නම් පොලිස්පතිවරයාට යොමු කරන්න. ඒ සඳහා වන බලය සහිත කමිටුවක් බවට අද COPE එක පත් කරනවා. ඒ නිසා අද දිනය COPE එක ව්‍යුහාත්මකව වෙනස් වන දිනයක් බවට පත් වෙනවා.

මේ රටේ පාලන බලය ගන්නට පෙර අපි මේ රටට දීපු පොරොන්දුවක් තිබුණා. ඒ තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක. අන්න ඒ පොහොසත් රට, ලස්සන ජීවිතය ගොඩ නැඟීම සඳහා වන දිසාවට අපි මේ COPE එක - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - යොමු කරනවා. අපි අද COPE එක පිළිබඳ විවාද කළාට COPE සහ COPA කියන කමිටු දෙකම මේ අරමුණ වෙනුවෙන් මෙහෙයවීම සඳහා වන මැදිහත් වීම කරමින් ඉන්නවා, ආණ්ඩුව විධියට.

විශේෂයෙන්ම අපි මේ විමර්ශනවලදී හඳුනා ගත් කාරණයක් තිබෙනවා. අපි මේ වෙනකොට මේ කමිටුවට ආයතන 14ක් ගෙන්වලා තිබෙනවා. එයින් වාර්තා 4ක් අපි පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. ඒ හැම ආයතනයක්ම විමර්ශනය කළාට පස්සේ අපි දැකපු කාරණයක් තිබෙනවා. ඒ මේකයි. විගණකාධිපතිවරයා විසින් කරන ලද විගණන වාර්තා පදනම් කරගෙන කරන විමර්ශනවලදී අපට තොරතුරු එළිදරවු කර ගැනීම හරිම අපහසුයි. විමර්ශනයට ගෙන්වන ඒ ආයතන, එහෙම නැත්නම් ඒ ආයතනවල නිලධාරින්ගෙන් තොරතුරු විමසීම හරිම අමාරුයි. ඔවුන් තොරතුරු කියන්නේ නැහැ; සූදානම් වෙලා එන්නේ කියන්නේ නැහැ කියලා. ඒකට හේතුවකුත් තිබෙනවා. හේතුව තමයි, මේ රටේ මේ ආයතන මෙහෙයවපු පාලකයන් විසින් කරන ලද වංචා, දූෂණ වැඩි ප්‍රමාණයක් අපේ රටේ නිලධාරින්ගේ කර මතින් තමයි ගිහිල්ලා තිබෙන්නේ; ඒවා නිලධාරින්ගේ කර මතින් ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා නිලධාරින් තොරතුරු හෙළිදරව් කරන්න භයයි. අවසානයේ හිර වෙන්නේ ඒ නිලධාරියා. එතැනින් එහාට ගිහිල්ලා, ඒ නිලධාරියා ඒ තත්ත්වයට පත් කරපු දේශපාලකයා හඳුනා ගැනීම සඳහා වන ක්‍රමයකට අපි දැන් මේ කටයුත්ත මාරු කර ගන්න ඕනෑ. අන්න ඒ අරමුණ සහිතව තමයි අපි අපේ රටේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වෙනස් කරලා COPE එකේ බලසීමාව වෙනස් කරන්න තීරණය කළේ. සමහර කරුණු එළිදරවු කර ගන්න වෙන්නේ විමර්ශනයක් ඇතුළේ. සමහර කරුණු හෙළිදරව් කර ගන්න වෙන්නේ විමර්ශනය කළ හැකි ආයතනයකට පවරලා කරන විමර්ශනයකින් පසුවයි.

අපි COPE එකට ආයතන ගෙන්වලා, විමර්ශනය කරලා ඒ පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ වෙද්දී ඒ හොරකම්, වංචා, දූෂණවලට සම්බන්ධ පුද්ගලයන් හොරෙන් හොරෙන් ඇවිල්ලා අපව හම්බ වෙනවා. හොරෙන් හොරෙන් ඇවිල්ලා අපව හම්බ වෙලා, "අපට දඬුවම් කරන්න එපා, අපට මේ සීමාවේ ඉඳලා, මේ මට්ටමින් ගොඩ යන්න පුළුවන් නම් හොඳයි" වාගේ ප්‍රකාශ කරන්න පටන් අරගෙන තිබෙනවා. COPE එකේ හිටපු සභාපතිවරු, විශේෂයෙන් හඳුන්නෙත්ති ඇමතිතුමා වාගේ අය හම්බ වෙලා හිටපු සමහර දේශපාලකයන්, හිටපු සමහර සභාපතිවරු කථා කරන්න පටන් අරගෙන තිබෙනවා, ඔවුන් කරපු හොරකම් පිළිබඳව ඔවුන් දන්නා නිසා. ඒ සමහර නිලධාරින්, එහෙම නැත්නම් සමහර සභාපතිවරු ඇවිල්ලා අපි සමඟ පෞද්ගලිකව කථා කළාට, ඒ විමර්ශනය ඇතුළේ අපට ඒ තොරතුරු හෙළිදරව් කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි දන්නවා, ඇතුළේ වංචාවක් වෙලා තිබෙනවා, දූෂණයක් වෙලා තිබෙනවා කියලා. ඒ දූෂණය හෙළිදරව් කර ගැනීම සඳහා මැදිහත් වෙන්න ඕනෑකම තිබෙනවා. අන්න ඒ වෙනුවෙන් අපි මේ COPE එකේ බලසීමාව පුළුල් කරගෙන, ඒ සීමාව ඇතුළේ කරන විමර්ශන ඇතුළේ මේ සියලු දූෂිත ක්‍රියාමාර්ග හෙළිදරව් කරමින් රටට සාධාරණය ඉෂ්ට කරනවාය කියන සහතිකය දෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මට වෙලාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.16]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

COPE එක ගැන කථා කරනකොට විශේෂයෙන්ම අපට මතක් වෙනවා, 2015-2019 යහ පාලන ආණ්ඩුව කාලයේ සුනිල් හඳුන්නෙත්ති වර්තමාන ඇමතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට COPE එකේ සභාපති ධුරයේ කටයුතු කළ ආකාරය. එතුමා එහි සභාපතිවරයා හැටියට කටයුතු කරන කාලයේ තමයි මහ බැංකු බැඳුම්කර සිද්ධිය පිළිබඳව හෙළිදරව් වුණේ. වර්තමාන රජය බලයට එනකොට මේ රටේ ජනතාවට පොරොන්දු වුණා,

කැබිනට් මණ්ඩලය ගන්න පළමුවැනි තීරණය හැටියට හිටපු මහ බැංකු අධිපතිවරයා ලංකාවට ගෙනැල්ලා නීතිය ක්‍රියාත්මක කරනවා කියලා. පාස්කු ප්‍රහාරය කරපු අය පැය 24න් අල්ලනවා, අප්‍රේල් 21වැනි දාට මහ මොළකරු කවුද කියලා හෙළිදරව් කරනවා වාගේ කථා කිව්වත් මේ ආණ්ඩුව ජනතාවට දුන් ඒ පොරොන්දුවත් පුස් පොරොන්දුවක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවේ ප්‍රධාන පොරොන්දුවක් වුණේ හොරකම, වංචාව, දූෂණය පිටු දකිනවා කියන කාරණය. හැබැයි මේ ආණ්ඩුව තුළ ලංකා ඉතිහාසයේ වෙච්ච ඉතාම බිහිසුණු, භයානක, විශාලතම හොරකම සිදු වුණා. ඒ තමයි, කන්ටේනර් 323 සම්බන්ධ සිදුවීම. මේ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් වුණා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළේ නැහැ. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාර්තාව තුළ පැහැදිලිව තිබෙනවා, "රතු නිවේදන සහිත මේ කන්ටේනර් 323 ලංකාවට තුළට ගෙනාවා, මේවායේ මත්ද්‍රව්‍ය තිබෙන්න පුළුවන්, ආයුධ තිබෙන්න පුළුවන්, රත්තරන් තිබෙන්න පුළුවන්, ඒ වාගේම රුපියල් කෝටි ගණනක් මේ රටට අහිමි වෙනවා" කියලා. වෛද්‍ය රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා එදා අපට කිව්වේ ඇත්තද? මේවායේ ඇත්තටම ආයුධද තිබුණේ කියලා අපි දැනගන්න කැමැතියි. ආයුධ ආවා නම් කාගේ අතටද ඒවා ගියේ කියලාත් අපි දැනගන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම බිහිසුණු දූෂණයක් තමයි මේ ගනුදෙනුව හරහා කරන්නේ.

මේ රට පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වුණා. ඒකට යම් යම් පුද්ගලයන් මුදල් දීලා තිබුණා, පහසුකම් ලබා දීලා තිබුණා. ඊබ්‍රාහිම් නානාගේ පුතාලා දෙන්නා තමයි එදා අහිංසක කතෝලික ජනතාව මරන්න මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කළේ. අද ඒ පුද්ගලයා ගැන සද්දයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා එදා ජනතා විමුක්ති පෙරමුණේ - NPP එකේ - ජාතික ලැයිස්තුවේ හිටපු පුද්ගලයෙක්. මේ පිළිබඳ තොරතුරු දැනගෙන හිටපු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා -"බංකු බංකු" මැතිතුමාට- විරුද්ධව අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. වර්තමාන කථානායකතුමා අපට ඒ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්න ඉඩ දුන්නේ නැහැ. හැබැයි එතුමා ම ඊයේ පාර්ලිමේන්තු ලේකම්වරුන්ගේ උපදෙස් සහිත වාර්තාව මේ පාර්ලිමේන්තුවේ සභාගත කළා. ඒ වාර්තාවේ මොනවාද තිබෙන්නේ? 2025.09.04වැනි දා ඉදිරිපත් කරපු ඒ වාර්තාවේ, "There is no specific legal provision regarding a No-Confidence Motion against a Deputy Minister according to the Constitution of Sri Lanka, the Standing Orders or the Westminster system" යනුවෙන් සඳහන්ව තිබෙනවා. එතකොට, අර්ස්කින් මේ එකේ තිබෙන Westminster System එක උල්ලංඝනය කරලා තමයි කථානායකතුමා මේ විශ්වාස භංග යෝජනාව අපට ඉදිරිපත් කරන්න දුන්නේ නැත්තේ. එහි තවදුරටත් සඳහන් වෙනවා "It would set precedent of No-Confidence Motions against Deputy Ministers, in future" කියලා. ඒ වාර්තාවේ පැහැදිලිව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගේන්න පුළුවන් කියලා. අපි මේ පිළිබඳව අන්තර් පාර්ලිමේන්තු සංගමයට - Inter-Parliamentary Union එකට - Commonwealth Parliamentary Association එකට පැමිණිලි කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක් තමයි මේ අහිමි කරලා තිබෙන්නේ. එදා පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වෙලා මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ ජීවිත අහිමි වුණා. ඒ පිළිබඳ තොරතුරු දැනගෙන හිටපු රජයේ නිලධාරින් සහ තොරතුරු වසන් කරපු අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ අය තනතුරු දරද්දී ඒ අයට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගේනකොට මේ ප්‍රජාතන්ත්‍රවාදය ඉඩ දෙන්නේ නැහැ, අපට ඒ විශ්වාස භංග යෝජනාව ගේන්න. ප්‍රශ්නයක් නැහැ. අපි ජාත්‍යන්තරයට යනවා; අපි මේ වෙනුවෙන් සටන් කරනවා. මේ රටේ අහිංසක මිනිසුන් වෙනුවෙන් දේශපාලන ප්‍රවාහය තුළින් අපට කරන්න පුළුවන් උපරිමය කරනවා, අපි ඒ සඳහා නායකත්වය ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශ්‍රී ජයවර්ධනපුර වෛද්‍ය පීඨයේ දන්ත වෛද්‍ය ඒකකය සම්බන්ධව අපට යම් කිසි බියක් ඇති වන දෙයක් අහන්න, දකින්න ලැබෙනවා. එම ඒකකය වහන්නද යන්නේ, එහෙම නැත්නම් වෙනත් දන්ත වෛද්‍ය පීඨයකට එකතු කරන්නද යන්නේ කියන එක ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහන් කරන ආකාරයට, රෝගීන් 7,500කට එක දන්ත වෛද්‍යවරයෙක් අවශ්‍යයි. හැබැයි, අපේ රටේ රෝගීන් 13,280කට එක දන්ත වෛද්‍යවරයෙක් තමයි ඉන්නේ. එම නිසා වර්තමාන රජයට අපි පැහැදිලිව කියනවා, විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය ගොඩනඟලා, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙන්න කියලා. එම වෛද්‍ය පීඨ වසා දැමීම නොවෙයි, ඒවාට ලබා දෙන පහසුකම් අඩු කිරීම නොවෙයි, ඒවායේ ඉගෙන ගන්නා දරුවන්ට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දීමයි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන තවත් වරප්‍රසාදයක් තමයි පාර්ලිමේන්තු කැන්ටීම. එහෙම නේද? හැබැයි, පාර්ලිමේන්තුවේ කැන්ටීන් එකෙන් දැන් කන්නත් භයයි. මොකද, දැන් එහි මීයෝ ඉන්නවා. මම දන්නේ නැහැ, මීයන්ගේ අඩි පාරවල්, එහෙම නැත්තම් කැරපොත්තන්ගේ අඩි පාරවල් අපේ ගරු කථානායකතුමා කොහොමද හඳුනා ගන්නේ කියලා. හැබැයි, කොහොම හරි PHIගේ ප්‍රශ්නය ගියේ මීයාගේ පිටින්.

අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තුවේ අපේ ගරු ලේකම්වරු එතුමාට ඉදිරිපත් කළ වාර්තාව අපට ඉදිරිපත් කරන්න කියලා. ඇයි, හංගාගෙන ඉන්නේ? මේ ආණ්ඩුවට තිබෙන ප්‍රශ්න මොනවාද? විදුලිය ගියොත්, ඒකට හේතුව වඳුරා හෝ රිළවා. ගොවිතැන් පාලු වුණොත්, ඒකටත් වඳුරන් හා රිළවුන් තමයි වග කියන්න ඕනෑ. හොඳ වෙලාවට පාර්ලිමේන්තුව දූපතක් නිසා වඳුරන්ට හා රිළවුන්ට එන්න විදියක් නැහැ. එම නිසා කැන්ටීන් එකේ ප්‍රශ්නය මීයන්ගේ පිටින් ගිහින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරුවන්ගේ අධ්‍යාපනයට බලපාන කාරණා පිළිබඳව පෙරේදා පාර්ලිමේන්තුවේ සාකච්ඡා වුණා. දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව කථා කරනකොට, පියවරු හැටියට අපට ලොකු වගකීමක් තිබෙනවා. අපේ දරුවෝ තමයි මේ රටේ අනාගතය. අපට තිබෙන ලොකුම සම්පත තමයි අපේ දරුවෝ. මම ඉගෙන ගත්තේ කොළඹ රාජකීය විද්‍යාලයේ. අපි හැදුණේ ගුරුවරුන්ට භයෙන්. මම නම් රාජකීය විද්‍යාලයේ ගුරුවරුන්ගෙන් හොඳට ගුටි කාලා තිබෙනවා. එම නිසා තමයි අපි හැදිලා තිබෙන්නේ. අපට රාජකීය විද්‍යාලයේදී උගන්වපු දෙයක් තමයි, "වරදක් කරලා තිබෙනවා නම් ඒක පිළිගෙන, සමාව ගන්න" කියන එක. එතකොට මේ රටේ දරුවෝ අපි හදන්න ඕනෑ ගහලා, බැණලා කියලා මම කියන්නේ නැහැ. හැබැයි යම් කිසි ප්‍රමිතියක් සහිතව දරුවෝ හදන්න ඕනෑ. එම දරුවන්ට ඕනෑ විදියට කොණ්ඩය කපාගෙන යන්නයි, ඕනෑ සපත්තු දාගෙන යන්නයි, අවුරුදු 16දී ලිංගික කටයුතු කරන්න අවස්ථාව දෙන එකයි නොවෙයි කළ යුත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කල්පනා කරලා බලන්න. ඔබතුමාට දුවෙක් ඉන්නවා නම්, මේ සමාජය අද වල් බිහි වෙලා නම්, මොකක්ද වෙන්නේ? එම නිසා දරුවන්ව හරි මාර්ගයට යොමු කිරීම වැඩිහිටියන් හැටියට අපේ වගකීමක් වෙනවා.

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ඔබතුමා දන්නවා, බාල වයස්කාර දරුවන්ට ගැබ් ගැනීම් සිදු වන්න පුළුවන් බව. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම unplanned pregnancies නිසා අන්තිමට වෙන්නේ මොකක්ද? ඒ දරුවෝ abortionsවලට ලක් වෙනවා. ඒ විතරක් නොවෙයි. බෝවන ලිංගික රෝගී තත්ත්ව - STDs - පිළිබඳව දරුවන්ට අවබෝධයක් නැති වුණොත් මොකද වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අනාගතයයි අපි මේ විනාශ කරන්න කටයුතු කරන්නේ. එම නිසා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම මේ රටේ දරුවන්ව ආරක්ෂා කරන්න කටයුතු කරන්න. නීති රීතිවලින් අපි දෙමවුපියන්ට, ගුරුවරුන්ට බලපෑම් කරනවාට වඩා විශේෂයෙන්ම අපේ රටට වටිනා සම්පතක් වන දරුවන්ව සමාජගත කරන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න කියන ඉල්ලීම කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.25]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද අපි ඇත්තටම කල් තැබීමේ විවාදයේදී සාකච්ඡා කරන්නේ, COPE එකේ සභාපතිතුමා විසින් සභාගත කළ වාර්තාව ගැනයි. අද පාර්ලිමේන්තුව තුළ COPE එකේ වාර්තාව ගැන සහ COPE එකේ ඉදිරි ක්‍රියාමාර්ග ගැන අඩු ගණනේ ආණ්ඩු පක්ෂයෙන් හෝ දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා. COPE එකේ සාමාජිකයකු හැටියටත් මම ඒ ගැන සතුටු වනවා. අද උදේ ඉඳන්ම කන්ටේනර් සිද්ධිය ගැන, වෙනත් වෙනත් ආයතන ගැන ගැටලු විශාල ප්‍රමාණයක් මතු කළා. රජය පැත්තට ඇඟිල්ල දිගු කරමින්, විපක්ෂය පැත්තෙන් චෝදනා ප්‍රමාණයක් මතු වෙමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එක මේ පාර්ලිමේන්තුවේ කාරක සභාවක් හැටියට 1979 සිට තමයි ක්‍රියාත්මක වෙන්නේ. එතකොට අපි තේරුම් ගන්නට අවශ්‍ය දේ තමයි, COPE එක කියන්නේ රාජ්‍ය පොදු ව්‍යාපාර සම්බන්ධයෙන් තීරණාත්මක ප්‍රතිපත්ති වෙනසක් සිදු කරන ලද රජයක් යටතේ පාර්ලිමේන්තුව තුළ ඒ සඳහා යම් වාර්තා කිරීමකට limit කරලා තිබෙනවා කියන එක. මේ COPE එකේ සීමා - limitation - සහිත බව වර්ධනය කරන්න බලාපොරොත්තු වෙන්නේ කොහොමද කියන එක ගැන අද අපි කථා කළා. නමුත් අපි තේරුම් ගන්න ඕනෑ, 1977දී පත් වෙච්ච ජේ.ආර්. ජයවර්ධන රජය විසින් රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරන දිශාවකට රැගෙන යන අතරතුර තමයි COPE එක පාර්ලිමේන්තුවේ ඉතාම සීමිත වාර්තා කිරීමේ බලතලයක් සහිතව ස්ථාපිත කර තිබෙන්නේ කියන එක.

COPE කියන කමිටුව ඇත්තටම ජනතාවගේ අවධානයට යොමු වුණේ මීට අවුරුදු දහයකට විතර පෙරයි. ඒ, COPE එක විසින් සිදු කරන ලද විමර්ශන හේතුවෙනුයි. මම වැරදියි කියලා හිතෙනවා නම් ඕනෑ කෙනෙකුට නිවැරදි කරන්න පුළුවන්. ඊට පෙර COPE එකේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් එතරම් දැනුවත්කමක් හෝ අවබෝධයක් පොදු ජනතාව තුළ තිබුණේ නැහැ. ඒකට එක කාරණයක් වෙන්න පුළුවන්, COPE එකේ රැස්වීම් record කරලා ජනතාවට පෙන්වන්න පටන් ගැනීම. නමුත්, ඒ කාලය තුළ COPE එකේ ක්‍රියාකාරිත්වය ගැන ජනතා පැහැදීමක් තිබුණා. අපි තේරුම් ගන්න ඕනෑ දේ තමයි මේ COPE එක කියන එක රාජ්‍ය ව්‍යාපාර ආරක්ෂා කර ගැනීම සඳහා, එහෙම නැත්නම් රාජ්‍ය ව්‍යාපාර කියන එක තිරසාර ලෙස පවත්වා ගැනීම සඳහා අවශ්‍ය උපකරණයක් බවට පත් වන්නේ නිශ්චිත දේශපාලන අදහසක් සහිතව රාජ්‍ය ව්‍යාපාරවලට මැදිහත් වෙනවා නම් විතරයි කියන එක.

ඇත්තටම අපිට පෙනෙන දේ තමයි ඉතිහාසයේ දීර්ඝ කාලයක් තුළ COPE එක පාවිච්චි වෙන්නේ නැහැ, රාජ්‍ය ව්‍යාපාරවල කාර්යක්ෂමතාව තහවුරු කර ගන්නත්, රාජ්‍ය ව්‍යාපාරවල ලාභදායිත්වය තහවුරු කර ගන්නත්. ඒකේ ප්‍රතිඵලයක් හැටියට ඉතා දීර්ඝ කාලයක් තිස්සේ රජයට අයත් ව්‍යාපාර පාඩු ලැබීම සම්බන්ධයෙන් තමයි අපි අද කථා කරන්නේ. කථාවක් තිබෙනවා, SriLankan Airlines සිට කජු සංස්ථාව දක්වා රජයේ ව්‍යාපාර පාඩු ලැබීම සම්බන්ධයෙන්. ඇත්තටම රජයේ ව්‍යාපාර පාඩු ලබන එක, එහෙම නැත්නම් පාඩු ලැබෙන්න සැලැස්වීම කියන එක, එහෙම නැත්නම් ඒ ව්‍යාපාර වැසෙන්න සැලැස්වීම කියන එක රජයේ ප්‍රතිපත්තියක්ව පැවැති ආණ්ඩු නිසා තමයි මේ රජයේ ව්‍යාපාර මේ ආකාරයෙන් පාඩු ලැබීමේ දිශාවකට ගමන් කරන්නේ. අපේ රජය ඒ ප්‍රතිපත්තියෙන් තීරණාත්මක ලෙස වෙනස් වෙන රජයක්. රජයේ ව්‍යාපාරවලට, එහෙම නැත්නම් State-owned enterprisesවලට - SOEsවලට - තීරණාත්මක කාර්යභාරයක් ඉෂ්ට කිරීමට තිබෙනවා කියලා අපි හිතනවා, ආර්ථිකය තුළ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන ආකාරයට ආර්ථිකය හැසිරවීමට. එහිදී විදුලිබල මණ්ඩලය, තෙල් සංස්ථාව, ගමනාගමන මණ්ඩලය වාගේම අනෙකුත් සියලු සේවා සපයන ආයතන පමණක් නොවෙයි, නිෂ්පාදන කාර්යයේ යෙදිලා සිටින රජයේ ව්‍යාපාරවලට පවා තීරණාත්මක කාර්යභාරයක් තිබෙනවා. මෙන්න මේ කාර්යභාරය ආරක්ෂා කිරීමේ අරමුණින් තමයි අපි රජයක් හැටියටත්, COPE එකේ සාමාජිකයින් හැටියටත් COPE එකේ කටයුතුවලට මැදිහත් වෙන්නේ. එහිදී මේ ආයතනවල කාර්යක්ෂමතාව ආරක්ෂා කිරීම ඉතා වැදගත්. ඒ සඳහා ඒවා හොඳින් ළඟින් නිරීක්ෂණය කිරීම, ඒවායේ දුර්වලතා තිබෙනවා නම් ඒවා පැහැදිලි කර දීම ඉතා වැදගත්.

මෙහිදී අපිට examine කරන්න ආයතන 457ක් තිබෙනවා. මම හිතන විදියට මේ කෙටි කාලය තුළ අපි ආයතන 14ක් examine කරලා තිබෙනවා. ඒ කාලය තුළ COPE එකේ කරන විමර්ශන ගැන ජනතා ප්‍රසාදයක් ඇතිවෙලා එය ජනතාව අතර කථා බහට ලක් වෙන දෙයක් බවට පත් වෙලා තිබෙනවා. මෙහිදී පැහැදිලි වෙන දේ තමයි මේ රාජ්‍ය ව්‍යාපාර අලාභදායී ව්‍යාපාර බවට පත් වෙලා තිබෙන්නේ, නිසැකයෙන්ම රාජ්‍යයට ව්‍යාපාර කිරීමට ඇති නොහැකියාව නිසාවත්, එහෙම නැත්නම් මේ ව්‍යාපාර හැසිරවීමට අපිට තිබුණු නොහැකියාව නිසාවත් නොවෙයි කියන එක. මේ ව්‍යාපාර නිශ්චිතවම දේශපාලන අරමුණු වෙනුවෙන් මෙහෙයවීම නිසා තමයි මේ ව්‍යාපාර මේ ආකාරයෙන් අලාභදායීත්වයට පත් වෙලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ කාරක සභාවක් හැටියට COPE එකට බලතල ලබා දීම වැදගත් වෙන්නේ මෙන්න මේ කාරණය නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා, කන්ටේනර් සම්බන්ධ ප්‍රශ්නයත්. ඇත්තටම අපි හැම තිස්සේම කියපු දෙයක් තමයි, මේ රටට system change එකක් අවශ්‍යයි කියන එක. ඒ කියන්නේ මේ වැඩ සිද්ධ වන ආකාරය වෙනස් කිරීමට අවශ්‍යයි කියන එක තමයි අපි දිගටම

කිව්වේ. එහෙම කියනකොට අපි මතුකරගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මට පෙර කථා කරපු කවින්ද හේෂාන් මන්ත්‍රීතුමා කිව්වා, මේ කන්ටේනර් 323 පිළිබඳ සිද්ධිය තමයි ලංකාවේ සිදුවෙච්ච බිහිසුණුම දූෂණ ක්‍රියාව කියලා.

ඇත්තටම අපි අද උදේ COPE එකේ කථා කරපු කාරණා අරගෙන බැලුවොත්, අද දවස තුළත් ඊට වඩා බිහිසුණු, දූෂණ ක්‍රියා ගැන සාකච්ඡා වුණා. ඇත්තටම මේ කන්ටේනර් 320 හෝ 323 ගැන කථාවේදී අපට පේනවා, කාලයක් තිස්සේ මෙවැනි දුර්වල රාජ්‍ය ව්‍යාපාර පවත්වා ගැනීම, දුර්වල නියාමන පරිසරයක් පවත්වා ගැනීම රාජ්‍ය ප්‍රතිපත්තියක් බවට පත් වෙලා තිබුණු බව. ශ්‍රී ලංකා රේගුව කියන ආයතනය අද මෙච්චර විවේචනයට ලක් වෙනවා. රේගුව තුළින් කන්ටේනර් 323ක් ආවා, එහෙම නැත්නම් අයිස් කන්ටේනර් ඇවිල්ලා තිබෙනවා කියලා දැන් මේ හැමෝම කාටද විවේචන එල්ල කරන්නේ? මේ නිලධාරින්ව තමයි අල්ලා ගන්න හදන්නේ. බොහොම පැහැදිලිව මේ ආයතන දේශපාලන නායකත්වයක් යටතේ කඩා දමලා, දුර්වල නියාමන පරිසර ඇති කරලා, රේගුවට ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය පහසුකම් සකස් කරන්නේ නැතිව, මේවා තුළ ආයෝජන කරන්නේ නැතිව වරායේ තදබදයක් ඇති වෙනකම්, ඒ තත්ත්වයට එනකම් ආණ්ඩු කළේ අපි නොවෙයි නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය ඇති වෙන්නේ 2024 වසරේ දෙසැම්බර් මාසයේදී. 2024 වසරේ නොවැම්බර් මාසයේදී තමයි මහ මැතිවරණය පවත්වන්නේ. දෙසැම්බර් මාසය වෙනකොට ඇමතිවරයා පත් වෙලා මාසයයි. ඇමතිවරයා පත් වෙලා මාසයක් ඇතුළත තමයි මේ ප්‍රශ්නය ඇති වෙන්නේ. එහෙම තත්ත්වයකදී පවා ජනතාව වෙනුවෙන් වගකීමක් අරගෙන, නිලධාරින් වෙනුවෙන් වගකීමක් අරගෙන තමයි රජය ඒ වෙලාවේ කටයුතු කරලා තිබෙන්නේ. නමුත් මේ ප්‍රශ්න මේ තරම් නරක් වෙනකම් පාලන බලයේ හිටියේ කවුද? ජනාධිපතිතුමාගේ කථාවේදී බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා, මීට පෙර 12 වතාවක් මේ ආකාරයෙන්ම කමිටු යටතේ කන්ටේනර් නිදහස් කරලා තිබෙනවා කියලා. එතකොට ඒ කිසිම අවස්ථාවක අඩු ගණනේ ඒ ගැන කථා කළේවත් නැහැ. මෙහෙම ප්‍රශ්නයක් මතු වෙනවා, ඒ හින්දා ඒකට යම්කිසි තිරසාර විසඳුමක් ලබා දෙන්න ඕනෑය කියන අදහසක්වත් මේ පාර්ලිමේන්තුව තුළ කථා වෙලා නැහැ. වරාය ගැන, රේගුව ගැන මෙච්චර බරපතළ ලෙස අද කථා වෙන්නේ, කන්ටේනර්වලින් අයිස් කියන මත් ද්‍රව්‍යය මතු වෙච්ච හින්දා. මේ උත්සාහ කරන්නේ deflection එකක් ඇති කරන්න. සැබෑ දේශපාලන කතිකාව ඇති වෙන්න නොදී මොවුන් කාලයක් තිස්සේ උත්සාහ කරනවා, කන්ටේනර්, කන්ටේනර්, කන්ටේනර් කියලා ප්‍රශ්නයක් මතු කරන්න. ජනතාව ශත පහකට ගණන් ගන්නේ නැහැ, මේ කථාව. එහෙම තිබියදී හැම පාර්ලිමේන්තු සතියකම වාගේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් නැඟිට නැඟිට කන්ටේනර්, කන්ටේනර් කියලා මේ ප්‍රශ්නය මතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තත්පර 30ක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම හිතන විදියට, මේ ප්‍රශ්නය හැම සතියේම මතු කරන්නේ ජනතාවගේ අවධානය distract කරන්න. ඒගොල්ලන් හිතනවා, කන්ටේනර් ගැන කිව්වාම අපි අපහසුතාවට පත් වෙයි කියලා. අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. කන්ටේනර් තදබදයක් ඇති වුණා නම් එය ඇති වුණේ පෙර පැවති රජයන් විසින් ගෙන යන ලද අසාර්ථක ආර්ථික වැඩ පිළිවෙළ සහ ඇති කරන ලද දුර්වල නියාමන පරිසරය නිසායි. ඒ ප්‍රශ්නය අපි ක්‍රම ක්‍රමයෙන් හරිගස්සනවා. ඒ වාගේම මම මතක් කරන්න කැමතියි, මේ ප්‍රශ්නය පිළිබඳව විමර්ශනයක් සිදු කරන්න නියම කළේ මුදල් විෂය භාර ඇමතිවරයා ලෙස ජනාධිපතිතුමා බව. ඒ විමර්ශන වාර්තාවට අනුව අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්නේත් අපේ රජය විසින්. මේ සම්බන්ධයෙන් වෙනත් කරුණු තිබෙනවාද කියලා වාර්තා කිරීමට CID එකටත් යොමු කරලා තිබෙන්නේ. එහෙම තිබියදී මේ අයිස් කතන්දරයක් යට ගහන්න, අයිස් කන්ටේනර් ආපු හින්දා මේ දූෂණය වෙලා තිබෙනවා කිය කියා කථා කරනවා. මම හිතන විදියට මේ උත්සාහ කරන්නේ deflection එකක් ඇති කරන්න. මොවුන් උත්සාහ කරන්නේ අවධානය වෙනතකට යොමු කරන්න, distraction එකකට. කොහොම වුණත්, ඒ උත්සාහය ජනතාව ගණන් ගන්නේ නැහැ. අපිත් ඒක ගණන් ගන්නේ නැහැ කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.36]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම පොදු ව්‍යාපාර ගැන නොවෙයි අද කථා කරන්න තිබෙන්නේ, මඩ ව්‍යාපාර ගැන. විශේෂයෙන් විපක්ෂයේ මඩ ව්‍යාපාර ගැන. අද උදේ පාන්දරම ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා මේ සභාවට ඇවිල්ලා දඟර ගහලා, පෙණය පුප්පලා "ප" යන්න පෙන්වලා තඩි නයෙක් ඇරියා. එතුමා මොකක්ද කිව්වේ? ඒ මන්ත්‍රීතුමා කිව්වා, මැතිවරණ කාලයේදී කිව්ව කථාව වාගේම කථාවක්. ජනාධිපතිවරණය දිනපු ගමන් යන්නේ කියුබාවේ කිව්වා. ඒ ජාතියේම බොරුවක් නැවත කිව්වා. මොකක්ද කිව්වේ? අපි බයයි කිව්වා, private modelsවලට. අපි දිග model, කොට model, පොඩි model කියන ඔය මොන model එකකටවත් බය නැහැ. හැබැයි, අපි හොර modelවලට බයයි. මේ පාර්ලිමේන්තුව හොඳ model එකක්, හැබැයි පාවිච්චි කළේ හොරකමට. ජනාධිපතිකම හොඳ model එකක්, පාවිච්චි කළේ හොරකමට. ඇමතිකම, මන්ත්‍රීකම හොඳ models, පාවිච්චි කළේ හොරකමට. ඒ නිසා අපි හොර modelවලට බයයි. එතුමා කියන්න හැදුවේ මොකක්ද?

CEB එකේ සභාපති, කාලයකදී LTL එකේත් සභාපති වශයෙන් කටයුතු කළා. ඒක අමතක කරලා ඒ මන්ත්‍රීතුමා එක වෙලාවක කිව්වා, දැන් LTL එක ලාභ ලබනවා, හැබැයි විදුලිබල මණ්ඩලය - CEB - පාඩු ලබනවා, මොකද එහෙම වෙන්නේ, ඒවාට අපි බයයි. ඒවාට අපි ගතු කියනවා කියලා. මොකක්ද මේ කියන්න හදන්නේ? ජනතාවට කියන්න උත්සාහ කරනවා, අපි පෞද්ගලික ව්‍යාපාර කරගෙන යන්න දෙන්නේ නැහැ, අපි ඒවාට විරුද්ධයි වාගේ එකක්. ඇත්තටම මොකක්ද මේ වෙලා තිබෙන්නේ? LTL එකේ සියයට 63ක අයිතිය තිබෙන්නේ විදුලිබල මණ්ඩලයට. සියයට 27ක් තිබුණා, ABB සමාගමට. ඒක විකුණලා යනකොට LTL එකේම දේපළ උගසට තියලා ණයක් අරගෙන අලුත් සමාගමක් හැදුවා. ඒක වෙනමම පෞද්ගලිකව

[ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා]

පාවිච්චි කරන්න පටන් ගත්තා. ඒකේ සේවකයන්ට සියයට 10ක කොටස් ප්‍රමාණයක් තිබුණා. ඒකේ ප්‍රතිලාභ ගෙව්වාද, නැද්ද කියන කාරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. හොඳ models හොර models විධියට පාවිච්චි කළා, ඒකේ ඉන්න කණ්ඩායමක් එකතු වෙලා. ඒ නිසා සේවකයන් උසාවි ගිහින් නඩු දැම්මා. තමන්ගේ අයිතිය ඉල්ලුවා, වන්දි ඉල්ලුවා. ඒ නඩු තිබියදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අවස්ථාව දුන්නා, රජයේ කොටස් තිබෙනවා නම් විගණනය කරන්න. හැබැයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වගන්තියක් පෙන්වලා, ඒක යට ගහලා විගණනය කරන්න අවස්ථාව නොදී හිටියා. ඊට පසුව උසාවි ගියා. ආපසු වතාවක් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් වරද හැදුවා. වරද හැදුවාට පස්සේ ආපසු උසාවියෙන් මේක ඇද ඇද ඉඳලා නඩුව ඉල්ලා අස්කර ගත්තා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත් කරන්න දෙයක් නැති වුණාට පස්සේ විගණකාධිපතිතුමාට - Auditor Generalට - මේකේ අවසරය දෙන්නම් කියලා Board decision එකක් ගත්තා. ඊට පස්සේ ඒකේම දූහිතෘ සමාගම ගිහිල්ලා Commercial High Court එකේ නඩුවක් දමලා, ඒ විශේෂ මහ සභාව වැළැක්වූවා. තවම ඒ නඩුව යනවා. දැන් මොකක්ද මේ තුළින් පෙනෙන්නේ? හොඳ models, හොර models විධියට පාවිච්චි කරන විධිය. මහජනයාගේ මුදල් පෞද්ගලික සමාගමක් ඇතුළේ තිබෙනවා. ඒක විගණනය කරන්න ඕනෑය කියනකොට විගණනය කරන්න දෙන්න බැහැ කියලා අධිකරණයට ගිහිල්ලා, විවිධ මහජන මත හදලා, විවිධ අයට බලපෑම් කරලා, ඒක වළක්වන්න හදනවා.

ඊළඟට, COPE එකට අධ්‍යක්ෂකවරයෙක් ආවා. එතුමා කිව්වා, "ඕනෑම දෙයක් කරලා දෙන්නම්. රජයට සියයට 51ක් යන එක වළක්වලා දෙන්න" කියා මේ සමාගම කිව්වාය කියලා. නම් කිහිපයකුත් කිව්වා. ඒ නිසා අපි modelsවලට භය නැහැ. හැබැයි, අපි හොර modelsවලට භයයි. මොකද, අපි සුදු හුනු ගාන්න යන්නේ නැහැ. ඒ, අපි විදුලිබල මණ්ඩලයේ හරි, LTL එකේ හරි කොන්ත්‍රාත් කරලා නැති නිසා. සමහරු කොන්ත්‍රාත් කරපු අය. ඒ නිසා ඒගොල්ලන් සුදු හුනු ගානවා. නමුත්, අපි ඒවායේ සුදු හුනු ගාන්න යන්නේ නැහැ.

දැන් කියනවා, රාජ්‍ය සේවකයා භය වෙලා, රාජ්‍ය සේවකයාට දරා ගන්න බැහැ, දැන් ඔවුන් වැඩ කරන්නේ නැහැ කියලා. කවුද එහෙම කියන්නේ? අපේ මේ ජයමහ මන්ත්‍රීතුමා. හොරු භය වෙන එක හොඳයි. හොරු භය වෙන්න ඕනෑ; නීතිය ඉස්සරහ භය වෙන්න ඕනෑ; නීතියට නැවෙන්න ඕනෑ; දණ ගහන්න ඕනෑ; නීතියට අනුව වැඩ කරන්න ඕනෑ. ඒ නිසා හොරු භය වෙන එක හොඳයි. හැබැයි, ඇත්තට වැඩ කරන සේවකයින් භය වෙන්නේ නැහැ. අපි මේ විමර්ශන කරනකොට ද භයවෙලා ඉන්නේ? නැහැ. ඇත්තටම භයවෙලා හිටියේ කොහේද? LRC එකේ නීති නිලධාරියා COPE එකට ඇවිල්ලා මොකක්ද කිව්වේ? එස්.එම්. චන්ද්‍රසේන රුපියල් මිලියන 350 ගන්න, තවත් නිලධාරියෙක් එක්ක අමාත්‍යාංශයට එන්න කියලා, පුටුවට පයින් ගහලා, කුණුහරුප කියලා බැන්නේ කියා කිව්වා. භයවෙලා හිටියේ, ඒ වෙලාවේ. තරුණ සේවා සභාවේ නිලධාරිනියට මැතිවරණයට කලින් දවසේ රුපියල් මිලියන 100ක චෙක් අත්සන් කරන්න කියද්දී එතුමිය භයවෙලා ඇඬුවා. එතුමිය භයවෙලා හිටියේ ඒ වෙලාවේ. අපි රාජ්‍ය සේවකයාගේ කොන්ද කඩලා නැහැ. මේ ආණ්ඩුව ඒ අයගේ කොන්ද කෙළින් කරලා තිබෙන්නේ. ඔවුන්ගේ කොන්ද කෙළින් කරලා, තද කරලා, හරිගස්සලා, හිටවලා තිබෙන්නේ මේ දූෂණයට, වංචාවට එරෙහිව. ඒ නිසා රාජ්‍ය සේවකයා දැන් භය නැහැ. රාජ්‍ය සේවකයා ඉස්සරහට ඇවිල්ලා මේ වැඩ කටයුත්ත නිසි පරිදි ඉටු කරනවා.

දැන් තව චෝදනාවක් කළා, LRC සභාපතිතුමා සම්බන්ධයෙන්. නියෝගයක් තිබෙනවා, ඉඩම් ටික පවරා ගන්නේ නැහැ කිව්වා. පිල්ලෙයාන්ගේද, කාගේද ගෝලයෙකුගේ ඉඩම් තිබෙනවාය කිව්වා. නැහැ. ඒ, අනෙක් එක. අයථා විධියට පාවිච්චි කරන ඉඩම් සම්බන්ධයෙන් වර්තමාන සභාපතිවරයා සහ LRC එක විමර්ශනයක් කරලා, ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න යනකොට අනෙක් පාර්ශ්වය නඩුවක් දමලා තිබෙනවා. දැන් LRC එක ඒකට කරුණු කියනවා; උසාවි යනවා; නඩුවලට පෙනී සිටිනවා. ඒ නිසා මේක නියෝගයක් දීලා තිබෙන එකක්. ඉඩම් පවරා ගත්තේ නැහැ.

ඊළඟ එක තමයි, බොරු කියන එක. මුවලින්දලා ඉන්නේ ඔක්කෝම; කෙළින්ම "ප" යන්න එළියේ දාගෙන මුවලින්දලා මේකේ ඉන්නේ. හැබැයි, මෙහෙම දෙයක් තිබෙනවා. බොරුවක් කියනකොට ඔය විධියටවත් බොරුව කියන්න ඕනෑ. මොකද, පසුව sorry කියන්න ඕනෑ නැහැ, මෙතැනම බොරුව අහු වෙනවා. ඒ නිසා ඒ විධියට බොරු කියන එක හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මිත්‍ර ඩී.වී. චානක මන්ත්‍රීතුමා කිව්වා, මේ ඒ කාලයේ theme එක කියලා. ඒ මොකක්ද? මුලින්ම foundation එක දමන්න. මුල්ගල තියන්න කලින්, foundation එක දමන්න කලින්, බිත්ති බඳින්න කලින් වහල ගහන එක, වහල ගෙනෙන එක. ඒක, theme එක. ඒක, ඒ කාලයේ lotus theme එක ලු. ඔව්, ඒක lotus theme එක තමයි. නිදහස් පක්ෂය දෙකට, තුනට කඩලා අලුතින් කරන්න යන කුමන්ත්‍රණ ව්‍යාපාරයේ theme එක තමයි ඒක. ඉතින්, ඒ theme එකට team එක බැහැලා, airport එක හාලා, අද airport එක නැහැ. ඒක අද හදා ගන්න බැහැ. ඒ ගාණට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මුල්ගල විතරයි අද ඉතුරු වෙලා තිබෙන්නේ.

දැන් කන්ටේනර් ගැන පුදුම අමාරුවක් තිබෙනවා. ඇයි, ඒ? වෙන මුකුත් නිසා නොවෙයි. කන්ටේනර් අමාරුව හැදිලා තිබෙන්නේ, අපේ මන්ත්‍රීතුමන්ලාට.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මොකක්ද, මේ කුඩු කාපු අමාරුව?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මන්ත්‍රීතුමන්ලා කුඩු කාලා ඉන්නේ කියලා කියන්න බැහැ, පාර්ලිමේන්තුව ඇතුළේ. වහාම ඒක ඉවත් කර ගන්න කියන්න. එහෙම කියන්න බැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්නම්.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කුඩු කෑ කථාව" කියන්නේ සාහිත්‍ය කථාවක්. *[බාධා කිරීමක්]* என்ன? கொஞ்சம் உட்காருங்க! "කුඩු කෑ කථාව" කියන්නේ සාහිත්‍ය කථාවක්. ඒක තේරෙන්නේ නැති මෙතුමා වෙන කථාවක් කියනවා. මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි දැන් ඉන්නේ. දැන් කුඩු කුමාරයා කුලප්පු වෙලා ඉන්නේ. ඇයි, කුඩු කුමාරයා කුලප්පු වෙලා ඉන්නේ? ඒගොල්ලන්ගේ කට්ටිය කුඩු, අයිස් කන්ටේනර් පිටින් ගෙනැල්ලා. ගෝලයොත් ගෙනැල්ලා. ඒවා අහු වෙනකොට දැන් ලොකු අමාරුවක් තිබෙනවා, හයක් තිබෙනවා. ඒක වහගන්න කන්ටේනර් 300, 300, 300 කිය-කියා ඇවිදිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව COPE එක තුළින් අද ජනතාවට දුන් පොරොන්දුව ඉෂ්ට කරමින් ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක තමයි accountability එක. ඉස්සෙල්ලා තිබුණේ අලි බබා සහ හොරු හතළිහේ ආණ්ඩු. ඒවාට වගවීමක් - accountability එකක් - තිබුණේ නැහැ. ඒගොල්ලන්ට මහජන මුදල් ගැන වගකීමක් තිබුණේ නැහැ. ඒගොල්ලන්ට මේ ගැන කිසි වුවමනාවක් තිබුණේ නැහැ. හැබැයි, මේ ආණ්ඩුවට වගවීම පිළිබඳව ලොකු වුවමනාවක් තිබෙනවා. ඒ නිසා ජනතා මුදල් ආරක්ෂා කරනවා. ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. ජනතාවගේ මුදල් ආරක්ෂා කරන්න, ජනතාවගේ දේපළ ආරක්ෂා කරන්න බැඳිලා ඉන්නවා. කිසිදු වෙනසක් නැතුව ඒ වෙනුවෙන් වැඩ කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. COPE එක විධියට අපි මහජන ආණ්ඩුවේ වගකීම බොහොම පැහැදිලිව ඉෂ්ට කරනවා. මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය වඩා ශක්තිමත් කරන්න, හොර නඩය අල්ලාගෙන, ජනතාවගේ මංකොල්ල කාපු දේපළ ටික නැවත ඔවුන්ට උරුම කරදෙන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරනවා. ඒ වෙනුවෙන් අපි පෙනී සිටිනවා. පාර්ලිමේන්තුව විධියට අපි කවුරුත් එකතුවෙලා ඒ ක්‍රියාවලිය ශක්තිමත් කරමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.46]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று பாராளுமன்றத்தில் ஆளும் தரப்பு உறுப்பினர்கள், எதிர்க்கட்சியினுடைய செயற்பாடுகள் சம்பந்தமாகப் பேசுகின்றபொழுது, எவ்வாறு, எதைப் பேசுவதென்று தெரியாமல் பேசுவதை jokeஆக அல்லது வேடிக்கைமிக்க விடயமாகவே நான் பார்க்கின்றேன். ஏனென்றால், இப்பொழுது அரசாங்கத்தில் இருக்கின்ற சில அமைச்சர்கள் அன்று எதிர்க்கட்சியில் இருந்தபொழுது எவ்வாறு செயற்பட்டார்கள் என்பதை நாங்கள் நன்கு அறிவோம். அவ்வாறு இருக்கையில், இன்று ஆட்சிக்கு வந்ததற்குப் பிறகு, எதிர்க்கட்சியினர் எதற்காகவேனும் ஆர்ப்பாட்டம் செய்தால் அது இவர்களுக்குப் பெரிய பிரச்சினையாக இருக்கின்றது. எதிர்க்கட்சியினர் சொல்கின்ற விடயங்களைக் கேட்க முடியாமல், பாம்புக்கு மண்ணெண்ணெய் ஊற்றியதுபோல் இன்று ஆளும் தரப்பில் இருக்கின்றவர்கள் துடித்துக்கொண்டு இருக்கின்றார்கள். இன்று ஆர்ப்பாட்டத்தை விமர்சிக்கின்றவர்கள் சென்ற காலங்களில் 'ஆர்ப்பாட்டமே அரசியல்' என்று நம்பிக்கையோடு செயற்பட்டவர்கள் என்பதை மறந்திருக்கின்ற நிலைமையை என்னவென்று எடுத்துக்கொள்வதென எங்களுக்குத் தெரியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கு பேசுவதற்குப் பல விடயங்கள் இருந்தாலும், நேரத்தைக் கருத்திற்கொண்டு, என்னுடைய திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற ஒரு பிரதான பிரச்சினை பற்றி பேசலாமென நினைக்கின்றேன். அங்குள்ள மொரவெவ பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள ரொட்டவெவ மற்றும் மிரிஸ்வெவ பிரதேசங்களில் பொதுமக்கள் குடியிருக்கின்ற காணிகளுக்குள் யானை வேலி அமைக்கப்படுகின்ற ஒரு நிலைப்பாடு இன்று காணப்படுகின்றது. யானை வேலி என்பது உண்மையிலே தேவையான ஒன்று. அந்தப் பிரதேச மக்கள் பலரும் அதை எதிர்பார்த்தவர்களாக இருந்தார்கள். யானை வேலி அமைக்கப்படுகின்ற செயற்பாடுகளை நாங்கள் சென்று பார்வையிட்டு இருந்தோம். அது இனவாதம் கலந்த ஒரு செயற்பாடா? என நாங்கள் இந்த இடத்தில் கேட்கவேண்டி இருக்கின்றது. ஏனென்றால், யானை வேலி அமைப்பதற்கென சில சூழல்கள் காணப்படுகின்றன. அந்தப் பிரதேசத்திலுள்ள வீதிகள் மற்றும் கால்வாய்களை அண்டிய பகுதிகளில் அந்த யானை வேலியை அமைத்திருக்கலாம். ஆனால், யானை வேலியை அமைப்பதன்மூலம் அங்கு குடியிருக்கின்ற முஸ்லிம் மக்களுடைய காணிகளுக்கும் வயல் காணிகளுக்கும் இடையிலே செயற்பாடுகளை முடக்குவதைப் போன்ற விடயங்கள் அந்தப் பிரதேசத்தில் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன.

திருகோணமலை மாவட்டத்தில் நடைபெறுகின்ற அண்மைய செயற்பாடுகளைப் பார்க்கும்போது, முஸ்லிம் சமூகத்தின்மீது வித்தியாசமான கண்ணோட்டத்துடன் அங்கு செயற்பாடுகள் நடைபெறுகின்றனவா? என்ற கேள்வி எங்கள் மத்தியிலே எழுகின்றது. மொரவெவ பிரதேசத்தில் தற்பொழுதும் முஸ்லிம் மக்கள் சிலர் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். அந்தப் பிரதேசத்தில் யானை வேலிகளை அமைப்பதன் மூலம், அவர்களுடைய தொழில்வாய்ப்புகள் மற்றும் குடியிருப்புச் செயற்பாடுகளை முடக்குகின்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன. இன்று

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

எங்களுடைய பிரதேசத்திலே மீனவர்களுக்குப் பிரச்சினைகள் காணப்படுகின்றன. அனுமதிக்கப்பட்ட வலைகளைப் பயன்படுத்துகின்ற மீனவர்கள்கூட அங்கு நிம்மதியாக, சுதந்திரமாக தங்களுடைய தொழிலை மேற்கொள்ள முடியாத நிலைப்பாடு காணப்படுகின்றது. அதேபோன்று, முத்துநகர் போன்ற முஸ்லிம் பிரதேசங்களில் காணிப் பிரச்சினைகள் காணப்படுகின்றன.

சென்றமுறை திருகோணமலை மாவட்ட DCC கூட்டம் வெள்ளிக்கிழமையில் நடைபெற்றது. திருகோணமலை மாவட்டத்தில் கூடுதலான முஸ்லிம் அதிகாரிகள் பணிபுரிகின்றார்கள். முஸ்லிம் மக்கள் அதிகளவாக வாழுகின்ற ஒரு பிரதேசத்திலே DCC கூட்டம்கூட வெள்ளிக்கிழமை நடைபெறுகின்ற ஒரு நிலைமை இன்று ஏற்பட்டுள்ளது. "நாங்கள் இனவாதத்தை ஒழித்துவிட்டோம்; மதவாதத்தை ஒழித்துவிட்டோம்; மக்களால் தெரிவு செய்யப்பட்ட 159 பேர் இங்கு வந்திருக்கிறார்கள்" என்று சொல்கின்ற நீங்கள், ஏன் இவ்வாறான ஒரு செயற்பாட்டைச் செய்து இனவாதத்தை வெளிப்படுத்துகின்றீர்கள்? இதற்குப் பொறுப்புக் கூறவேண்டியது அரசாங்கமா? அல்லது அரச அதிகாரிகளா? என்று நாங்கள் கேட்கின்றோம். நாங்கள் இந்தச் சபையில் எந்த விடயத்தைப் பேசினாலும், பழைய வரலாற்றைத் தொட்டு, சென்ற காலங்களில் நடைபெற்ற விடயங்களைப் பேசுகின்ற அரசியலைத்தான் இந்த ஒரு வருடமாக நீங்கள் செய்துகொண்டு இருக்கின்றீர்கள். இந்த ஒரு வருட காலத்தில் நீங்கள் என்ன அபிவிருத்திகளைச் செய்திருக்கிறீர்கள்? என்பதை நாங்கள் கேட்கின்றோம்.

இன்று highwayஇல் செல்லும்போது cardஐப் பாவித்து உரிய கட்டனத்தைச் செலுத்துவது அபிவிருத்தியா? 100-200 மீற்றர் தூரத்துக்கு carpet வீதிகளை அமைப்பது அபிவிருத்தியா? மிகக் கவலையோடு இந்த இடத்தில் சொல்கின்றேன். எந்தவோர் அபிவிருத்திச் செயற்பாடு நடந்தாலும் அதில் கலந்துகொள்ள மாட்டோமென்று நீங்கள் அரசாங்கத்தை அமைப்பதற்கு முன்னர் கூறினீர்கள். நீர்க் குழாயைத் திறப்பதென்றாலும், வீதியில் காணப்படுகின்ற ஒரு குழிக்கு சீமெந்து இடுவதாக இருந்தாலும் மாலையுடன் வருகின்றீர்கள். இதை எவ்வாறு நாங்கள் ஏற்றுக்கொள்வது? நீங்கள் சொன்ன என்ன விடயத்தைச் செய்துள்ளீர்கள் என்பதைக் கேட்கின்றோம். 2015ஆம் ஆண்டு நல்லாட்சி அரசாங்கம் 100 நாள் வேலைத்திட்டத்தை முன்னெடுத்த சந்தர்ப்பத்திலே, 100 நாட்களுக்குள் என்ன செய்து கிழித்தீர்கள் என்று நீங்கள் கேட்டீர்கள். இன்று நீங்கள் ஒரு வருட காலத்தை நிறைவு செய்துள்ளீர்கள். இந்த ஒரு வருடத்திலே நீங்கள் என்ன செய்துள்ளீர்கள் என்பதை நாங்கள் கேட்கின்றோம்.

இந்தச் சபைக்கு ஒரு விடயத்தை விவாதத்துக்குக் கொண்டுவந்தால், அதில் கலந்துகொள்பவர்கள் பேசுகின்ற விடயங்களை நீங்கள் பட்டியலிட்டுப் பாருங்கள்! ஒருவர் சொல்கின்ற அதே விடயத்தைத்தான் ஏனையவர்களும் சொல்கிறார்கள். இன்று 'ஐஸ்' போதைப்பொருள் பற்றி நீங்கள் பேசுகின்றீர்கள். அதில் சம்பந்தப்பட்டவர்கள்மீது நடவடிக்கையை எடுங்கள்! இந்தச் சபையில் உள்ளவர்கள் யாராவது அதனுடன் சம்பந்தப்பட்டிருந்தால், அவர்கள் யாரென்பதை மக்கள் மத்தியில் தெரியப்படுத்துங்கள்! இதைத்தான் நாங்கள் கேட்கின்றோம். இதைவிட்டுவிட்டு, எல்லோரும் கள்வர்கள் என்றும் போதைப்பொருளுடன் சம்பந்தப்பட்டவர்கள் என்றும் குறிப்பிடுவதை தயவுசெய்து நிறுத்திக்கொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே அரசாங்கத்தைக் குற்றஞ்சாட்டுவதோ அல்லது விமர்சிப்பதோ எங்களுடைய நோக்கமல்ல. எந்த அரசாங்கமாக இருந்தாலும், அவர்கள் சொன்ன விடயங்களை முன்னெடுத்துச் செல்ல வேண்டுமென்ற எதிர்பார்ப்பு மக்கள் மத்தியிலே காணப்படுகின்றது. அதைச் சரியாகச் செய்யுங்கள் என்றுதான் நாங்கள் கேட்கின்றோம். இன்று திருகோணமலை மாவட்டத்தில் உங்களால் மேற்கொள்ளப்படுகின்ற அபிவிருத்திகளைக் குழப்புவதற்கு நாங்கள் முன்வந்தோமா? நல்ல விடயங்களை நீங்கள் செய்து வருகின்றபோது அதை எதிர்க்கின்ற செயற்பாடுகளை நாங்கள் முன்னெடுத்தோமா? எங்களுடைய மாவட்டத்திலே சிறப்பான முறையிலே நாங்கள் அரசியலைச் செய்து கொண்டிருக்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
අවසන් කරනවා.

நாட்டின் சில மாவட்டங்களைப் பாருங்கள்! DCC கூட்டங்களில்கூட சண்டை இடுகிறார்கள். அங்கே பல கருத்து வேறுபாடுகள் காணப்படுகின்றன; ஒற்றுமையில்லாத நிலைப்பாடு காணப்படுகின்றது. ஆனால், எங்களுடைய மாவட்டங்களிலே உங்களுக்கு ஒத்துழைப்பை வழங்கி வருகின்றோம். நீங்கள் முன்னெடுக்கும் விடயங்களை நாங்கள் கலந்தாலோசிக்கின்றோம். அபிவிருத்திக்கான எல்லாச் செயற்பாடுகளுக்கும் உங்களுக்கு உறுதுணையாக இருந்துள்ளோம். அப்படியிருந்தும், எங்களுடைய சமுதாயத்துக்கு நீங்கள் எதிர்ப்பு காட்டிக்கொண்டு இருக்கின்றீர்கள். ஆகையால், இந்த விடயங்களைக் கவனத்திற் கொண்டு, அனைத்து மக்களும் ஒன்றுபட்டுச் செயற்படுகின்ற செயற்பாடுகளைச் சிறப்பாக முன்னெடுக்க வேண்டுமென இந்தச் சபையில் நான் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ DCC එකේ මුස්ලිම් නිලධාරීන්ට සහ මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වුණා කියලා ප්‍රකාශ කළා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක - *[බාධා කිරීමක්]*

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මම හිතන විධියට, එතුමා අදහස් කළේ පල්ලියට යන වේලාව සම්බන්ධයෙන් වෙන්න ඕනෑ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව රැස්වීම සාමාන්‍යයෙන් කැඳවන්නේ පැය තුනයි. උදේ 9.00ට රැස් කළාම 12.00, 12.30 වෙනකොට, පල්ලි යන වේලාව වෙනකොට -*[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.55]

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, එහෙම නැත්නම් හැමෝම දන්නා ප්‍රසිද්ධ කෝප් කමිටුවේ සිව්වැනි වාර්තාව සම්බන්ධයෙන් සිදු කරන සභාව කල් තබන අවස්ථාවේ විවාදයේදී අද උදේ සිටම විපක්ෂයේ මන්ත්‍රීවරු මාතෘකාවෙන් බැහැරව තම තමන්ට හිතලු ලෝකවල, තම තමන්ගේ මනෝ ලෝකවල තිබුණු කාරණා පිළිබඳව කථා කළා මිස වර්තමාන නව රජය පත් කළ දසවන පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ ක්‍රියාකලාපය, කෝප් කමිටුව සාධනීයව ගෙන තිබෙන අංග මොනවාද, සාධනීය පියවර මොනවාද යන්න පිළිබඳව කථා නොකිරීම ගැන කෝප් කමිටු සමාජිකයෙක් ලෙස මා කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආයතන 450කට වැඩි ප්‍රමාණයක් විමර්ශනය කිරීමේ බලය කෝප් කමිටුව සතුව තිබෙනවා. මේ දක්වා ආයතන රැසක් කෝප් කමිටුව හමුවට කැඳවා ඒ පිළිබඳව සිදු කළ පරීක්ෂණවලදී කෝප් කමිටු සභාපති ගරු වෛද්‍ය නිශාන්ත සමරවීර සහෝදරයා ඇතුළු අපි සියලුදෙනාටම ඒ හැම රාජ්‍ය ආයතනයකම පොදුවේ හඳුනා ගන්න පුළුවන් වුණු දුර්වලතා, ගැටලු කිහිපයක් තිබුණා. එකක් තමයි, ඒ ආයතන බිහි කිරීමට අදාළ පනත එක්කෝ වැරදි ලෙස තේරුම් අරගෙන තිබුණා, එහෙම නැත්නම් වැරදි ලෙස අර්ථකථනය කරලා තිබුණා. තව එකක් තමයි, සංයුක්ත සැලැස්ම, වාර්ෂික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව ඒ අයට නිසි අවබෝධයක් තිබුණේ නැහැ. ඒ වාගේම තමයි කාර්ය මණ්ඩලය සහ කාර්ය සාධනය සම්බන්ධයෙන් තිබුණු ගැටලු.

ඉතිහාසයේ තිබුණු කෝප් කමිටු දිහා බැලුවාම, මීට පෙර සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා කෝප් කමිටුවේ සභාපති ලෙස ඉන්නකොට තමයි කෝප් කමිටුව වැඩිම මහජන අවධානය දිනා ගත්තේ, හොඳම කාර්ය සාධනය පෙන්නුම් කළේ. ඒ වාගේම දැන් මේ නව රජයේ කෝප් කමිටුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව කථා කරනකොට -මීට මොහොතකට පෙර කථා කළ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් ඇහුවා, කථා කරනවා විතරයි කෝ වැඩ කියලා. උත්තර අහ ගන්න එතුමා සභාවේ නැහැ- වර්තමාන කෝප් කමිටුව පළමු වරට විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව පදනම් කරගෙන ආයතන 458ටම දන්වා යවා තිබෙනවා මාස 2ක් ඇතුළත එම විගණන ගැටලු පිළිබඳව ලිඛිතව වාර්තා ලබා දෙන ලෙස. මෙතෙක් කල් සිදු වුණේ කෝප් කමිටුවට අදාළ ආයතනවලින් තෝරා ගත්ත කිහිපයක් කැඳවනවා. එක ආයතනයක් ආවාට පස්සේ නැවත සැහෙන කාලයක් යනකම් එම ආයතනය කැඳවීමක් වෙන්නේ නැහැ. ඒ නිසා ඔවුන් සුවසේ ඉන්නවා වංචාව, දූෂණය, නාස්තිය සිදු කරමින්. නැවතත් මේ රටේ, මේ ලංකාවේ එහෙම වෙන්න බැහැ. මේ කෝප් කමිටුව සියලු ආයතනවලට, 458ටම ලිඛිතව දන්වා අවසානයි ලිඛිත වාර්තා ලබා දෙන ලෙස.

ඒ විතරක් නොවෙයි. මෙතෙක් පැවති කෝප් කමිටුවලින් සිදු කළේ ආයතන රාශියක් පිළිබඳව එක වාර්තාවක් සකස් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. කැමැති නම් තමයි එය නීතිපති වෙත යන්නේ. එහෙම නැත්නම් එය තබනවා පාර්ලිමේන්තු පුස්තකාලයේ. නමුත් දැන් සිදු වෙන ක්‍රමවේදය වෙනස්. වර්තමානයේ විමර්ශනය කරන සෑම එක් එක් ආයතනයක් වෙනුවෙන්ම වෙන වෙනම වාර්තා ඉදිරිපත් කරනවා. ඒ විතරක් නොවෙයි. ඒ වාර්තාව පදනම් කරගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යන්න පුළුවන් වෙන විධියට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වෙනස් කරන්නත් අද යෝජනා භාර දුන්නා, මේ ගරු සභාවට.

ඒ වාගේම කෝප් කමිටුවේ වැඩ කරනකොට අපි දැකලා තිබෙන දෙයක් තමයි සමහර නිලධාරින් එන්නේ කොහොම හරි ඒ පැය තුන හතර ඉඳලා ගෙදර යන්න. ආසන්නයේම කැඳවපු විදුලිබල මණ්ඩලයේ නිලධාරි මහත්මයෙක් කිව්වා, "කොහොම හරි මේ බැණුම් ටික අහලා ගියාම එතැනින් පස්සේ වැඩේ ඉවරයි" කියලා. ඒ නිලධාරි මහත්ම මහත්මීන්ට අපි කියන්න කැමැතියි, මෙතැනින් එහාට එහෙම වෙන්නේ නැති බව. බැණුම් අහලා ගිහිල්ලා විතරක් හරියන්නේ නැහැ. ඔබ වංචාවකට, දූෂණයකට, යම් අනීතික ක්‍රියාවකට සම්බන්ධයි නම්, ඔබ පසුපස නීතිය එන බව විශේෂයෙන් කියන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයතන රාශියක් ගැන කියන්න තිබුණත් මට ලැබී තිබෙන මේ කෙටි වෙලාව තුළ මම අවධානය යොමු කරවන්න කැමැතියි, COPE එක හමුවට කැඳවූ සබරගමුව විශ්වවිද්‍යාලය පිළිබඳව මතු වූ සාකච්ඡාවකට. සබරගමුව විශ්වවිද්‍යාලය කියන්නේ, ලංකාවේ සුන්දර ස්වාභාවික පරිසරයක පිහිටා තිබෙන, අතිරමණීය විශ්වවිද්‍යාලයක්; සරසවියක්. හැබැයි, එදා COPE එකේ රැස්වීමේදී හෙළි වූ විධියට ඒ සුන්දර සරසවියේ ඉතාම අසුන්දර කථාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 වර්ෂයේදී සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා පොත් මිල දී ගැනීමක් සිදු කර තිබෙනවා. ඒ යටතේ වර්ග 33කට අදාළව පොත් 114ක් මිල දී ගෙන තිබෙනවා. ඒ සඳහා රුපියල් හැත්තෑපන්ලක්ෂ අනූහයදහස් හාරසියයක මුදලක් ගෙවීම් කිරීමට අනුමත කර තිබෙනවා. විශ්වවිද්‍යාලයට ආවාට පසුවයි දැනගන්නේ, ලක්ෂ 75ක් වියදම් කරලා ගෙනැවිත් තිබෙන්නේ පාවිච්චි කළ පොත් කියලා. අලුත් පොත් ගන්නා මුදලට - රුපියල් හැත්තෑපන් ලක්ෂයක් වියදම් කරලා - ගෙනෙනවා, පාවිච්චි කළ පොත්.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තවත් පොත් 227ක් මිලට ගෙන තිබෙනවා, රුපියල් ලක්ෂ 121කට. ඒ මුදල ගෙන බැලුවාම, අලුත් පොතක තිබෙන වටිනාකමටත් වඩා වැඩියි. COPE එකේදී හෙළි වෙනවා, සාමාන්‍ය වෙළෙඳ පොළේ රුපියල් 3,500කට, 4,000කට ගන්න පුළුවන් පොත සබරගමුව විශ්වවිද්‍යාලය රුපියල් 150,000කට මිල දී ගෙන තිබෙනවා කියලා. මේවා මේ රටේ ජනතාව දැන ගත යුතුයි. තව ගොඩක් කරුණු තිබෙනවා. ඉතින්, සරසවි දේවිය බලයිද? ලක්ෂ්මී දේවියත් රවට්ටලා, සබරගමුව විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය.

[ගරු රුවන් මාපලගම මහතා]

ඒ විතරක් නොවෙයි. ඒ පොත්වලින් විතරක් කෙටි කාලයක් තුළ සබරගමුව සරසවියට සිදු වෙලා තිබෙන පාඩුව රුපියල් ලක්ෂ 200කට වැඩියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් ද නොවෙයි, තවත් තිබෙනවා. 2022 වර්ෂයේ දහවෙනි මාසයේ සබරගමුව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන් වාර්තා කර තිබෙනවා, විශ්වවිද්‍යාල භූමියේ පස් අඩුයි කියලා. ආරක්ෂක නිලධාරියා දන්නේ නැහැ, campus එකේ භූමියේ පස් අඩුයි කියලා. ආරක්ෂක නිලධාරියාගේ වාර්තාවේ තිබෙනවා, පස් කියුබ් 45ක් විතර අඩුයි කියලා. ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කර තිබෙනවා. විමර්ශනයේදී හෙළි වී තිබෙනවා, සබරගමුව සරසවි භූමියෙන් පස් කියුබ් 500ක් කපලා අයින් කරගෙන තිබෙනවා කියලා. ඒ ගැන ආරක්ෂක අංශය දන්නේ නැහැ, විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා දන්නේත් නැහැ.

ඒ කාගේ වුවමනාවටද? ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික ඉල්ලීමකට. පස් කියුබ් 500 කපන්නේ Sabaragamuwa Campus එකේ භූමියෙන්. මේ වාගේ ඉතාම දූෂිත පාලනාධිකාරි පිළිබඳ තොරතුරු හැමදාම වාගේ අනාවරණය වෙනවා.

පසුගිය දවසක සබරගමුව විශ්වවිද්‍යාලයේම සිසුවෙකු දිවි නසා ගත්තු පුවතක් අපි දැක්කා. රජයක් ලෙස අපි ඒ පිළිබඳව සාතිශය සංවේගය පළ කරනවා. ඒ ගැන කරුණු සොයා බලන්න විශ්‍රාමික විනිසුරු විජිත් මලල්ගොඩ මහත්මයාගේ නායකත්වයෙන් ත්‍රිපුද්ගල කමිටුවක් ද පත් කර තිබෙනවා. ඒ පිළිබඳ විමර්ශනය සිදු වෙමින් පවතිනවා. දැනගන්නට ලැබෙන විධියට ඒ සිසුවාගේ දිවි නසා ගැනීමට හේතුවක් විධියට දක්වා තිබෙන්නේ නවක වධයයි. එම නවක වධය වළක්වා ගන්නට විශ්වවිද්‍යාලයේ ඉහළම පාලනාධිකාරිය කටයුතු නොකිරීම ඒ මරණයට හේතු භූත වෙලා තිබෙන බව පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එකෙන් සිදු වන්නේ, එක එක ආයතන ප්‍රධානීන්, ආයතනවල ඉහළ පුටුවල වැජඹෙමින්, සීතල කාමරවල සිටිමින් මහ ජනතාවගේ මුදල් අමු අමුවේ ගසා කාපු ආකාරය හෙළිදරව් වන එකයි. අපට මතකයි, එක්තරා අවස්ථාවක ජාතික තරුණ සේවා සභාව COPE එකට කැඳවූ වෙලාවේ හෙළි වුණා, පසුගිය ජනාධිපතිවරණය ආසන්නයේ ජාතික තරුණ සේවා සභාවෙන් පැවැත්වූ තරුණ සැණකෙළියකට මිල දී ගෙන තිබුණු රුපියල් මිලියන ගණනක ටී-ෂර්ට් වෙනුවෙන් බිල් ඉදිරිපත් කරලා තිබුණේ හාඩ්වෙයාර් එකකින් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න ඔහොමයි හිටපු අය හොඳටම කරලා තිබුණේ. මේවා ගැන අහන්න දැන් මෙතැන සිටියා නම් හොඳයි, අනාගත අයිස්ලන්තයේ සිහින ජනාධිපතිලා. ඒ කවුරුවත් දැන් මෙතැන නැති එක ගැන මම කනගාටු වෙනවා.

මම ස්ථිරවම කියන්න අවශ්‍යයි, ජනතාව මේ රජය පත් කර ගත්තේ නව අභිලාෂයක් වෙනුවෙන් බව. ඒ අභිලාෂය තමයි, වංචාවට, දූෂණයට, නාස්තියට එරෙහිව කටයුතු කිරීම. ඒ සඳහා ජනාධිපති අනුර සහෝදරයාගේ සිට සමස්ත කැබිනට් මණ්ඩලය ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159දෙනාත්, 4,000කට වැඩි අපගේ පළාත් පාලන මන්ත්‍රීවරුනුත්, තමන්ගේ පෞද්ගලිකත්වය ඉවත දමා මුළු රටේම මහා ජන ගංගාවකුත් පොදු අරමුණක් වෙනුවෙන් කැප වෙලා ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙනවා.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂය තැනින් තැන කෙඳිරිලි නැඟුවාට, නයි කෙඳිරිලි නැඟුවාට, මර ළතෝනි නැඟුවාට, අමුතු අමුතු ජාතියේ කෙඳිරිලි නැඟුවාට ජාතික ජන බලවේගයේ; මේ ජනතා රජයේ ගමන, ස්ථාවරව, නොනැවතී ඉදිරියට යන ගමන වෙනස් කරන්න බැහැ නොවෙයි, හිතන්නවත් එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ කථාව අවසන් කරන්න කැමැතියි, නාමල් ජයසිංහගේ "සහෝදරයා" නාට්‍යයේ එන දෙබසකින්.

"සමහරු එන්නෙ වරදින්න
සමහරු එන්නෙ ඒ වැරැද්ද දැනුමක් බවට හරවන්න
සමහරු එන්නෙ පොළොව තෝරන්න
සමහරු සෘතුව තෝරන්න
සමහරු පොළොව කොටන්න
සමහරු වල් ගලවන්න
සමහරු දඬු වැට බඳින්න
සමහරු බීජ වපුරන්න
සමහරු ඒ වැපිරුව බීජ රැකබලා ගන්න
අස්වනු නෙළන්නේ කවුරු වුණත් ඒ දක්වා වැඩ කොටස අපේ..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දූෂණයෙන්, වංචාවෙන් තොර රටක් හදනවා. එහි අස්වනු අපේ අනාගත පරම්පරාව නෙළපුදෙන්. ඒ දක්වා වූ වැඩ කොටස ජාතික ජන බලවේගය ආණ්ඩුව සිදු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.06]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඇත්තටම සතුටු වෙනවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විධියට සහ එහි සාමාජිකයකු විධියට ස්ථාවර නියෝග 120 යටතේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 10වැනි පාර්ලිමේන්තුවට සිය 4වැනි වාර්තාවත් ඉදිරිපත් කර අවසන් මොහොතේ හෝ මේ පාර්ලිමේන්තුව තුළ යම් අදහසක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව.

ඇත්තටම මේ සාකච්ඡාව සිදු කරමින් තිබෙන මේ මොහොතේ, COPE එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවලට අදාළ මේ සාකච්ඡාව පාර්ලිමේන්තුව තුළ කරන කොට විපක්ෂයේ මන්ත්‍රීවරු එක එක දේවල් assume කරලා - උපකල්පනය කරලා - මේ සභාව ඉදිරියේ නොයෙක් දේවල් ප්‍රකාශ කරනවා අපි දැක්කා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අප කියන්නේ, මේ රට, මේ සමාජය සමස්ත පද්ධතියක් විධියට අරගෙන වෙනස් කිරීමට අවශ්‍ය මැදිහත් වීම අපි මේ වන විටත් කරමින් ඉන්න බවයි; ඒ ගැන ඔබතුමන්ලා බියක් සැකක් තබාගන්න අවශ්‍ය නැති බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් අවුරුදු 76ක් තිස්සේ පවත්වාගෙන ආපු සමාජ ආර්ථික වටපිටාවත් එක්ක ඔවුන්ට දැනෙන දෙයක් තිබෙනවා, ඔවුන් දන්නා දෙයක් තිබෙනවා; ඔවුන් ඉතිහාසයේ වැඩ කරපු ක්‍රමයක් තිබෙනවා. ඒ දේවල් එක්ක අහවල් තැන වංචාවක් සිදු වෙන්න ඇති, විවලින් සහල් නිෂ්පාදනයට අදාළ ටෙන්ඩරයේදී මේ වාගේ ගැටලු ඉදිරියේදී මතු වෙයි, එහෙම නැත්නම් රේගුවෙන් කන්ටේනර් ටික නිදහස් කරද්දී මේ වාගේ ප්‍රශ්න මතු වෙන්න ඇති, වංචා විමර්ශනවලට අදාළ කටයුතුවලදී මෙන්න මේ වාගේ දේවල් හෙළි වෙයි යනුවෙන් විවිධ උපකල්පනයන් කරමින් ඔවුන් නොයෙක් අදහස් ප්‍රකාශ කරනවා. හැබැයි, අපි අධ්‍යාපනය, සෞඛ්‍යය, නීතිය, ආර්ථිකය කියන සියලු පැති -සියලු පාර්ශ්ව ටික- එක විධියටම සැලකිල්ලට අරගෙන සමස්ත පද්ධතියක් විධියට ඉදිරියට ගෙන යනවා. ඒ කටයුත්ත කරමින් තිබෙන මොහොතක්, මෙය. පාර්ලිමේන්තුව තුළ අපට ලැබුණු බලය සහ COPE එකට නෛතිකව තිබෙන බලයත් එක්ක ගත්තාම, විශේෂයෙන්ම COPE එකේ ගරු සභාපතිතුමා ඇතුළු අප කණ්ඩායම විසින් කරගෙන යනු ලබන කාර්යභාරයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් හුදෙක් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අතර සහ සමාජයේ යම් යම් තැන්වල කථාබහට ලක් වෙනවා, රාජ්‍ය නිලධාරින් යම්කිසි විධියකින් පීඩනයකට ලක් කරන්නද, ඔවුන් අපහසුතාවකට පත් කරන්නද COPE එක පවත්වා ගෙන යමින් ඔවුන් ප්‍රශ්න කරන්නේ කියලා. නැහැ, එහෙම දෙයකට නොවෙයි අපි ඔවුන් ප්‍රශ්න කරන්නේ.

ඇත්තටම බලාපොරොත්තු කීපයක් යටතේ තමයි ඉතිහාසයේ COPE එක ස්ථාපිත කර තිබෙන්නේ. හැබැයි, එහි භාවිතාව කොයි ආකාරයෙන්ද සිදු වුණේ කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. නමුත්, මීට ඉහත COPE එකේ හිටපු සභාපතිවරයෙකු වන සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ සමයේදී සහ වර්තමානයේදීත් රටේ යහපත, මේ සමාජයේ යහපත වෙනුවෙන් එයට පැවරුණු වගකීමත් එක්ක ඒ ආශ්‍රිත කටයුතු ටික සිදු කරමින් එනවා. එහිදී රාජ්‍ය සම්පත් වඩාත් ඵලදායී ලෙස යොදා ගන්න, රාජ්‍ය ආයතනවල අරමුණු කරා ළඟා වෙන්න, පැවැති තත්ත්වය වෙනස් කරලා, කඩිනමින් නීති ක්‍රියාත්මක කරලා වඩා හොඳ තත්ත්වයකට යන්න අපි කටයුතු කරනවා. ඉදිරියේදී වංචා, දූෂණ සිද්ධ වන එක වළක්වන්නට අවශ්‍ය ප්‍රවේශයත් අපි මේ තුළ ගන්නවා.

විශේෂයෙන්ම COPE එක ඇතුළේ අපට ආයතන 457ක් විමර්ශනයට ලක් කරන්න තිබෙනවා. ඒ ආයත 457ම විමර්ශනය කරන්න අපට හැකියාවක් නැති වුණත්, විගණකාධිපතිවරයා විසින් ලබා දී තිබෙන තොරතුරු අනුව අපි එම ආයතනවලින් ලිඛිතව විමසීම් සිදු කරනවා. ඒවා අතරින් තෝරා ගත් ආයතන 14ක් මේ වන විට අපි COPE එක ඉදිරියට ගෙන්වා සාකච්ඡා කර තිබෙනවා. ආණ්ඩුව පැත්තෙන් මීට කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමාත් එසේ කැඳවූ ආයතන සම්බන්ධයෙන් යම් අදහසක් ප්‍රකාශ කළා. එහිදී අපට පෙනී ගිය කාරණයක් තමයි, එම ආයතන පිහිටුවීමට බලපෑ මූලික නීතිමය තත්ත්වයන් පසෙකලා බොහෝ දෙනෙකු කටයුතු කර තිබෙනවා කියන එක.

ආයතනයක් ගොඩනඟද්දී, ආයතනයක් ඉදිරියට පවත්වාගෙන යද්දී, එම ආයතනයේ කටයුතු සිදු කරද්දී විශේෂයෙන්ම එහි දැක්ම සහ මෙහෙවර - vision and mission - සම්බන්ධව අවධානය යොමු කර ඒ ඔස්සේ තමයි වැඩ කටයුතු කරගෙන යා යුත්තේ. නමුත් ඒ දේවල් පැත්තක තබා තමයි පසුගිය කාලයේ සමහර රාජ්‍ය ආයතන කටයුතු කර තිබුණේ. ඒ වාගේම, සංයුක්ත සැලැස්මට - Corporate Plan එකට - අනුව වැඩ කරනවා වෙනුවට තමන්ගේ හිතුමනාපයට අනුව, ඇමතිවරයාගේ අවශ්‍යතා අනුව තමයි එම කටයුතු සිදු වෙලා තිබුණේ. ඉතින් මෙන්න මේ දේවල් වෙනස් කිරීම සඳහා, මෙන්න මේ දුර්වලතා නැති කිරීම සඳහා තමයි අපි පසුගිය කාලයේ රාජ්‍ය ආයතන COPE එක හමුවට ගෙන්වා විමර්ශනයට ලක් කළේ.

විගණකාධිපතිවරයාගේ වාර්තාව අනුව අපි ආයතන 14ක් විමර්ශනයට ලක් කර තිබෙනවා. ජාතික තරුණ සේවා සභාව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල, මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රාජ්‍ය දැව සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, අවසාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය කියන ආයතන අපි පසුගිය කාලයේ විමර්ශනයට ලක් කළා. එකී ආයතන 14 විමර්ශනයට ලක් කරද්දී අපි දැකපු සුවිශේෂී තත්ත්වයක් තමයි එම ආයතන තම අරමුණින් පරිබාහිරව කටයුතු කර තිබීම. එවැනි අවස්ථා තිබුණා. ඊට හොඳම උදාහරණයක් තමයි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව. 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා තිබෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා පසුගිය කාලයේ සිද්ධ වුණු ලොකු මූල්‍ය වංචාවක්, ලොකු වැරැද්දක් හෙළි කර ගන්න අපට පුළුවන් වුණා. ඒ තමයි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට කෙසේවත් අදාළ නැති පොහොර නිෂ්පාදන කටයුත්තකට දායක වෙලා ඔවුන් රටේ මුදල් රුපියල් මිලියන 350ක් විනාශ කරන්න මඟ පාදා ගැනීම.

විශේෂයෙන්ම මම අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මේ කාරණය කියන්න ඕනෑ. අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු එක පක්ෂයක දිස්ත්‍රික්කයේ නායකයා, හිටපු ඉඩම් ඇමතිවරයා රුපියල් මිලියන 350ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා අරගෙන, ඒකෙන් රුපියල් මිලියන 302ක් සම්පූර්ණයෙන් වියදම් කරලා කිසිම සැලැස්මක් නැති, කිසිම තේරුමක් නැති කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කටයුතු කරලා තිබුණා. ඒ තුළින් රටට අත් වෙච්ච ලාභයක්, රටට ලැබුණු ප්‍රතිලාභයක් නැහැ. ඇත්තටම කිසිම ව්‍යාපෘති වාර්තාවක් නැතුව, ශක්‍යතා අධ්‍යයනයකින් - feasibility study එකකින්- තොරව තමයි ඒ කටයුතු කරලා තිබෙන්නේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා ගත්ත රුපියල් මිලියන 350න්, රුපියල් මිලියන 302ක් මේ විධියට වියදම් කළාම, ඒ තුළින් මේ රටේ මුදල් සැලකිය යුතු ලෙස අවභාවිත වෙලා තිබෙනවා.

ඊට අමතරව තව කථාවක් මම කියන්නම්. අපි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විමර්ශන කරන කොට, 2022/2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට අනුව අපට දැන ගැනීමට ලැබුණා හන්තාන, ඌරාගල වත්තේ අක්කර 25ක් පෞද්ගලික සමාගමකට විකුණා තිබෙන බව. ඒක ඇතුළේ තව කථාවක් තිබෙනවා. නමුත් අවසානයට තිබෙන කථාව මම කියන්නම්. ඒ අක්කර 25ක ඉඩම විකුණලා තිබෙන්නේ 101,109ක මුදලකට. එතකොට පර්චස් එකක වටිනාකම රුපියල් 28.72ක්. ඒ ඉඩම විකුණලා තිබෙන්නේ, "හෝම් ලැන්ඩ්ස්" කියන සමාගමට. ඒ සමාගම පර්චස් එකක් රුපියල් ලක්ෂ 6 ගණනේ විකුණලා රුපියල් බිලියන 2.2ක ආදායමක් අරගෙන තිබෙනවා. ඔන්න ඉතිහාසයේ වෙච්ච දේවල්! එහෙම වැඩ කරපු මිනිස්සු තමයි දැන් අපට උපදෙස් දෙන්නේ ටෙන්ඩර් ගැන, වංචා ගැන අපට උපදෙස් දෙන්නේ. ඔන්න ඔය වාගේ දේවල් තමයි අතීතයේ සිද්ධ වෙලා තිබෙන්නේ.

2024 මාර්තු 31 දින වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ තිබිලා තිබෙනවා, වැඩ කරන සේවකයන්ට සුබසාධන

[ගරු තිළිණ සමරකෝන් මහතා]

පහසුකම් යටතේ ඉඩම් කොටස් යම් යම් දේවල් සඳහා දෙන්නට පුළුවන් කියලා. ඒ අනුව එහි වැඩ කරපු සේවකයන් අක්කර 50කට වඩා එහා ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. 2024 මාර්තු 31ට පෙර දිනට රට පුරා ඉඩම් අක්කර 50ක ප්‍රමාණයක් සේවකයන් අරගෙන තිබෙනවා. ඔය විධියට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා සහ තවත් ආයතන හරහා ඉඩම් අරගෙන තිබෙනවා. මට එකින් එක ඒ තොරතුරු කියන්න පුළුවන්. නමුත් ඒ සඳහා වෙලාව මදි. රට ඇතුළේ සිදු වූ එවැනි නොයෙක් වංචා, දූෂණ අපට හෙළි කරගන්න හැකියාව ලැබිලා තිබෙනවා. නමුත් අපි කිසිම අවස්ථාවක රාජ්‍ය සේවකයන් අපහසුතාවට පත් කරන්න නොවෙයි උත්සාහ කළේ. අපි ඒ තීන්දු තීරණ ගත්ත, ඒ වෙනුවෙන් මැදිහත් වෙච්ච දේශපාලන අධිකාරිය රටට හෙළි කරන්න ඕනෑ. එවැනි දේවල් සඳහා තමයි අපි උත්සාහ දැරුවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව පොඩ්ඩක් කියන්න තිබෙනවා.

අපි ඉඩම් ඇමතිතුමා එක්ක, නියෝජ්‍ය ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ තිබෙන අඩුපාඩු ටික පෙන්වලා දීලා තිබෙනවා. ඒ අනුව දැන් යම් යම් වැඩ පිළිවෙළ හදලා ඉඩම් තක්සේරු කිරීම නිවැරැදිව කරන්න, ඒ වාගේම සේවකයන් වැඩි කරන්නේ නැතුව ප්‍රමාණවත් සේවක පිරිස් තියාගෙන ඒ ආයතනයේ කටයුතු සක්‍රිය කරන්න කටයුතු කරනවා. ඒ වාගේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව ඇති ඉඩම් ප්‍රමාණයවත් ඔවුන් දන්නේ නැහැ. ඒ ඉඩම් ප්‍රමාණය හරියට ලේඛනගත කරලා පවත්වාගෙන යන්න, ඒ වාගේම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරලා වඩාත් ඵලදායී විධියට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම් රටේ කටයුතුවලට යොදවන්න අපි කටයුතු කරනවා. මෙන්න මේ විධියට ආයතන මට්ටමින් සිදු වෙච්ච නොයෙක් වංචා, දූෂණ හෙළි කරන ගමන්, මිනිසුන් අපෙන් බලාපොරොත්තු වෙච්ච දේ අපි රටට, සමාජයට ඉෂ්ට කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. අපි කණ්ඩායමක් විධියට මේ තොරතුරු ඉදිරිපත් කරලා අපේ රටේ සමාජය, ආර්ථිකය, දේශපාලනය, නීතිය වෙනස් කරලා රට සුබවාදී දිශාවකට ගන්න අදාළ මැදිහත් වීම කරනවාය කියන එක මේ සභාවට ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.16]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ලොකුම ප්‍රශ්නය තමයි කුඩු. කුඩු කන්ටේනර් පැන්නුවේ කවුද? ඒක රටට ගෙනාවේ කවුද? ඒකේ ගිනි අවි තිබුණාද, නැද්ද කියලා මම ඒ කාලයේ කිව්වාම මට කිව්වා, "පිස්සා" කියලා. කුඩු ගෙනාවා, ගිනි අවි ගෙනාවා කියනවා. "ඌ, පිස්සා. ඌට පිස්සු" කිව්වා. මම ඉතින් අහගෙන හිටියා. මම doctor කෙනෙක් නේ. මට ethics තිබෙනවා. මම doctor කෙනෙකු විධියට oath එක අරගෙන තිබෙනවා. මට කාටවත් "පිස්සා' කියලා බණින්න බැහැ. එතකොට ඒක diagnose වෙනවා. කරුණාකරලා ඒක දැන ගන්න. ඔබතුමන්ලාට කියන්න පුළුවන්, "පිස්සා" කියලා. එහෙම කියපු ගමන්ම ඒක diagnose වෙනවා. ඔබතුමන්ලා doctorsලා දෙන්නෙක් මුණ ගැහිලා ඒගොල්ලන්ගෙන් අහන්න ඕනෑ, මට පිස්සුවක් තිබෙනවාද, නැද්ද කියලා. නැත්නම් ඒක diagnose වෙනවා. ඒ නිසා මේ 159දෙනාට ethics නැති වුණාට doctor කෙනෙකු විධියට මට තිබෙනවා. මම පාර්ලිමේන්තු ආවා කියලා, මට වරප්‍රසාද තිබෙනවා කියලා, ඒ අයට පිස්සු කියලා මට කියන්න බැහැ.

හැබැයි, ඇත්තටම සමහරුන්ට මේ රට ඇතුළේ, මේ පාර්ලිමේන්තුව ඇතුළේ පිස්සු කෙළින්න පිස්සුවක් තිබෙනවා. අවුරුද්දක් මට මේක ඉවසන්න පුළුවන් වුණා. මම කට වහගෙන හිටියා, අවුරුද්දක්. දැන් ඇත්ත කියන්න වෙනවා; මම දැන් medicines කිහිපයක් දෙන්නම්. International Classification of Diseases අනුව, ICD-10 එකේ symptoms කිහිපයක් කියන්නම්. ජනතාව හිතා ගන්න, මේ 159දෙනාගෙන් කාට හෝ ඒවා තිබෙනවාද නැද්ද කියලා. පළමුවැනි එක තමයි, delusion කියන එක. Delusion කියන්නේ වැරැදි මෝහය. ඒ කියන්නේ අපි මේක පෙන්නලා phone එකක් කිව්වාම, නැහැ නැහැ මේක තුවක්කුවක් කියනවා නම්, ඒ තත්ත්වයට කියනවා delusion කියලා. අපේ රටේ සමහරුන්ට ඒ delusion තිබෙනවා. මෙතැන doctorsලාත් ඉන්නවා. Deputy Minister ඉන්නවා. ඒ නිසා සමහරුන්ගේ delusion එක අපට වෙනස් කරන්න බැහැ. සමහරුන්ට තිබෙන්නේ hallucination. අද උදේ කථා කළා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක් අහලා, උත්තර දීලා, මම තව ප්‍රශ්නයක් ඇහුවාම එතුමා කියනවා, මට පිස්සු කියලා. ඒ hallucination එක. අනෙක් එක තමයි, එතුමන්ලාට තිබෙනවා ලෙඩ ගැන insight එක. සමහරුන්ට තමුන්ට ලෙඩක් තිබෙනවා කියලා දැන ගන්න බැහැ. Doctor කෙනෙක් කිව්වාම ඒක මාර අවුලක් වෙනවා. ඒ නිසා මම කියන්න කැමැති නැහැ. Deputy Minister ඉන්නවා, එතුමාට පුළුවන් ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩු බිව්වොත්, ඒ කියන්නේ drug abused කට්ටියට තමයි ඒක වැඩිපුර එන්නේ. අපිත් hospital යනවා නේ. ඒ ගිහිල්ලා psychiatric ward එකට ගියාම ලෙඩ්ඩු ටික කෑ ගහනවා, "ඔන්න පිස්සා ආවා" කියලා, doctorට. එතකොට doctorට බැහැ, හැම පිස්සාටම "ඔයා පිස්සා, ඔයා පිස්සා, ඔයා පිස්සා" කියන්න. අපට හිනා වෙලා යන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් අපට ලෙඩක් වෙනවා.

මම දැක්කා, අද report එකක් ඇවිල්ලා තිබෙනවා, "Sri Lanka as a safe, inclusive and welcoming destination for LGBTIQ" කියලා. සමහරුන්ට English තේරෙන්නේ නැතුව ඇති. "බිග් කුච්චන්" කියන කට්ටිය නේ ඉන්නේ. ඇමති කෙනෙක් ගිහිල්ලා international forum එකක "බිග් කුච්චන්" කිව්වාම, එයා අහනවා fractureද කියලා. නැහැ, නැහැ "කුච්චන්" කියනවා. ඒ වාගේ කට්ටියට අපට Englishවලින් කියන්න බැහැ. හැබැයි, මම කියන්නම් පස්සේ translate කර ගන්න. LGBTIQ stands for lesbian, gay, bisexual, transgender, intersex and queer. ඒ වාගේ තැනක් දැන් මේ රට. මේ රට දැන් system change කරලා ලස්සන කරලා තිබෙන්නේ. LGBTIQවලට ලස්සන රට අපේ රට කියලා අපේ Tourism Development Authority එකෙන් ලියුමක් දීලා තිබෙනවා. ඒ කියන්නේ, තව කාලයකින් අපට ඉස්සරහා පුටුවල විනෝද විනෝද දේවල් බලන්න පුළුවන්. හැබැයි, ඒවා මට කියන්න බැහැ. දැන් ඔය එක එක තැන්වල වෙනවාද දන්නේ නැහැ. අපේ රටේ ඉන්න ලොකු ලොකු ප්‍රධානියා ඇමෙරිකාවේ LGBTIQවලට,- ගෙදරත් කරන්නේ ඒ වැඩ. මේ පාර්ලිමේන්තුවේත් කරන්නේ ඒ වැඩ. දැන් report එක දීලා තිබෙනවා. "වරෙල්ලා වරෙල්ලා අපේ රටට වරෙල්ලා" අපි LGBTIQ කියලා tourism develop කරනවා. එතකොට හිතලා බලන්න. මෙච්චර කාලයක් මේක බෞද්ධ රට. බෞද්ධ, මුස්ලිම්, හින්දු හැම ජාතියක්ම ලස්සනට ජීවත් වෙන රට. දැන් වෙලා තිබෙන්නේ LGBTIQ රට. අපි කියනවා, දඬුවම් දෙන්න ඕනෑ. corporal punishment දෙන්න බැහැ, හැබැයි, ඉස්සරහා පේළියේ වාඩි වෙලා ඉඳගෙන LGBTIQ කරන්න පුළුවන්. ඒ ඇමතිකම් කරන කට්ටිය report එකක් දීලා තිබෙනවා, "Sri Lanka is a very nice place to conduct LGBTIQ transparent business" කියලා. එතකොට හිතලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එකක් මම කියන්න කැමැතියි. අපි මේක කලින් කියලා තිබෙනවා. අපේ සමහර MPලා දැන් ගිහිල්ලා tap අරිනවා, සමහරු පාරවල තිබෙන පොඩි පොඩි කැඩුණු තැන්වලට සිමෙන්ති දමනවා, සමහරු බ්ලොක් ගල් අරගෙන ඇවිල්ලා බිත්ති බඳිනවා. This is parliament. කරුණාකරලා දැන ගන්න මේක පාර්ලිමේන්තුව. සමහරුන්ට තේරෙන්නේ නැතුව ඇති, MP කියන්නේ මොකක්ද කියලා. MP කියන්නේ, Member of Parliament. MP කියන එකේ ගෞරවයක් තිබෙනවා. සමහර අය නැඟිටලා කියනවා, පිස්සෝ ටිකක් කියලා. මේ රටේ,- *[බාධා කිරීම්]* කෑ ගහන්න එපා බබාලා, වාඩි වෙන්නකෝ. අහන්නකෝ අපි කියන එක. *[බාධා කිරීම්]* ඇයි, ඇයි, කුඩු ගහලා ආයෙත් සද්දේ දමන්න පටන් ගත්තා. ඕවාට කෑ ගහන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එක්කෙනෙක් නැඟිටලා කියන්න ප්‍රභාකරන් ත්‍රස්තවාදියෙක් කියලා? කවුරුත් නැහැ නේ. ඉස්සරහත් නැහැ, පිටුපසත් නැහැ. හැබැයි, අපේ රණවිරුවන්ට කියනවා සෙබළු කියලා. ඔබතුමන්ලාට කොන්ද පණ තිබෙනවා නම්, කවුරු හරි කියන්න. මම වෙලාව දෙන්නම්. මට විනාඩි නවයක් තිබෙනවා, මම ඒකෙන් දෙන්නම්. ඔන්න එනවා, "බිග් කුච්චන්". බිග් කුච්චන් අයියා අපිට කියන්න, මේ රටේ ඉන්නේ සෙබළු නොවෙයි රණවිරුවෝ කියලා. එහෙම නැත්නම් කියන්න ප්‍රභාකරන් ත්‍රස්තවාදියෙක් කියලා. එතුමාටත් කියන්න බැරිව ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තරමට මේ රට වැටිලා තිබෙන්නේ.

සමහර විට තවත් කල් යනකොට - දැන් නොවෙයි, තවත් කල් යනකොට - අපේ ජනාධිපති, Prime Minister වාගේ අය LGBTIQ සංස්කෘතිය promote කරන්න පුළුවන්, වීඩියෝ දමලා. ඒ තැනට තමයි අපේ රට ගිහිල්ලා තිබෙන්නේ. ඔබතුමන්ලා දන්නවා, අපේ රට ගැන මුළු ලෝකයේම යම් කිසි ගෞරවයක් තිබෙනවා කියලා. ශ්‍රී ලංකාවට කියන්නේ, the Pearl of the Indian Ocean කියලා. අපේ රට තුළ LGBTIQ සංස්කෘතිය promote කරනවා. හැබැයි, අපට කවදාවත් corporal punishment කිරීම තබාගන්න බැහැ, ඒක වැරදියි කියනවා. තවත් කල් යනකොට තවත් ප්‍රශ්න එනවා. මම කියන්නම්, අහගන්න.

දැන් මෙච්චර කාලයක් අපි කිව්වා, බස්වල ගිහිල්ලා දේශපාලනය කරනවාය කියලා. හොඳයි, අපි trainsවල ගිහිල්ලා - සමහර වීඩියෝ පවා දැම්මා, trainsවල. ඇවිල්ලා බලන්න, ඔය මාදිවෙල තිබෙන අපේ ගෙවල්වල සමහරුන්ට කාර් දෙකයි. සමහරුන්ට වාහන තුනයි. *[බාධා කිරීමක්]* ඔව්, දැන් තවත් 2,000ක් ගෙන්වනවා ලු, MPsලාට දෙන්න. අපි ආවේ අපේ සල්ලිවලින්; අපේ ඩයස්පෝරා සල්ලිවලින්. මම කිව්වා, මගේ National Identity Card number එක තමයි, 861803295V. Total assets අද මගේ ළඟ තිබෙන්නේ ලක්ෂ 18යි. ඊට වඩා කොහේ හරි සල්ලි තිබෙනවා නම් අරගෙන දෙන්න, මම තියා ගන්නම්. හැබැයි එක MP කෙනෙකුට නැඟිටලා ඒ අයගේ වත්කම් බැරකම්, National Identity Card number එක කියන්න කියන්න. "බිග් කුච්චන්" අයියාගෙන් අහන්න, පුළුවන් නම් එයාගේ National Identity Card number එක කියන්න කියලා. කියන්න බැහැ නේ. වඩේ විකුණලා, පාන් විකුණලා,- මාධ්‍යවලට ගිහිල්ලා අහනවා, "මම දැන් මේ කෙසෙල් ගෙඩි ගත්තා, රයිස් ගත්තා, මට මිනිස්සු සල්ලි දුන්නාම පාන්ද?" කියලා. නැහැ, නැහැ. මම කියනවා, "පරිප්පු" කියලා. ඔයගොල්ලන්ට පුළුවන් නම් නැඟිටලා කියන්න, ඔයගොල්ලන්ගේ National Identity Card numbers ටික.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
විනාඩි දෙකක් තිබෙනවා නේ, පොඩ්ඩක් ඉන්න.

මම අහන්න කැමැතියි, ඔයගොල්ලන් වත්කම් බැරකම් ගැන මේ කාරණය. මෙච්චර කාලයක් කිව්වා, "අපට සල්ලි නැහැ, අපි ප්‍රභූ ජාතියක් නොවෙයි, අපි සාමාන්‍ය මිනිසුන්ගේ ජාතියේ" කියලා. දැන් වෙන්නේ මොකක්ද? දැන් බැලුවාම ඔයගොල්ලන්ගේ වත්කම් බැරකම් නාමල්ට වඩා වැඩියි. දැන් බැලුවාම යෝෂිතට වඩා වත්කම් බැරකම් වැඩියි. මට හිනාත් යනවා. එතකොට ඔබතුමන්ලා කියන්න, මේ ක්‍රියාවලිය මොකක්ද? දැන් ඔයගොල්ලන් කියනවා, "අපට සල්ලි නැහැ" කියලා. සමහර අය කියනවා, තමන්ගේ බබාලාගේ,- *[බාධා කිරීමක්]* මොකක් හරි කියන්න ඕනෑ නම් කියන්න. කිසි අවුලක් නැහැ. සමහර අය කියනවා, තමන්ගේ බබාලාගේ puberty ceremoniesවලට මිනිස්සු ඇවිල්ලා සල්ලි දුන්නා ලු. හොඳ වෙලාවට මට බබෙක් නැහැ. නැත්නම් මට කියන්න තිබුණා, මගේ බබාගේ puberty ceremony එකට තමයි මේ සල්ලි ලැබුණේ

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

කියලා. මට කෙල්ලෙක් නැති නිසා - දැන් මේ වෙලා තිබෙන්නේ, සමහර MPලා - හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පුතාලා නේ ඉන්නේ, දැන් විපක්ෂයේ. දකුණේ හැමෝම දන්නවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පුතාලා තමයි දැන් කන්ටේනර් පන්නන්නේ කියලා. ඒ, ජනාධිපති කාලයේ ගිහිල්ලා එක එක ගෙවල්වලට දීපු වැඩ නිසා දැන් මේ කන්ටේනර් ටික එළියට ඇවිල්ලා තිබෙනවා. ඊට පස්සේ අයියා ඇවිල්ලා බණිනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියනවා, "නැහැ, නැහැ. අයියා, ඔයා තමයි කුඩුකාරයා" කියලා. මේක එක පවුලේ ප්‍රශ්නයක්; එක පවුල ඇතුළේ වෙන කුඩු ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා බලන්න අපි වාගේ දුප්පත් මිනිසුන්ට මොකක් හරි වෙලා තිබෙනවාද කියලා. අපට පෙට්‍රල් අඩු වුණාද? Vitz එක ලක්ෂ 12ට හම්බ වුණාද? එහෙම නැත්නම් ඔබතුමන්ලාට ජපන් බයික් එකක් හම්බ වුණාද? අවුරුදු 5ක් නොවෙයි, 10ක් කළත් මේක බොරුවක්; මේගොල්ලන් දිගින් දිගටම කරනවා. නාමල් අල්ලනවාද එයාගේ වරාය ඇමති අයියාව, ආයෙත් ඉස්සරහට? ඉස්සරහට නාමල් ජනාධිපති වෙනකොට අයියාව අල්ලන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තව තත්පර 20ක් දෙන්න. මම අවසන් කරනවා.

ඒ නිසා මේ දුප්පත් මිනිසුන්ට මම කියන්නේ, මේ දේශපාලනය කියන්නේ - මම වැඩි කාලයක් ඉන්නේ නැහැ. බය වෙන්න එපා, ඉන්නේ තවත් මාස දෙක තුනයි. හැබැයි, මම ඉන්නකල් ඇත්ත කියලා තමයි යන්නේ. මේ රටේ සාමාන්‍ය ජනතාවට කවදාවත් හොඳ දේවල් වෙන්නේ නැහැ. අපට පෙට්‍රල් රුපියල් 150ට ගන්න හම්බ වෙන්නේ නැහැ. දැන් පෙට්‍රල් භාගයක් තමයි රුපියල් 150ට ගන්න පුළුවන්. මේ ඉන්න එක්කෙනෙකුට කියන්න පුළුවන්ද, ඊගොල්ලන් වේදිකාවල ඒවා කිව්වේ නැහැ කියලා? කවදාද ඒක වෙනස් කරන්නේ? System නොවෙයි වෙනස් වෙන්නේ, මේ රටේ. සමහර වෙලාවට ඉස්සරහට යනකොට අපේ ජනාධිපතිලා, Prime Ministerලා කියන්න පුළුවන්, අපිත් LGBTIQ කියලා. එච්චර තමයි මේ රටේ වෙන්නේ.

Thank you.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න. තත්පර 30ක කාලයක් දෙන්නම්.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවෙන් පස්සේ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය මගේ නම කිව්වා. කන්ටේනර් 320 පිළිබඳව මම කළ ප්‍රකාශය ගැන; ඒක බිහිසුණු අපරාධයක් කියන එක සම්බන්ධව එතුමිය කිව්වා, මීට වඩා බිහිසුණු අපරාධ සිදු වෙලා තිබෙනවා කියලා. ඒ කියන්නේ එතුමිය පිළිගන්නවා, ඒක අපරාධයක්ය කියලා. ඒ නිසා තමයි අපි කියන්නේ, පරීක්ෂණ කරන්න කියලා. මම දැන් වාහනයේ යන්න යනකොට "News Center" එකේදී දැක්කේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව පරීක්ෂණ කරන්න කියන්නේ ඒකයි. අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමා කිව්වා, තුවක්කු ගෙනාවාය කියලා. ඉතින් එහෙම නම් බිහිසුණු අපරාධයක් තමයි; බිහිසුණු අපරාධයක්. කාටද තුවක්කු දුන්නේ, කවුද තුවක්කු ගෙනාවේ, කොහේද ඒ තුවක්කු ටික තිබෙන්නේ කියන එක අර්ච්චුනා මන්ත්‍රීතුමාට කියන්න කියලා කියන්න. අපේ රටේ අහිංසක මිනිසුන්ගේ ජීවිත ඒ තුවක්කුවලින් බිලි ගන්න හදන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක අපරාධයක් නොවෙයිද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක පැහැදිලියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම සඳහන් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ නමට හානියක් වන ආකාරයට මේ සභාවේ වචන භාවිත වුණේ නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කියන්නේ කන්ටේනර් කථාව ගැන. කොහොමද හානියක් නැහැ කියන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වෛද්‍ය හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. මගේ නම සඳහන් කළා. මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීමක්]* විනාඩියක්වත් දෙන්න බයයි.

[අ.භා. 4.27]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම *[බාධා කිරීමක්]* දසවන පාර්ලිමේන්තුවේ සිව්වන COPE වාර්තාව සම්බන්ධයෙන් වූ කතිකාවක් තමයි අද තිබෙන්නේ. අපි ඉස්සෙල්ලා කථා කළා වාගේ, ඒ කතිකාවේ hallucinations, delusions සහ තව ගොඩක් දේවල් තිබෙනවා. ඒක නිසා ඕක ආවාම ඉතින් නිකම් ඔහොම කියැවෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම COPE කියන්නේ මේ රටේ ඉතාම වැදගත් කමිටුවක්. COPE එක තිබෙන්නේ කාටවත් දඬුවම් දෙන්න නොවෙයි. නමුත් COPE එක මඟින් හෙළි කර ගන්නා කරුණු රටේ අනාගතයට ඉතාම වැදගත් වෙනවා. ඇත්තටම මේ විගණන ක්‍රියාවලිය ගත්තාම, විගණන ක්‍රියාවලිය සම්බන්ධව රටේ බොරු මතයක් ගොඩනඟමින් තිබෙනවා. විශේෂයෙන්ම අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් ගත්තාම, අපේ නිලධාරින් බිය වැද්දීමක් කරනවා, මේ COPE එක හා ඒ වාගේම නොයෙකුත් විගණන ක්‍රියාවලි තිබෙන්නේ මේ නිලධාරින්ට දඬුවම් කරන්න ඒ වාගේ දෙයක් සඳහා කියලා. ඇත්තටම COPE එකේ මෙවර සහ මීට ඉහත තිබිච්ච කමිටුවල එම වාර්තා අපට අපේ වැරදි නිවැරදි කර ගන්න, අපේ අඩුපාඩු නිවැරදි කර ගන්න හුඟක් උපයෝගී වෙලා තිබෙනවා. ඒ නිසා COPE එක අද දින මේ ඉදිරිපත් කරපු වාර්තාව අපි ඉතාම ධනාත්මක විධියට පිළිගන්නවා. ඒ වාගේම මේ වාර්තාව තුළින් පෙන්වන කරුණු ඉතාම වැදගත් වෙනවා.

විශේෂයෙන්ම අපේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය ගත්තාම, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවන්නේ 2015 අවුරුද්දේ. ඒක පිහිටුවලා දැන් අවුරුදු 10ක් වෙනවා. අවුරුදු 10ක් වුණාට එහි සංවර්ධනයක් වෙන්නේ නැහැ. එහි සංවර්ධනයට අවශ්‍ය වූ එක් එක් පියවර තිබෙනවා; තව තව දේවල් තිබෙනවා එකතු කරන්න. නමුත් ඒ development එක වෙන්නේ නැහැ. ඒක හරියට අර හැමදාම බබෙක් වාගේ තියා ගන්නවා වාගේ වැඩක් තමයි කරන්නේ. ඒකට develop වෙන්න දෙන්නේ නැහැ. ඒක නිසා අපි රජයක් විධියට පත් වුණාට පස්සේ මේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ - NMRA එකේ - developmentsවලට අදාළ කාරණා සිදු කරමින් පවතිනවා. අපි හිතනවා, COPE එකේදී අපි හෙළි කර ගත් කරුණු මේ අපේ ඉදිරියට කරගෙන යන development එකට ගොඩක් වැදගත් වෙයි කියලා. ඒ වාගේම මට කලින් කථා කරපු මන්ත්‍රීවරුන්ගෙන් ඔය hallucinations and delusions කියන එක මතු වුණා. මම හිතන විධියට, delusion කියන්නේ අපි වැරදි මතයක එල්බගෙන සිටීම. මෙන්න මේක, මේක නොවෙයි, මෙහෙම එකක් කියලා හිතනවා; මේක පැනක් නොවෙයි, බෝලයක් කියලා හිතනවා. එහෙම නැත්නම් hallucination. එක එක විකාර පෙනෙනවා. ඒ විකාර පෙනෙනකොට දක්වන ප්‍රතික්‍රියාව තමයි අර එතුමා ඉස්සෙල්ලා පෙන්නුවේ. ඉතින්, එතුමාත් වෛද්‍යවරයෙක් නිසා ඒ වාගේ දේවල්වලට ස්වයං ප්‍රතිකාර ගන්න හොඳ නැහැ කියලා මම හිතනවා. එහෙම දෙයක් අපි පෙන්වා දුන්නාම, අදාළ වෛද්‍යවරයෙකුට පෙන්වා ප්‍රතිකාර ගන්න එක තමයි වඩාත් සුදුසු කියලා මම හිතනවා. මේ වේලාවේම ඒකට ගිය එකත් හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය hallucinations, delusionsවලට වඩා එහා ගිය දෙයක් තමයි අපේ බොහෝ රාජ්‍ය ආයතනවල පසුගිය කාලයේ සිදුවෙලා තිබුණේ. ඒ බොහෝ දේවල් නිකම්ම නිකම් අතපසුවීම් නොවෙයි. සංවිධානාත්මක අපරාධ, සංවිධානාත්මක වැරදි තමයි සිදු වෙලා තිබුණේ. අපි අද ගොඩක් කථා කළා Waiver of Registration - WoR - කියන එක ගැන. WoR කියලා කියන්නේ අපි යම්කිසි බෙහෙතක් හෝ ශල්‍ය උපකරණයක් ගෙන්වනකොට ක්‍රමවේදයක් තිබෙනවා, registration එක waive off කරලා. ඒ කියන්නේ registration එකක් නැතුව ගෙන්වීමේ ක්‍රමවේදයක් තිබෙනවා. එතකොට යම්කිසි ආකාරයකට එහෙම එකක් ගෙන්වන්න සිද්ධ වෙනවා නම්, ඒ ලංකාවට ඉතාම පොඩි ප්‍රමාණවලින් ගෙන්වන ඖෂධ හෝ ශල්‍ය උපකරණ සම්බන්ධව. එහෙමත් නැත්නම් අපට donations විධියට, ආධාර විධියට ලැබෙන දේවල්. එහෙම නැත්නම් සුවිශේෂී වූ අවස්ථාවකදී මීට ඉස්සෙල්ලා ගොඩක් ගෙන්වන්න ඇති. ඒ, සුවිශේෂී වූ අවස්ථාවලදී ගෙන්වන බෙහෙත් හා ශල්‍ය උපකරණ. අන්න ඒ වාගේ ඒවාට දෙන්න තමයි මේ Waiver of Registration එක තිබෙන්නේ. මේ සඳහා කමිටු දෙකක් තිබෙනවා. එකක් තමයි, ඖෂධ සම්බන්ධයෙන් වූ කමිටුව. අනෙක් එක තමයි, ශල්‍ය උපකරණ සඳහා තිබෙන කමිටුව.

මේ WoR - Waiver of Registration - කියන්නේ registration එකක් වාගේම බොහොම වගකීමෙන් දෙන සහතිකයක්. නමුත්, පසුගිය කාලයේ මොකද කළේ? විශේෂයෙන්ම මීට අවුරුදු 2කට ඉස්සරවෙලා ඔවුන් කළේ මොකක්ද? මේ Waiver of Registration එකටත් යම්කිසි කාලයක් ගත වෙනවා. එසේ කාලයක් ගත වන නිසා කිව්වා, මේ Waiver of Registration Committee එකට අපට යන්න බැහැ, ඒ නිසා ලංකාවට බෙහෙත් සහ උපකරණ ගෙන්වීම සඳහා අපි විශේෂ වූ මාර්ගයක් - special pathway එකක් - හදාගන්න ඕනෑය කියලා. අපි දන්නවා, එහි අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද කියලා. එහි අවසාන ප්‍රතිඵලය වුණේ, විශේෂයෙන්ම දේශපාලන අධිකාරිය මැදිහත් වෙලා මේ රටට ඖෂධ නොවන ඖෂධ ගෙන ඒම. ඉමියුනොග්ලොබියුලින් කියලා, වතුර බෝතල් ගෙනාවා. ඒ වාගේම තත්ත්වයෙන් ඉතාම බාල ඖෂධ ගෙනාවා. බැක්ටීරියා තිබෙන බෙහෙත් ගෙනාවා, ඇස්වලට දමන්න. අවසානයේ ඒ වරද පිළිඅරගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට ඒ මිනිස්සුන්ට වන්දි දෙන්න අපට සිද්ධ වුණා. නමුත් අපි දන්නවා, ඒ කිසිම වන්දියකින් ඒ මිනිස්සුන්ගේ නොපෙනී ගිය පෙනුම කවදාවත් ලැබෙන්නේ නැහැ කියලා. රාජ්‍ය සේවයේ හෝ ඉන් පිටත හෝ කිසිම කෙනෙකුට අනෙක් මිනිස්සුන්ගේ ජීවිත ගැන තීරණ ගැනීමේදී, විශේෂයෙන්ම මේ තිබෙන නියම කඩ කරගෙන යෑමේ අයිතියක් නැහැ. අපි COPE එකට ආරාධනා කරනවා, අපේ ආයතන ගැන තව තවත් සොයන්න, ඒ වාගේම අපට ඒ අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙන්න කියලා.

අද උදේ සජබයෙන් මුලින්ම කථා කරපු මන්ත්‍රීවරයා කිව්වා, කොළඹ මහ ඉස්පිරිතාලේ බෙහෙත් නැහැ කියලා. වේදනා නාශකවත් නැති ලු. එතුමා වේදනා නාශක කියලා හඳුනාගත්තේ මොනවාද කියලා මම දන්නේ නැහැ. මොකද, සෑම වේදනා නාශකයක්ම කොළඹ මහ රෝහලේ තිබෙනවා. ඒ වාගේම එතුමා සඳහන් කළ අනෙක් ඖෂධත් එහි තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ, ඒ මහත්වරුන් කොළඹ මහ රෝහලට යන්නේත් නැතිව, අනෙක් රෝහල්වලට යන්නේත් නැතිව මෙතැන බොරු කියලා යම්කිසි මතවාදයක් හදන්න හැම තිස්සේම උත්සාහ ගැනීමයි.

ඒ වාගේම කිව්වා, අපේ ආණ්ඩුව ආ පසු නීති තද නිසා වෛද්‍යවරුන් පිටින් ගන්න කියලා බෙහෙත් ලියන්නේ නැහැ කියලා. නමුත් එහෙම එකක් නැහැ. අපි රෝහල්වලට අවශ්‍ය ඖෂධ සපයා තිබෙනවා. ඒ වාගේම ඒ ඖෂධ යම්කිසි ආකාරයකින් සපයා ගැනීමේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ සඳහා ඒ රෝහල් පාලනාධිකාරියට අපි මුදල් වෙන් කර දී තිබෙනවා. ඒ වාගේම හදිසියේවත් ඒ ක්‍රම දෙකෙන්ම බැහැර වූ, යම්කිසි

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

ආකාරයකට දුලබව භාවිත කරන ඖෂධයක්, එහෙම නැත්නම් ඒ මොහොතේ ක්ෂණිකව අවශ්‍ය වන ඖෂධයක් තිබුණොත්, ඒක වෙනදා විධියටම පිටින් මිලදී ගැනීමට ලියන්න පුළුවන්. එහෙම කරන්න බැහැ කියලා අපි කිසිම circular එකක් නිකුත් කරලා නැහැ. අපි මේ සියලු දේ කරන්නේ යම් විනයක් ඇතිව මේ රට ඉදිරියට පවත්වාගෙන යෑම සඳහායි, යම් ක්‍රමවේදයක් ඇතිව, විධිමත්භාවයකින් යුතුව මේ වැඩ ඉදිරියට කරගෙන යෑම සඳහායි.

එතුමන්ලාගේ කථාවලදී හැම තිස්සේම මතු වුණු දෙයක් තමයි, අපි එතුමන්ලාව හිර කරන්න හදනවා කියන එක, එතුමන්ලාට සහයෝගය දක්වන නිලධාරීන් හිර කරන්න හදනවා කියන එක. ඇත්තටම COPE එකෙන් කරන්නේ මොකක්ද? වැරදි පෙන්වා දෙන එක, එහෙම නැත්නම් දූෂිතයන් නිරාවරණය කරන එක. එතුමන්ලා හිතනවා නම් මේ එතුමන්ලා අල්ලන්න එන එකක් කියලා, අපට ඒකට කරන්න දෙයක් නැහැ. මොකද, යම්කිසි ආකාරයකට අපි දූෂිතයන් සෙවීමට පටන් ගත්තාට පස්සේ දූෂිතයන්ටම තමයි ඒ වාගේ සිතුවිලි පහළ වෙන්නේ.

ඒ වාගේම ඒ සමහර මහත්වරුන් කථා කළා, එක් එක් විදුලි බලාගාර ගැන. ඒ කථා කරපු අයට ඒ ආයතන එක්ක සම්බන්ධකම් තිබෙනවා. එතකොට ඒ අය කථා කරන්නේ තමන්ගේ ප්‍රදේශයේ තමන් නියෝජනය කරන ජනතාව වෙනුවෙන්ද, ඔවුන්ගේ පක්ෂය නියෝජනය කරන ජනතාව වෙනුවෙන්ද, ඒ කොම්පැනි වෙනුවෙන්ද කියා ප්‍රශ්නයක් ඇති වෙනවා. සමහරුන් ඉතා දීර්ඝ විස්තර ඉදිරිපත් කළා, ඒ කොම්පැනි වෙනුවෙන්. ඔවුන් අද ඇවිල්ලා ඉන්නේ ඒ සමාගම්වල වුවමනා ඉෂ්ට කරන්න, ඒ වාගේම මේ රටේ ඉන්න ඇතැම් ජාවාරම්කාර වෙළෙඳුන් ආරක්ෂා කරන්න. ඔවුන් ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ.

පසුගිය කාලයේ, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සම්බන්ධව ලොකු කතිකාවක් තිබුණා, COPE එක ඇතුළේ. අපි ඒ ප්‍රශ්න සියල්ල හඳුනාගෙන තිබෙනවා. ඉදිරියේදී ඒ සියල්ල නිවැරදි කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මැතිවරණයක් ආසන්නව තිබියදී ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට සේවකයින් බඳවා ගැනීම් සිද්ධ කර තිබෙනවා. ඒවා ඉතාම දැඩි විධියට, අක්‍රමවත් විධියට තමයි සිද්ධ කර තිබෙන්නේ. ඒ වාගේ බොහෝ කාරණා එම රෝහල සම්බන්ධව තිබෙනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 4.37]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையில் கலந்துகொண்டு வரையறுக்கப்பட்ட விமான நிலையம் மற்றும் விமான சேவைகள் (இலங்கை) ( தனியார்) கம்பனி தொடர்பான சில கருத்துகளைக் குறிப்பிட விரும்புகின்றேன்.

2020ஆம் ஆண்டு கொரோனா தொற்றுடன், இலங்கை - சவூதி அரேபியாவுக்கான நேரடி விமான சேவையை வழங்கி வந்த சவுதியா, எதிஹாத், கத்தார், எமிரேட்ஸ் ஆகியவற்றின் விமான சேவைகள் இடைநிறுத்தப்பட்டன. தற்போது மிக உயர்ந்த கட்டணத்தில் மட்டுப்படுத்தப்பட்ட விமான சேவையை ரியாத், தமாம் ஆகிய விமான நிலையங்களுக்கு ஸ்ரீ லங்கா எயர்லைன்ஸ் வழங்கி வருகின்றது. சவூதி அரேபியாவில் எமது நாட்டைச் சேர்ந்த சுமார் 3 இலட்சம் பேர் பணிபுரிந்து வருகின்றனர். அதுமாத்திரமல்ல, நமது நாட்டிலிருந்து ஒவ்வொரு வருடமும் சுமார் 3,500 பேர் ஹஜ்ஜுக்கும் 50,000க்கும் அதிகமானவர்கள் உம்ராவுக்கும் சவூதி அரேபியாவுக்குச் செல்கின்றனர். இடைத்தரகர்கள் அற்ற ஓர் ஒழுங்கான, நியாயமான நேரடி விமான சேவையை சவூதி அரேபியா அரசுடன் இணைந்து எமக்கு ஆரம்பிக்க முடியுமானால், ஒருவருக்கான ஹஜ், உம்ரா கட்டணங்களை ஓரிலட்சத்தால் குறைக்க முடிவதுடன், சவூதி அரேபியா நாட்டில் தொழில்புரியும் சுமார் 3 இலட்சம் இலங்கையர்களும் நன்மையடைவார்கள். அதேவேளை, சவூதி அரேபியாவிலிருந்து இலங்கைக்கு வரும் உல்லாசப் பயணிகளின் எண்ணிக்கை அதிகரிப்பதுடன், இலங்கையில் இருந்தான உண்ணாட்டு ஏற்றுமதியையும் பல மடங்கு அதிகரித்து, வெளிநாட்டுச் செலாவணியையும் பல மடங்கு அதிகரிக்கக்கூடியதாக இருக்கும்.

ஏனைய விமான நிலையங்களைத் தொட்டுச் செல்லும் விமான சேவையால் நமது இலங்கை மக்கள் 15-20 மணித்தியாலங்கள் கொழும்பு - அபுதாபி, கொழும்பு - டுபாய், கொழும்பு - பஹ்ரைன், கொழும்பு - சார்ஜா, கொழும்பு - கத்தார், கொழும்பு - ஓமான் ஆகிய விமான நிலையங்களில் தாமதித்து, தங்கி சவூதி அரேபியாவுக்குச் செல்லவேண்டிய நிர்ப்பந்த நிலைக்குத் தள்ளப்பட்டுள்ளனர். எனவே, போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் சவூதி அரேபியாவில் தொழில்புரியும் எமது நாட்டைச் சேர்ந்த 3 இலட்சம் பேரின் நன்மை கருதியும் தொடர்ச்சியாக இலங்கையிலிருந்து உம்ரா, ஹஜ் கடமைகளை நிறைவேற்றச் செல்லும் 85,000 முஸ்லிம் மக்களின் நன்மை கருதியும் ஏற்கனவே இடைநிறுத்தப்பட்டுள்ள இலங்கை - சவூதி அரேபியாவுக்கான நேரடி விமான சேவையை மீண்டும் ஆரம்பிப்பதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இதனால் எமது நாட்டின் பொருளாதார வளர்ச்சி அதிகரிக்கும். இது நமது நாட்டின் பொருளாதாரத்துக்குப் பெரும்பங்காற்றி வருகின்ற இலட்சக்கணக்கானோரின் கோரிக்கையாகவும் இருக்கின்றது. வெளிநாட்டில் வாழுகின்ற நமது இலங்கையர்கள் நீண்ட காலமாக இந்தக் கோரிக்கையை முன்வைக்குமாறு மக்கள் பிரதிநிதி என்ற வகையில் என்னிடம் கூறினார்கள். எனினும், நாட்டின் பொருளாதார நிலையைக் கருத்திற்கொண்டு நாங்கள் அதைத் தாமதித்தோம். இப்போது நல்லதொரு சூழ்நிலை ஏற்பட்டிருப்பதால், இலங்கைக்கும் சவூதி அரேபியாவுக்குமான நேரடி விமான சேவையை மீள ஆரம்பித்து, நேரடியாக ஜித்தாவுக்குப் போகக்கூடிய நிலைமையை ஏற்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, வட, கிழக்கு மாகாணங்களுக்கான உள்ளூர் விமான சேவையை மீள ஆரம்பித்தல் பற்றி கூற விரும்புகின்றேன். யுத்தம் நடந்த காலத்தில்கூட வட, கிழக்கு மாகாணங்களுக்கான உள்ளூர் விமான சேவைகள் இடம்பெற்றன. உதாரணத்துக்கு, இரத்மலானை விமான நிலையத்திலிருந்து அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை, பலாலி போன்ற பிரதேசங்களுக்கு உள்ளூர்

விமான சேவைகள் வாரத்தில் மூன்று தடவை இடம்பெற்றன. இதனால் வட, கிழக்கு மாகாணங்களில் வாழுகின்ற மக்கள் மாத்திரமன்றி, அங்கு செல்கின்ற வெளிநாட்டவர்கள், உயர் அதிகாரிகள், தனவந்தர்கள், தொழில்வழங்குநர்கள் போன்றோர் பாரிய நன்மை அடைந்தார்கள். எனவே, அந்த விமான சேவையை மீண்டும் ஆரம்பிக்க வேண்டுமென நான் வட, கிழக்கு மக்கள் சார்பில் கோரிக்கை முன்வைக்கின்றேன்.

கடந்த காலத்தில் கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு, பொத்துவில், அறுகம்பே போன்ற பிரதேசங்களில் வரையறுக்கப்பட்ட விமான நிலைய மற்றும் விமான சேவைகள் (இலங்கை) (தனியார்) கம்பனி seaplanes சேவையை நடாத்தி வந்தது. தற்போது இந்தச் சேவை இடைநிறுத்தப்பட்டுள்ளது. எனவே, உரிய தனியார் கம்பனியுடன் தொடர்புகளை ஏற்படுத்தி, இடைநிறுத்தப்பட்டுள்ள seaplanes சேவையை மீள ஆரம்பிப்பதற்கான நடவடிக்கைகளை கௌரவ போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். பொத்துவில் என்பது கிழக்கு மாகாணத்தில் உல்லாசப் பிரயாணிகள் அதிகமாக வரும் அறுகம்பே அமைந்திருக்கின்ற பிரதேசமாகும். அந்தப் பிரதேசத்துக்குச் செல்கின்ற வெளிநாட்டவர்கள் மாத்திரமன்றி, கொழும்பில் இருக்கின்ற தனவந்தர்களும் ஏனையவர்களும் இந்த seaplanes சேவையால் பிரயோசனம் அடைந்திருக்கிறார்கள். எனவே, இந்தச் சேவையை மீண்டும் ஆரம்பிப்பதற்கான நடவடிக்கைகளை கௌரவ போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமென கேட்டுக் கொள்கின்றேன். நாடு பொருளாதார ரீதியில் வளர்ச்சியடைந்து நல்ல நிலைக்கு வரும்போது, நாங்கள் இவ்வாறான வசதிகளை உருவாக்கிக் கொடுத்தால், எமது நாட்டின் பொருளாதாரம் இன்னும் வளர்ச்சி அடையும் என்பதை உங்களுக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் கிழக்கு மாகாண வீதி அபிவிருத்தி அமைச்சராகவும் நீர்ப்பாசன அமைச்சராகவும் இரண்டு தடவை பணிபுரிந்து இருக்கின்றேன். அந்தக் காலத்தில் சாதி, பேதம் இல்லாமல் எல்லா மக்களுக்கும் பணி செய்திருக்கிறேன். எனது சொந்த ஊரான அட்டாளைச்சேனையில் ஓர் ஆறு இருக்கிறது. நான் கிழக்கு மாகாணத்தில் பல இடங்களுக்கும் போயிருக்கிறேன். அங்கு ஆறுகள் இருக்கின்றன. ஆற்றுக்கு நடுவில் கிராமங்கள், பிரதேசங்கள் இருக்கின்றன. ஆனாலும், ஓர் ஊரின் ஆரம்பத்தில் இருந்து முடிவு வரை ஊருக்கு நடுவால் ஓர் ஆறு செல்வதை நான் எனது ஊரில் தவிர வேறு எங்கும் காணவில்லை. எங்களுடைய ஊரிலுள்ள அந்த ஆற்றை அகலமாக்கி, அழகுபடுத்தி அதில் seaplanes சேவையை மேற்கொள்வதற்கான ஏற்பாடுகளை நாங்கள் செய்தோம். ஆனாலும், அரசியல் மாற்றங்கள் மற்றும் ஏனைய காரணங்களால் அது சாத்தியப்படவில்லை. இப்போது நல்ல சூழ்நிலை ஏற்பட்டு இருக்கின்றது. அட்டாளைச்சேனை யிலுள்ள கோணாவத்தை ஆற்றில் அந்த seaplanes திட்டத்தைச் செய்யாவிட்டாலும், அட்டாளைச்சேனை, அக்கரைப்பற்றுப் பிரதேசத்தில் இருக்கின்ற சம்புக்களப்பு ஆற்றிலாவது அதனைச் செய்ய வேண்டும். ஏனெனில், அங்கு எல்லா வசதிகளும் இருக்கின்றன. அக்கரைப்பற்று பட்டியடிபிட்டியில் இருந்து அட்டாளைச்சேனை சம்புக்களப்பு வரை அந்த ஆறு இருக்கின்றது. அதில் எந்நேரமும் நீர் இருக்கிறது. எனவே, சம்புக்களப்பு பிரதேசத்தில் seaplanes சேவைக்கான வசதியைச் செய்து கொடுக்கும்போது, அங்கு பொருளாதார அபிவிருத்தி ஏற்படுவதோடு, உல்லாசப் பிரயாணிகளின் வருகையும் அதிகரிக்கும். அதுமாத்திரமல்ல, அந்தப் பிரதேசத்தில் இருக்கின்ற காணிகளும் உல்லாசப் பிரயாணத்துறை சார்ந்து அபிவிருத்தி அடையும். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இதனைச் செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, இங்கு உரையாற்றிய சிலருடைய பேச்சுக்களைக் கேட்கும்போது கவலையாக இருக்கின்றது. இது பற்றி நான் இதற்கு முன்னரும் சொல்லியிருக்கிறேன். இந்தப் பாராளுமன்றம் ஒரு வரலாற்றுப் பாராளுமன்றம்! பத்தாவது பாராளுமன்றம் என்பது விசேடமான ஒரு பாராளுமன்றம்! இந்தப் பாராளுமன்றத்தில் எத்தனை தலைவர்கள் பேசியிருப்பார்கள்; எத்தனை சமூகங்களுடைய தலைவர்கள் பேசியிருப்பார்கள். அவர்களுடைய ஓசைகள் இங்குள்ள காற்றில் கலந்திருக்குமென நான் நினைக்கிறேன். இந்த நாட்டிலுள்ள ஒவ்வொரு சமூகம் தொடர்பான விடயங்கள், வரலாறுகள் என்பன இங்கு பேசப்பட்டு இருக்கிறது. ஒவ்வொருவருக்கும் ஒவ்வொரு சந்தர்ப்பத்தை இறைவன் தந்திருக்கிறான். பரம்பரை பரம்பரையாக அரசியலில் ஈடுபட்ட பெருந்தலைவர்கள், கோடீஸ்வரர்கள் என 150க்கும் மேற்பட்டவர்கள் கடந்த பொதுத் தேர்தலில் தோற்கடிக்கப் பட்டு, நான் உட்பட 225 பாராளுமன்ற உறுப்பினர்கள் இந்தப் பத்தாவது பாராளுமன்றத்துக்குத் தெரிவாகி வந்திருக்கிறோம். இது இறைவனுடைய தீர்ப்பு என்பதை நாங்கள் ஏற்றுக்கொள்ள வேண்டும். இங்கு பேசுகின்ற உறுப்பினர்கள் ஒழுங்கைப் பேண வேண்டும். மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்த நாட்டின் சனாதிபதியாக வருவாரென நீங்கள் யாராவது நினைத்திருப்பீர்களா? அவராவது நினைத்திருப்பாரா? இல்லை! அவர் நீண்ட காலம் எதிர்க்கட்சியில் இருந்து நியாயத்துக்காகப் போராடினார்; குரல்கொடுத்தார். காலப்போக்கில் அவருடைய கட்சி வளர்ச்சியடைந்து, இன்று 159 பாராளுமன்ற உறுப்பினர்களுடன் அவர் ஆட்சியமைத்து இருக்கிறார். இங்கு இருக்கின்ற அமைச்சர்கள் யாராவது நினைத்திருப்பார்களா, வாழ்நாளில் தாங்கள் அமைச்சராக வருவோம் என்று? இல்லை! அநுர குமார திஸாநாயக்க என்ற தனி ஆளுமைமீது கொண்ட விசுவாசத்தின் காரணமாக இந்த நாட்டு மக்கள் உங்களுக்கு வாக்களித்தார்கள். அதனால்தான் இன்று நீங்கள் சபாநாயகராக, அமைச்சர்களாக, பிரதி அமைச்சர்களாக இருக்கின்றீர்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක්වත් දෙන්න. මම මේ සභාව සම්බන්ධයෙනුයි කථා කරන්නේ. මගේ ප්‍රශ්නයක් ගැන මම කථා කළේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා හොඳට කථා කරන්න. උඩේට සභාව දිහා බලන්න. මේ මන්ත්‍රීවරු සියලුදෙනාට ගෞරවයක් තිබෙන්න ඕනෑ. මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් කරුණාකර කථා කරන්න. ඒවාට විසඳුමක් දෙන්න කියලා ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලන්න, විපක්ෂයේ කට්ටිය. විපක්ෂයයි, ආණ්ඩු පක්ෂයයි හොඳට ඉන්න ඕනෑ. අද උඩේ ගැලරියේ ඉඳන් කොච්චර පාසල් ළමයි ප්‍රමාණයක් මේ සභාව දිහා බලාගෙන හිටියාද? ඒ වාගේ වෙලාවක අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගහ ගන්න වාගේ කුණුහරුප කියමින් හැසිරුණොත් ඒක හොඳ නැහැ. මූලාසනයෙන් තමයි ඒක

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

කන්ට්‍රෝල් කරන්න ඕනෑ. කවුරු වුණත් කමක් නැහැ. අද උදේ පාසල් දරුවන් 500ක් විතර මේ ගැලරියේ ඉඳන් සභාවේ වැඩ කටයුතු දිහා බලාගෙන හිටියා. ඒ දරුවන් පාසලට ගිහිල්ලා මොකක්ද කියන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පාසලේ විදුහල්පතිතුමා හමු වුණාම ඒ දරුවන් කියන්නේ මොකක්ද? "අපි පාර්ලිමේන්තුව බලන්න ගියා, ඒ වෙලාවේ මන්ත්‍රීවරු ගහ ගත්තා; නරක වචන කිව්වා" කියලා තමයි ඒ දරුවන් කියන්නේ. ඒ නිසා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සිදු කරනකොට සියලුදෙනාම පරිස්සමෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.48]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව සම්බන්ධයෙන් අද අපි විවාද කරනවා. අද උදෑසන ඉඳලා පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු සියලුදෙනාම පාහේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් වුණු බොහෝ ආයතන සම්බන්ධයෙන්, ඒවායේ තිබෙන මූල්‍ය අක්‍රමිකතා, වංචා හා දූෂණ සම්බන්ධයෙන් කථා කළා. මමත් පොඩි අවස්ථාවක් ගන්නම්, අප විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශනයට ලක් කළ මහපොළ උසස් අධ්‍යාපන අරමුදල සම්බන්ධයෙන් සිදු වූ යම් අක්‍රමිකතාවක් ගැන කියන්න. මහපොළ උසස් අධ්‍යාපන අරමුදල තමන්ගේ මුදල් රුපියල් මිලියන 1,438ක් වියදම් කරලා, මහපොළ භාරකාර අරමුදලට අයත් ඉඩමක තොරතුරු තාක්ෂණ ආයතනයක් එහෙම නැත්නම් SLIIT නමින් තමන්ගේ උප සමාගමක්, ආයෝජන සමාගමක් විධියට ආරම්භ කරනවා. විවිධ තාක්ෂණික පාඨමාලා සඳහා සිසුන්ගෙන් මුදල් අය කර ගනිමින් මේ SLIIT එක ඇතුළේ විවිධ පාඨමාලා පවත්වාගෙන යනවා.

ටික කාලයක් යනකොට SLIIT එක ඉතා හොඳ ආදායමක්, ලාභයක් උත්පාදනය කරන ආයතනයක් බවට පත් වෙනවා. එහි අධ්‍යක්ෂ මණ්ඩලයට හිතෙනවා, මේ විධියට ආදායම් උත්පාදනය කරන මේ ආයතනය පෞද්ගලික ආයතනයක් බවට තමන්ටම පත් කර ගන්න තිබෙනවා නම් ඒක හොඳ ආයෝජනයක් කියලා. එම අධ්‍යක්ෂ මණ්ඩලය ඒ විධියට දැකපු නිසා එදා පැවති ආණ්ඩුව සමඟ, විශේෂයෙන්ම 2015 අවුරුද්දේ විවිධ ගිවිසුම් කිහිපයකට අත්සන් කරලා අවසාන වශයෙන් එකඟතාවකට එනවා, SLIIT එක, මහපොළ භාරකාර අරමුදලට ඒ කියන මුදල ගෙවලා, ඔවුන් විසින් තක්සේරු කරන මුදල ගෙවලා, තමුන්ට අවශ්‍ය නම් පෞද්ගලික ආයතනයක් බවට පත් වෙන්න පුළුවන් කියලා. ඒකේදී සිදු කර තිබෙන විශේෂ කාර්යය මෙයයි. SLIIT එක මහපොළ භාරකාර අරමුදල යටතේ තිබෙන වෙලාවේ උපයන ලද ආදායම්, ලාභ කිසිවක් මහපොළ භාරකාර අරමුදලට නොගෙවා රඳවා තියාගෙන ඉඳලා, අවසාන වශයෙන් අන්න අර ගිවිසුම් ප්‍රකාරව තමන් මහපොළ භාරකාර අරමුදලට දෙන්න තිබුණු මුදලින්ම මෙන්න මේ කියන දේපළ, වත්කම් සම්බන්ධයෙන් තිබෙන ගෙවීම කරලා, අද පෞද්ගලික ආයතනයක් බවට පත් කරගෙන රිසි පරිදි තමන්ගේ වැඩ ටික කරගෙන යනවා. අද උදේ ඉඳලා කථා කරපු බොහෝ අක්‍රමිකතා ඇතුළේ තිබුණු තව එක අක්‍රමිකතාවක්, එහෙම නැත්නම් වංචාවක් සම්බන්ධයෙන් කරපු හෙළිදරව්වක් තමයි මේක.

විශේෂයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව අද දවසේ සභාගත කරලා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, එහෙම නැත්නම් COPE එකේ ප්‍රගමනය සම්බන්ධයෙන් අපේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම විශේෂ පැහැදිලි කිරීමක්, හැඳින්වීමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විධියටත්, විපක්ෂයේ මන්ත්‍රීවරු විධියටත් දෙපැත්තක වාඩි වෙලා විවිධ කාරණා, විෂයයන්, එහෙම නැත්නම් ගැටලු සම්බන්ධයෙන් තර්ක විතර්කවල යෙදෙනවා. හැබැයි, ආණ්ඩු පක්ෂය ලෙසත්, විපක්ෂය ලෙසත් අපට ගැටෙන්න බැරි, තර්ක විතර්ක කරන්න බැරි යම් පොදු කරුණක් තිබෙනවා. රටේ දූෂණය, වංචාව පිටු දකිනවා කියන මාතෘකාව යටතේ අපට ආණ්ඩු පක්ෂය, විපක්ෂය විධියට තර්ක විතර්ක කරන්න අයිතියක් නැහැ. රටේ දූෂණය, රටේ මුදල් අවභාවිතය, මහජන දේපළ, වත්කම් අවභාවිතය පිටු දකිනවා කියන මාතෘකාව ගත්තොත්, ඒ මාතෘකාව යටතේ පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ආණ්ඩු පක්ෂයේ අපටත්, විපක්ෂයේ ඔබටත් තර්ක විතර්ක කරන්න, විවාද, සංවාද පවත්වන්න අයිතියක් නැහැ.

මේ පාර්ලිමේන්තුවට එන හැම මන්ත්‍රී කෙනෙකුටම යුතුකමක් තිබෙනවා. තමන්ට ඡන්දයක් දීලා තමන්ව මේ පාර්ලිමේන්තුවට එවපු ඒ හැම මනුස්සයෙකුගේම, එහෙම නැත්නම් හැම ඡන්ද දායකයෙකුගේම අවසාන අරමුණ වන තමන්ට යහපත් රටක්, සුන්දර රටක් නිර්මාණය කර ගැනීම සම්බන්ධව දැකපු ඒ සුබ සිහිනය, ඒ සුබ අරමුණ ඉටු කර දීමේ වගකීමක් පාර්ලිමේන්තුවේ ඉන්න පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් වන අපි හැම දෙනාටම තිබෙනවා. ගොඩක් වෙලාවට පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් වන අපි හැමෝම වාගේ කැමැතියි, විශේෂයෙන් විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් කැමැතියි, තමන් මේ පාර්ලිමේන්තුව තුළ කරන කථාවක්, එහෙම නැත්නම් ඒකෙන් උපුටා ගත් යම්කිසි voice-cut එකක් කිසියම් මාධ්‍යයක, රූපවාහිනී නාළිකාවක, පත්තරයක, එහෙම නැත්නම් FB එකේ, එහෙම නැත්නම් YouTube එකේ ප්‍රචාරය වෙනවා නම්. අන්න, ඒ මාධ්‍ය ප්‍රචාරණ උදව් කර ගෙන තමන්ගේ පෞද්ගලික දේශපාලන ප්‍රතිරූපය ගොඩ නඟා ගන්න දරන ප්‍රයත්නයක් අපි මේ විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ගෙන් දකිනවා. හැබැයි, අපි ඒ විධියට තමන්ගේ පෞද්ගලික දේශපාලන ප්‍රතිරූපය ගොඩ නඟා ගන්න දරන උත්සාහය තුළ අපට ඡන්දය දීලා, අපට බලයක් දීලා තමන්ගේ සුබ සිහින සැබෑ කර ගන්න, ඉටු කර ගන්න බලාපොරොත්තුවෙන් පාර්ලිමේන්තුවට එවූ ජනතාවගේ බලාපොරොත්තු සුන්වෙලා යනවා නම්, ඒ ජනතාවගේ අවසාන අරමුණ බොඳවෙලා යනවා නම් අපට අයිතියක් නැහැ, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු විධියට ඒ විධියට කටයුතු කරන්න.

අපිව පාර්ලිමේන්තුවට එවූ ජනතාව විශ්වාස කරනවා, - මෙතැන අපි කියලා කියන්නේ ආණ්ඩු පක්ෂයේ ඉන්න 159දෙනා

විතරක් නොවෙයි. "අපි" කියන වචනයෙන් අර්ථවත් වෙන්නේ පක්ෂ, විපක්ෂ අපි 225දෙනාම- අපි බිමේදි පාට, පක්ෂ විධියට වෙන් වෙලා හිටියාට අපි 225දෙනාම මේ පාර්ලිමේන්තුව ඇතුළට ගිහිල්ලා ජනතාවට අවශ්‍ය කරන ඒ යහපත් රට, ලස්සන රට බිහි කරන්න අවශ්‍ය කරන අරගළය, එහෙම නැත්නම් අවශ්‍ය කරන වටපිටාව පාර්ලිමේන්තුව තුළ බිහි කරයි කියලා. ඒ නිසා වංචාවෙන්, දූෂණයෙන්, අල්ලසින් තොර රටක් බිහි කරන්න දරන මේ ප්‍රයත්නයේදී විපක්ෂයේ, අර මම කිව්වා වාගේ මාධ්‍ය තුළින් තමන්ගේ පෞද්ගලික දේශපාලන ප්‍රතිරූපය ගොඩ නඟා ගන්න දරන උත්සාහය ඇතුළේ අපේ ජනතාවගේ, එහෙම නැත්නම් අපට ඡන්දය දුන් ඡන්ද දායකයාගේ හීනය බොඳ වෙනවා නම් ඒ සම්බන්ධයෙන් අපට වගවීමක්, වගකීමක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ අනිවාර්යයෙන් තිබෙන්න ඕනෑ.

අද අපි රටේ මූල්‍ය විනය සම්බන්ධයෙන්, රටේ මූල්‍ය විනය ගැන ප්‍රශ්න කිරීම සම්බන්ධයෙන්, මූල්‍ය විනයට අදාළ අණපනත් සම්මත කිරීම සම්බන්ධයෙන්, COPE එක, අනෙක් පැත්තෙන් COPA එක සහ අපේ විගණකාධිපති කාර්යාලය ඇතුළු සියලු ආයතන එකතු වෙලා නව දේශපාලන සංස්කෘතියක් ගොඩ නඟමින් යන කාලයක්, මේක. අපි එසේ ගොඩ නඟන දේශපාලන සංස්කෘතිය ඇතුළේ සියලුදෙනා නීතියට යටත් විය යුතුයි, සියලුදෙනා තමන්ගේ මූල්‍ය කටයුතුවලදී, එහෙම නැත්නම් රාජ්‍ය මූල්‍යකරණයේදී විනිවිදභාවයකින් යුක්ත විය යුතුයි කියන කරුණ, කොන්දේසිය තුළ තමයි මේ සංස්කෘතිය බිහි කරමින් ඉදිරියට යන්නේ.

ඒ නිසා ආණ්ඩු පක්ෂය විධියට මේ සංස්කෘතිය බිහි කරනකොට විපක්ෂය විධියට ඒ සංස්කෘතියට දායක වෙන්න විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා. අපි පෞද්ගලිකව මොන මොන පක්ෂවලින් ආවත්, බිමේ ඉන්න ජනතාව පක්ෂ, පාටවලට බෙදිලා හිටියත් ඒ ජනතාවගේ ඇත්ත ජීවිතය අපි හිතනවාට වඩා ගොඩක් පහත් තැනක තිබෙන්නේ. ඒවා හරි දුක්ඛදායී ජීවිත. ඒ ජීවිතවල තිබෙන දුක්ඛදායී බව අපිට මතුපිටින් අතපත ගාලා විසඳන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපිට සිද්ධ වෙනවා, ඇත්ත උත්තර -ඇත්ත පිළිතුරු- ඒ ජීවිතවලට ලබා දෙන්න. ඒ නිසා ඒ ජීවිත මේ තිබෙන තත්ත්වයෙන් ඉහළට අරන් ගිහිල්ලා යහපත් තැනක ස්ථානගත කිරීමේ වැයමේදී ජාතික ජන බලවේගයේ; ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විතරක් නොවෙයි, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගේත් උර මත ඒ වගකීම ඒ විධියටම පැටවෙනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අපි වාද කරමු, විවාද කරමු. නමුත් අපි වාද-විවාද කරන අතරතුර අපේ පෞද්ගලික දේශපාලන භාවිතයට එහා ගියපු සෑම කාර්යයකදීම ඉස්සරහින් තියාගන්න ඕනෑ කරුණු කිහිපයක් තිබෙනවා. එහි පළමුවැනි දේ තමයි, කුමන පෞද්ගලික දේශපාලන මතිමතාන්තර තිබුණත්, න්‍යාය පත්‍ර තිබුණත් සෑම දේකටම වඩා ඉදිරියෙන් තිබෙන්න ඕනෑ "මගේ රට" කියන සංකල්පය. රට එකට තිබෙන්න ඕනෑ, රටේ දරුවන්ගේ ජීවිත ඉදිරියෙන් තිබෙන්න ඕනෑ, අනාගත පරම්පරාව තිබෙන්න ඕනෑ. අනාගත පරම්පරාවට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" බිහි කර දීම කියන අරමුණ අපේ මේ පෞද්ගලික දේශපාලන අභිමතාර්ථවලට ඉදිරියෙන් තිබෙන්න ඕනෑ කියන අදහසයි පෞද්ගලිකවම මට තිබෙන්නේ.

අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට මේ රටේ දරුවන්ට වගකියන, අපිට එදා ගොඩනඟා ගන්න බැරි වෙච්ච, නමුත් අනාගත පරපුරට ගොඩනඟා දෙන්න උත්සාහ දරන පොහොසත් රට, ලස්සන ජීවිතය උරුම කරලා දෙන්න දරන වැයමට සහාය දෙන්න කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අපි ගෞරවයෙන් ආරාධනා කරනවා. ඒකට හේතුව, කුමන මාතෘකා සම්බන්ධයෙන් මත ගැටුම් තිබුණත්, අපිට මත ගැටුමක් නැතුව යන්න පුළුවන් එකම මාතෘකාව රටේ වංචාව, දූෂණය පිටු දකිනවා කියන මාතෘකාව වීමයි. රටේ වංචාව, දූෂණය පිටු දකින්න අපිත් එක්ක එකතු වෙලා මේ යන නව වැඩ පිළිවෙළට එකතු වෙන්න කියාත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ මෙතැනින් ඉදිරියට ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් දක්වමින්, යහපත් අත්වැල් බැඳ ගැනීමක් කරන්න කියලා ඔබ තමුන්නාන්සේලාටත් ආයාචනා කරමින්, ආරාධනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.59]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் ஊழல் ஒழிப்பு சம்பந்தமாக, ஊழலுக்கு எதிரான நடவடிக்கைகளை மேற்கொள்வதற்காகத் தற்போதுள்ள நிலையியற் கட்டளையில் திருத்தங்களைக் கொண்டுவருவது சம்பந்தமாக விவாதித்துக் கொண்டிருக்கின்றோம். உண்மை யில் இந்த நாட்டை ஊழலற்ற ஒரு நாடாக மாற்றுவதற் காகத்தான் மக்கள் உங்களுக்கு ஆணை வழங்கினார்கள். அந்த அடிப்படையில், ஊழலை ஒழிக்க வேண்டிய கடப்பாடு உங்களுக்கு இருக்கின்றது. அந்த வகையிலே, இது பற்றிய உங்களுடைய தொடர்ச்சியான செயற்பாடுகளுக்கு நான் இந்த இடத்தில் நன்றியைக் கூறினாலும், இந்த அரசாங்கத்திலும் இன்றும் பல ஊழல்வாதிகள் தங்களுடைய கெட்டித் தனத்தினால் ஊழல்களைச் செய்வதற்கும் செய்த ஊழலிலிருந்து தப்புவதற்கும் தயாராகிக் கொண்டிருக் கிறார்கள். அதேநேரத்தில், அதற்கு இடங்கொடுக்கும் விதமான செயற்பாடுகளையும் எங்களால் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. அவற்றை உங்களுடைய ஆட்சிக்காலம் முடிந்த பிறகுதான் நீங்கள் உணருவீர்கள்!

அந்த நிலை இல்லாமல் தற்பொழுதே எந்த நோக்கத்தைக் கூறி நீங்கள் ஆட்சிக்கு வந்தீர்களோ அந்த நோக்கத்தை நிறைவுசெய்யும் விதமாக, கடந்த கால ஊழல்களைக் கண்டுபிடித்து நடவடிக்கை எடுப்பதோடு, இனிமேல் ஊழல் நடைபெறாத வண்ணம் உங்களுடைய நடவடிக்கைகள் அமைய வேண்டும். அப்படி ஊழல் நடந்தால், யார், எந்தக் கட்சிக்காரர் என்ற எந்தவித பாகுபாடுகளோ, பாரபட்சமோ இல்லாமல் நடவடிக்கை எடுக்க வேண்டும். இதுதான் மக்களுடைய எதிர்பார்ப்பு. எனவே, உங்களுடைய செயற் பாடுகள் அதற்கேற்ற வகையில் அமைய வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

நான் கௌரவ ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களை இந்த இடத்தில் பாராட்டுகின்றேன். மிகவும் பாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்ற பலஸ்தீன மக்களுக்காக அவர் UNGAஇல் உரிய முறையில் குரல் கொடுத்தமைக்காக எனது பாராட்டுகளையும் நன்றிகளையும் இந்த இடத்தில் மீண்டும் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதேநேரத்தில், அந்த மக்களுக்குக் கொடுமைகளை, அட்டூழியங்களைச்

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

செய்கின்ற இஸ்ரேல் நாட்டவர்கள் தற்பொழுது இங்கும் வந்து தங்களுடைய கைவரிசைகளைக் காட்டுகின்ற முயற்சிகளை எடுக்கின்றார்கள். "கடந்த கால அரசாங்கம் அதற்கு அனுமதி கொடுத்தது. கடந்த கால அரசாங்கம் செய்ததை நாங்கள் ஒன்றும் செய்ய முடியாது" என்று கைகட்டிப் பார்த்து கொண்டிராமல், உரிய நடவடிக்கைகளை நீங்கள் எடுக்க வேண்டும். அவர்கள் இங்கே வந்து 'வீசா' புதுப்பிக்காமல் இருக்கிறார்கள்; அவர்கள் இருக்கின்ற பகுதிகளுக்கு மக்கள் செல்ல இயலாமல் இருக்கின்றது. இப்படிப் பல பிரச்சினைகள் இருக்கின்றன. அதற்காக நான் நேடியாக இந்த அரசாங்கத்தைக் குற்றஞ்சாட்டவில்லை. கடந்த காலத்தில் விட்ட பிழைகளைச் சரி செய்வதற்காகத்தான் நீங்கள் வந்திருக்கிறீர்கள். நீங்களும் அதையே மறுபடியும் சொல்லிக் கொண்டிருக்காமல், உரிய நடவடிக்கைகளை மேற் கொள்ளுங்கள்!

அடுத்து, எங்களுடைய மன்னார் தீவை எடுத்துக் கொண்டால், அது இன்று அழிவடையக்கூடிய நிலையில் இருக்கின்றது. இந்த விடயத்தில் கடந்த கால அரசாங்கம் விட்ட பிழையை இந்த அரசாங்கமும் விடுவதாகத்தான் நான் கருதுகிறேன். அதாவது, அங்கு நிறுவப்படவுள்ள காற்றாலை தொடர்பில் மக்கள் கிட்டத்தட்ட 55 நாட்களாகப் போராட்டக் களத்தில் இருக்கின்றார்கள். அங்குள்ள மக்கள் பிரதிநிதிகளும் உயர்மட்ட அரச அதிகாரிகள் குழுவும் மாண்புமிகு ஜனாதிபதி அவர்களைச் சந்தித்து இது சம்பந்தமாகக் கதைத்திருக் கிறார்கள். கௌரவ அமைச்சர் அவர்களையும் நாங்கள் சந்தித்தோம். இது சம்பந்தமாக நிபுணர் குழு ஒன்று நியமிக்கப்பட்டு அதன் பரிந்துரையின்படி நல்லதொரு முடிவு எடுக்கப்படுமென மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சொன்னார். கடைசியாக இந்தத் திட்டத்தை ஆரம்பிப் பதற்கான அங்கீகாரத்தைத்தான் வழங்கியிருக்கிறார். நாங்கள் இதை எதிர்பார்க்கவில்லை. மன்னார் மாவட்டத்தில் பல இடங்கள் இருக்கின்றன. தீவுக்குள்தான் அந்தக் கோபுரங்களை அமைக்க வேண்டுமா? தீவுக்குள் மட்டும்தானா காற்று வீசுகிறது?

ஏற்கனவே கடந்த கால அரசாங்கங்களால் அந்தத் தீவின் ஒரு பகுதியில் கிட்டத்தட்ட 30 காற்றாலை மின் கோபுரங்கள் நிறுவப்பட்டுள்ளன. இரண்டாம் கட்டத்துக்காக கடந்த கால அரசாங்கம் நான்கு கோபுரங்களுக்கான அனுமதியைத்தான் வழங்கியது. முன்னைய அரசாங்க காலத்தில் tender கோரப்பட்டாலும், அதில் ஏற்பட்ட முறைகேடுகள், பிரச்சினைகள் காரணமாக அப்போது ஒப்பந்தம் செய்து முடிக்கப்படவில்லை. ஆனால், புதிய அரசாங்கம் வந்துதான் 10 காற்றாலை மின் கோபுரங்களுக்கான ஒப்பந்தத்தைச் செய்து முடித்தது. அப்படிச் செய்துவிட்டு கடந்த கால அரசாங்கத்தின்மீது பழி சொல்லாதீர்கள்! அந்த தீவுக்குள் அதனை அமைக்க வேண்டாம் என்றுதான் அங்குள்ள மக்கள் கூறுகின்றார்கள். ஏனென்றால், அங்கு காற்றாலை அமைப்பதற்கான நிலத்தன்மை இல்லை. அந்தத் தீவின் வடக்குக்கும் தெற்குக்கும் இடையிலான அகலம் 4 கிலோமீற்றர்தான். அதில் தென் கடற்கரைப் பகுதியை அண்மித்து ஏற்கனவே கிட்டத்தட்ட 30 காற்றாலைகள் அமைக்கப்பட்டு இருக்கின்றன. மறுபடியும் 4 காற்றாலை களுக்கு அனுமதி வழங்கப்பட்டிருக்கின்றது. அதைவிட அதிகமாக காற்றாலைக் கோபுரங்கள் அமைக்கப்பட இருப்பதற்கு எதிர்ப்புத் தெரிவித்தே அந்த மக்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருக்கின்றார்கள்.

நாங்கள் கடந்த காலத்திலும் சரி, மாவட்ட ஒருங் கிணைப்புக் கூட்டத்திலும் சரி, இதற்கான எந்தவோர் அனுமதியும் கொடுக்கவில்லை. எந்தவித கட்சிப் பாகுபாடும் இல்லாமல் சகலரும் அந்தத் திட்டத்துக்கு எதிர்ப்புத் தெரிவித்திருந்தார்கள்; இன்றும் அதே நிலைப்பாட்டில்தான் இருக்கிறார்கள். உங்களுடைய NPP அரசாங்கத்தைச் சார்ந்த அந்த மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவர்கூட அதற்கான அனுமதியைக் கொடுக்கவில்லை. ஏனென்றால், அந்த மக்களின் எதிர்ப்பு அந்தளவுக்கு இருந்தது. இன்று அந்த தீவு அழியக்கூடிய நிலைமையில் இருக்கின்றது. இந்த நிலைமையைச் சிந்திக்காமல் இந்த அரசாங்கம் இப்படிச் செய்வது மிகவும் ஆச்சரியமாக இருக்கின்றது. நான்கு காற்றாலைகளுக்கான ஒப்பந்தமே முடிக்கப்பட்டிருந்தது. நீங்கள் இன்னும் 10 கோபுரத்துக்கான அனுமதியை வழங்கி யிருக்கிறீர்கள்; அதை நீங்கள் நிறுத்தியிருக்கலாம்.

அன்று மாண்புமிகு ஜனாதிபதி அவர்கள் எங்களை அழைத்து, இந்தத் திட்டத்தைச் செய்யாவிட்டால், 2028ஆம் ஆண்டு நாங்கள் இருளில் மூழ்கவேண்டி வரும் என்ற அடிப்படையில் இதைச் செய்துதான் ஆக வேண்டுமெனச் சொல்லியிருந்தார். நாங்கள் இதைத் தீவுக்குள் அமைக்காது அதற்கப்பால் உள்ள பிரதேசங்களில் அமையுங்கள் என்றுதான் சொல்கிறோம். மன்னார் வட பகுதியில் தள்ளாடியில் இருந்து வெள்ளாங்குளம் வரைக்குமான பகுதிகளில் எவ்வளவு காற்றாலைகளை அமைக்க முடியும்! அதேபோன்று, முள்ளிக்குளத்தில் இருந்து காரைதீவு வரைக்குமான பகுதிகள் காடுகளாக இருக்கின்றன. அந்தப் பகுதியில் எவ்வளவோ காற்றாலை மின் கோபுரத்தை அமைக்க முடியும். அதைவிடுத்து, மக்களைச் சிரமப்படுத்தி, அவர்கள் விரும்பாததை ஏன் செய்கின்றீர்கள்? எங்களுடைய இளைஞர்கள், மக்கள், மதகுருமார் மற்றும் மக்கள் பிரதிநிதிகள் எல்லோரும் இது சம்பந்தமாக ஆழ்ந்த கவலையைத் தெரிவித்து, அதற்கான விபரங்களையும் கூறியிருந்தோம். ஆகவே, அந்த 10 காற்றாலைகளையும் தீவுக்குள் அமைக் காமல், ஏனைய பகுதிகளில் அமையுங்கள் என மாண்புமிகு ஜனாதிபதி அவர்களிடத்திலும் உரிய அமைச்சர் அவர்களிடத்திலும் இந்த அராசங்கத்திடமும் தயவாகக் கேட்டுக் கொள்கிறேன்.

இந்த நாட்டின் பொருளாதாரம் உயராமல் இருப்பதற்கும் மக்கள் மின்சாரம் இல்லாமல் இருளில் இருப்பதற்கும் மன்னார் மாவட்ட மக்கள் விரும்ப மாட்டார்கள். அவர்கள் மக்களுடைய நன்மைக்காக எதையும் செய்யக் கூடியவர்கள். இன்று அவர்களுடைய தொழிலே அழிந்திருக்கின்றது. கடந்த காலங்களில் கூடுதலாக வருமான வரி செலுத்தியவர்கள் மன்னார் மாவட்ட மீனவர்கள். இன்று அவர்களுடைய நிலைமையைப் பாருங்கள்! நாங்கள் இதைத்தான் சொல்கின்றோம். இது சம்பந்தமாகக் கலந்துரையாடுவதற்காக நாங்கள் கௌரவ அமைச்சர் அவர்களுடன் பல இடங்களுக்குச் சென்றோம். குறிப்பாக, மன்னார் தீவுக்குள் இருக்கின்ற சவுத்பார், தாழ்வுபாடு, தோட்டவெளி, ஓலைத்தொடுவாய், பேசாலை போன்ற பல இடங்களுக்கு கௌரவ அமைச்சர் அவர்களை அழைத்துச் சென்று மக்களுடைய கருத்துகளைக் கேட்டறிந்தோம். அந்த மக்களுடைய எதிர்ப்பு எப்படி இருந்ததென அவருக்குத் தெரியும். உண்மையில் அங்குள்ள நிலைமைகளைப் பேசாலை இளைஞர்கள் மிகவும் அழகாகத் தெளிவு படுத்தினார்கள். அதனால் காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை மன்னார் தீவுக்குள் செய்ய வேண்டாம்.

ஏனென்றால், அந்தப் பிரதேச மக்கள் 2 வருடங்களுக்கு முன்னர் பாரிய வெள்ள அனர்த்தத்தால் பாதிக்கப்பட்டார்கள்.

நான்கு மாதங்களாக அந்தப் பிரதேசம் வெள்ளத்தில் மூழ்கியிருந்தது. அந்த நிலைமையைக் காரணமாக வைத்துத் தான் அவர்கள் இந்தக் காற்றாலைத் திட்டத்தைக் கடுமையாக எதிர்க்கின்றார்கள். அதிலும் குறிப்பாக, மன்னார்த் தீவிலேயே கூடுதலாக மக்கள் வாழுகின்ற பகுதி பேசாலைதான். "காற்றாலை மின் உற்பத்தித் திட்டத்தைத் தயவுசெய்து மன்னார் தீவுக்குள் செய்யாதீர்கள்! மன்னார் தீவுக்கு அப்பால் உள்ள ஏனைய பகுதிகளில் செய்யுங்கள்!" என்று அந்த மக்களும் சொன்னார்கள். இங்கு சிலர் அவுஸ்திரேலியாவிலும் இதேபோன்ற திட்டம் செயற்படுத்தப்படுவதாகச் சொன்னார்கள். அவுஸ்திரேலியாவிலே இதேபோன்ற திட்டம் செயற்படுத்தப்படுகின்ற இடங்கள் பற்றி விசாரித்தால், அவை மக்களின் குடிமனைகள் இல்லாத பகுதிகளாகத்தான் காணப்படுகின்றன. குடிமனைகள் உள்ள பகுதிகளில் அங்குள்ள மக்கள் அதனை அமைக்க விடமாட்டார்கள்; அமைக்கவும் முடியாது.

மக்களுக்காகச் செயற்படத்தான் நீங்கள் ஆட்சிக்கு வந்திருக்கின்றீர்கள். கடந்த கால அரசாங்கத்தின் நிலைமைகள் என்னவென்பது உங்களுக்குத் தெரியும்! எனவே, மேற்கூறிய நிலைமைகளைக் கருத்திற்கொண்டும் மக்களுடைய நன்மையைக் கருதியும் இந்தத் திட்டத்தை மன்னார் தீவுக்குள் அமைக்காமல் அதற்கு அப்பாலுள்ள பகுதிக்குள் அமைக்குமாறு கேட்டுக் கொள்கின்றேன். 10 காற்றாலைகளை அமைப்பதற் குரிய அனுமதியை அரசாங்கம் கொடுத்திருக்கின்றது. எனவே, அந்தக் கம்பனி மன்னார் தீவுக்கு வெளியேயுள்ள ஏனைய பகுதிகளில் அவற்றை அமைப்பதற்குரிய வகையில் அத்திட்டத்தை மீளொழுங்கு செய்யுமாறு நான் இந்த அரசாங்கத்தைக் கேட்டுக்கொண்டு, நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබතුමාට පිළිතුරු කථාව සඳහා දැන් අවස්ථාව ලැබෙනවා.

[අ.භා. 5.08]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා පිළිබඳවයි මේ පාර්ලිමේන්තුවේදී දවසක විවාදයක් අද පැවැත්වුණේ. මේ විවාදයේදී මතු වුණු මූලික කාරණා අතරේ, විරුද්ධ පක්ෂයෙන් මතු වෙච්ච වැදගත් කාරණාවකට ආණ්ඩුව වෙනුවෙන් පිළිතුරු දෙන්න අවශ්‍යයි කියලා මට හිතුණා. ඒ තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම පිළිබඳව මතු වෙච්ච කාරණය. විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම අදහසක් මතු කළා, ඔහු මේ ආණ්ඩුව වෙනුවෙන් කටයුතු කරන, එහෙම නැත්නම් ආණ්ඩුව වෙනුවෙන් පත් කරපු, ආණ්ඩුවේ දේශපාලන බලය පාවිච්චි කරන්න පත් කරපු කෙනෙකු හැටියට.

එක වෙලාවක නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කියනවා මම දැක්කා, ඔහු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිතුමායි කියලා. එහි සභාපතිතුමාට අපේ පක්ෂයේ සම්බන්ධයක් නැහැ. එහි සභාපතිතුමා හැටියට ඉන්නේ, මේ පාර්ලිමේන්තුවේ සේවය කරපු, පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලයත් නියෝජනය කරපු නීල් ඉද්දවල මැතිතුමා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කරලා තිබෙන්නේ අපේ ආණ්ඩුව එන්න කලින්. ඒ නිසා මේ ක්‍රියාවලිය ගැන විශේෂයෙන්ම පැහැදිලි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත අනුව -ඒ අලුත් තත්ත්වය යටතේ; අලුත් නීතිය අනුව- ඒ කොමසාරිස්වරුන් පත් කරන්නේ ජනාධිපතිවරයා විසින් නම් කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එවලා නොවෙයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළව කලින් නම් සිදු වුණේ ජනාධිපතිවරයා විසින් නම් කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එව්වාට පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් එය සලකා බලා නැවත ජනාධිපතිතුමාට නිර්දේශ කරලා යැවීමයි. නමුත් විශේෂයෙන්ම දූෂණ විරෝධී පනත අනුව දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සිද්ධ වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම් කරලා ජනාධිපතිතුමාට දන්වා යැවීමෙනුයි. එතකොට අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තමයි interview කරන්නේ. සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවන්නේත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. එසේ අයදුම්පත් කැඳවා ස්වාධීන නියෝජිතයන් තුන්දෙනා විසින් තමයි interview කරන්නේ. අපේ ආණ්ඩුව බලයට එන්න කලින්, ඒ කියන්නේ 2024 ජනවාරි 01වැනි දා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දැනට ඉන්න කොමසාරිස්වරුන් තුන්දෙනා පත් කරලා තිබෙන්නේ. අපි දන්නේ නැහැ, ඒ කොමසාරිස්වරු ජේවීපී ද, නැද්ද කියලා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් interview කරලා තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා තෝරා ගත්තේ. විශේෂයෙන්ම රංග දිසානායක මහත්මයා මහාධිකරණ විනිසුරුවරයෙක්. එතුමා තෝරා ගන්නකොට, ඒ තෝරා ගත්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා ඉන්නවා, විපක්ෂ නායක හැටියට. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා හිටියා. ඒ අය සාමාජිකයන් වශයෙන් ඉන්නකොට තමයි ඒ සඳහා අනුමැතිය ලබා දෙන්නේ. ඒ අනුමැතිය ලබා දුන්නාම වර්තමාන ආණ්ඩුවේ ජනාධිපතිතුමා හැටියට අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා, 2025 ජනවාරි 08වැනි දා තමයි එතුමාව නම් කරන්නේ. එතුමාට නම් කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා තෝරලා දෙන්නේ පාර්ලිමේන්තුව වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. ඒ අවස්ථාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නියෝජනය කළ විපක්ෂ නායකතුමාවත්, සමගි ජන බලවේගය නියෝජනය කළ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාවත්, වෙන කිසිම කෙනෙක්වත් එම අධ්‍යක්ෂ ජනරාල්වරයා ආණ්ඩුවට වැඩ කරන කෙනෙකු හැටියට නම් කළේ නැහැ. එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ තිබෙන්න ඇති, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව එතුමන්ලාට ඕනෑ විධියට මෙහෙයවන්න පුළුවන්කමක්. නමුත් දැන් එහෙම බැහැ. දැන් ඒක ඉතාම ස්වාධීන ආයතනයක්. ජනාධිපතිවරයාටවත් පාලනය කරන්නට බැරි ස්වාධීනත්වයක් ඒකට තිබෙනවා. ඒක කිසිම අමාත්‍යාංශයකට අයත් නැහැ. ආණ්ඩුවට තිබෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉල්ලන ප්‍රතිපාදන, පහසුකම් ලබා දෙන එක විතරයි. අය වැයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට වෙන් කරලා තිබෙන ප්‍රතිපාදන, පහසුකම් ලබා දෙන එක විතරයි අපට කරන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තමයි interviews කැඳවලා, අධ්‍යක්ෂ ජනරාල්වරයා නම් කරලා,

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ජනාධිපතිතුමාට යවන්නේ. මට ඒකයි අවධාරණය කරන්න ඕනෑකම තිබුණේ. එහෙම නැතිව ජනාධිපතිතුමා නම් කරලා එවන කෙනෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අනුමත කළා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණයේදී මට මූලික වශයෙන් පැහැදිලි කරන්න තිබෙන්නේ ඒකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ආණ්ඩුවේ වුවමනාවට අනුව කටයුතු කරනවා කියලා කවුරු හරි කෙනෙක් කියනවා නම්, එය දූෂණ විරෝධී පනත යටතේ පාර්ලිමේන්තුව පවරපු බලය වැරදි විධියට අර්ථකථනය කිරීමක්. ඒ වාගේම, ස්වාධීන ආයතනයක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නිග්‍රහයට ලක් කිරීමක් හා දෝෂ දර්ශනයට ලක් කිරීමක්. එය දේශපාලන අතකොළුවක් යැයි හැඟවෙන ආකාරයෙන් පාර්ලිමේන්තුවේදී හරි එළියේදී හරි කවුරු හෝ කියනවා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බලතල යටතේත්, ඒ වාගේම දූෂණ විරෝධී පනතේ 160 වගන්තිය යටතේත් ඕනෑ කෙනෙකුට පුළුවන් රිට් ආඥාවක් ගන්න; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගත්ත තීරණයක් වැරදියි, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගත්ත තීරණයක් වැරදියි කියලා එම වගන්ති අනුව රිට් ආඥාවක් ගන්න පුළුවන්. ඒ වාගේම, දේශපාලන වශයෙන් කටයුතු කරනවා කියලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අයුතු ආරෝපණයක් කරනවා නම්, පනතේ 3වන වගන්තිය සහ 118 වන වගන්තිය අනුව කටයුතු කරන්න අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් පුළුවන්.

මම ඒක කියන්නේ මේ නිසායි. අපි රටක් හැටියට ජාත්‍යන්තරයට ගෙන ගිය පණිවුඩයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දූෂණ විරෝධී රාජ්‍යයක් නිර්මාණ කර තිබෙනවා. අපි ඒ ගැන ලෝකයට ආදර්ශයක් දීලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා මේ රටේ දෙකෝටි විසිපන්ලක්ෂයක් ජනතාව නියෝජනය කරලා තමයි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී කිව්වේ, දූෂණයට එරෙහි වීමේ අපේ පදනම. අද විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාම මේ ආකාරයෙන් කියනවා නම්, එතුමන්ලා අද හෑල්ලුවට ලක් කරන්නේ, එතුමන්ලා ම ගෙනාපු, එතුමන්ලා ම සම්මත කළ දූෂණ විරෝධී පනතේ බලතල ම තමයි. එදා එතුමන්ලා ආණ්ඩුවේ සිටිද්දී යම් කිසි හැඟීමක් අනුව උත්සාහ කළා නම් ඒ පනත ගෙනැල්ලා සද්භාවයෙන් කටයුතු කරන්න, අද එතුමන්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින්, අධ්‍යක්ෂක ජෙනරාල්වරයා, සභාපතිවරයා හා කොමසාරිස්වරු අවඥාවට ලක් කරනවා නම්, හෑල්ලු කරනවා නම්, ඔවුන් ගන්න තීරණ හෑල්ලු කරනවා නම්, ඔවුන් අපහාසයට ලක් කරනවා නම්, එතුමන්ලා කරන්නේ තමන් විසින්ම නිර්මාණය කරන්න උත්සාහ කළ ඒ තත්ත්වය හෑල්ලු කර ගැනීමක්. හැබැයි ඒකෙන් කොහොමවත්ම පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - COPE - රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අපි, නාස්තියට හා දූෂණයට එරෙහිව ගෙන යන අරගළය, ආණ්ඩුවක් හැටියට අපි ඒ වෙනුවෙන් ගන්න ක්‍රියාමාර්ග මොහොතකටවත් හකුළන්නේ නැහැ.

විශේෂයෙන්ම දූෂණ විරෝධී අරගළයේ දී මේ රටේ ජනතාවට විශ්වාසයක් නැතිවම තිබුණු ආයතන, අද විශ්වාසජනක ආයතන බවට පත් වෙලා තිබෙනවා. එදා එහෙම විශ්වාසයක් නැති වෙන්න හේතුව මේකයි. එදා ආණ්ඩු බලය කොච්චර දුරට නීතියට ඇඟිලි ගැහුවාද කිව්වොත්, අපේ රටේ ඉතිහාසයේ දැවැන්ත කළු පැල්ලමක් නිර්මාණය වෙච්ච තැන තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමිය, ශිරානි බණ්ඩාරනායක මහත්මිය ගැන මේ පාර්ලිමේන්තුවේ රෑ එළි වෙනකන් විවාද කරලා ගත්ත තීරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඉතිහාසයෙන් අපට ගැළවෙන්න බැහැ. ජාතිකවත්, ජාත්‍යන්තරවත් රටේ පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් උල්ලංඝනය කරලා, ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව උල්ලංඝනය කරලා නීතිය තමන්ගේ අතට අරගෙන, නීතිය උඩ වාඩි වෙලා එදා ඒ බලය පාවිච්චි කරපු ආකාරය නින්දිතයි. ඒ තීරණ පාරා වළලූ වාගේ ඒ අයගේ පිටුපස්සෙන් එනවා. අද ඒ තත්ත්වය නිවැරදි කරගෙන තමයි, අදීනව, කොන්ද කෙළින් තියාගෙන මේ ආසියාවේ පුංචි රටේ නායකයාට ගිහිල්ලා එක්සත් ජාතීන්ගේ සමුළුව ආමන්ත්‍රණය කරලා අපේ රට ගැන අභිමානයෙන් කථා කරන්න පුළුවන්කම ලැබුණේ, ඒ කටයුතු භාවිතාවෙන්ම ක්‍රියාවට නඟන ආණ්ඩුවක් නිසා. එහෙම නායකත්වයක් අපට තිබෙන නිසා. හරි නම් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කුහක නොවී අද ඒ කථාව අගය කරන්න ඕනෑ. නමුත් අපි ඒ අයගෙන් ඒක බලාපොරොත්තු වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර පුවත් පත්, එක්සත් ජනපදයේ පුවත් පත්, නිව්යෝර්ක් පුවත් පත්, ජාත්‍යන්තර නායකයන් විශාල ප්‍රමාණයක් ජනාධිපතිතුමාගේ කථාව ඉතා පැසසුමට ලක් කරලා තිබුණා, මම දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම සම්බන්ධයෙන්, එහි නිලධාරින් පත් කිරීම සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධයෙන් විපක්ෂය අද මතු කරපු අභූත චෝදනාව අපි පිළිකුල්සහගතව ප්‍රතික්ෂේප කරනවාය කියන එක මම අවධාරණයෙන් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එකේ කාර්යභාරය පිළිබඳවත් මම කියන්න ඕනෑ. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ COPE එකේ සභාපතිවරයා ගැන. එතුමා වෛද්‍යවරයකු හැටියට වෘත්තීය ජීවිතය ගත කරලා, දේශපාලනයට ඇවිල්ලා, ජාතික ජන බලවේගයේ දේශපාලන භූමිකාවක් කරලා මෙතරම් ඉක්මනින් ගිණුම්කරණය, කළමනාකරණය, විගණනය කියන ක්‍රියාවලිය අවබෝධ කරගෙන තිබෙනවා. අද COPE එකට දෙන නායකත්වය පිළිබඳව මම නිශාන්ත සමරවීර මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ස්වාධීනව ඒ කටයුතු කරගෙන යන එක ලොකු ආදර්ශයක්. මේ වාර්තා පරිශීලනය කරද්දී COPE එකේ හිටපු සභාපතිවරයකු හැටියට මම ඉතා සතුටු වෙනවා, කෙටි කාලයක් තුළ මේ ආයතන 457න් විශාල බලපෑමක් අද රටට එල්ල කරලා තිබෙන එක ගැන. මම ඊයේත් මාධ්‍යයේ දැක්කා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් ඔබතුමා කරන ලද පරීක්ෂණය. ඒවා ඉතා සත්‍ය, නිවැරදි තොරතුරු. එදා ගෑස් මිල වැඩි කරලා, බඩු මිල වැඩි කරලා, විදුලි අර්බුදය නිර්මාණය කරලා ඒ උද්ධමනය කෘත්‍රිමව නිර්මාණය කරපු හැටි ඔබතුමන්ලා සාක්ෂි සහිතව රටට දැන් හෙළිදරව් කරලා තිබෙනවා. එදා ඒ තත්ත්වය නිසා ජනතාවට වෙච්ච පීඩනය කොච්චර ද කියලා අපි අත්දැකීමෙන් දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ගැටලුවක් තිබෙනවා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම පිළිබඳව. මෙතැනදී මම ඔබතුමාට යෝජනාවක් සහ ඉල්ලීමක් කරනවා. මේ ක්‍රියාවලිය විධිමත් කරන්න නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් ඉල්ලීමක් කරලා, අඩුම තරමින් නිරීක්ෂණ කණ්ඩායමක් හැටියට හෝ නීතිඥ සහයෝගය සහිත නීති නිලධාරින් COPE එකට කැඳවන්න. ස්ථාවර නියෝග අනුව, එම නිලධාරින්ගේ සහාය ලබා ගන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා. ඒ, පළමු කාරණය. ඒ ගැන සාකච්ඡා කරලා ඔබතුමන්ලා COPE එකේදී තීරණයක් ගත්තොත් සමහර ගැටලු විශාල ප්‍රමාණයක් නිරවුල් කර ගන්න පුළුවන්.

දෙවෙන්න, COPE එකේ කටයුතු ඩිජිටල් කිරීම. අපි දන්නවා ලේඛන ගණනාවක් ඔබතුමන්ලාට පරිහරණය කරන්න තිබෙනවා

කියලා. ඒවා පරිශීලනය කරන්න ඕනෑ. ඒ ලිපිලේඛන කොච්චර ගෙනාවත් ඒවා පරිශීලනය වෙන්නේ නැහැ. මේ සභාගත කරන බොහෝ ලිපි ලේඛන ගෙනියන්නෙත් නැහැ. හැබැයි, ඩිජිටල් කර ගත්තොත්, සාමාජිකයන්ට විතරක් පරිහරණය කරන්න පුළුවන් විධියට වෙනම SWIFT Code එකක් අරගෙන, රහස් අංකයක් අරගෙන එවෙලේම දත්ත ඒක රාශි කර ගන්න පුළුවන්. අමාත්‍යාංශවලින්, ආයතනවලින්, විගණන දෙපාර්තමේන්තුවෙන්, විගණන අධිකාරියෙන් අවශ්‍ය සහයෝගය COPE එක හරහා අරගෙන, ඒ තොරතුරු, දත්ත එවෙලේම ඔබතුමන්ලාට නිරීක්ෂණය කරගෙන ප්‍රශ්න කරන්න පුළුවන් තත්ත්වයත් COPE එකේ කටයුතු ඩිජිටල් කිරීමෙන් කර ගන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා.

සාමාජික මන්ත්‍රීතුමන්ලා පිරිසට අවශ්‍ය ඕනෑම තොරතුරක් ලබා ගන්න ටැබ් එකක්, එහෙම නැත්නම් ලැප්ටොප් එකක් පාවිච්චි කරගන්න පුළුවන් නම්, අන්න ඒ සම්බන්ධීකරණය කරගත්තොත් මේ කටයුත්ත කරගන්න පුළුවන්. අපි එක අවස්ථාවක උත්සාහ කළා, UNDP එකේ සහයෝගය අරගෙන මේ කටයුත්ත සිද්ධ කරන්න. නමුත් ඒ වෙලාවේ ඒක කරගන්න බැරි වුණා. ගරු සභාපතිතුමා මැදිහත් වුණොත්, ඉදිරි අය වැයෙන් ප්‍රතිපාදන අරගෙන හෝ පාර්ලිමේන්තුවට වෙන් වෙන ප්‍රතිපාදනවලින් හෝ මේක ඩිජිටල්කරණය කරගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. කාලයක් තිස්සේ විසඳෙන්නේ නැතිව තිබුණු ගැටලු ගොඩක් ඒ නිසා විසඳාගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම ක්‍රියාත්මක කිරීමේ පැත්ත ගැන ආණ්ඩුවේ අමාත්‍යාංශයක අමාත්‍යවරයෙක් හැටියට මම ඉතාම සන්තෝෂ වෙනවා. අද සාකච්ඡා කරන ආයතන 14 සම්බන්ධව ඔබතුමන්ලා නිර්දේශ විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙනුවෙන් අපේ අමාත්‍යාංශයටත් නිර්දේශ ලබා දුන්නා. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක්. ඒ ආයතනය සම්බන්ධයෙන් ඔබතුමා ලබා දුන් නිර්දේශ විශාල ප්‍රමාණයක් අපි ක්‍රියාත්මක කරලා තිබෙනවා. කෝප් කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කරලා ඔබතුමාගේ කමිටුවට නැවත වාර්තා ඉදිරිපත් කළ මේ ආණ්ඩුවේ පළමුවැනිම ආයතනය එය වීම අපේ අමාත්‍යාංශය ලබා ගත් ලොකු ජයග්‍රහණයක් කියලා මම හිතනවා. කෝප් කමිටුවේ නිර්දේශ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සහ වර්තමාන ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ඇතුළත් ලේඛනයක් ඔබතුමාට ලබා දීලා තිබෙනවා. මම ඒ ලේඛනය **සභාගත*** කරනවා.

මම එහෙම කියන්නේ මේ නිසායි. සමහර අය කියනවා, කෝප් කමිටුවෙන් හොරු ඇල්ලුවේ නැහැ නේ කියලා. ඒක ඇත්ත. මම ඒක පිළිගන්නවා. හේතුව, කෝප් කමිටුවට ගියාම අහුවෙන්නේ නිලධාරින්. දේශපාලකයන් නොවෙයි. මම එක උදාහරණයක් කියන්නම්. මම ඔබතුමාට මේ ගැන පෞද්ගලිකවත් කිව්වා. කෝප් කමිටුවට ධීවර සංස්ථාව කැඳවා සාකච්ඡා කළ අවස්ථාවක කෝප් කමිටුවේ හිටපු සාමාජිකයෙක් කලින් ආණ්ඩුවේ ඇමති හැටියට ඉඳලා විපක්ෂයේ වාඩි වෙලා සිටියා. කාලයක් පරණ audit වාර්තා ගැන තමයි විභාග කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අර ඇමති හැටියට හිටපු කෙනා දැන් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්නවා. එතුමා අදාළ නිලධාරියාගෙන් ප්‍රශ්න කරනවා, "ඔයාට කවුද මේ තීරණය ගන්න කිව්වේ?" කියලා. හතර පස් වතාවක් ප්‍රශ්න කළත් අර නිලධාරියා නිහඬව සිටියා. උත්තර දෙන්න විධියක් නැහැ. "කරුණාකරලා කියන්න, ඔයාට මේක ක්‍රියාත්මක කරන්න කිව්වේ කවුද?" කියලා නැවතත් ඇහුවාට පස්සේ අර නිලධාරියා නැඟිටලා කිව්වා, "ඔබතුමාම නේ කිව්වේ. ඔබතුමා ඇමති හැටියට තමයි නිර්දේශ දුන්නේ" කියලා. එහෙම තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඇමති හැටියට කියපු දේ එතුමාට මතක නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිවරු ලිඛිතව නොවෙයි කියන්නේ, කට වචනයෙන්. නිලධාරින්ට තමයි අත්සන ගහලා ක්‍රියාත්මක කරන්න වෙන්නේ. අවසානයේ අත්සන ගහලා ක්‍රියාත්මක කරපු නිලධාරියා තමයි අහුවෙන්නේ. ඔබතුමන්ලාගේ ප්‍රශ්න කිරීම්වලට ලක් වෙනකොට හුඟක් වෙලාවට නිලධාරින් අපහසුතාවට පත් වෙන බව පෙනෙනවා. හැබැයි, ඒ විමර්ශන ක්‍රියාලිය අවසානයේ හමුවෙන්නේ නිලධාරියෙකුට වඩා දේශපාලනඥයෙක්; ඇමතිවරයෙක්. මොකද, ඇමතිවරයෙකුගේ නියෝගයක්; නිර්දේශයක්; බලකිරීමක් නැතිව පසුගිය කාලයේ නිලධාරින්ට වැඩ කරන්න බැරිව තිබුණේ. ස්වාධීනත්වයක් තිබුණේ නැහැ.

දැන් මේ අය කියනවා නේ, නිලධාරින්ව බය කරලා තිබෙන්නේ කියලා. මේගොල්ලන් කරුණු දෙකක් කියනවා; විපක්ෂයේ ඉන්න අය කරුණු දෙකක් කියනවා. අද මේ මුළු විවාදයේදීම දෙවිධියකටයි කථා කළේ. එක අවස්ථාවක කියනවා, කෝප් කමිටුවෙන් නිලධාරින් බය කරලා තිබෙන නිසා නිලධාරින් වැඩ කරන්නේ නැහැ ලු. අනෙක් පැත්තෙන් ඒගොල්ලන් කියනවා රජය දේශපාලනීකරණය කරලා තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් පවා දේශපාලන වශයෙන් අපට වැඩ කරනවා කියලා. ඒ දෙකම කියනවා නේ. මේක පරස්පරයි නේ. මේ දෙකම කියනවා. නිලධාරින් බය කරලා තිබෙනවා කියනවා. බය කරපු නිලධාරින් දැන් නැහැ; බය වෙන නිලධාරින් දැන් නැහැ. රාජ්‍ය සේවයේ සියලුම නිලධාරින්ට දැන් ස්වාධීනව වැඩ කරන්න පුළුවන්. මෙතැන සිටින කිසිම ඇමතිවරයෙක්, මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා බලපෑම් කරලා, මේක කරන්න කියලා කියන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඊට අමතරව මම තව පොඩි වෙලාවක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලා ඕනෑ කෙනෙකුගෙන් අහන්න, ප්‍රශ්න කරන්න මොන ඇමතිවරයාද බලපෑම් කළේ කියලා. අපි කිසි කෙනෙකුට එහෙම බලපෑම් කරලා නැහැ, කරන්නෙත් නැහැ. අද රාජ්‍ය සේවයේ ඒ ස්වාධීනත්වය ස්ථාපිත කරලා තිබෙනවා.

දැන් මොකක්ද මේගොල්ලන් කියන්නේ? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම දේශපාලනීකරණය වෙලා තිබෙනවා කියලා මේ කියන්නේ මොකක්ද? ඒගොල්ලන්ට ඕනෑ විධියට වැඩ කරන්නේ නැහැයි කියන එක මේ කියන්නේ. මේගොල්ලන් දේශපාලනයෙන් තොරයි, ස්වාධීනයි කියලා විරුද්ධ පක්ෂය අද කියන්නේ මොකක්ද? ඒ කාලයේ ආණ්ඩු බලය තිබෙනකොට ඒගොල්ලන්ට ඕනෑ විධියට වැඩ කරපු එක. ආණ්ඩු බලය තිබෙන පක්ෂයකට ගැති විධියට වැඩ කරන එක ස්වාධීනත්වය නොවෙයි. එහෙම වැඩ කරලා වැඩක් නැහැ. අපි අද

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ස්ථාපිත කරලා තිබෙන නිසා රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඇති වෙලා තිබෙනවා. රාජ්‍ය ව්‍යාපාරවල කාර්යක්ෂමතාව ඇති වෙලා තිබෙනවා. පාඩු ලබපු රාජ්‍ය ව්‍යාපාර ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අවදානමේ තිබිච්ච ව්‍යාපාර අවදානමෙන් ගොඩ ඇවිල්ලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ මොකක් නිසාද?

අපි මේ ආයතනවලට අධ්‍යක්ෂ මණ්ඩලය විතරයි පත් කර තිබෙන්නේ; සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ හය හත්දෙනෙක් විතරයි පත් කර තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒ ආයතන තුළ කාර්යක්ෂමතාව ඇති වෙලා, නාස්තිය, දූෂණය අඩු වෙලා, ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ කොහොමද? ඒ නිලධාරින් වැටුපට එහා ගිහිල්ලා තෘප්තිමත් රැකියාවක දැන් නියැළෙනවා. මම උදාහරණ කිහිපයක් කියන්නම්. මට මේක වැදගත් වෙන්නේ, මේ සියලුම ආයතන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට ලක් වෙන ආයතන නිසායි. 2024දී පාඩු ලැබූ, නමුත් 2025 මුල් මාස හය තුළ ලාභ ලබපු ආයතන 14ක් තිබෙනවා. 2024දී අපි බලය ගන්නකොට -සැප්තැම්බර් 21වන දා වෙනකොට- පාඩු ලබපු ආයතන මම කියන්නම්. පළමුවැනි එක, ලංකා ඛනිජ වැලි සමාගම. එය මගේ අමාත්‍යාංශය -කර්මාන්ත අමාත්‍යාංශය- යටතේයි තිබෙන්නේ. 2024.01.01 ඉඳලා 2024.06.30 වෙනකම් ඒ ආයතනයේ මෙහෙයුම් ආදායම තිබුණේ, මිලියන 617යි. 2025 ජනවාරි 01වැනි දා ඉඳලා 2025.06.30 වෙනකොට එහි මෙහෙයුම් ආදායම මිලියන 873යි. මෙහෙයුම් ආදායම මත ලබා ඇති ලාභය මිලියන 480ක්. ඊළඟට තිබෙනවා, මිල්කෝ පුද්ගලික සමාගම, ජාතික කඩදාසි සමාගම. ඒවාත් කර්මාන්ත අමාත්‍යාංශය යටතේයි තිබෙන්නේ. ඊළඟට, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව, ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, කාර්මික සංවර්ධන මණ්ඩලය කියන ඒවාත් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. මේ ආයතන ඔක්කොම පළමුවෙනි මාස හයම ලාභ ලබා තිබෙනවා. ඒ, අපට ගැතිව වැඩ කරලා නොවෙයි; දේශපාලනීකරණය වෙලා නොවෙයි. ස්වාධීනව වැඩ කරන්න ඒ අයට අපි ලබා දුන් ධෛර්යය, ශක්තිය නිසායි; කෝප් කමිටුවෙන් ලබා දුන් මග පෙන්වීම නිසායි. ඒකයි මෙතැන තිබෙන විශේෂත්වය.

ඒ වාගේම මේ කාරණයත් මම කියන්න ඕනෑ. මම මේක කලිනුත් කිව්වා. මේ ලේඛනය මම සභාගත කළා. මේ නිර්දේශ යටතේ තිබෙනවා, ක්‍රියාකාරී සැලැස්ම. ඒ වාගේම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනය කරන්න කියපු එක. අපි දැනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියත්, මැණික් පර්යේෂණ ආයතනයත් ඒකාබද්ධ කරන්න යෝජනා කර තිබෙනවා. ඒක කෝප් කමිටුවටත් දැනුම් දීලා තිබෙනවා. තවත් කමිටු නිර්දේශයක් තිබෙනවා, මැණික් කර්මාන්තයේ නියාමනය සහ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ගැන. ඒ අනුව 2025.03.18 දින වන විට කටයුතු කර බලපත්‍රයක් ලබා දුන්නාට පසුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය දක්වා ප්‍රදර්ශනය කරන්න අපි නිර්දේශ කර තිබෙනවා. බලපත්‍ර ලබා දුන් ක්‍රියාවලිය, බලපත්‍ර ලබා ගෙන තිබෙන්නේ කවුද කියන එක පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිසාපති කාර්යාලයේ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ- පවා අපි ප්‍රසිද්ධ කරනවා. ඒක කෝප් කමිටුවේ නිර්දේශයකුත් වෙලා තිබෙනවා. කාටවත් කියන්න බැහැ ඉලක්කම් හැටියට මෙන්න මෙච්චර ප්‍රමාණයක් ඉතුරු වුණා කියලා. මේවායෙන් තමයි නාස්තිය, දූෂණය නතර කරන්නේ. මේවායෙන් තමයි විනිවිදභාවය පේන්නේ. මේවායෙන් තමයි කාර්යක්ෂමතාව නිර්මාණය වෙන්නේ. මේ නිසා තමයි ආයතන ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම මැණික් ආනයනය හා ප්‍රතිඅපනයනය පිළිබඳව තිබිච්ච ගැටලු අපි නිරාකරණය කර තිබෙනවා. ඒ පිළිබඳව භෞතික නිරීක්ෂණ වාර්තා පවා හදන තත්ත්වයට පත් කර තිබෙනවා. ඔබතුමන්ලා අපට පෙන්වා දුන් කරුණු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම අපි දැකපු කාරණා තිබෙනවා. විගණන වාර්තාවලින් ඉදිරිපත් කරපු කාරණා තිබෙනවා. ඒ නිසා මෙතෙක් විශාල නඩු ගොඩක් තිබිච්ච ආයතන -ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වගේ ආයතන- අද ස්වාධීනව වැඩ කරන ආයතන බවට අපි පත් කර තිබෙනවා.

පසුගිය අවුරුද්දේ අලාභ ලබපු, නමුත් මේ අවුරුද්දේ මෙහෙයුම් ආදායම් වැඩි කරගෙන, අලාභ අඩු කරගත්ත ආයතන තිබෙනවා. ඒවා ලාභ ලබන තත්ත්වයට ගෙනෙන්න අපට තවම බැරි වුණා. හැබැයි, මෙහෙයුම් ආදායම වැඩි කරලා, අලාභ තත්ත්වය ලාභ ලබන තත්ත්වයට පත් කරපු ආයතන 7ක් තිබෙනවා. ඒ තමයි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ පුද්ගලික සමාගම, තල් සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල. ඒ ආයතන මෙහෙයුම් ආදායම වැඩි කර ගෙන අලාභ තත්ත්වය අඩු කරගෙන තිබෙනවා.

ඒ වාගේම පසුගිය අවුරුද්දේ මෙහෙයුම් ආදායමට සාපේක්ෂව මේ අවුරුද්දේ මෙහෙයුම් ආදායම වැඩි කරගත් ආයතන තිබෙනවා. ඒ කියන්නේ පසුගිය අවුරුද්දේත් ආදායම වැඩි වුණා, හැබැයි මේ අවුරුද්දේ ඊටත් වඩා ආදායම වැඩි කර ගත් ආයතන ප්‍රමාණයක් තිබෙනවා.

මට තව විනාඩි දෙක තුනක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සී/ස පරන්තන් කෙමිකල් සමාගම, මිල්කෝ පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ලංකා මුද්‍රණ ආයතනය, ලංකා වරාය අධිකාරිය, කොළඹ නෙළුම් කුලුන කළමනාකරණ (පුද්ගලික) සමාගම, ජාතික චිත්‍රපට සංස්ථාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ විශේෂයෙන්ම අද විවාදයට ලක් වෙච්ච ශ්‍රී ලංකා ගුවන්තොටුපළ හා ගුවන් සේවා සමාගම ඇතුළු තවත් ආයතන කිහිපයක් ඒ අතර තිබෙනවා. මේ ආයතන දැන් මෙහෙයුම් ලාභය වැඩි කරගෙන තිබෙනවා.

මම එක උදාහරණයක් කියන්නම්. අද ඔබතුමන්ලා සාකච්ඡා කරපු ගුවන්තොටුපළ හා ගුවන් සේවා සමාගමේ මෙහෙයුම් ආදායම 2024 අවුරුද්දේ දෙසැම්බර් 31 වෙනකොට රුපියල් මිලියන 21,875.20යි. ඒ වාගේම 2025 ජනවාරි 01 ඉඳලා 2025 ජූනි 30 වෙනකොට මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 27,249.24යි. ඒ කියන්නේ සියයට 25කින් මෙහෙයුම් ආදායම වැඩි කරගෙන තිබෙනවා. එම තොරතුරු ඇතුළත් වාර්තාව හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

මේක තමයි කාර්යක්ෂමතාව. මේක තමයි රටක වෙන්න ඕනෑ දේ. ඒ නිසා වෙච්ච පිටුවහල තමයි, මේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව ජනතාවගේ විශ්වාසය ගොඩනැඟීම. COPE එක කරපු මේ

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

කාර්යභාරය, මේ ආණ්ඩුව පත් කරපු ජනතාව අපට භාර දුන් වගකීම ඉෂ්ට කිරීමක් හැටියට තමයි මම නම් දකින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වගකීම ඉෂ්ට කරද්දි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයේ සියලුදෙනා අතිරේක වැඩ කොටසක් කරන බව අපි දන්නවා.

මම මෙහිදී විශේෂයෙන්ම ලේකම් මණ්ඩලයේ සහ කථානායකතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, යම් කාරණයක් සම්බන්ධව. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිලධාරින්ට හුඟක් වෙලාවට training ලැබෙන්නේ නැහැ. ඒ අයට විදේශ රටවලට ගිහිල්ලා අත්දැකීම් ලබා ගන්න අවස්ථාවක් ලැබෙන්නේත් නැහැ. සාමාන්‍ය කාර්ය මණ්ඩලයට තිබෙන පහසුකම් තමයි ඒ අයටත් තිබෙන්නේ. ඒ තත්ත්වය දියුණු කරන්න ඕනෑ. ඒ තත්ත්වය දියුණු කරලා මේ කාරක සභා පද්ධතිය ශක්තිමත් කළොත්, ඉදිරි අවුරුදු කිහිපයේදී වඩා කාර්යක්ෂම කාර්යභාරයක් කරන පාර්ලිමේන්තුවක් බවට මේ පාර්ලිමේන්තුව පත් කරගන්න පුළුවන්. ඒ වාගේම ජනතාව තුළ බිඳ වැටිච්ච විශ්වාසය නැවත ගොඩනඟන්නත් මේ තුළින් අපට හැකියාව තිබෙනවා කියන කාරණයත් අවධාරණය කරමින්, ඒ සඳහා අපේ සභාපතිතුමාට සහ මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද ලේඛනය:**
**சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று:*
**Document tabled:*

**රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායන්**

**1. පසුගිය වර්ශයේ අලාභ ලැබූ නමුත් මේ වර්ශයේ ලභ ලබර රාජ්‍ය ව්‍යාපාර**

- පසුගිය වසරේ (2024) පාඩු ලැබූ නමුත් මේ වසරේ (2025) මුල් මාස 06තුළ ලාභ ලබන රාජ්‍ය ව්‍යාපාර ආයතන 14කි. සී/ස ලංකා ඛණිජ වැලි සමාගම, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව, කිතුල් සංවර්ධන මණ්ඩලය, ලක්දිව ඉංජිනේරු සමාගම, මිල්කෝ පුද්ගලික සමාගම, කෘෂිකර්ම සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය, පරමාණුක බලශක්ති මණ්ඩලය, කළුබෝවිටියාන තේ කර්මාන්ත සමාගම, ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම, සීමා සහිත ජාතික කඩදාසි සමාගම, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි විද්‍යා ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය මේ අතර වේ. මෙලෙස ලාභ ලැබූ ආයතන කිහිපයක මෙහෙයුම් ආදායම් තත්වයන් පසුගිය වසරේ මුල් මාස හයට සාපේක්ෂව මේ වසරේ මුල් මාස හය මෙහෙයුම් ආදායමේ වර්ධනය පහත පරිදි විග්‍රහ කළ හැකිය.

(රු.මි.)

| | රාජ්‍ය ව්‍යාපාර ආයතනයේ නම | 2024.01.01 සිට 2024.06.30 දක්වා මෙහෙයුම් ආදායම | 2024 ලැබූ ලාභය/ අලාභය | 2025.01.01 සිට 2025.06.30 දක්වා මෙහෙයුම් ආදායම | 2025.06.30 දක්වා මෙහෙයුම් ආදායම මත ලබා ඇති ලාභය |
|---|---|---|---|---|---|
| 01 | සී/ස ලංකා ඛණිජ වැලි සමාගම | 617.80 | (77.06) | 873.87 | 480.61 |
| 02 | මිල්කෝ පුද්ගලික සමාගම | 15,932.88 | (43.11) | 8904.89 | 627.91 |
| 03 | සී/ස ජාතික කඩදාසි සමාගම | 220.18 | (65.55) | 41.22 | 7.76 |
| 04 | කළුබොවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 1678.20 | (10.53) | 507.25 | 39.51 |
| 05 | ගල්ඔයවැලි පුද්ගලික සමාගම | 7835.84 | (839.34) | 2074.33 | 968.86 |
| 06 | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව | 232.49 | (55.34) | 233.95 | 187.59 |
| 07 | කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 623.35 | (3182.19) | 264.17 | 344.47 |
| 08 | කාර්මික සංවර්ධන මණ්ඩලය | 857.04 | 58.58 | 320.53 | 56.78 |

**2. පසුගිය වර්ශයේ අලාභ ලැබූ නමුත් මේ වර්ශයේ මෙහෙයුම් ආදායම් වැඩි කර ගැනීම තුලින් අලාභ අඩු කර ගත් රාජ්‍ය ව්‍යවසාය**

- අලාභ ලබන නමුත් නව පාලනය සමඟ මෙහෙයුම් ආදායමේ වර්ධනයක් වාර්තා කර ගෙන ඇති රාජ්‍ය ව්‍යාපාර ආයතන හා ඒවායෙහි මෙහෙයුම් ආදායම පිළිබඳ විස්තර පහත පරිදි විග්‍රහ කළ හැකිය. මෙමඟින අලාභය අඩු කර ගෙන ඇත.

(රු.මි.)

| | රාජ්‍ය ව්‍යාපාර ආයතනයේ නම | 2024.01.01 සිට 2024.06.30 දක්වා මෙහෙයුම් ආදායම | 2024 ලැබූ ලාභය/ අලාභය | 2025.01.01 සිට 2025.06.30 දක්වා මෙහෙයුම් ආදායම | 2025.06.30 දක්වා මෙහෙයුම් ආදායම මත ලබා ඇති ලාභය/ අලාභය | මෙහෙයුම් ආදායමේ වර්ධනය |
|---|---|---|---|---|---|---|
| 01 | ලංකා ධීවර වරාය සංස්ථාව | 396.39 | (85.30) | 747.82 | (22.66) | 89% |
| 02 | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 38.93 | (645.93) | 55.77 | (303.71) | 43% |
| 03 | කැළණිය විශ්ව විද්‍යාලයේ පුරා විද්‍යා පශ්චාද් උපාධි ආයතනය | 4.49 | (23.78) | 0.66 | (7.76) | 33% |
| 04 | ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ (පුද්) සමාගම | 2.37 | (187.90) | 3.14 | (38.72) | 33% |
| 05 | තල් සංවර්ධන මණ්ඩලය | 34.44 | (40.80) | 41.56 | (1.00) | 21% |
| 06 | ශ්‍ර ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 495.52 | (68.64) | 558.09 | (42.11) | 13% |
| 07 | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල | 63.67 | 46.96 | 80.84 | (35.6) | 27% |

**3. පසුගිය වර්ශයේ මෙහෙයුම් ආදායමට සාපේක්ෂව මේ වසරේ මෙහෙයුම් ආදායම් වැඩි කර ගත් රාජ්‍ය ව්‍යවසාය**

පසුගිය වසරට (2024) සාපේක්ෂව මේ වසරේ (2025) මුල් මාස 06තුළ රාජ්‍ය ව්‍යාපාර ආයතන 58ක් සිය මෙහෙයුම් ආදායම වර්ධනය කරගෙන ඇත. ඉන් කිහිපයක මෙහෙයුම් ආදායම් විස්තර පහත පරිදි වේ.

(රු.මි.)

| | රාජ්‍ය ව්‍යාපාර ආයතනයේ නම | 2024.01.01 සිට 2024.12.31 දක්වා මෙහෙයුම් ආදායම | 2025.01.01 සිට 2025.06.30 දක්වා මෙහෙයුම් ආදායම | වර්ධනයේ ප්‍රතිශතය (පසුගිය වසරේ මුල් මාස 6ට සාපේක්ෂව) |
|---|---|---|---|---|
| 01 | සී/ස පරන්තන් කෙමිකල් සමාගම | 360.00 | 368.50 | 2% |
| 02 | මිල්කෝ පුද්ගලික සමාගම | 7966.44 | 8904.89 | 12% |
| 03 | සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (General) | 12666.29 | 13047.75 | 3% |
| 04 | සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (Life) | 11784.26 | 15451.18 | 31% |
| 05 | ලංකා මුද්‍රණ ආයතනය | 11.83 | 12.89 | 9% |
| 06 | රාජ්‍ය දැව සංස්ථාව | 1990.60 | 2061.79 | 4% |
| 07 | ලංකා වරාය අධිකාරිය | 37283.70 | 40818.89 | 9% |
| 08 | කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ (පුද්) සමාගම | 848.59 | 991.91 | 17% |
| 09 | ජාතික චිත්‍රපට සංස්ථාව | 44.79 | 53.80 | 20% |
| 10 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 495.52 | 558.09 | 13% |
| 11 | සී/ස ලක්දිව ඉන්ජිනියරින් සමාගම | 120.28 | 148.55 | 24% |
| 12 | ශ්‍රී ලංකා ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගම | 21875.20 | 27249.24 | 25% |
| 13 | සී/ කුරුණෑගල වැවිලි සමාගම | 642.23 | 815.07 | 27% |
| 14 | ජාතික රක්ෂණ භාර | 13806.01 | 17400.82 | 26% |

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

| | | | | |
|---|---|---|---|---|
| | අරමුදල | | | |
| 15 | සී/ස හලාවත වැවිලි සමාගම | 481.30 | 671.02 | 39% |
| 16 | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව | 116.25 | 233.95 | 101% |
| 17 | ජාතික ප්‍රවාහන කොමිෂම | 281.33 | 350.18 | 24% |
| 18 | කොළඹ වරාය නගර ආර්ථික කොමිෂම | 143.42 | 362.38 | 153% |
| 19 | සේවක අර්ථසාධක අරමුදල් මණ්ඩලය | 32677.00 | 33917.00 | 4% |
| 20 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 4224.29 | 4437.29 | 5% |

මීට අමතරව, ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සහ රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීමේ අරමුණින් පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාර (SOEs) රැසක් ප්‍රතිව්‍යුහගත කිරීමේ හෝ පෞද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර තිබේ. ඒ අතර අවධානය යොමු කර ඇති ප්‍රධානම ආයතන වන

*එකල්හි වේලාව අ.භා. **5.30** වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, **2025** ඔක්තෝබර් **07**වන අඟහරුවාදා පූ.භා. **9.30** වන තෙක් කල් ගියේ ය.*

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2025 ஒக்ரோபர் 07, செவ்வாய்க் கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Tuesday, 07th October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.